# ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තෝරාගත් නියෝග

# (2017-2018)

## තීරණ පිළිබඳ සූචියක් සහිත

*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන්*
*සභාවේ ප්‍රකාශනයක්*
*2019*

# ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තෝරාගත් නියෝග (2017-2018)

**ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව**

සියලු හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ පූර්ව අවසරයකින් තොරව විද්‍යුත්, යාන්ත්‍රික, ඡායා පිටපත්කරණය හෝ වෙනයම් ආකාරයකට ප්‍රතිනිෂ්පාදනය, සමුද්ධරණ පද්ධතියක ගබඩා කර තැබීම හෝ සම්ප්‍රේෂණය කිරීම සිදුකළ නොහැකිය.

**ISBN 978-624-5092-01-7**

**මුද්‍රණය**

මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය සඳහා ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වගකීම දරනු ලැබේ.

**ප්‍රකාශයට පත්කළේ:**

ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
කාමර අංක 203-204, දෙවන පරිශ්‍රය,
බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07

දුරකතන/ෆැක්ස් : **+ 94 11 2691625/26**
විද්‍යුත් තැපෑල: **rti.commission16@gmail.com**
වෙබ් අඩවිය: **http://www.rticommission.lk**

**මුද්‍රණය කළේ:**

සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ,
53, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,
(මාලිගාකන්ද පාර) කොළඹ 10

# පටුන


I කෙටියෙදුම් පිළිබඳ සටහන 01 පිටුව

II පෙරවදන 03 පිටුව

III තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ පණිවිඩය 07 පිටුව

IV මූලික පද ඇතුලත් තෝරාගත් නියෝග

1 එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන එ. ශ්‍රී ලංකා යුද හමුදාව(RTIC/89/2017) 14 පිටුව

2 එල්. ඩී. එන්. කුමාරසිරි එ. කොළඹ මහානාම විද්‍යාලය/අධ්‍යාපන අමාත්‍යාංශය(RTIC/44/2017) 19 පිටුව

3 ඕ. ඩබ්ලිව් කේ ඥානදාස එ. ලංකා බැංකුව (RTIC/131/2017) 22 පිටුව

4 ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් එ. අග්‍රාමාත්‍ය කාර්යාලය/ ජනාධිපති ලේකම් කාර්යාලය (RTIC/06/2017) 24 පිටුව

5 ඩයලොග් ඇක්සියාටා එ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) (RTIC/09/2018) 75 පිටුව

6 ඩිලංගනී නිරෝෂිකා එ. බෝගම්බර බන්ධනාගාරය (RTIC/228/2018) 81 පිටුව

7 තරිඳු ජයවර්ධන එ. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය (RTIC/119/2017) 83 පිටුව

8 තිලක් රංජිත් සිල්වා එ. ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය (RTIC/142/2018) 87 පිටුව

9 පී.යූ. රංගබණ්ඩාර එ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (RTIC/55/2017) 93 පිටුව

10 පුරුජෝත්තමන් තංගමයිල් එ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (RTIC/78/2017) 100 පිටුව

11 බෂීර් සේගු දාවුද් එ. ජනාධිපති ලේකම් කාර්යාලය (RTIC/22/2017) 103 පිටුව

12 බී. ඒ. ජේ. ඉන්ද්‍රතිලක එ. විසාකා විද්‍යාලය/අධ්‍යාපන අමාත්‍යාංශය (RTIC/63/2018) 107 පිටුව

13 ආචාර්ය මාරියෝ ගෝමස් එ. මහජන සවිබලගැන්වීම, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය (RTIC/51/2018) 112 පිටුව

14 රයිසා වික්‍රමතුංග එ. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (RTIC/106/2018) 115 පිටුව

15 ලංකා බැංකු සේවක සංගමය එ. මහජන බැංකුව (RTIC/58/2018) 119 පිටුව

16 වෙරිටේ රිසර්ච් පුද්ගලික සමාගම එ. ශ්‍රී ලංකා මහ බැංකුව (RTIC/26/2018) 135 පිටුව

17 ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය එ. ශ්‍රී ලංකා ගුවන් සේවය (RTIC/99/2017) 156 පිටුව

18 ශ්‍රීන් සරුර් එ. අග්‍රාමාත්‍ය කාර්යාලය (RTIC/01/2018) 171 පිටුව

19 ෆයිසාල් සමත් එ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (RTIC/201/2017) 175 පිටුව

V **ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිළිබඳ සටහන** 177 පිටුව

VI **සමුද්දේශන පිළිබඳ වගුව** 179 පිටුව

VII **ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව - තෝරාගත් නියෝගයන් පිළිබඳ සූචිය** 186 පිටුව

# කෙටියෙදුම් පිළිබඳ සටහන

CBEU - ලංකා බැංකු සේවක සංගමය
CBSL - ශ්‍රී ලංකා මහා බැංකුව
CCO - ප්‍රධාන වෙළඳ නිලධාරී
CEO - ප්‍රධාන විධායක නිලධාරී
CIC - මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව
CID - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
COI - පරීක්ෂණ කොමිෂන් සභාව
DALL - 1975 අංක 01 දරණ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන නීතිය
DG - අධ්‍යක්ෂ ජනරාල්
DO - නම්කළ නිලධාරී
EIA - පාරිසරික බලපෑම් ඇගයීම
EMP - පාරිසරික කළමණාකරණ සැලැස්ම
EPF - සේවක අර්ථසාධක අරමුදල
FAC - සංඛ්‍යාත වෙන්කිරීමේ කමිටුව
FOI - තොරතුරු දැනගැනීමේ නිදහස
FOIA - තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත
GoSL - ශ්‍රී ලංකා රජය
HHR - මානව සම්පත් ප්‍රධානී
HQ - මූලස්ථානය
IO - තොරතුරු නිලධාරී
ISIN - ජාත්‍යන්තර ආරක්ෂණ හඳුනාගැනීමේ අංකය
ISP - අන්තර්ජාල සේවා සැපයුම්කරු
LKR - ශ්‍රී ලංකා රුපියල්
LTTE - දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය
MASL - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
MHz - මෙගාහර්ට්ස්
MOU - අවබෝධතා ගිවිසුම
NIC - ජාතික හැඳුනුම්පත
NWSDB - ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
PA - පොදු අධිකාරිය
PCOI - ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

| | |
|---|---|
| PIA | - පකිස්තානු අන්තර්ජාතික ගුවන්සේවය |
| PMO | - අග්‍රාමාත්‍ය කාර්යාලය |
| PUCL | - සිවිල් නිදහස සඳහා වන ජනතා සංගමය |
| RTI | - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම |
| RTIC | - තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව |
| SC(FR) | - ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් |
| SCM | - ශ්‍රේෂ්ඨාධිකරණ වාර්තා |
| SD | - විශේෂ තීරණය |
| SLA | - ශ්‍රී ලංකා යුද හමුදාව |
| SLR | - ශ්‍රී ලංකා නීති වාර්තා |
| SLTA | - ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත |
| TISL | - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකා |
| TRCSL | - ශ්‍රී ලංකා විදුලි සංදේශ හා නියාමන කොමිෂන් සභාව |
| UNHRC | - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය |
| UN | - එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UOI | - ඉන්දීය සමූහාණ්ඩුව |
| WTO | - ලෝක වෙළඳ සංවිධානය |

# පෙරවදන

ප්‍රජාතන්ත්‍රවාදය තුළ ආණ්ඩුවේ සාරය පිළිබඳව එහි සෑම ව්‍යුහයකම; විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකය පුරවැසියන්ට පිළිතුරු දීම පිළිබඳව විනිවිදභාවයක් පැවතිය යුතුවීම විශ්වීය වශයෙන් පිළිගෙන තිබේ. එබැවින්, ඉන්දියානුවන් විසින් මොහන්දාස් කරම්චන්ද් ගාන්ධි ඔවුන්ගේ ජාතියේ පියා ලෙස සැලකූ අතර ඉන්දියාව සඳහා ඔහුගේ ස්වයං පාලනය (ස්වරාජ්) පිළිබඳ දැක්ම පැහැදිලි කිරීමේදී එය පහත පරිදි විස්තර කර දක්වයිඃ

> "සැබෑ ස්වරාජ්‍ය පැමිණෙන්නේ කීපදෙනෙකු අධිකාරිය අත්පත් කරගැනීමෙන් නොවන අතර අවභාවිතාවන්හිදී අධිකාරියට එරෙහිවීමට සියලු දෙනාගේ ධාරිතාව අත්පත්කර ගැනීමෙන්ය"

එබැවින්, 2005 ඉන්දීය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාශ කරනුයේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම සඳහා ප්‍රධානවම අවශ්‍ය වන්නේ දැනුවත් පුරවැසියන් හා තොරතුරුවල විනිවිදභාවය වන අතර දූෂණය අවම කරමින් ආණ්ඩුවලට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය වගවීමකින් යුක්තව පවත්වාගැනීමයි. මෙය දරිද්‍රතාවය තුරන් කිරීම, යටත්විජිත පාලනයේ නිර්මිතයන් සඳහා කැපවී සිටින රටවල්වන විශේෂයෙන්ම දකුණු ආසියානු රජයන්ට වැදගත්වන විශ්වීය සත්‍යයකි. මෙම අදහස 2005 මැයි මස 11 වන දින පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත්කරමින් අගමැති මන්මෝහන් සිං මහතාගේ කතාවෙන් සොයාගන්නා ලදි.

පසුගිය සියවසේ අවසන් දශක කිහිපය තුළ ඕස්ට්‍රේලියාව, නවසීලන්තය හා කැනඩාව යන රටවල් තොරතුරු නිදහස පිළිබඳ නීති පනවන විට නිදහස් හා සාධාරණ මැතිවරණ හැරුණු විට අපගේ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල කැපීපෙනෙන ලක්ෂණයක් හා ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයේ මනා නිර්වචනයක් ලෙස මෙය පත්වෙමින් තිබේ. 1999 වර්ෂය වන විට පොදුරාජ්‍ය මණ්ඩලීය නීති අමාත්‍යවරුන් විසින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ප්‍රධාන මූලිකාංග ලෙස සීමිත හා පටු ව්‍යතිරේකයන් මත හෙළිදරව් කිරීම හඳුනාගත් අතර වාර්තා පවත්වාගැනීම හා සංරක්ෂණය කිරීම මෙන්ම ස්වාධීන විමර්ශන

ක්‍රියාවලියකට තොරතුරුවලට ප්‍රවේශය ලබාදීම පොදුරාජ්‍ය මණ්ඩලයේ තොරතුරු පිළිබඳ නිදහස නීතින්හි අවමය බවට පත්විය.

අනතුරුව, පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින් ලොවපුරා රටවල අත්දැකීම්වලින් යහපත් පරිචයන් සහිත තොරතුරු නිදහස පිළිබඳ ආකෘතියක් හඳුන්වා දෙන ලදි. එය සියලු දෙනාටම යෝග්‍ය තනි ආකෘතියක් විය නොහැකි අතර මෙම කෙටුම්පත ව්‍යතිරේකයක් නොවූ නමුත් එවැනි නිතීන් අවශ්‍ය වුවහොත් සිවිල් සමාජය හා මාධ්‍ය තුළ සාකච්ඡාවක් උත්පාදනය කිරීමට එය සමත් වූ අතර එවැනි විවෘතභාවයක් ඇතිකිරීමට රජයන්ගේ ප්‍රතිරෝධය හමුවේ; ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පියවරයන් ලෙස දුර්වල ආර්ථිකයක් සහිත රටවලට එවැනි නීතින් ස්ථාපිත කිරීමට ආධාර සපයන නියෝජිතායතන බලාපොරොත්තු වේ.

ඉන්දියාවේ, පිළිගත නොහැකි මට්ටමේ දරිද්‍රතාවයේ දුෂ්කරතාවන් සමඟ හා දිළිඳුබව තුරන් කිරීම සඳහා දැවැන්ත රාජ්‍ය ආයෝජනයත් රාජස්ථාන් ප්‍රාන්තයේ ග්‍රාමීය ප්‍රජා මට්ටමේ හඬනැගීම් ප්‍රකාශනයත් සමඟ බිහිවිය. අවාසනාවකට, පුරවැසියන්ගෙන් පැනනැගුණු තොරතුරු නිදහස පිළිබඳ එවැනි නීතියක් ඉල්ලාසිටීමේ අඩුපාඩුව බොහෝදුරට පෙනීයන හේතුවක් වන අතර මෙය වෙනත් බොහෝ රටවල තොරතුරු නිදහස පිළිබඳ නීතින්හි මන්දගාමී වර්ධනයටද බලපාන්නක් වනවා සේම එවැනි නීති සැබවින්ම අනුමත කර ඇතත් විධිමත්ව ක්‍රියාත්මවීමේ අඩුපාඩුවක් පවතී. නිදසුන් ලෙස, පකිස්තානය, නේපාලය, සියෙරා ලියොන්, ටැන්සානියාව හා කෙන්යාව වැනි රටවල, සංවිධාන හා ක්‍රියාකාරීන් අතලොස්සක් පමණක් විශාල නගරවල ජීවත්වන අයගේ ඉල්ලීම් සුරක්ෂිත කරගැනීමට නිර්භීතව කටයුතු කරන අතරම අර්ධ නාගරික හා අර්ධ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජාව ආශ්‍රිත කණ්ඩායම් නොපැහැදිලි තීරණ ගැනීමේ ක්‍රියාවලින් සමඟ කටයුතු කරන අතර ඔවුන්ගේ වැඩකටයුතුවලදී එවැනි නීතින් භාවිතය හෝ ආයාචනය කළ නොහැකිය.

යහපාලනය ප්‍රවර්ධනය කිරීමේ නියෝජිතයන් ලෙස ඔවුන්ගේ ස්ථාපිත දෛනික ශක්‍යතාවන් පිළිබඳව නොසළකාහැරීමක් හා අනවශ්‍ය ඇඟිලිගැසීමේ අපහසුතාවක් ලෙස තොරතුරු නිදහස පිළිබඳ නීතින් සැළකීම ආණ්ඩුවේ අවධානය යොමුවී ඇති ප්‍රධාන අභියෝගයයි.

මෙය සම්පත් දායකයන්ගෙන් හෝ මාධ්‍යන් මඟින් වැරදිකරුවන් හෙළිදරව් කිරීමේ ඉල්ලීම්වලින් උග්‍ර වී ඇති අතර එවැනි රජයේ නියෝජිතායතනවල අදහස වන්නේ එය සමාජආර්ථික සංවර්ධනය සඳහා වූ ඔවුන්ගේ අභිලාසක සැළසුම්වලට බාධා පැමිණවීමක් වන බවත් එය අනෙක් සියලු කාරණා සලකා බැලීමේදී ප්‍රමුඛත්වයක් ගත යුතු බවත්ය. අනෙක් අතට, සිවිල් සමාජය හා මාධ්‍යය බොහෝවිට දේශපාලනඥයින්ගේ හා නිලධාරීන්ගේ මූල්‍ය වංචා සඟවාගැනීම සඳහා ආණ්ඩුවේ අභිප්‍රායන් පිළිබඳව ඇගිල්ල දිගුවන පරිදි ආණ්ඩුවේ සැකැස්ම පිළිබඳව සැක කරයි. මෙම ගැටුම්කාරී බැඳියාවන් ප්‍රජාතන්ත්‍රවාදය පුළුල්කිරීම මත වන ඍජු දැරීම් තොරතුරු පිළිබඳ නිදහසට පැවතිය යුතුය යන මූලික මූලධර්මය අපැහැදිලිභාවයට පත්කරනු ලබයි. එනම්, නම් වශයෙන් මහජනතාවට සමාජආර්ථික පිළිබඳ පොදු දර්ශනය සකස් කිරීම සඳහා රජය සමඟ එක්ව කටයුතු කිරීමටත් එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය දැක්වීමත් යන කාරණාය.

ජීවිතය හා මරණය අතර වෙනසක් සිදු කළ හැකි තොරතුරු රජයේ තොරතුරු දුප්පතුන්ට හා අසරණයන්ට ලබාගැනීම සඳහා මෙවන් අයිතියක් කොතරම්දුරට වැදගත් වන්නේද යන්න පිළිබඳව ශ්‍රී ලංකාවේ නීතිය අවධාරණය කරයි. හිටපු එක්සත් ජාතීන්ගේ මහලේකම් කොෆී අනන් විසින් බෙහෙවින් අවධාරණය කර ඇති පරිදි, "දැවැන්ත ප්‍රජාතාන්ත්‍රිකරණ තොරතුරු පිළිබඳ බලවේග මඟින් අද දින අපට සිතාගත නොහැකි ආකාරයෙන් දිළිඳුකම පිටුදැකීම හා වෙනස් කිරීම සඳහා සියලු අවස්ථාවන් ලබා දී තිබේ. අපගේ කාර්යය, ඔබගේ කර්තව්‍ය... එය අවශ්‍ය ඕනෑම තැනක සිටින අයට එම වෙනස සැබෑ ලෙසම ඇති කිරීමයි. අපගේ පාර්ශ්වයෙන් පවත්නා තොරතුරු සමඟ හා සියල්ලන් සඳහා ශක්තිසම්පන්න දැනුමත් සමඟ දරිද්‍රතාවය ප්‍රතිවර්තනයට මං එළිපෙහෙළි කළ හැකිය".

දශක එකහමාරක පමණ කාලයක් සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීති බිහිකර ගැනීම සඳහා සිවිල් සංවිධානවල සිය උපදේශන අත්දැකීම් පිළිබඳව සැලකීමේදී විනිවිදභාවය පිළිබඳ ආණ්ඩුවක් නිර්මාණය කිරීම ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුගම්‍ය වන තොරතුරු දැනගැනීමේ

අයිතිවාසිකම පිළිබඳ නීතියක් සම්මත කිරීම මෙන් සරල නොවේ. මෙම සිවිල් සමාජය ආණ්ඩුව සමඟ වැඩකරමින් නායකත්වය ගත යුත්තේ, වගවීම සත්‍යවශයෙන්ම ඇතිකරන නිරන්තර වගවීම ප්‍රතිපෝෂණය ඇති කරමින් පවත්වාගැනීමටය. එය ප්‍රජාතන්ත්‍රවාදය තුළ ආණ්ඩුවේ සාරය පිළිබඳව එහි සෑම ව්‍යුහයකම; විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකය පුරවැසියන්ට පිළිතුරු දීම පිළිබඳව විනිවිදභාවයක් පැවතිය යුතුවීම විශ්වීය වශයෙන් පිළිගෙන තිබේ.

පාලනය යන්න සේවාසැපයීමට පමණක් නොව ශ්‍රී ලංකාව හා ඉන්දියාව වැනි රටවලට වඩාත් වැඩි වැදගත්කමක් උසුලන දේපළ හා ජීවිත පිළිබඳ සුරක්ෂිතතාව යන මේ ද්විත්වයම ජාතියේ සුරක්ෂිතභාවය මත පදනම්ව ආරක්ෂක බලකායන් හෝ නිලධාරී තන්ත්‍රය මඟින් නොව මහජනතාව විසින් පිළිසිඳගත යුතුය. මෙය වටහාගන්නේ නම්, පවත්නා ආණ්ඩුක්‍රමය මඟින් හඳුනාගත් අවශ්‍යතාවයන් සපුරා නොමැති වීමට වන හේතුව පුළුල් ලෙස පහසුවෙන් දැකගතහැකිවනු ඇත.

එම අවස්ථාවේදී, මා හට සෑම ආකාරයකම බලාපොරොත්තුවක් ඇත්තේ පොදු අධිකාරීන් සඳහා යහපත් පරිචයන් හා පූර්වාදර්ශයන් සකස්කරමින් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ තන්ත්‍රය පිළිබඳව ප්‍රවීණ දායකයන්ගේ පිළිඹිබු කිරීම් සමඟ සමන්විත ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තෝරාගත් නියෝග (2017-2018) පිළිබඳ ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ පාලනය පිළිබඳව නවමු සීමාවක් විද්‍යමාන කරනු ඇත.

**වජාත් හබිබුල්ලාහ්**
පළමු ප්‍රධාන තොරතුරු කොමසාරිස්,
මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව,
ඉන්දියාව
***(ඔක්තෝබර් 2005 - සැප්තැම්බර් 2010)***

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වී 2019 පෙබරවාරි 03 දිනට දෙවසරක් සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් පසුගිය කාලය තුළදී රටෙහි වර්ධනය වෙමින් පැවති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ තන්ත්‍රයට අදාළ සුවිශේෂී මූලධර්මයන් ප්‍රවර්ධනය කරමින් ලබාදුන් තීරණයන්හි තෝරාගත් තීරණ කිහිපයක උද්ධෘතයන් ප්‍රකාශයට පත්කිරීමට ලැබීම පිළිබඳව සිය ප්‍රසාදය පළකර සිටී. තීරණවල සන්දර්භයට අදාළව සැළකියයුතු විශේෂ පද හා තීරණවල පුළුල් පරාසයකට අයත් ලැසිතුවක්ද මෙහි අන්තර්ගත වේ.

මෙම තීරණ ලබාදීමේදී, පනත විසින් අවධාරණය කරනු ලබන පොදුයහපත උදෙසා තොරතුරු හෙළිදරව් කිරීමේ මූලධර්මය හා තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි පනතෙහි විශේෂිත ව්‍යවස්ථාපිත පදනම් (5(1) වගන්තිය) යන ද්විත්වය කෙරෙහි මනා සමතුලිතතාවයක් පවත්වාගැනීමට උත්සාහ කරන ලදි. තනි පුරවැසියෙකුට එහා ගිය රාජ්‍ය සතු දැඩි බලය හා සම්පත් පිළිබඳ කරුණ සළකා බලමින් පොදු අධිකාරිය හා අභියාචක අතර ඇති ගැටලුව සාධාරණත්වය පිළිබඳ මූලධර්මය ප්‍රකාරව අප විසින් සළකා බලන ලදි.

මෙහිදී, පොදු අධිකාරිය හා අභියාචකයා අතර පමණක් නොව පනතෙහි අර්ථය තුළ අදාළවන රාජ්‍ය හා (නිශ්චිත) රාජ්‍ය නොවන දේහයන් සම්බන්ධයෙන්ද අප විසින් මෙම ක්‍රියාදාමයේදී අවධාරණය කරන ලදි. එහි ව්‍යාප්තිය රාජ්‍ය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ස්ථිතියන් දක්වා පමණක් නොව ජනාධිපති කාර්යාලයේ සිට පහළ ස්ථරය දක්වා වන රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මකවන සංස්ථාපිත දේහයන්, රජය සමඟ ගිවිසුම්ගත පෞද්ගලික දේහයන්ද හා ජාත්‍යන්තර සංවිධාන හෝ විදේශීය රජයන් මගින් අරමුදල් ලබගන්නා රාජ්‍ය නොවන සංවිධානද "මහජනතාවට සේවයක් ලබාදෙන" අර්ථයේ ව්‍යාප්තියට ඇතුළත්වන ලදි.(තොරතුරු පනතේ 43 වන වගන්තිය)

2017 පෙබරවාරි 10 දින නිකුත් කරන ලද පළමු ප්‍රසිද්ධ නිවේදනයකදී අප විසින් පෙන්වා දුන්නේ මානව සම්පත හා මූල්‍යමය බාධාවන් මධ්‍යයේ වුවද, කොමිෂන් සභාව "විශේෂඥතාවය සමඟින් ශක්තිමත් ස්වාධීන ක්‍රියාදාමයක් ගොඩනැගීමට හා තොරතුරු සොයන්නන්ට හා තොරතුරු සපයන්නන්ට සහාය වීමේ ධාරිතාවයකින් කටයුතු කරන බවයි." මෙහි සැළකිය යුතු දුෂ්කරතාවයන් බොහෝමයක් තිබුණද මෙය අප විසින් සත්‍ය වශයෙන්ම ලබාදුන් පොරොන්දුවක් විය.

එතැන් සිට ගත වී ඇති අවුරුදු දෙකකට ආසන්න කාලයක් තුළ ධනාත්මකව සැළකීමට බොහෝ දේ ඇත. ඇතැම් රාජ්‍ය ආයතනවල තොරතුරු සොයන්නන් හට බාධාකිරීමේ හා ප්‍රමාද කිරීමේ රටාවක් පැවතියද අතිවිශාල බහුතර අවස්ථාවන්වලදී පොදු අධිකාරීන් විසින් ඔවුන්ට එරෙහිව ඇති අභියාචනා සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් ක්‍රියාකරන ලදි. 2017 අප්‍රේල් මාසයේදී පළමුවරට විභාග කරන ලද අභියාචනා විභාගයේදී එනම්, පානදුර හිරණ පදිංචිකරුවෙකුට පානදුර නගර සභාව විසින් පහත්බිම් පිරවීම සඳහා සංවර්ධනය කරන්නාට අවසරය ලබාදීමෙන් අවට ඇති ඉඩම් වැසි ජලයට යටවීම සම්බන්ධයෙන් වන තොරතුරු ලබාදීමේ සිට 2018 දෙසැම්බර් 31 වනදා දක්වා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා ඒවායෙහි විෂය කරුණු සම්බන්ධයෙන් පුළුල් හා විවිධාකාර විය.

මහජනතාවට නිකුත් කරන ලද තොරතුරු අතරට පහත සඳහන් දෑ අන්තර්ගත වේ;

- මෙතෙක් රහසිගතව පැවැති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවන්, ජනමාධ්‍ය නියාමන කොමිෂන් සභාව විසින් වෙබ් අඩවි තහනම් කිරීම වැනි අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට නිශේධනාත්මකව බලපෑම් කළ නියාමන නියෝජිතායන විසින් ගනු ලැබූ තීරණයන්ට හේතු,
- රාජ්‍ය අංශයේ/ සමාගම්වල ජ්‍යෙෂ්ඨ විධායක නිළධාරීන්ට රාජ්‍ය අරමුදල්වලින් ගෙවන ලද වැටුප් හා ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු,

ජාතික ගුවන් සමාගම වන ශ්‍රී ලංකන් එයාර්ලයින් ගුවන් සමාගම සමඟ ගිවිසුම්ගත විදේශීය ගුවන් සේවා සමාගම් සහ ගුවන් සමාගමට විශාල අලාභයක් ඇති කරමින් කළමණාකාරීත්වය විසින් ගනු ලැබූ මණ්ඩල තීරණ,

- සංක්‍රමණික සේවකයන්ට අදාළ ශ්‍රී ලංකාව හා වෙනත් රටවල් අතර ඇති ගිවිසුම් මෙන්ම මහජනතාවට ඉදිරිපත් නොකළ පනත් කෙටුම්පත්
- රාජ්‍ය රක්ෂණ සමාගම විසින් රක්ෂණ හිමිකම් ලබාදීම ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම,
- රාජ්‍ය බැංකුවලින් මහජන අරමුදල් පෞද්ගලික නීතිඥයන් සඳහා නීතිඥ ගාස්තු ගෙවීමේ ප්‍රමාණය පිළිබඳ තොරතුරු,
- යුද හමුදාපතිවරයාගේ නිගමන හා ජ්‍යෙෂ්ඨ හමුදා නිළධාරියෙකුට එරෙහිව ලිංගික අපචාරයන් පිළිබඳ චෝදනාවන් සම්බන්ධ පරීක්ෂණයට අදාළ ලිපි ලේඛන,
- මහවැලි අධිකාරිය ඇතුළු විවිධ රාජ්‍ය අධිකාරීන් විසින් ඉඩම් අත්පත් කරගැනීමේදී ඊට අදාළ බලය ලබාදුන් සහතික,
- පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශය මඟින් 2017 වර්ෂය දක්වා වයස, දිස්ත්‍රික්කය හා ලිංගිකත්වය අනුව වර්ගකරන ලද දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) පුනරුත්ථාපනය කළ හිටපු සාමාජිකයින්ගේ සංඛ්‍යාත්මක දත්ත,
- අවිධිමත් ගොඩනැගිලි සඳහා පළාත් පාලන ආයතනයන් විසින් ලබාදුන් අනුමැති පිළිබඳ තොරතුරු ලබාදෙන ලදි.

කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරන ලද අභියාචනා අතුරින් ප්‍රධාන වශයෙන් තොරතුරු ලබාදීමට අදාළව වැදගත් වන්නේ රාජ්‍ය ආයතන විසින් සිදුකරන ලද ප්‍රසම්පාදන හා ටෙන්ඩර් ප්‍රදානයන්ට අදාළ තොරතුරු, පොලීසියට සිදුකරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග, රාජ්‍ය ආයතනවල උසස්වීම් හා විනය ක්‍රියාපටිපාටීන්, ඉඩම් අත්පත්කරගැනීම් වෙනුවෙන් ඉඩම් හිමියන්ට වන්දි ගෙවීම් හා පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ සුදුසුකම් යනාදියයි. පාසල් ප්‍රවේශය හා සම්බන්ධව ළමුන් ඇතුළත්කර ගැනීමේදී දූෂණ චෝදනා සම්බන්ධව ශ්‍රී ලංකාවේ දෙමාපියන් පාසල්වලින් තොරතුරු විමසා තිබිණි.

සැබවින්ම ඇතැම් අභියාචනාවලදී, මෙම අක්‍රමිකතා හෙළිදරව් වීම නිසා ළමයින් ඔවුන්ගේ කැමතිම පාසල්වලට ඇතුළත්කර ඇත. උතුරුමැද පළාතේ ගම්වාසීන් විසින් ගරාවැටී ඇති මාර්ග හා වැව් සම්බන්ධයෙන් පළාත් පරිපාලනයට ලබාදුන් මහජන මුදල් පිළිබඳ තොරතුරු ප්‍රශ්නකළ අතර එම අරමුදල්වලින් විශාල ප්‍රතිශතයක් වංචාකර ඇති බව සොයාගන්නා ලදි. ඒ අනුව, අදාළ නිලධාරීන් සේවයෙන් පහකළ අතර මුදල් නැවත අයකරගන්නා ලදි. වත්මන්ව මහාමාර්ග හා වැව් ප්‍රතිසංස්කරණය කර ඇත.

දේශපාලනඥයන්ගේ වත්කම් ප්‍රකාශනයන් පිළිබඳ තොරතුරු ඉල්ලා සිවිල් සමාජ ආයතන විසින් අභියාචනා යොමු කරන ලදි. ජාතික හා පළාත් ව්‍යවස්ථාදායක සභාවන්හි රාජ්‍ය අරමුදල් යොදාගැනීම හා විශ්‍රාම වැටුප් අරමුදල කොපමණදැයි දැනගැනීමට මහජන අයිතිය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජනය පිළිබඳ විස්තර ඉල්ලා සිටින ලදි.

මෙම තීරණවලට එළඹීමේදී, පොදු යහපත යන කරුණ කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිතව පැවරුණු විධානාත්මකභාවය තුළ ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගන්නා ලදි. මෙහිදී අප විසින් සිහිතබාගත් කරුණක් වූයේ ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසික පිළිබඳ පනත හා සම්බන්ධිත පොදු අධිකාරිවල විනිවිදභාවය හා වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම සපථ කිරීමේ අභිප්‍රායෙන් "ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගී විය හැකි සහ රටේ පොදු ජන ජීවිතයේදී සක්‍රිය ලෙස සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීමටය."

'අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් ඒ සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම හා තීරණය කිරීම' (15(ඊ) වගන්තිය) යන එහි මූලික කර්තව්‍යය ක්‍රියාවට නැංවීමේදී කොමිෂන් සභාව විසින් සිය තීරණ ලබාදීමේදී මෙම වැදගත් අරමුණු නිරූපණය කර ඇත. 2018 දෙසැම්බර් මස 31 වැනි දින වනවිට කොමිෂන් සභාව ඉදිරියේ අභියාචනා පැමිණිලි 1030 ක් පැවති අතර එයින් අභියාචනා 654ක් අවසන් කරන ලදි. ඉතිරිව පවත්නා අභියාචනාවලදී, ප්‍රධාන අවස්ථා කීපයකදීම කොමිෂන් සභාව විසින් තොරතුරු නිකුත් කිරීමට අදාළ අතුරු නියෝගයන් ලබා දී ඇත. ආරම්භක වර්ෂයන්වලදී

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ ප්‍රමිතීන් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කොමිෂන් සභාව විසින් විශ්වාසකරන ලද අතර එහි තීරණ අතිමහත් ලෙස මහජන බැඳියාවන් හා තොරතුරු අනාවරණය කිරීමේ මූලධර්ම පිළිඹිබු කරයි.

මෙම ප්‍රකාශනයේ තෝරාගත් නියෝගවල සාරාංශවලට අදාළ බොහෝ අභියාචනා විභාගවලදී අභියාචනයට අදාළ දෙපාර්ශ්වයෙන්ම හෝ එක් පාර්ශ්වයකින් හෝ නීතිඥවරු පෙනී සිටින ලදි. මෙය ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත සන්දර්භයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ අන්තර්ගතයන් සංස්ථාපනය කරමින් වඩාත් වැදගත් අදහස් දැක්වීම් සඳහා ඉඩලබා දුන් අතරම එහි ප්‍රතිඵලයක් ලෙස අභියාචනා විභාගයේ ස්වභාවය යම්කිසි නෛතික තත්වයේ ස්වභාවයකට පත් වූ අවස්ථාද ඇත. කෙසේවෙතත්, මෙය ඉතාමත් සුළු ප්‍රතිශතයක් බව සඳහන් කළ යුතුය. කොමිෂන් සභාව ඉදිරියේ බහුතරයක ප්‍රමාණයක වන අභියාචනා විභාගන්හිදී, පුරවැසියන් හා පොදු අධිකාරීන්හි නියෝජිතයින් සිය තර්කයන් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කිරීමෙන් විනිශ්චයන් ලබා ගැනීමට පනත හා රෙගුලාසි භාවිත කරමින් ඊට මනා ඵලදායීතාවයක් ලබාදෙන ලදි.

ඒ සම්බන්ධයෙන් සලකා බලන විට, 2017 පෙබරවාරි 03 වනදින සිට පොදු අධිකාරීන්හි නිහඬ හා ඇතැම්විට නිරීක්ෂණය නොකළ පරිවර්තනය පුරවැසියන්ගෙන් පමණක් නොව මහජන නිලධාරීන්ද මෙම නීතිය භාවිත කරමින් අයුක්තිය හා දූෂණයන් අනාවරණය කරගැනීමට ක්‍රියාකර ඇති බව පිළිගත යුතුය. තොරතුරු නිලධාරීන්ට (සහ අනෙකුත් නිළධාරීන්ටද) සද්භාවයෙන් යුතුව පනත යටතේ සිය කර්තව්‍ය ඉටුකිරීමෙන් ඇතිවන ප්‍රතිවිපාක (30 හා 40 වගන්ති) හා පනතෙන් ලැබෙන ආරක්ෂණයද කොමිෂන් සභාව විසින් නිරන්තරයෙන් අවධාරණය කරන ලදි.

එක් අවස්ථාවකදී, තොරතුරු නිලධාරියෙකු සිය ව්‍යවස්ථාපිත කාර්යය ඉටුකිරීම නිසා දඬුවම් පැමිණවීමක් පිළිබඳව අප ඉදිරියට වාර්තා වී ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව පරීක්ෂණයක් ආරම්භ කළ අතර, එවැනි හැසිරීම්වල ප්‍රතිවිපාක සම්බන්ධයෙන් අදාළ පොදු අධිකාරියට අනතුරු ඇඟවීමක් නිකුත් කරමින් තහවුරු කරනු ලැබීය.

කොමිෂන් සභාවේ පුළුල් මෙහෙවර, පොදු අධිකාරීන්ගේ පරිචයන් අධීක්ෂණය කිරීම හා විධිමත් විනිශ්චයකිරීම් මෙන්ම යහපාලනය හා සබැඳි අනෙකුත් කරුණු පිළිබඳව 'ප්‍රගාමී හෙළිදරව්ව' මඟින් පුරවැසියන් තොරතුරු පිළිබඳව මනාව දැනුවත්කොට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සංවර්ධනය කිරීමට හා සුරක්ෂිත කිරීමට අවධානය යොමුකරන ලදි. තොරතුරු ප්‍රගාමී ලෙස ලබාදීමට ඇති පොදු අධිකාරීන් සතු යුතුකම බොහෝදුරට විදහා දැක්විය යුතු සේම, දිරිගන්වන සාධකයක් (2017 මැයි 30 ප්‍රසිද්ධ නිවේදනය බලන්න) වන්නේ 'තොරතුරු දැනගැනීමේ අයිතිය' ප්‍රශංසනීය උද්යෝගයත් සමඟ සමස්ථ භූමියේම පුරවැසියන් සහයෝගීව හා කැමැත්තෙන් යුතුව මෙම අයිතිය භාවිත කිරීමයි. තොරතුරු දැනගැනීමේ සංස්කෘතිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා මෙය පනතක් හරහා නිර්මාණය කිරීමට ශ්‍රී ලංකාව තුළ වසර දහහතරක් ගත වී ඇති අතර මෙම ධනාත්මක ප්‍රවණතාවය ඉදිරියටද පවතිනු ඇතැයි අපි බලපොරොත්තු වෙමු.

නීතිඥ සුෂ්මිතා තයනන්දන්, නීතිඥ ජයනි පෙරේරා හා නීතිඥ ක්‍රිසී අබේසේකර විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කොමසාරිස් හා ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධනගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද තෝරාගත් නියෝග (2017-2018) සම්පිණ්ඩනය, තීරණ සාරාංශගත කිරීම හා ප්‍රධාන පද සකස් කිරීම සම්බන්ධයෙන් සහයෝගය දක්වන ලදි. කොමිෂන් සභාවේ නියෝග පිළිබඳ ලැයිස්තුව සඳහා නීතිඥ ඉමල්කා අබේසිංහ විසින් ලබාදුන් සහාය මෙහි ලා අගය කර සිටී. නීතිඥ රධිකා ගුණරත්න, නීතිඥ ශලනි ප්‍රනාන්දු, නීතිඥ සේනබ් ඉස්මයිල් හා නීතිඥ දුමිඳු මධුෂාන් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කොමසාරිස් හා ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්.ජී. පුංචිහේවාගේ විමර්ශනය යටතේ සිංහල ප්‍රකාශනයේ පරිවර්තන කාර්යය සිදුකරන ලදි. නීතිඥ ක්‍රිජා සිවකුමාර් හා නීතිඥ තවප්‍රියා තෙවකුමාර් දමිළ ප්‍රකාශනය සඳහා සහය වනලදි.

ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය විසින් ලබාදෙන ලද සහය දැඩිව අගය කර සිටින අතර විශේෂයෙන්ම මෙම

විශේෂ සටහනේ ප්‍රතිඵලය අවබෝධකරගත් හා සහයෝගීතාවය දැක්වූ පළමු ලේකම් (දේශපාලන) ඩමියානෝ ස්ගුඅයිටාමට්ටි හට විශේෂ ස්තුතිය පුදකර සිටිමු.

**ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව**
**කාමර අංක 203-204**
**දෙවන පරිශ්‍රය**
**බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව**
**බෞද්ධාලෝක මාවත**
**කොළඹ 07**

# එච්.සී.එස්. ද සොයිසා සිරිවර්ධන එ. ශ්‍රී ලංකා යුද හමුදාව[1]

'තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පනතේ ඇති නීතිය ක්‍රියාත්මක කිරීමට ව්‍යවස්ථාපිත වගකීමකින් බැඳී සිටින අතර පනතේ මූලික මූලධර්මය වන 'උපරිම ලෙස තොරතුරු අනාවරණය කිරීමේ මූලධර්මයට' අනුකූලව තොරතුරු ප්‍රදානය මුක්ත කළ හැක්කේ පනතේ 5 (1) උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති ව්‍යතිරේඛයන් පදනම් කරගෙනම පමණි. ශ්‍රී ලංකා යුද හමුදාවද තොරතුරු පනතේ විෂය පථයට අදාළ වන පොදු අධිකාරියක් නිසාවෙන් තොරතුරු පනතේ ඇති විධිවිධාන අනුව කටයුතු කිරීමට ව්‍යවස්ථාපිත වගකීමකින් බැඳී ඇත'

**තීරණය:** උසාවි සිතාසි, සිය පුද්ගලිකත්වයට බලපෑම් ඇති තුන්වන පාර්ශවයන් විසින් ලබා දුන් සාක්ෂි සංස්කරණයන් සහිත සම්පූර්ණ විමර්ශන වාර්තා, විමර්ශන හා ඊට අදාළ ලේඛනයන්හි නිරීක්ෂණයන් සහ නිගමනයන්, විමර්ශන වල නිගමනයන් කෙටුම්පත් කළ අයගේ සුදුසුකම් හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියම කර සිටියි.

**මූලික පද:** විධානාත්මක කාර්යපටිපාටි ප්‍රතිවිපාක/පරීක්ෂණ වාර්තා/පෞද්ගලිකත්වය (5(1)(අ) වගන්තිය/යම් කොටසකින් සාධාරණ ලෙස වෙන්කළ හැකිභාවය (6 වගන්තිය)

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

අභියාචක විසින් 2017.05.02 වන දින කරනු ලැබූ තොරතුරු ඉල්ලීමකින්, නීතිඥ මේජර් ජනරාල් ආර්.පී. රාජපතිරණ ආර්.එස්.පී. යූ.එස්.පී. විසින් අභියාචකට සිදු කළායැයි කියනු ලැබූ ලිංගික අතවරය සම්බන්දව සිදුවීමට අදාළව මූලික පරීක්ෂණ උසාවිය පිළිබඳ, පහත සඳහන් තොරතුරු විමසා තිබුණේය.

1 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /89/2017, 2017.11.06, 2017.11.27, 2018.01.30, 2018.02.23, 2018.03.16, 2018.04.03, 2018.05.30, 2018.07.17, 2018.07.31, 2018.08.14, 2018.10.02, 2018.10.09, 2018.10.30 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී. 2018.05.30 දින නියෝගය ලබා දෙන ලදී.

1. ඉහත සඳහන් ලිංගික අතවරය පිළිබඳව සිදුකළ පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට 2014.08.01 දින පත් කරන ලද මූලික පරීක්ෂණ උසාවියේ කැඳවීම් නියෝගයෙහි/නොතීසියෙහි සහතික කළ පිටපත්
2. අත් අකුරින් සඳහන් කළ මූලික පරීක්ෂණ උසාවි වාර්තාවෙහි සහතික පිටපත්
3. නිරීක්ෂණ හා නිගමන වල සහතික පිටපත්
4. ඊට අදාළ වෙනත් ලේඛන වල සහතික පිටපත්
5. යුධ හමුදාපති නිගමනයක් සකස් කර ඇත්නම් එම නිගමනයෙහි සහතික පිටපත්
6. මෙම මූලික පරීක්ෂණ උසාවියේ නීති නිලධාරීන්ද, සාක්ෂිකරුවන්ද වූ බැවින්, යුධ හමුදාපති නිගමනයක් නිකුත් කර ඇත්නම් එම නිගමනය කෙටුම්පත් කර සකස්කළ, නිලධාරියා/නිලධාරීන්ගේ තොරතුරු හා වෘත්තීය සුදුසුකම්

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය:</u>

අභියාචකගේ තොරතුරු ඉල්ලීමට පිළිතුරු දෙමින්, තොරතුරු නිලධාරී මේජර් ජෙනරාල් ඒ.ඩබ්ලිව්.එම්.පී.ආර්. සෙනෙවිරත්න, 2017.05.12 දිනැති ලිපියෙන් අභියාචකට යුද්ධ හමුදා පනතට යටත්ව සේවයේ යෙදී සිටින නිලධාරිනියක් ලෙස, ඉල්ලා ඇති තොරතුරු ලබා ගැනීම පිළිබඳව යුද්ධ හමුදා පනතේ දක්වා ඇති පරිදි අභියාචකගේ අණදෙන නිලධාරී මගින් අනුපිළිවෙලට යුද හමුදාධිපති අමතන මෙන් දන්වා තිබුණි.

ඒ අනුව 2017.05.14 දිනැති ලිපියෙන් අභියාචක තමාගේ අණදෙන නිලධාරී හට තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කර ඇත. අණදෙන නිලධාරීගෙන් පිළිතුරක් නොලැබීම හේතුවෙන්, අභියාචක 2017.06.05 දාතමින්, නම්කළ නිලධාරී වන යුධ හමුදාපති හට අභියාචනයක් ගොනු කර ඇත. නම්කළ නිලධාරී විසින් ද ඒ සඳහා ප්‍රතිචාරයක් ලබා දී නොතිබුණි.

## අතුරු නියෝගය[2]

මෙම අභියාචනයේදී, පොදු අධිකාරිය වන ශ්‍රී ලංකා යුධ හමුදාව,තොරතුරු ඉල්ලීමෙන් විමසා තිබූ තොරතුරු සපයා නොමැති අතර අභියාචකට තොරතුරු ලබා ගැනීම පිළිබඳව යුද්ධ හමුදා පනතේ දක්වා ඇති අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන්ට අනුකූලව ක්‍රියා කරන ලෙසට දන්වා ඇත. තොරතුරු පනතේ 25 වන වගන්තියේ පැහැදිලි ලෙස දක්වා ඇති පරිදි, තොරතුරු නිලධරයකු විසින්, ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර, එම තීරණය, ඉල්ලීම කළ පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතු ය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පනතේ ඇති නීතිය ක්‍රියාත්මක කිරීමට ව්‍යවස්ථාපිත වගකීමකින් බැඳී සිටින අතර පනතේ මූලික මූලධර්මය වන 'උපරිම ලෙස තොරතුරු අනාවරණය කිරීමේ මූලධර්මයට' අනුකූලව තොරතුරු ප්‍රදානය මුක්ත කළ හැක්කේ පනතේ 5 (1) උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති ව්‍යතිරේකයන් පදනම් කරගෙනම පමණි. ශ්‍රී ලංකා යුද හමුදාවද තොරතුරු පනතේ විෂය පථයට අදාළ වන පොදු අධිකාරියක් නිසාවෙන් තොරතුරු පනතේ ඇති විධිවිධාන අනුව කටයුතු කිරීමට ව්‍යවස්ථාපිත වගකීමකින් බැඳී ඇත. එහෙත් අභියාචකගේ 2017.05.02 දාතමින් ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලීම සම්බන්ධව පොදු අධිකාරිය කටයුතු කර ඇති ආකාරය තොරතුරු පනතේ 25 වගන්තියට හෝ 5 වන වගන්තියට අනුකූල නොවේ.

එබැවින්, අභියාචක විසින් ඉල්ලා ඇති මූලික පරීක්ෂණ කැඳවීම් නියෝග/නොතීසි වැනි ඇතැම් තොරතුරු ස්වාභාවික යුක්තියේ මූලධර්මයන්ගෙන් සාධාරණීකරණය කළ හැකි බවද සඳහන් කරමින්, පොදු අධිකාරියට අභියාචකගේ 2017.05.02 වන දින තොරතුරු ඉල්ලීම නැවත සළකා බලන ලෙසටත් පනතේ 25 වන වගන්තියට අනුව ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වැඩි ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කර අභියාචනය විභාග

2 2017.11.06 දින ලබා දෙන ලදි.

කරනු ලබන ඊළඟ සභාවාරයේ, එනම් 2017.11.27 වන දින කොමිෂන් සභාවට දන්වන ලෙස කොමිෂන් සභාව නියෝග කරන ලදී.

## අතුරු නියෝගය[3]

කොමිෂන් සභාව මුලික විමර්ශන වාර්තා හෙළිදරව් කිරීම සම්බන්ධයෙන්, සාමාන්‍යයෙන් ප්‍රවේශම් වන්නේ, මන්දයත්, ඉන් අනතුරුව සිදුකරන විධිමත් පරීක්ෂණ හා අධිකරණ කටයුතුවලදී, අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට ඉන් අගතියක් සිදු විය හැකි බැවිනි. එනමුත් මෙම අවස්ථාවේ එවැනි ක්‍රියාමාර්ගයක් නොගන්නා බව යුධ හමුදාපතිගේ නිගමන (අයිතම අංක 5 කොමිෂන් සභාව ඉදිරිපිටදී ලබා දී අභියාචක වෙත නිකුත් කරන ලද) මගින් පැහැදිලි වන බැවින් පොදු අධිකාරිය වෙත, එම අත් අකුරින් සඳහන් කළ මූලික පරීක්ෂණ උසාවි වාර්තාවෙහි පිටපතක් (එහි තොරතුරු ඉල්ලීමෙහි අංක 2 හා 3 අඩංගු වේ), තෙවන පාර්ශ්වයකට අගතියක් සිදු විය හැකි කොටස් ඉවත් කොට සාදන ලද සාරාංශයක් සමග කොමිෂන් සභාවට පරීක්ෂා කර බැලීම සඳහා ලබා දෙන ලෙසට නියෝග කර සිටිමු. පෙර විභාග කිරීම් වලදී කොමිෂන් සභාව විසින් මුලික පරීක්ෂණ වාර්තාව ලබාදීමට පොදු අධිකාරිය පෑ විරෝධය පිළිගෙන තිබුණද, යුධ හමුදාපතිගේ නිගමන සියුම් ලෙස පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව සහ පරීක්ෂණය අවස්ථාවේදී තමාට සිදුවී ඇති බලවත් අසාධාරණය පිළිබඳව කොමිෂන් සභාව ඉදිරියේ අභියාචක විසින් කරන ලද වාචික හා ලිඛිත කරුණු කියාපෑම් මඟින් කරන ලද අඛණ්ඩ කරුණු දැක්වීම් හේතුකොටගෙන කොමිෂන් සභාවේ පරීක්ෂාවට පමණක්, මුල් අවස්ථාවේදී, මුලික පරීක්ෂණ වාර්තාව ලබා දීම මගින් පොදු අධිකාරියට අගතියක් සිදු වන්නේ නොමැති බව කොමිෂන් සභාව අවධාරණය කර සිටියි.

## අතුරු නියෝගය[4]

අත් අකුරින් ලියන ලද වාර්තාව, සාරාංශගත කරන ලද වාර්තාව හා සැසඳීමෙන් පෙනී යන්නේ සාරාංශගත වාර්තාව සම්පූර්ණ පරීක්ෂණ වාර්තාවේ කරුණු සැඟීමකට පත්විය හැකි ආකාරයට ඉදිරිපත් නොකරන

3 2018.01.30 දින ලබා දෙන ලදි.

4 2018.04.03 දින ලබා දෙන ලදි

බවයි. එම නිසා පරීක්ෂණ වාර්තාවේ සම්පූර්ණ නිරීක්ෂණ හා නිගමන මෙන්ම පොදු අධිකාරිය ඉදිරිපත් කළ සාරාංශගත කරන ලද වාර්තාව අභියාචකට ලබා දෙන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු.

තවද, සාරාංශගත වාර්තාවේ අභියාචකට වාසිදායක අයුරින් සටහන් කර ඇති තොරතුරු සම්පූර්ණයෙන්ම පැහැර හැරීමකට ලක්ව ඇති බව මෙහිදී නිරීක්ෂණය වේ. අභියාචකට වාසිදායක අයුරින් සටහන් වී ඇති සාක්ෂිකරුවන්ගේ සටහන් සියල්ල අභියාචකට ලබා දෙන මෙන් පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු. මීට 5, 12, 16, 17 සහ 18 වන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අයත් වේ. මෙම තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පෞද්ගලිකත්වයට බාධා සිදු වන සාක්ෂිකරුවන්ගේ ලේඛනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස පොදු අධිකාරියට තවදුරටත් නියෝග කර සිටී.

## අතුරු නියෝගය[5]

සිය පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා තම සාක්ෂි අභියාචකට ලබා දීමට එකඟ නොවන බව සඳහන් කරමින් එම නිලධාරිනියන් දෙදෙනාගෙන් ලිඛිත ප්‍රකාශයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු. මෙම සාක්ෂිකරුවන් දෙදෙනාගේ සටහන් හැර පරීක්ෂණ වාර්තාවේ ඉතිරි කොටස් අභියාචකට ලබා දීමට නොහැකි වීමට කිසිදු හේතුවක් නොමැති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටියි.

සංස්කරණයට යටත්ව තොරතුරු ලබාදීමට, නම්කළ නිළධාරීයාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.[6]

---

5 2018.05.30 දින ලබා දෙන ලදි.

6 මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න/සාක්ෂි සහ නැවත ප්‍රශ්න/සාක්ෂි ඇතුලු නිලධාරිනියන් දෙදෙනා විසින් ලබා දුන් සාක්ෂි, සහ වෙනත් සාක්ෂිකරුවන් එම නිලධාරිනියන් පිළිබඳව ලබා දුන් පෞද්ගලිකත්වයට බලපෑ හැකි සාක්ෂි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුකූලව සිදු වන්නේදැයි කොමිෂන් සභාවෙහි ඇගයීමට යටත්ව, වෙන් කිරීම සඳහා, පොදු අධිකාරිය විසින් 2018.02.23 දිනැතිව ලබා දෙන ලද මුද්‍රිත වාර්තාව 2018.07.17 නියෝගය අනුව නැවත පොදු අධිකාරියට ලබා දී (අත් අකුරින් ලියන ලද වාර්තාව කොමිෂන් සභා භාරයේ තබා ගනිමින්) සිටිමු. 2018.10.02 නියෝගය අනුව සංස්කරණයට යටත් කරන ලද වාර්තාව අභියාචකට ලබා දෙන ලදි.

# එල්. ඩී. එන්. කුමාරසිරි එ. කොළඹ මහානාම විද්‍යාලය / අධ්‍යාපන අමාත්‍යාංශය[7]

'එම ලේඛන ඉවත් කර /විනාශ කර තිබේ නම්, එකී ලේඛන විනාශ කිරීමට බලය ලබාදුන් බව පෙන්වන යම්කිසි වාර්තාවන්/ ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් තිබේ නම් එය සපයන ලෙසට පොදු අධිකාරිය (කොළඹ 03 මහානාම විද්‍යාලය) ට නියම කරනු ලැබේ'

**තීරණය:** පළමුවැනි සම්මුඛ පරීක්ෂණයෙන් පසුව ලබා ගත් ලකුණු සමග තෝරාගත් සිසුන්ගේ ලැයිස්තුව, අභියාචන මත පදනම්ව තෝරාගත් අයගේ හා ලකුණු හා සම්මුඛ පරීක්ෂණය අනුව ලබාගත් ලකුණු හා නම්, 2012 දී පළමු ශ්‍රේණියට සිසුන් බඳවාගත් පන්ති ගණන (අභියාචනවලින් තෝරාගත් අය) හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියම කර සිටියි. ඉල්ලා සිටින ලද ලැයිස්තුවලින් එකක පිටපත් සියල්ලම විනාශ වී ඇති බවට පොදු අධිකාරිය ප්‍රකාශ කළ බැවින් තොරතුරු ඉල්ලීමට අදාළ විෂය කරුණ විනාශ වී ඇති බවට ලියකියවිලි ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි. පොදු අධිකාරිය විසින් අදාළ සිසුවා බඳවා ගැනීම හේතුවෙන් පොදු අධිකාරිය සමථයකට එකඟ වූ අතර ඉල්ලීම ඉවත්කරගෙන තිබේ.

මූලික පද: ලේඛන විනාශකිරීම/පාසල් ප්‍රවේශය

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

අභියාචක විසින් 2017.03.16 දින කරනු ලැබූ තොරතුරු ඉල්ලීමකින් ආදී ශිෂ්‍ය පදනම යටතේ 2012 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඉල්ලුම් කරනු ලැබූ දරුවන්ගේ පහත දැක්වෙන තොරතුරු විමසා තිබුණි

1. මූලික/පළමු සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ ළමයින් එම පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු සමඟ නාම ලේඛනය
2. ඉහත (1) හි සඳහන් සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගනු ලැබූ ළමයින් සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු සමඟ නාම ලේඛනය

---

7 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /44/2017, 2017.09.14 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.

3. ඉහත (1) අනුව සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඉහත (2) අනුව තෝරාගනු නොලැබ නැවත අභියාචනා කර ඒ අනුව පවත්වන ලද අභියාචන පරීක්ෂණයේදී ළමයින් ලබාගත් මුළු ලකුණු සමග නාම ලේඛනය

4. ඉහත (3) අනුව පවත්වන ලද අභියාචනා පරීක්ෂණයේදී තෝරාගනු ලැබූ ළමයින් ලබාගත් මුළු ලකුණු සමඟ නාම ලේඛනය (තෝරාගත් සිසුන් 04)

5. කො/ මහානාම මහා විදුහලේ 2012 වසරේ ළමයින් ඇතුළත් කරගත් 1 වසර පංති සංඛ්‍යාව (අභියාචනයෙන් තෝරාගත් අය)

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරයඃ</u>

තොරතුරු ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීමට තොරතුරු නිළධාරියා සහ නම්කළ නිළධාරියා අපොහොසත් වී ඇත.

<u>අභියාචනා අවස්ථාවේදී උද්ගත වූ කරුණු</u>

අභියාචනය පැවැත්වෙන අතරතුරදී ඉහත 2, 4 හා 5ට අදාළ තොරතුරු නිකුත් කරන ලදි. තොරතුරු ඉල්ලීම් අයිතම 1 සහ 3ට අදාළව පොදු අධිකාරිය සඳහන් කර සිටියේ 1 සහ 3 යටතේ වන ලැයිස්තු පාසල විසින් නඩත්තු නොකරන බවත්, බඳවාගැනීමේ ක්‍රියාවලියේ ලේඛන පමණක් වගුගතකර හා ප්‍රසිද්ධ කර ඇති බවයි.

## නියෝගයඃ

ඉහත සඳහන් ලැයිස්තු එනම්, මූලික/ ප්‍රථම සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වූ ශිෂ්‍යයින්ගේ නම් සහිත ලකුණු ලැයිස්තුව සහ 1 වන අයිතමය යටතේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව 2012 වසරේදී කොළඹ 03 මහානාම විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ආදී ශිෂ්‍ය කාණ්ඩය යටතේ අයදුම් කළ දරුවන්ගේ ලැයිස්තුව (නම් සමඟ), 2 වන අයිතමය යටතේ තෝරානොගත් හෙයින් අභියාචන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවූවන්ගේ ලැයිස්තුව (නම් සමඟ) සොයාගැනීම සඳහා පාසලේ තිබෙන වාර්තා නිසි උද්‍යෝගයෙන් යුතුව පරීක්ෂා කර බලන මෙන් පොදු අධිකාරියට මෙයින් නියෝග කරනු ලැබේ.

එම ලේඛන ඉවත් කර /විනාශ කර තිබේ නම්, එකී ලේඛන විනාශ කිරීමට බලය ලබාදුන් බව පෙන්වන යම්කිසි වාර්තාවන්/ ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් තිබේ නම් එය සපයන ලෙසට පොදු අධිකාරිය (කොළඹ 03 මහානාම විද්‍යාලය) ට නියම කරනු ලැබේ. මෙකී ලැයිස්තු විදුහල්පති භාරයේ ඇති ලිපිගොනුවක් තුළ පවත්වාගෙන යන බව පොදු අධිකාරිය සඳහන් කරන හෙයින්, සහ එකී ලැයිස්තු පිළියෙළ කළ සමයේ ධූරය දැරූ හිටපු විදුහල්පතිවරයා විසින් ඒවා ඔහු වෙත භාර දී ඇති හෙයින්, එසේ භාරදුන් අයිතමයන්ගේ අන්තර්ගතය දක්වන ලිපිය/ ලේඛනය මීළඟ කොමිෂන් සභා විභාගයේදී කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය[8].

කොළඹ මහානාම විද්‍යාලයට අභියාචකගේ දරුවා ඇතුළත් කර ගැනීමට පොදු අධිකාරිය එකඟ වී තිබේ. තොරතුරු ඉල්ලීමට පාදක වූ තම දුක්ගැනවිල්ල සඳහා මෙය පිළිගත හැකි විසඳුමක් වන බව අභියාචක සඳහන් කරයි.

නම්කළ නිළධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

---

8 2017.11.20 දිනැති නියෝගය. 2018.01.16 දින වාර්තාකළ සටහන අනුව පොදු අධිකාරිය විසින් දරුවා කොළඹ, මහානාම විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට එකඟ විය. තොරතුරු ඉල්ලීමට පාදක වූ තම දුක්ගැනවිල්ල සඳහා මෙය පිළිගත හැකි විසඳුමක් වන බව අභියාචක සඳහන් කරයි. මෙයට අනුව අභියාචනය පවත්වාගෙන යාමට අභියාචක බලාපොරොත්තු නොවේ. මේ අනුව අභියාචක විසින් සිය අභියාචනය, 2017.02.03 දින ප්‍රකාශයට පත් කරන ලද 2004/66 දරණ ගැසට් පත්‍රයේ තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ 30 වන රීතිය ප්‍රකාරව, අභියාචක විසින් සිය අභියාචනය ඉවත් කර ගත් බව කොමිෂන් සභාව සඳහන් කරයි.

## ඕ. ඩබ්ලිව්. කේ. ඥානදාස එ. ලංකා බැංකුව[9]

**'පොදු අධිකාරිය නෛතික පදනමක් මත තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අපොහොසත් වීම නිසා, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව අභියාචක ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීමට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටී'**

**තීරණය:** පොදු පරිපාලනය සඳහා ඇති අපේක්ෂිත බාධක යන්න, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වැනි වගන්තිය යටතේ පුරවැසියෙකුට ඇති තොරතුරු දැනගැනීමේ අයිතිය අහිමි කළ හැකි පදනමක් නොවන නිසා අපේක්ෂකයින් ලබාගත් ලකුණු ඇතුළුව කුමන පදනමක් මත අභ්‍යන්තර උසස්වීම් සිදු කරන ලද්දේද යන්නට අදාළ තොරතුරු හෙළිදරව් කිරීමට පොදු අධිකාරිය බැඳී සිටියි.

**මූලික පද:** රජයේ චක්‍රලේඛ/ආයතනික ප්‍රතිපත්ති/ පොදු යහපත/ මහජන අරමුදල් / ව්‍යතිරේක

### පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

අභියාචක විසින් 2017.03.27 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු විමසා තිබුණේය.

1. 2016.09.27 දිනැති අංක 78/2016 චක්‍රලේඛයට අනුව, කළමනාකරණ ශ්‍රේණියේ තිබූ පුරප්පාඩු ගණන
2. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර 2017.02.20 දිනැති අංක 17/2017 චක්‍රලේඛයට අනුව කළමනාකරණ ශ්‍රේණියට උසස්වීම් හිමිවූ නිලධාරීන් 58 දෙනා ලබා ගත් ලකුණු
3. මෙම 58 දෙනා සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු
4. ඉහත තනතුර ලබාදීම සඳහා සලකනු ලැබූ කඩඉම් ලකුණු
5. 2016.09.27 දිනැති අංක 78/2016 චක්‍රලේඛයට අනුව 2017.01.19 දිනැති සම්මුඛ පරීක්ෂණයේදී ඕ. ඩබ්ලිව්. කේ. ඥානදාස (නො.099350) ලබාගත් මුළු ලකුණු

9 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /131/2017, 2017.12.04 දිනයන්හි පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. නියෝගය 2018.02.23 දින ලබාදෙන ලදි.

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය:</u>

2017.05.03 දිනැති ලිපියෙන් තොරතුරු නිලධාරීවරයා පනතේ 5(1)(ආ) වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ අතර, අභියාචක 2017.04.14 දිනැති ලිපියෙන් නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමු කරන ලදී. මෙම අභියාචනයට 2017.06.21 දිනැති ලිපියෙන් පිළිතුරු සැපයූ නම්කළ නිලධාරී, පනතේ 5(1)(අ) වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙයින් සෑහීමකට පත් නොවූ අභියාචක 2017.07.06 දින කොමිෂන් සභාවට අභියාචනාවක් යොමු කරන ලදී.

**නියෝගය:**

පොදු අධිකාරිය ලබා දුන් තොරතුරු නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව පැහැදිලි වන්නේ අභියාචක ඉල්ලා සිටින ලද තොරතුරු රහස්‍යභාවය සම්බන්ධ තොරතුරු නොවන බවයි. පොදු ආයතනයේ සාමාන්‍ය පරිපාලනයට බාධා පැමිණවිය හැකි වීම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සඳහා භාවිතා කළ හැකි පදනමක් ලෙස සැලකිය නොහැකිය.

පොදු අධිකාරිය නෛතික පදනමක් මත තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අපොහොසත් වීම නිසා, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව අභියාචක ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීමට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටී. මෙය කොමිෂන් සභාව ඉදිරියේ විභාග වන අභියාචනයේ විමසා ඇති තොරතුරු වල කරුණු සහ සන්දර්භය පමණක් සැළකිල්ලට ගනිමින් එම තොරතුරු වලට සීමිතව ඉදිරිපත් කර ඇති නියෝගයක් වේ. මෙම නියෝගය වෙනත් අවස්ථාවල දී පූර්වාදර්ශයක් ලෙස ඍජුවම අදාළ නොවන අතර, කොමිෂන් සභාවට ඉදිරිපත් වන සෑම අභියාචනයක්ම එහි ඉල්ලා ඇති තොරතුරු මත තීරණය වනු ඇත.

කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ගෙන එන ලද මුල් ලේඛනයෙන් අභියාචක ඉල්ලා නොසිටි තොරතුරු අපශෝධනය කර සංශෝධිත ලේඛනය 2018.02.23 දින ප.ව.12.30 ට කොමිෂන් සභාව ඉදිරියේ අභියාචකට ලබා දෙන ලෙසට මෙයින් නියෝග කර සිටිමු.

නම්කළ නිලධාරියාගේ තීරණය මෙයින් ප්‍රතිවර්තනය කරනු ලැබේ.

## ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් එ. අග්‍රාමාත්‍ය කාර්යාලය/ ජනාධිපති ලේකම් කාර්යාලය [10]

'මෙම කොමිෂන් සභාව අධිකරණයක් ලෙස ස්ථාපිත නොකළ අතර එය පනතේ අරමුණ සඳහා ස්ථාපිත කරන ලදි. (බලන්න පනතේ 11(1) වගන්තිය). එමගින් බලාපොරොත්තු වූයේ පොදු අධිකාරීන් තුළ විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුත් සංස්කෘතියක් බිහි කිරීමය. (බලන්න පනතේ පූර්විකාව). ඒ අනුව කොමිෂන් සභාව විසින් අත්‍යාවශ්‍යයෙන්ම එකී ව්‍යවස්ථාපිත චේතනාව ක්‍රියාත්මක කරලිය යුතුය. මේ යටතේ කොමිෂන් සභාවද වඩාත් අවධානයෙන් යුතුව සළකා බලනුයේ පනත මඟින් ලබා දී ඇති අභියාචනයේ අයිතිය උපරිම පුළුල් තත්වයෙන් පවත්වා ගැනීම වන අතර එය සීමාකිරීම පිළිබඳව නොවේ..... වත්කම් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම හා සම්බන්ධයෙන් පවතින ඉතා දෘඪ වගකීම කිසිඳු ව්‍යතිරේකයකට යටත් නොවී මහජන ඡන්දයෙන් තේරීපත්වන නිළධාරීන්ට (දේශපාලනඥයින්ට) විනිවිදභාවය ආරක්ෂා කිරීමට අදාළවන බවයි'

**තීරණය: (නෛතික බල සීමාව) :** ඉල්ලුම් කරන්නා සංස්ථාගත හෝ සංස්ථාගත නොකරන ලද ආයතනයක් වන විට පුරවැසිභාවය තහවුරු කිරීම තොරතුරු නිලධාරියා විසින් පළමු අවස්ථාවේදීම තහවුරු කළ යුතු නෛතික බල සීමාව පිළිබඳව සාධකයක් වේ/ආයතනයක් විසින් එසේ කිරීමට අපොහොසත් වීම යන්න, ව්‍යතිරේකී අවස්ථාවන්වලදී එවැන්නක් කිරීමට යොදවා ඇති අභිමතය සමඟ අභියාචනය නම් දෙවන අදියරේදී කොමිසම ඉදිරියේ පිළියම් කළ හැකි දෝෂයක් වේ. ආයතනයක් විසින් 'පුරවැසියෙකු' ලෙස පුරවැසිභාවය තහවුරු කිරීම 'පුරවැසිභාවය පිළිබඳ සාක්ෂි'යන්නෙන් වෙනස් වේ.

**(කුසලතා) :** නිශ්චිත අභියාචනයක සිද්ධිමය සංදර්භය තුළ සහ විශේෂයෙන්ම දේශපාලනඥයින්ගේ මහජන වගවීම පිළිබඳ මූලධර්මය තුළ මහජන යහපත යන්න මගින් එවැන්නක් නියෝග කිරීම මත 2015

10 RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/5/2017 හා RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/6/2017 2017.06.12, 2017.08.08, 2017.09.25, 2017.11.06; 2018.01.08, 2018.02.23 (නෛතික බලසීමාව පිළිබඳ නියෝගය ලබාදෙන ලදි ); 2018.04.24 (අභියාචක විසින් පත්‍රිකාවන් සංශෝධනය කරන ලදි) ; 2018.06.26, 2018.09.04, 2018.10.30 යන දිනයන් හි පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.

සහ 2016 වර්ෂ සඳහා අගමැතිවරයාගේ වත්කම් ප්‍රකාශනයක පිටපතක් සැපයීමට පොදු අධිකාරිය බැඳී සිටියි.

**නිර්දේශය :** විධායක ජනාධිපතිවරයාට වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට නීත්‍යානුකූල වගකීමක් පැනවීම පිණිස 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධිත) නීතිය තවදුරටත් සංශෝධනය කිරීම.

**ආප්තඃ** ප්‍රකාශිතයෙන් අප්‍රකාශිතය බැහැර කෙරේ, සාමාන්‍ය නීතිය මගින් විශේෂ නීති යටපත් කළ නොහැක, (1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධිත) නීතිය සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අන්‍යෝන්‍ය වශයෙන්)

**මූලික පද :** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ, 121 ව්‍යවස්ථා/වත්කම් ප්‍රකාශ/පුරවැසිභාවය ප්‍රකාශ කිරීම (3(1) වගන්තිය, 24(1) හා (2) වගන්තිය, 32(1) වගන්තිය, 43 වගන්තිය)/තුන්වන පාර්ශවයක් පිළිබඳ රහසිගත තොරතුරු/තොරතුරු නිලධාරී හා නම්කළ නිලධාරීගේ යුතුකමක් (31(3) වගන්තිය යටතේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට අදාළව නිශ්චිත හේතු දැක්වීම)/තොරතුරු අයදුම්කරුවන්ගේ නිසි උද්‍යෝග ය/භාරකාරත්ව සබඳතාව (5(1)(උ) වගන්තිය)/29(2)(ඇ) වගන්තිය සමඟ කියවිය යුතු 5(1)(එ) වගන්තිය)/තොරතුර පිළිබඳ 'භුක්තිය, සන්තකය හෝ පාලනය' (3 වගන්තිය)/පුරවැසිභාවය ඔප්පු කිරීම/පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීතියක් අභිබවා බලපැවැත්වීම/පොදු යහපත (5(4) වගන්තිය)/පෞද්ගලිකත්වය (5(1)(අ) වගන්තිය)/කථානායකවරයාගේ නියමය/තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති හා රෙගුලාසි/යම් කොටසකින් සාධාරණ ලෙස වෙන්කළ හැකි භාවය (6 වන වගන්තිය යටතේ)

## පසුබිම් වූ සිද්ධිමය සාධක සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

2017.02.03 දිනැති තොරතුරු ඉල්ලීම මගින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ හා රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාගේ 2015 හා 2016 වර්ෂයන්හි වත්කම් හා වගකීම් පිළිබඳ සහතික කරන ලද පිටපතක් අභියාචක විසින් ඉල්ලා සිටින ලදි.

පොදු අධිකාරියේ ප්‍රතිචාරය

ජනාධිපති ලේකම්වරයාගෙන් අයැද සිටින ලද තොරතුරු ඉල්ලීම, තොරතුරු නිලධාරියා විසින් 2017 මාර්තු 06 වන දින ප්‍රතික්ෂේප කරන ලදි. එකී තීරණය පොදු අධිකරියේ නම්කළ නිලධාරියාද (ජනාධිපතිවරයාගේ ලේකම්) මාර්තු 20 වන දින ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදි.

අග්‍රාමාත්‍යවරයාගේ තොරතුරු පිළිබඳව අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අයැද සිටින ලද තොරතුරු අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් 2017 මාර්තු 01 දින ලබාදීම ප්‍රතික්ෂේප කරන ලද අතර (මෙකී තොරතුරු සඳහා වන ඉල්ලීම අභියාචක විසින් පනතේ 23(1)(ආ) යටතේ ඉදිරිපත් කරන ලදි) මෙකී තීරණයම මාර්තු 14 වන දින සනාථ කරන ලදි.

අභියාචනා අවස්ථාවේදී උද්ගත වූ කරුණු[11]

පහත සඳහන් කරුණු නීතිය පිළිබඳව වන මූලික කරුණු ලෙසට සළකා බැලිය යුතු බවට කොමිෂන් සභාව හා අභියාචනයේ පාර්ශ්වකරුවන් යන දෙපිරිසම එකඟතාවය පළකරන ලදි.

තොරතුරු අයදුම්කරන්නා ශ්‍රී ලාංකේය පුරවැසියෙකු බව පැහැදිලිවම සඳහන් කිරීම පනතේ 3(1) වගන්තිය හා 43 වගන්ති දෙක එක්ව කියවූ විට අත්‍යාවශ්‍ය කරුණක්ද? යන්න.

ඉහත කී අවශ්‍යතාවය කොමිෂන් සභාව හමුවේ ඇති අභියාචනයක දෙවන අවස්ථාවට අදාළව යථාතත්වයට පත්කළ හැකි හෝ නොහැකි ගැටලුවක්ද? යන්න.

මෙකී ප්‍රශ්න නිර්මාණය වූයේ අභියාචක විසින් අදාළ තොරතුරු අයැද සිටීම සිදු කිරීමේදී පනතේ 3(1) වගන්තිය ,24(1) වගන්තිය හා 43 යන වගන්ති සමඟ එක්ව කියවීමේදී තමා පුරවැසියෙකු බව ප්‍රකාශ කිරීමට තොරතුරු අයැද සිටින්නා 2017 පෙබරවාරි 03 පොදු අධිකාරීන්ට ලිඛිත ඉල්ලීමක් කළ විට මෙන්ම ඒ හා සමාන අභියාචනා 2017.05.19 හා 2017.05.12 යන දින කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමේදීද ඉදිරිපත් කර නොතිබීමය.

11 පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටීම ; අභියාචක වෙනුවෙන් නීතිඥ ගෙහාන් ගුණතිලක, නීතිඥ සංකිතා ගුණරත්න, (අග්‍රාමාත්‍ය කාර්යාලය/ජනාධිපති ලේකම් කාර්යාලය) පොදු අධිකාරීන් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් නෙරීන් පුල්ලේ, රජයේ නීතිඥ සුරේන් ඥානරාජ්.

## නෛතික බල සීමාව පිළිබඳ කාරණයට අදාළ තීරණය[12]

අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) (2015 දී ගෙන එන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද) පහත පරිදි වේ.

14අ. (1) සෑම පුරවැසියෙකුටම

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මඟින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇතිකරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ;

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයෙකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මඟින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සතුව පවත්නා වූ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නා වූ; සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව වෙනත් යම් තැනැත්තෙකු සතුව පවත්නා වූ,

සහ පුරවැසියෙකුගේ යම් අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශවීමේ අයිතිවාසිකම ඇත්තේය.[13]

---

12 2018.02.23 වන දින ලබාදෙන ලදි.

13 මෙම ව්‍යවස්ථාව තවදුරටත් දක්වන පරිදි;

(2) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිසද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිසද, සෞඛ්‍ය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසද, අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිසද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිසද, අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිසද, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම්දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිසද හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිසද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමාකිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැනවිය යුත්තේය.

(3) මේ ව්‍යවස්ථාවේ "පුරවැසියා" යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.

ඉහතින් සඳහන් කළ තොරතුරු ලබාගැනීම සඳහා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අයිතිය "නීතිය මඟින් සලසා ඇති ආකාරය" 2016 අංක 12 දරණ පනත මඟින් දක්වයි. මීට අදාළ පනතේ වගන්තීන් පහත පරිදි වේ.

3(1) මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිවාසිකම සෑම පුරවැසියෙකුටම තිබිය යුතුය.

43 වගන්තිය. මෙම පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "පුරවැසියා" යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.[14]

> තවද, 32(1) කොමිෂන් සභාවට කරනු ලබන අභියාචන සම්බන්ධව (අ) 31(1) වගන්තිය යටතේ වන අභියාචනයක් සම්බන්ධයෙන් අගතියට පත් යම් තැනැත්තෙකු විසින්, එම තීරණය සන්නිවේදනය කිරීමෙන් මාස දෙකක් ඇතුළත දී; හෝ (ආ) 31(3) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත තීරණයක් ලබාදිය යුතු යම් අභියාචනයකට තීරණය ලබා ගැනීමට නොහැකි වීමෙන් අගතියට පත් යම් තැනැත්තෙකු විසින්, එසේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීමෙන් මාස දෙකක් ඇතුළතදී, එම තීරණයට හෝ තීරණය ලබා ගැනීමට නොහැකි වීමට එරෙහිව කොමිෂන් සභාවට

14 මීට අමතරව, 24(1) සහ (2) වගන්තිවල තොරතුරු ඉල්ලීම් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරයි; 24(1) මෙම පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන යම් පුරවැසියෙකු විසින්, ඉල්ලා සිටින තොරතුරු පිළිබඳ විස්තර නිශ්චිතව දක්වමින් උචිත තොරතුරු නිළධාරියාට ලිඛිතව ඉල්ලීමක් කළ යුතුය: එසේ වූවද, මේ උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන යම් පුරවැසියෙකුට යම් හේතුවක් මත එම ඉල්ලීම ලිඛිතව කිරීමට නොහැකි අවස්ථාවක, එම ඉල්ලීම වාචිකව කිරීමට එම පුරවැසියාට හිමිකමක් ඇති අතර, ඉල්ලීම කරනු ලබන පුරවැසියා වෙනුවෙන් එම ඉල්ලීම ලිඛිතව සටහන් කර ගැනීම උචිත තොරතුරු නිළධරයාගේ කාර්යය වන්නේය. (2)යම් පුරවැසියෙකු විසින්

(අ) පොදු අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවකදී; හෝ

(ආ) මේ පනතේ නියමයන්ට අනුකූල නොවන ආකාරයට යම් පොදු අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී, තොරතුරු නිළධරයා විසින් මේ පනතේ විධිවිධානවලට අනුකූලවන ආකාරයට එම ඉල්ලීම ඉදිරිපත් කිරීම සඳහා ගාස්තු අයකිරීමකින් තොරව එම පුරවැසියා වෙත සහාය ලබා දීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතුය.

සභාවට අභියාචනා කළ හැකි අතර, කොමිෂන් සභාව විසින්, එම අභියාචනය ලැබීමෙන් දින තිහක් ඇතුළත අභියාචනා කොට ඇත්තේ කවර තීන්දුවකට එරෙහිව ද එම තීරණය ස්ථිර කිරීම, වෙනස්කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි අතර, එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා අදාළ තොරතුරු නිළධරයාට නැවතත් යැවිය හැකිය.

පනතේ 41 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් තොරතුරු දැනගැනීම සම්බන්ධයෙන් පනවන රෙගුලාසීන් (මින් මතුවට තොරතුරු රෙගුලාසී) හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ගාස්තු සම්බන්ධයෙන් සාදන රීති හා කාර්යපටිපාටිය පිළිබඳව, මෙන්ම පනතේ 41 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් තොරතුරු අයිතිය පිළිබඳ සාදන රෙගුලාසී (මින් මතුවට තොරතුරු රෙගුලාසී) හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය සම්බන්ධයෙන් වූ පනතේ 42 වගන්තිය යටතේ එන රීතීන් (2017.02.03 දින දරණ ගැසට් අංක 2004/66 හි සඳහන්) අතිරේකව අදාළ වේ.

රෙගුලාසී අංක 03 යටතේ යම් තොරතුරක් ඉල්ලා සිටින විට එය තොරතුරු රෙගුලාසිවල එන පෝරම අංක 01 යටතේ ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය බව දක්වයි. එම පෝරමයේ එන 11 වන කරුණ යටතේ තොරතුරු ඉල්ලා සිටින්නා ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේද යන්න දැක්වීම අවශ්‍ය බව සඳහන් කරයි. රෙගුලාසි 03 මඟින් අංක 01 පෝරමය යොදාගැනීම අත්‍යාවශ්‍ය නොවන බව වැඩිදුරටත් දක්වයි. අදාළ අංක 01 දරණ පෝරමය සඳහන් කර සිටින්නේ තොරතුරු සඳහා අයැදීම තුළ ඉල්ලා සිටින තොරතුරු හඳුනාගත හැකිවන ආකාරයට කරුණු සඳහන් කිරීම ප්‍රමාණවත් වන බවයි.

## නීතිය පිළිබඳව පැන නැගුණු මූලික ගැටලු

මෙකී අභියාචනයේදී නීතිය පිළිබඳව පැන නැගුණු මූලිකම ගැටලු නම් තොරතුරු පනතේ 3(1) වගන්තිය, 24(1) හා (2), හා 32(1) යන වගන්තීන් සමඟ එක්ව කියවූ විට තොරතුරු ඉල්ලා සිටින <u>සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ දේහයකට</u> (අමතර කරුණු දැක්වීම අපගේය) සිය පුරවැසිභාවය ප්‍රකාශ කිරීම, පනත යටතේ තොරතුරු අයැද

සිටීම සඳහා කරන ඉල්ලීමකදී අත්‍යාවශ්‍ය කරුණක් වන්නේද? හා එකී අවශ්‍යතාවය ඉටු නොකිරීම කොමිෂන් සභාව හමුවේ පවතින අභියාචනයක දෙවන අවස්ථාවේ යථාතත්වයට පත්කළ නොහැකි හෝ පත්කළ හැකි කරුණක්ද යන්න විමසීම වේ.

මෙකී ගැටලුව තොරතුරු ඉල්ලීම සඳහා පනතේ 24(1) වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමේදී මෙන්ම කොමිෂන් සභාව ඉදිරියේ 32(1) යටතේ කරනු ලබන මෙකී අභියාචනයට අදාළවද එක ලෙසම බලපාන අතර පනත මඟින් ප්‍රකාශ කරන්නේ නම්කළ නිලධාරියා විසින් ලබාදුන් තීරණයකට එරෙහිව ඕනෑම පුරවැසියෙකුට කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බවත් යම් හෙයකින් තොරතුරු ලබාදීමට අදාළ තීරණය අයදුම්කරුට සන්නිවේදනය කර නොමැති විටකදී වුවද ඉහත තත්ත්වයම ඒ ආකරයෙන්ම බලපාන බවයි.

මෙකී ගැටලු සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද දේහයන් විසින් පනතේ 43 වගන්තියට යටත්ව කරනු ලබන ඉල්ලීම් සඳහාද බලපෑමක් ඇති කරයි. එහිදී පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් නම්කළ නිලධාරියාගේ තීරණයට එරෙහිව පනතේ 31 වගන්තිය ප්‍රකාරව ඉහතින් සඳහන් කළ පාර්ශ්වය කොමිෂන් සභාවට එකී අභියාචනය 32(1) යටතේ ඉදිරිපත් කිරීමේදී ද ඒ ආකාරයෙන්ම අදාළ වේ.

යම් අවස්ථාවක පුරවැසියෙකු විසින්, පනතේ 24(1) වගන්තිය යටතේ පුරවැසිභාවය පිළිබඳව ප්‍රකාශයක් සිදුකර නොමැති විටක උගත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාගේ පිළිගැනීම වූයේ එමඟින් කිසිඳු නෛතික ගැටලුවක් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් පැන නොනගින බවයි. කෙසේ හෝ පනතේ 43 වගන්තිය සළකා බලන විට හා එහි තුළ ගැබ් වී ඇති ව්‍යවස්ථාදායකයේ 2016 අගෝස්තු 04 වන දින තිබූ චේතනාව සළකා බලන විට මෙකී පුරවැසියන් හා සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ දේහයන් අතර ඇති වෙනස වැදගත් බව පෙනී යයි.

කොමිෂන් සභාව විසින් පුද්ගලයන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමට බලපෑමක් එල්ලකරනු ලබන යම් තීරණයක් ගනු ලබන විටක කොමිෂන් සභාව විසින් සිය බලය ක්‍රියාත්මක කරවීම

තොරතුරු පනතේ සිව්කොණ තුළ සිදුකළ යුතුය. පනතේ 32(1) යටතේ යොමුකර ඇති අභියාචනයක් සළකා බැලීම සඳහා එය සතුව පවතින නෛතිකමය බලය පිළිබඳව සෑහිමකට පත්වීම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර එය පනතේ 34(1) වගන්තිය ප්‍රකාරව තමා විසින් ලබාදෙන තීරණයක් අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතියට යටත්ව පවතින බවට වූ පූර්ව අනතුරු ඇඟවීමට යටත්ව සිදුකළ යුතුය. එකී හේතුව නිසා අභියාචනා ද්විත්වයෙහි කුසලතා මත අභියාචනා ඇගයීමට පෙර කොමිෂන් සභාව විසින් තමා ඉදිරියට පැමිණ ඇති කරුණු පිළිබඳව සාධාරණ ලෙස සැලකිල්ලට ගෙන මනා හේතු දැක්වීම් සහිත නියෝගයක් ලබාදීම වැදගත් බව සඳහන් කරන ලදි.

සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද දේහයක් විසින් තොරතුරු අයැද සිටීමේදී පනතේ 3(1) වගන්තිය 24(1) හා (2), 43 හා 32(1) යන වගන්තීන් සමඟ එකට කියවූ විට, පුරවැසිභාවය පිළිබඳව ප්‍රකාශයක් කිරීමේ බලපෑම කුමක්ද?

පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු නිළධාරියා විසින් තොරතුරු අයැද සිටීම සැලකිල්ලට ගැනීමේදී හා ඒ පිළිබඳව තීන්දුවක් හෝ තීරණයක් ලබාදීමේදී සලකා බැලිය යුතු කරුණු කවරේද? මේ සම්බන්ධයෙන් ප්‍රශ්න 02ක් සැලකිල්ලට ගතයුතු වේ.

1. පළමු කරුණ නීතිය පිළිබඳව වූ හරයාත්මක පැණයකි, එනම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා හා ජනාධිපතිවරයා විසින් සිය වත්කම් හා වගකීම් හෙළිදරව් කිරීම අවශ්‍ය වේද?
2. දෙවන කරුණ නම්, තොරතුරු පනතේ 3(1) වගන්තිය හා 43 යන වගන්තීන් එක්ව කියවූ විට තොරතුරු අයැද සිටින්නා විසින් පුරවැසිභාවය පිළිබඳව ප්‍රකාශයක් කිරීම අවශ්‍ය වන්නේද? යන්නයි.

තොරතුරු නිළධාරියා විසින් ඉහත සඳහන් 2වන කරුණ මත පදනම්ව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප නොකළේය. වග උත්තරකරුගේ මූලිකම තර්කය වූයේ පනතේ 3(1) හ 43 යන වගන්තීන් එක්ව කියවූ විට තොරතුරු අයැදීමක් සිදුකළ හැක්කේ පුරවැසියෙක්ට පමණක් වන බැවින් තොරතුරු අයැද සිටින්නා සාංගමික දේහයක් වන විට පුරවැසිභාවය පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් නොකිරීම

යථාතත්ත්වයට පත්කළ නොහැකි දෝෂයක් වන බවයි. අභියාචකගේ තර්කය වූයේ එලෙස පුරවැසිභාවය පිළිබඳ ප්‍රකාශයක් කිරීම අවශ්‍ය කරුණක් නොවන බවත් එය අවශ්‍ය කරුණක් වූවද එය අනිවාර්ය වූ යමක් නොවන බවයි. දෙපාර්ශ්වය විසින් මෙකී කරුණ පිළිබඳව දරන මතවාදයන් පොදු අධිකාරීන් හා තොරතුරු අයැද සිටින්නන් මෙන්ම වඩාත් පුළුල්ව ගත්කළ තොරතුරු පනත යටතේ ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත කොමිෂන් සභාවල ස්වභාවය හා අරමුණු පිළිබඳ මෙන්ම ඒවා සතු වගකීම් හා යුතුකම් සම්බන්ධයෙන් එකී පාර්ශ්වයන් තුළ පවතින සංකල්පමය අවබෝධයක් මෙකී විභේදනයට හේතු වී ඇත.

පනතේ ප්‍රතිපාදන පිළිබඳව අභියාචක විසින් දරණ මතවාදය අනුව, එකී ප්‍රතිපාදන පනත යටතේ සාදනු ලබන රීති හා රෙගුලාසීන් සමඟ එක්ව සළකා බැලූ විට ක්‍රියාත්මක වන කාර්යපටිපාටිය වඩාත් නම්‍යශීලි හා සීමාකම් අඩු එකක් වියයුතු බව අභියාචකගේ අදහසයි. මෙකී තර්කනය අභියාචක වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයා විසින් මෙකී කරුණ පිළිබඳව 2017.08.08 දින වූ විභාගයේදී පෙන්වා දුන් අතර එහිදී පෙන්වා දුන්නේ මෙවැනි වගකීමක් තොරතුරු පනත මඟින් තොරතුරු අයැදසිටින්නා මත ආරෝපණය නොකරන බවත් එවැනි යමක් ඔප්පුකිරීමේ සම්පූර්ණ භාරය පොදු අධිකාරීන් වෙත පැවරෙන බවත්ය.

රීති සෑදීම හා මෙකී කොමිෂන් සභාව විසින් රෙගුලාසි සෑදීමට අදාළව ඒ සඳහා පත් වී සිටින බලධාරී ආයතනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් කරනු ලැබූ (2017.02.03 දින අංක 2004/66 දරණ) රෙගුලාසීන් සෑදීම හරහා මූලික ලෙසම අරමුණු කරන ලද්දේ තොරතුරු අයැද සිටින්නන් මත වූ වගකීම අවම කිරීමය. එයට හේතුව නම් රාජ්‍ය සතුව පවත්නා බලය හා සම්පත්වලට සාපේක්ෂව පුරවැසියන් හෝ පුද්ගලයන් සතු බලය හා සම්පත් අවම වීමය. ඒ අනුව, පනත තුළ වූ මූලික හරය එනම්, පනතේ පූර්විකාවේ සඳහන් තොරතුරු හෙළි කිරීම වැඩිකිරීමේ මූලධර්මය යන්න ප්‍රජාතන්ත්‍රවාදය දියුණුකිරීමත්, සිවිල් සමාජය තුළ ජීවත්වීමේදී ජනතා සහභාගීත්වය වැඩිකරලීමත් මෙකී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම හරහා එන වැදගත් තත්ත්වයකි.

කෙසේවෙතත්, එය තොරතුරු අයැද සිටින්නා සතුව කිසිඳු වගකීමක් නොමැතිය යන්න ප්‍රකාශ කිරීමට වඩා වෙනස් වූ දෙයකි. *මණ්ඩි එ. මධ්‍යම පරිසර අධිකාරිය* (2004) SC Appeal 58/203 හා *ගානී එ. දයානන්ද දිසානායක* (2004) SC Appeal 37/2003 යන නඩු තීන්දු අභියාචක විසින් පෙන්වා දීම ඒ අනුව මෙම කාරණයට අදාළව ආධාරයකයක් නොවන අතරම එයට හේතුව මෙකී අවස්ථාවට අදාළ සිද්ධිමය සාධක වෙනස් ස්වරූපයක් ගැනීමයි. පනතේ 3(1) හා 43 වගන්තීන් එක්ව ගෙන කිය වූ විට විශේෂයෙන්ම සංවිධානාත්මක සම්පත් පවතින සංස්ථාගත කළ හෝ නොකළ දේහයක් විසින් තොරතුරු අයැද සිටින විට ඔවුන් සතුව පවතින වගකීමේ යුතුකම වෙනස් තත්ත්වයක් ගනී. සත්‍ය ලෙසම, තොරතුරු අයැද සිටින්නන්ගෙන් හා අභියාචනාකරුවන්ට පනතේ ස්වභාවය හා ප්‍රතිපාදන මඟින් නිශ්චිත වූ වගකීම් ලබාදෙන අතර එය පුද්ගලයන් හා ආයතන යන ද්විත්යටම එක ලෙස අදාළ වේ.

අභිමතය ක්‍රියාත්මක කළ හැකි වූවද එය ක්‍රියාත්මක කළ යුත්තේද නීතිය අනුවය. උදාහරණයක් ලෙස 32(2) වගන්තියේ සන්දර්භයට අනුව අභියාචනා පෙත්සමක් නම්කළ නිළධාරියාගේ තීරණයෙන් අභියාචනය කිරීම "නියමිත කාලයෙන් බැහැරව" (උදාඃ මාස 02ක් ගත වූ පසුව) සිදුකළ විටකදී වූවද කොමිෂන් සභාවට එවැනි අභියාචනයක් වූවද අදාළ ප්‍රමාදය තොරතුරු ඉල්ලා සිටින්නාගේ පාලනයෙන් තොරවූවක් බවට කොමිෂන් සභාව "සෑහීමකට පත් වේ නම්" විමසා බැලීමට කටයුතු කළ හැකිය.

අනෙක් අතට උගත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් පෙන්වාදීමට උත්සාහ කරනුයේ අභියාචනාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරලීම සඳහා අවශ්‍ය දෘඪ වූ කාර්යපටිපාටියන් කොමිෂන් සභාවේ නෛතික බලය ක්‍රියාත්මක කරවීමටද යොදාගත යුතු බවයි. ඉහත කී කරුණේ අදාළත්වය මතු වන්නේ උදාහරණයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති කාර්යපටිපාටියේ එන ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාමය අධිකරණ බලය ක්‍රියාත්මක කරලීම හා පනතේ 24(1) වගන්තිය මඟින් දක්වා ඇති කාර්යපටිපාටිය (ව්‍යවස්ථාවට අදාළ පැති සටහන බලන්න) තොරතුරු ලබගැනීමේ ඉල්ලීමකට අදාළව හා පනතේ 32(1) වගන්තිය

ප්‍රකාරව නම්කළ නිළධාරියාගේ තීරණයට "ඕනෑම පුරවැසියෙකුට තමා අතෘප්තියට පත් වේ නම් (හෝ තීරණයක් නොලැබෙයි නම්) කොමිෂන් සභාවට නියමිත කාලය තුළ අභියාචනා කළ යුතුය" යන කරුණු දෙක එකිනෙකට සමපාත වීමක් හරහාය. අභියාචක හා වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මෙකී සංකීර්ණ කරුණු එකී කරුණුවල ඇති සංකීර්ණභාවය නිසාම හා ඒවායේ ඇති අන්තගාමී ස්වභාවය නිසා අදාළ කරගත නොහැකි වේ. අප විසින් සාමාජිකත්වය දරණ ව්‍යවස්ථාපිත අභියාචන කොමිෂන් සභාවක් වන මෙම කොමිෂන් සභාවේ ස්වභාවය හා වපසරිය සළකා බැලීම ඒ අනුව යම් උපකාරයක් වනු ඇත. මෙවැනි කොමිෂන් සභා ව්‍යවස්ථාපිත අභියාචනා පර්ෂද වන අතර ඒවාට තමා ඉදිරියේ ඇති කරුණු දැක්වීම් හා තර්ක විතර්ක නිසිලෙස සලකා අවශ්‍ය බර තැබීම් කර ගැටලුවට අදාළ විෂයානුගත තීරණයක් ලබාදීමේ වගකීමක් පවතී.

බැලූබැල්මට මෙකී පනත හරහා කොමිෂන් සභාව සතු බලයට අදාළව පනතේ 32 වගන්තිය ප්‍රකාරව එයට තමා වෙත අගතියට පත් පාර්ශ්වයක් යොමුකරනු ලබන අභියාචනයක් අසා තීන්දුවක් ලබා දීමටත්, පනතේ 39 වගන්තිය යටතේ දක්වා ඇති වරදවල් සම්බන්ධයෙන් පනතේ 39(4) වගන්තිය යටතේ නඩු පැවරීමටත් බලය ඇත. පනතේ 34 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ තීරණයක් අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකිය. මෙකී පසුබිම මත කොමිෂන් සභාව විසින් සිය තීරණය ලබාදීමේදී අයිතීන් වෙත බලපෑමක් සිදුකරනු ලබන විටක එකී තීරණය නීතියට අනුව ක්‍රියාත්මක කළ යුතුය. එමෙන්ම, එයට අදාළ පිළිතුර වනුයේ අධිකරණමය හැකියාව යන්නට ප්‍රතිවිරුද්ධ වූ විධායක හෝ පරිපාලනමය ස්වරූපයේ බලයකින් කටයුතු කරන බවට දැක්වීම හරහා නොවේ (*Ridge v Baldwin*, (1964), AC, 40, 130 පිටුව, හොට්සන් සාමිවරයාට අනුව). අභියාචක විසින් දක්වන පරිදි පුරවැසිභාවය පිළිබඳව කරුණු සඳහන් නොකිරීම පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව එය තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට අදාළ කරුණක් නොවන්නේය යන්න අපගේ මතය අනුව වැරදිසහගත තර්කයකි. මක්නිසාද යත්, පුරවැසිභාවය සඳහන් කිරීමට අපොහොසත්වීම හරයාත්මක ලෙස තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට අදාළ නොවන බැවිණි. ඒ වෙනුවට පනතේ 3, 24(1) හා 43 යන වගන්තිවල සමුච්චිත බලපෑම නම් පනත මගින් යම් තොරතුරු නිලධාරියෙකුගෙන් සංස්ථාගත කළ

හෝ සංස්ථාගත නොකළ දේහයක් තොරතුරු ඉල්ලා සිටින විටක එමගින් නෛතික බලය පිළිබඳව තීරණයක් ගැනීමේ අවශ්‍යතාවය කොමිෂන් සභාවට ඇතිකරලීමය. ලතින් ආප්තයක් වන "*expression unius estexclusio alterius*" (ප්‍රකාශිතයෙන් අප්‍රකාශිතය බැහැර වන්නේය) යන මූලධර්මය මෙවැනි අවස්ථාවකට ආදාළ නොවේ. මීට සමානවම, පනත යටතේ කොමිෂන් සභාවේ කාර්යභාරයන්ට අදාළව නෛතික බලය යන ප්‍රශ්නය ආනුෂංගික ගැටලුවක් ලෙසට සැළකිය නොහැකි අතර ඒ අනුව අභියාචක විසින් ගෙනහැර දැක්වූ නඩු තීන්දු අදාළ නොවේ. අභියාචක විසින් තවදුරටත් පෙන්වා දෙන්නේ පුරවැසිභාවය සඳහන් කළ යුතුය යන්න අවශ්‍යතාවයක් ලෙස දැක්වීම රෙගුලාසි 03 හා තොරතුරු අයිතිවාසිකමට අදාළ පළමු පෝරමයේ ඇති කරුණු හා නොගැළපෙන බවයි. තුන්වන රෙගුලාසියට අදාළව එකී තොරතුරු දැනගැනීමේ පළමු පෝරමය යොදාගැනීම (අවධාරණය කිරීම අපගේය) අත්‍යවශ්‍ය බව නොදක්වයි. කෙසේ හෝ මෙකී අවශ්‍යතාවය සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ දේහයක් විසින් සිය පුරවැසිභාවය දැක්වීමේ අවශ්‍යතාවට වඩා වෙනස් වූ අවශ්‍යතාවයක් වන අතර එය තොරතුරු ලබා ගැනීමට අදාළව කරනු ලබන ඉල්ලීමකදී නෛතික බලය පිළිබඳව ඇතිවන්නක් වන අතර එය පනතේ 25 වගන්තිය ප්‍රකාරව තොරතුරු නිළධරයා විසින් ස්ථාපිත කළ යුතු කරුණකි. ඕනෑම අවස්ථාවකට අදාළව තොරතුරු දැනගැනීමේ අයිතිය හා පවතින රෙගුලාසීන් තොරතුරු පනතට වඩා පහළ මට්ටමක පවතින බැවින් පනතේ ප්‍රතිපාදන රෙගුලාසි මගින් යටපත් කළ නොහැකිය.

ඉන්දීය මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව විසින් තීරණය කළ *ශ්‍රී කේ බාලක්‍රිෂ්ණා පිල්ලේ එ. ජාතික මානව හිමිකම් කොමිසම* (No; CIC/OK/C/2008/00016, 26th May 2008) තීන්දුව අභියාචක විසින් ගෙනහැර දැක්වූ අතර එහිදී එකී කොමිෂන් සභාව ප්‍රකාශ කරන ලද්දේ පොදු අධිකාරියක් විසින් පුරවැසියෙකුගෙන් පුරවැසිභාවය සඳහා සාක්ෂි සපයන ලෙසට ඉල්ලා සිටිනුයේ ඉතාමත්ම කලාතුරකින් වන බව පෙන්වා දෙන ලදි. තොරතුරු වඩාත් නිශ්චය කරගැනීම සඳහා 2017.08.08 වන දින පැවති විභාගයට හා කොමිෂන් සභාව විසින් 2017.07.25 දින අභියාචකගෙන් ලද ලිඛිත දේශනවල සන්දර්භය සැලකීමේදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කළ කරුණක්

නම් "සඳහන් කිරීම" හා "ඔප්පු කිරීම" යනු එක හා සමාන කරුණු ලෙස සැලකිල්ලට නොගත යුතුය යන්න ප්‍රකාශ කරන ලදි. ඒ අනුව පෙන්වා දෙන ලද්දේ මෙකී අභියාචනාවල ගැටලුව වූයේ මූලිකවම පුරවැසිභාවය පිළිබඳව සඳහන් කිරීම වන බවත් එහිදී යම් සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ දේහයකට අදාළව එයට පුරවැසිභාවය ඔප්පුකිරීමේ අවශ්‍යතාවයක් පවතීද යන්න තීරණය කිරීම වේ. (පනතේ 43 වගන්තිය ප්‍රකාරව).

ශ්‍රී ලංකාවේ නෛතික සන්දර්භය ගත්කළ ඉහත අවශ්‍යතාවය පනතේ 43 වගන්තිය මඟින් මතුවන අතර එවැනි ප්‍රතිපාදනයක් ඉන්දීය තොරතුරු පනතේ නැත. ඒ අනුව අභියාචක විසින් පෙන්වා දුන් *:ශ්‍රී කේ බාලක්‍රිෂ්ණා පිල්ලේ එ. ජාතික මානව හිමිකම් කොමිසම* (No; CIC/OK/C/2008/00016, 26th May 2008) යන තීරණය වර්තමාන අවස්ථාවට අදාළ වන්නේ සීමා සහිතවය. එය එසේ වූවද, ඉන්දීය කොමිෂන් සභාවේ තීරණය හා අප එකඟ වන අතර ඒ අනුව, පුරවැසිභාවය ඔප්පුකිරීමට වනුයේ ඉතාමත්ම සීමිත අවස්ථාවලදී පමණක් වන අතර එය සිදුවිය යුත්තේ අදාළ පොදු අධිකාරිය සතුව තොරතුරු අයැද සිටින්නාගේ පුරවැසිභාවය පිළිබඳව සද්භාවී සැකයක් පවතී නම් පමණි.

තවද, ඉන්දීය තොරතුරු පනතේ 3 වන වගන්තිය අනුව, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සියලුම පුරවැසියන්ට හිමි බව දක්වන අතර කෙසේ හෝ 6 වන වගන්තිය දක්වන්නේ තොරතුරු ඉල්ලීමක් සිදුකළ හැක්කේ පුද්ගලයෙකුට වන බවයි. මීට සමගාමීව ශ්‍රී ලංකාවේ තොරතුරු පනතේ සම්පාදකයින්ගේ චේතනාව වඩාත් දෘඪ එකක් වන අතර එහිදී පුරවැසිභාවය යන්න විශේෂයෙන්ම සාංගමික දේහයන්ට අදාළව දක්වා ඇත. මෙකී කරුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම දක්වා ඇති අතර එහි ඇතැම් අයිතිවාසිකම් පුරවැසියන්ටත්, තවත් සමහරක් පුද්ගලයින් සතුවත් පවතින බව දක්වයි. උදාහරණ ලෙස පුරවැසියෙකුට 12(2) ව්‍යවස්ථාව යටතේ එන වෙනස් නොකොට සළකනු ලැබීමටත්, 14(1) ව්‍යවස්ථාව යටතේ එන අදහස් ප්‍රකාශ කිරීම, ඒකරාශී වීම හා යාමේ ඊමේ අයිතීන් ලබා දී ඇති අතර පුද්ගලයෙකුට විශේෂිත වූ අයිතීන් ලබා දී ඇති අතර ඒ තුළ සිතීමේ, හෘද සාක්ෂියේ හා ආගමික නිදහස (10 ව්‍යවස්ථාව), කෲර, අමානුෂික වදහිංසාවන්වලට

ලක්වීමෙන් ආරක්ෂා වීමේ අයිතිය (11 ව්‍යවස්ථාව), නීතිය ඉදිරියේ සමානව සැලකීමේ අයිතිය (12(1) ව්‍යවස්ථාව) හා අත්තනෝමතිකව සිරභාරයට ගැනීම, රඳවා ගැනීම හා දඬුවම් කිරීමෙන් වැලකීමේ අයිතිය මීට අදාළ වේ.

14අ ව්‍යවස්ථාව ගත්කළ දැකගත හැකි කරුණක් නම් එමගින් 2015 වර්ෂයේදී තොරතුරු අයිතිය පුරවැසියන්ට පමණක් නොව තුන්වන අනු ව්‍යවස්ථාවට අදාළව සාංගමික දේහයක් පුරවැසියෙකු බවට පත්වන අයුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව මගින් දක්වන පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාමය අධිකරණ බලය පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි බවට දක්වන්නාක් මෙන් හා පුරවැසියා යන්නට සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ දේහයක් අදාළ වන බවත් එහිදී, එකී දේහයේ සාමාජිකයින්ගෙන් හතරෙන් තුනක් පුරවැසියන් වීම අවශ්‍ය බව දක්වයි. අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන තොරතුරු පනතේ 43 වගන්තිය ආකාරයටම සකසා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ම ලබා දී ඇති නොයෙකුත් අයිතිවාසිකම් සඳහා මෙලෙස නොයෙකුත් වර්ගීකරණයන් කර තිබීම කොමිෂන් සභාවට මඟ හැරයාමට නොහැකි අතර එහිදී විශේෂයෙන්ම සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ දේහයක් යම් විශේෂිත අයිතියක පිහිට පැතීමේදී අදාළ වෙනස්කම් අනිවාර්යෙන්ම සැලකිය යුතුය.

තවද, තොරතුරු දැනගැනීමේ පළමු පෝරම තේමාකොට ඇත්තේ "තොරතුරු ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය" ලෙස වන අතර එය ගැසට් පත්‍රයේ සඳහන් වන ආකාරයට පැහැදිලිවම පෙනී යන්නේ එහි දක්වා ඇති 11 වන කරුණ අනුව තොරතුරු ඉල්ලා සිටින්නා පුරවැසිභාවය සඳහන් කළ යුතු බවයි. ගැසට්ගත කිරීමට පෙර පනතේ 41 වගන්තිය ප්‍රකාරව ඉහත කී රෙගුලාසිය කොමිෂන් සභාවේ සැලකිල්ලට භාජනය කිරීම සඳහා එවන ලද අතර එහිදී පනතේ 3(1) වගන්තිය, 24(1) හා 43 වගන්තිය සමඟ එකව කියවූ විට පුරවැසිභාවය සඳහන් කිරීමේ අවශ්‍යතාවය පැනනගින බව පෙනී යන ලදි. විශේෂයෙන්ම තොරතුරු ඉල්ලා සිටිනුයේ යම් දේහයක්, සංස්ථාගත කළ හෝ නොකළ ආයතනයක් වනවිට පනතේ 43 වගන්තිය ප්‍රකාරව ඉහත කී කරුණු ඉතා වැදගත් වේ.

අභියාචක පෙන්වා දෙන පරිදි තොරතුරු ඉල්ලා සිටින්නා යම් සමාගමක් හෝ අස්ථිත්වයක් වන විටක එයට පුරවැසිභාවය සඳහන් කිරීමට යැයි ප්‍රකාශ කිරීම අගතිදායක ප්‍රතිඵල ගෙන දෙන්නේ යැයි යන අභියාචකගේ තර්කය කොමිෂන් සභාව විසින් බැහැර කරනු ලබයි. තවද, විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් වන්නේ කොමිෂන් සභාව හමුවේ ඇති ගැටලුව පනතේ 43 වගන්තිය, 3(1), 24(1) හා 34(1) යන වගන්තීන් සමඟ එක්ව කියවූ විට සංස්ථාගත කළ හෝ නොකළ දේහයක් තොරතුරු ඉල්ලා සිටින විටක පුරවැසිභාවය ප්‍රකාශ කිරීම කොතරම් ප්‍රමාණයකට අවශ්‍ය වන්නේද යන්නට සීමා වේ. මේ වන විටත් කොමිෂන් සභාවට ලැබී ඇති අභියාචනා අතර ඉන් ආයතන (සංස්ථාගත කළ හෝ නොකළ) පැවරූ අභියාචනා වලින් හතරක් පමණක් පුරවැසිභාවය සඳහන් කිරීමට අපොහොසත් වී ඇත. එය තුළද මෙකී අභියාචක විසින් ගොනුකරන ලද තවත් අභියාචනයක් අන්තර්ගත වේ. මෙකී සංඛ්‍යාව වර්ෂ 2017.02.03 දින එනම් පනත ක්‍රියාත්මක කල දින සිට පනතේ 32(1) වගන්තිය යටතේ පුද්ගලයින් හා ආයතන යොමුකළ අභියාචනා අතරින් කොමිෂන් සභාව විසින් අභියාචනය සඳහා සුදුසු යැයි තීරණය කළ අභියාචනා 456කින් වූ කොටසකි. මෙය තුළ කොමිෂන් සභාව විසින් නිවැරදි අභියාචනා නොවන හෝ දෝෂ සහගත යැයි සළකා ඉවත් කළ අභියාචනා 200 අන්තර්ගත නොවේ. අවසානාත්මක ලෙස ප්‍රකාශ කළ හැක්කේ යම් දේහයක් සංස්ථාගත කළද නොකළද අපට සිතෙන ආකාරයට පුරවැසිභාවය පිළිබඳව දැක්වීම යනු තොරතුරු නිලධාරියා විසින් සනාථ කළ යුතු නෛතික බලසීමාව පිළිබඳ ගැටලුවක් වන අතර එය පනතේ 3(1) වගන්තිය,24(1) හා 43 යන වගන්තීන් එක්ව කියවූ විට එන අර්ථයෙන් සිදුකළ යුතුය.

තොරතුරු දැනගැනීමේ පනත සිය ශක්තීන් උකහාගන්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනය වන 14(අ) ව්‍යවස්ථාව මඟින්ද මේ හා සමාන වූ බාධාවක් මූලික අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනු කරන්නෙකුට තොරතුරු ලබා ගැනීමේ අයිතිය ප්‍රතික්ෂේප කිරීම සඳහා අදාළ වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව සළකා බලන විට හා ශ්‍රේෂ්ඨාධිකරණය මගින් සේවකයින් සඳහා වූ දීමනා සම්බන්ධ අයවැය සහන ලබා දීමට වූ පනත් කෙටුම්පත පිළිබඳ නඩුවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථව යටතේ පැනවූ

නඩුවේදී අධිකරණය විශේෂයෙන්ම ප්‍රකාශ කර සිටියේ "නඩුව පැවරූ වෘත්තිය සමිති අටේ සාමාජිකයින්ගෙන් හතරෙන් තුනකට නොවැඩි පිරිසක් පුරවැසියන් බව දැක්වීමට අපොහොසත් වී ඇති බවයි."

## පුරවැසිභාවය ප්‍රකාශ කර සිටීමට අපොහොසත් වීම අභියාචනය විමර්ශනය සඳහා නෛතික බලයට අදාළව එය අහෝසි වී යාමක් සිදු වේද?

පුරවැසිභාවය සඳහන් කිරීමට අපොහොසත් වීම කොමිෂන් සභාවේ අදාළ ගැටලුව පිළිබඳව තීන්දු තීරණයක් ලබාදීමට ඇති නෛතික බලය ඉවත් කරනු ලබන්නේද?

ඉහත පැණය සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට හා වග උත්තරකරුවන්ගේ කරුණු ගොනු කිරීම් ආපසු හැරවීම සඳහා පහත පැනය පිළිබඳව සළකා බලමු. යම් අවස්ථාවක පුරවැසියෙකු නොවන පුද්ගලයෙකු තොරතුරු සඳහා අයැද සිටින විට වැරදි සහගත ලෙස පුරවැසිභාවය සඳහන් කරයි නම් ඇතිවන තත්වය කුමක්ද? වැරදි සහගත ලෙස පුරවැසිභාවය දක්වයි නම් කොමිෂන් සභාවට පනත යටතේ නෛතික බලයක් සපයයිද? යන ප්‍රශ්නය කෙරෙහි එලෙස බලන විට පැහැදිලිවම පෙනී යන්නේ ප්‍රතික්ෂේප කිරීම හෝ ඉවත්කිරීම යන කරුණු හුදෙක් පුරවැසිභාවය සඳහන් කිරීමට අපොහොසත් වීම මතම රඳා නොපවතින බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද *නිකොලාස් එ. මර්කන් මාකර් සමාගම* (SC/Appeal No 30/81; SCM 24.3.1982; (1986) B. L. R.. Vol. 1. part VI at 245,) නඩුව මෙම කරුණ සම්බන්ධව ඉතා වැදගත් වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ බහුතරය විසින් අභියාචනාධිකරණයේ තීරණය ඉවත් කරමින් ප්‍රකාශ කළේ, 1978 ශ්‍රේෂ්ඨාධිකරණ රීතීන් 47 යටතේ අධිකරණයේ නෛතික බලය ගැන සඳහන් කිරීමට අපොහොසත්වීම සර්ෂියෝරාරි ආඥාවක් සඳහා කළ ඉල්ලීම ප්‍රතික්ෂේප වීමට බලපාන බවය. එහිදී අභියාචනය පිළිගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ පෙත්සම්කරුට යෙදීමට අපොහොසත් වූ කරුණ යළි යොදා පෙත්සම නැවත ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දීමයි.

පනතා පිළිබඳව සළකා බලන විට පැහැදිලිවම පෙනීයන කරුණක් නම්, උදාහරණයක් ලෙස තොරතුරු අයැද සිටින්නකු විසින් තොරතුරු නිලධාරියා ලබාදුන් තීරණයකට එරෙහිව පනතේ 32(1) වගන්තිය දක්වන ආකාරයට කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක්කේ 31 වගන්තිය ප්‍රකාරව නම්කළ නිලධාරියාගේ තීරණයකට එරෙහිව පමණක් බවට දක්වා ඇති විටක එකී ප්‍රතිපාදනය නොසළකා කොමිෂන් සභාව වෙත ඍජුවම කරන අභියාචනයක් සළකා බැලිය හැකිය.

පනත 2017.02.03 දින ක්‍රියාත්මකභාවයට පැමිණි දින සිටම කොමිෂන් සභාව විසින් නම්කළ නිලධාරියා වෙත නොගොස් ඍජුවම තොරතුරු නිලධාරියෙකුගේ තීරණයක් කොමිෂන් සභාව වෙතට අභියාචනා කර ඇති විටක එය නිසි අභියාචනයක් නොවන බවට සළකා පනතේ 32(1) වගන්තියට අනුව එවැනි අභියාචනා කොමිෂන් සභාව විසින් නොසලකා ඇත. බොහෝ අවස්ථාවලදී මෙලෙස කිරීම සඳහා තොරතුරු අයැද සිටින්නන් ඉදිරිපත් කරනු ලැබූ හේතු සාධක තේරුම්ගත හැකිය. නමුත් එවැනි සාධක සානුකම්පිත ලෙස ගත්කළ සැළකිය හැකිවුවද කොමිෂන් සභාවේ නෛතික බලය නීතිය මඟින් පනවා ඇති සීමාවන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

ඉහත ආකාරයට මෙන් නෛතික බලය වෙනත් ආකාරයකටද නැතිවීමට ඉඩ ඇත. පහත සඳහන් උපකල්පිත උදාහරණය සළකා බලමු. පුරවැසියෙකු නොවන අයෙකු තමා ශ්‍රී ලංකාවේ දීර්ඝකාලයක් පදිංචිව සිටි අයෙකු බව දක්වමින් පනතේ 32(1) යටතේ යම් ඉල්ලීමක් සිදුකරන්නේ යැයි සිතන්න. මෙයට අදාළව පනතේ දක්වා ඇති 3(1), 24(1) හා 43 යන වගන්තීන් යටතේ යම් තීරණයක් ලබාදීමට කොමිෂන් සභාවට නෛතික බලයක් නොමැත.

පනත මඟින් සපයාදී ඇති ආකාරයට තොරතුරු ලබා ගැනීමේ අයිතිය පුරවැසියෙකු සතු අයිතියක් වන අතර නියමිත ප්‍රතිපාදන මඟින් එකී අයිතිය යම් අයෙකු අත්විඳිය යුතු ආකාරය දක්වා ඇත. අප හමුවේ ගොනුකර ඇති අභියාචනා ද්විත්වය තුළ තොරතුරු අයැද සිටින්නා පුරවැසිභාවය සඳහන් කිරීමට අපොහොසත්වීම මත නෛතික බලය සම්බන්ධයෙන් යම් දෝෂයක් හටගන්නා අතර එය කාර්යපටිපාටිය හෝ නෛතික බලය ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් හටගන්නා ගැටලුවක්ද යන්න විමසිය යුතුය.

එඩ්වඩ් ඒ. ද සිල්වා නඩුවේදී සෝර්ට් අගවිනිසුරුවරයා පහත ආකාරයට ප්‍රකාශ කළේය.

> "සමහර රීතින් ඉතා වැදගත් වේ. ඒවා නීතියේ ජීවය හා බැඳුණු ඒවාය, ඒවා නෛතික ක්‍රියාවන්හි හරය බඳුය. ඒවා සමඟ අනුගතවීමට අපොහොසත්වීම හරහා නෛතික බලය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව නැති වී යනු ඇත. තවද, එවැනි විටක ලබාදෙන යම් නියෝගයක් හෝ සිදුකරනු ලබන ක්‍රියාවක් කිසිඳු නෛතික වටිනාකමකින් වියුක්ත වන්නේය. මීට අමතරව, පවතින මූලික නොවන වෙනත් රීතින් පිළිපැදීමට අපොහොසත් වීම, එනම්, නීතියේ පවතින වචන හා එහි පවතින විධික්‍රමවලට අනුගත නොවීම හරහා නෛතික බලය ඈඳා ගැනීමට බාධාවක් නොවනු ඇත. කෙසේ නමුත් එය නෛතික බලය නිසියාකාරව ක්‍රියාත්මක නොකිරීමේ තත්ත්වයක් ඇතිකළ හැකිය."

උගත් නියෝජ්‍ය සොලිසිටර්වරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද සේවකයින් සඳහා වූ දීමනා සම්බන්ධ අයවැය සහන ලබා දීමට වූ පනත් කෙටුම්පත පිළිබඳ නඩුව කොමිෂන් සභාව ඉදිරියේ ඇති අභියාචනය තීරණය කිරීම සඳහා ඉතා වැදගත් බවත් එය සැලකිල්ලට ගතයුතු බවත්ය. ඒ අනුව අභියාචනය නිෂ්ප්‍රභ කළ යුතු බවත්ය.

මෙහිදී අප අභියාචකගේ ප්‍රතිතර්කය සමඟ එකඟ වන අතර ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව හා පනතේ 43 වගන්තියේ එක හා සමාන ලෙස පද යෙදීම් යොදා තිබුණද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව යටතේ යම් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කරවීම පනතේ දක්වා ඇති තත්ත්වයට වඩා වෙනස් වන අතර එමනිසා පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කාලසීමාවන්ට අදාළව වඩාත් දෘඪ රීතීන් අනුගමනය කළ යුතු වේ. යම් පනත් කෙටුම්පතක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරවීමට කටයුතු කරන පෙත්සම්කරුවෙකුට එහි දක්වා ඇති කාල සීමාවන් මඟ හැර ක්‍රියා කළ නොහැකිය. එහිදී, කාල සීමාව සම්බන්ධයෙන් වූ කරුණු සඳහා අදාළ පෙත්සමේ ඇති කරුණු වෙනස් කිරීමටද ඉඩ ප්‍රස්ථාවක් ලබා නොදේ.

පහත සඳහන් ඡේදවලදී මෙම නියෝගයට අදාළව කරුණු දක්වන ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන විටක අනිවාර්යයෙන් පිළිපැදිය යුතු ප්‍රතිපාදනවලට අදාළවද අවස්ථානුගත සාධක මත සිය අභිමතය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් ශ්‍රේෂ්ඨාධිකරණය සතු වේ.

*පෙරේරා එ. ජාතික නිවාස කොමසාරිස්* (77 NLR 361) යන නඩු තීන්දුවද වගඋත්තරකරුවන් විසින් සිය තර්කය වූ නෛතික බලයක් නොමැතිව කොමිෂන් සභාව විසින් දෙනු ලබන යම් නියෝගයක් හෝ කරනු ලබන ක්‍රියාවක් අවලංගු සහගත එකක් වන අතර ඒ හරහා දෙනු ලබන නියෝගද අවලංගු සහගත වේ. (වගඋත්තරකරුවන් 2018.01.02 දින ගොනුකළ ලිඛිත සැළකිරීම) මෙම නඩුව අධිකරණයක හෝ පර්ෂදයක නෛතික බලය ප්‍රධාන මූලධර්ම දෙකක් යටතේ අහෝසිවිය හැකි බවට වූ අධිකාරියකි, එය නෛතික බලය නොමැති වීම තුළ හෝ එනම්, අධිකරණ බලය නඩු නිමිත්ත සම්බන්ධයෙන් හෝ පාර්ශ්වයන් සම්බන්ධයෙන් නොමැති වීම හරහා සිදුවිය හැකි අතර එය ඉතා අගතිදායක හෝ අදාළ කාර්යපටිපාටික ප්‍රතිපාදනවලට අනුගතවීමට නොහැකිවීම තුළ හෝ පැන නැගිය හැකිය.

අධිකරණය මඟින් පැහැදිලිවම ප්‍රකාශ කර ඇති ආකාරයට ඉහත තත්වයන් දෙක නෛතික බල සීමාව සම්බන්ධයෙන් වූ දෝෂ වේ. කෙසේ නමුත් එමගින් වෙනස් වූ ප්‍රතිඵල ඇති කරයි.

පළමු අවස්ථාවේදී අධිකරණ බලය නොමැති වීම අතහැරීම තුළ හෝ ක්‍රියා නොකිරීම තුළ හෝ විරුද්ධ නොවීම මත හෝ ස්වාධිකාරය මත හෝ එවැනි නෛතික බලයක් ලබාගත නොහැකි අතර දෙවන අවස්ථාවේදී ආනුෂංගික හෝ අනුබද්ධිත නෛතික බලය ඉහත කී කරුණු මතම යම් පාර්ශ්වයක් පසුව නෛතික බලයට විරුද්ධවීම වළක්වනු ලබයි.

ප්‍රකාශ දැක්වීම සම්බන්ධව අනුගතවීම හෝ නොවීම පිළිබඳ නීතිය අනිවාර්ය හෝ අනිවාර්ය නොවන විටක හා බැලූ බැල්මට අනිවාර්ය වන විටක, එවැනි ප්‍රකාශයක් කිරීමට අපොහොසත් වීම අභිමතානුසාරී වීම නිවැරදි කළ හැකිද? යන්න පිළිබඳව

ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණ රීතින් අර්ථනිරූපණයට අදාළව පවතින නඩු තීන්දු රාශියක් දැකගත හැකිය. (බලන්න Hussain's Digest of Case Law – pages 1375 to 1380) කොමිෂන් සභාවට අධිකරණ ධුරාවලියේ ස්ථානයක් හිමි නොවූවද ඉහළ අධිකරණ විසින් ලබා දී ඇති තීරණ මෙහි කරුණ සම්බන්ධව වැදගත් වේ.

මේ සම්බන්ධව පවතින නඩු තීරණ විමසා බැලීමේදී යම් ව්‍යවස්ථාවක හෝ ශ්‍රේෂ්ඨාධිකරණ රීතින් පිළිබඳ පවතින කරුණුවලට අදාළව අනුගත නොවීම සම්බන්ධයෙන් පවතිනුයේ විභේදනයට ලක් වූ මතිමතාන්තරය. කරුණු එසේ වූවද, තීරණවල වැඩිබරක් පවතිනුයේ ඉහත ආකාරයට අනුගත වීමට නොහැකිවීම ස්වයංක්‍රීයව අභියාචනය හෝ පෙත්සම නිෂ්ප බල නොපාන බවය.

එක්තරා ප්‍රමාණයකට අපහට ප්‍රකාශකළ හැක්කේ මේ සමබන්ධව වූ අධිකරණ චින්තනයේ සැලකිය යුතු මතිමතාන්තර පවතින බවය. එහිදී විනිසුරන් විසින් වැරදීමක් හෝ කරුණු නිවැරදිව නොදැකීමකට අදාළව (මේ හා සම්බන්ධිත වූ අදාළ දෝෂය නිවැරදි කර ගැනීමට බොහෝ ප්‍රමාද වීම) මෙවැනි ඉල්ලීමක් නිෂ්ප්‍රභවීමට හේතුවිය හැකිය. *මුණසිංහ ලීලා නන්ද සිල්වා එ. ටී.ජී. චන්ද්‍රවතී විජේසේකර හා තවත් අය* (S.C. H.C. C.A. L.A.Application No.449 /2014, WP/HCCA/ KAL/128/2007(F); D.C. Kalutara Case No.6040/P; SCM 02nd September 2016), නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ රීති 28(5) සමඟ අනුගත නොවීමේ ප්‍රතිවිපාක විමර්ශනයට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවිය.

ඉහත රීතිය මඟින් අභියාචක හෝ පෙත්සම්කරු වෙත අත්‍යාවශ්‍ය වන්නාවූ පාර්ශ්වයක් වග උත්තරකරු ලෙස නම් කිරීමේ අත්‍යන්ත වගකීමක් අභියාචක හෝ පෙත්සම්කරු මත පනවයි. තීරණය වූ නඩු තීන්දු රාශියක් දිගහැර දක්වමින් අනිවාර්ය වූ ප්‍රතිපාදන සමඟ අනුගතවීමට නොහැකි වීම ඉල්ලීම ප්‍රතික්ෂේපවීමට හේතුවන බව දැක් වූ අතර අධිකරණය විසින් 28 (5) යන රීතිය "කාර්යපටිපාටික නීතියේ එන ඉතා වැදගත් ප්‍රතිපාදනයක් බවත් එය නිර්මාණය කර ඇත්තේ යුක්තිය නිසි වේලාවට හා නියම ආකාරයට ඉටු කිරීමට වන බවත් පෙන්වා දුණි." වැරදීම මත හෝ අනවබෝධය මත යම් ප්‍රතිපාදනයක් හා අනුගත නොවීම (චේතනාන්විත නොවූවත්)

මඟින් යම් අතපසුවීමක් කාලය හා සම්බන්ධ අතපසුවීමට අදාළව වූවත් නිවැරදි කිරීමක් කරගත නොහැකිය. ඒ අනුව අනුගතවීමට නොහැකිවීම චේතනාන්විතව කළ දෙයක් නොවීම යන්න නිදහසට කරුණක් නොවේ.

කෙසේ හෝ අධිකරණය විසින් නිරීක්ෂණය කළේ තමා සතුව මෙවැනි ප්‍රමාදයන්ට අදාළව ඉතාමත් සුවිශේෂි අවස්ථාවලදී අනිවාර්ය ප්‍රතිපාදනයක් හා අනුගත නොවීමට අදාළව වූවද තීරණයක් ගැනීම සඳහා අභිමතයක් පවතින බවය. එහිදී අදාළ අනුගතවීමට නොහැකි වීම මඟ හැරීමට නොහැකි හෝ ඉතා සුවිශේෂි කරුණු මත හා පෙත්සම්කරුගේ හෝ අභියාචකගේ හෝ ඔහුගේ නීතිඥයාගේ කිසිඳු වරදක් නොසැළකිල්ලක් හෝ නිසි අවධානයක් නොතිබීම මත සිදුවූවක් බව නොවිය යුතුය. ඉහත නඩුවේදී අධිකරණයට එවැනි විශේෂිත කරුණු නොපෙනුණු බැවින් අභියාචනයට ඉඩ නොලැබිණි.

*වෙල්ලයියා එ. පොන්නම්බලම්*, IV, SriLR 61, යන නඩුවේදී පෙත්සම්කරු විසින් පහළ අධිකරණයේ නඩු වාර්තාව සිය පෙත්සමට ඇමිණීමට අපොහොසත් විය. අධිකරණය විසින් මෙය ශ්‍රේෂ්ඨාධිකරණ රීති 46ට අනුගත නොවීමක් ලෙස දක්වන ලද අතර ඒවා පළමු අවස්ථාවේදී අනිවාර්ය කරුණක් විය. (අභියාචනාධිකරණයඅභියාචනා කාර්යපටිපාටියවාර්තා සම්බන්ධ පිටපත්) අතපසුවීම්වලට අදාළව අභිමතය ක්‍රියාත්මක කිරීමේදී අදාළවන මූලධර්ම නම් අභිමතය ක්‍රියාත්මක කිරීම අතපසුවීමේ ස්වභාවය හා එමඟින් අනෙක් පාර්ශ්වයට සිදුවන අගතිදායක තත්වය සළකාබැලීමෙන් පසුව සිදුකළ යුතුය යන්නයි.

එම නඩුවේ කරුණු අනුව එකී ප්‍රමාදයට පිළිගත හැකි පරිදි කරුණු ඉදිරිපත් කිරීමට පෙත්සම්කරු අපොහොසත් වූ බැවින් ඒ වෙනුවට අදාළ වාර්තා පෙත්සම ගොනුකළ පසුව ඉදිරිපත් කළ බැවින්, හා අනෙක් පාර්ශ්වයට නිසිලෙස පිටපත් යැවීමට නොහැකි වීම හා අධිකරණයේ පූර්ව අනුමැතිය ලබා නොගත් බැවින් අවසර නොලැබිණි. මෙය අධිකරණය විසින් සහන ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට කාරණා වනබව දැක්වීය.

වෙනත් අවස්ථාවලදී වැරදීම හා නොසැලකිල්ල යන කරුණු අතර පැහැදිලි වෙනසක් පෙන්වා ඇත. කුලතුංග විනිසුරුවරයා විසින්

*පකියනාතන් එ. සිංහරාජා* (1991, 2SLR, 205) යන නඩුවේදී ප්‍රකාශ කළේ "හුදු වැරදීමකට සමාන්‍යයෙන් අවසර ලබාදීමක් සිදුකළ හැකි නමුත් නොසැලකිල්ලකට හෝ විශේෂයෙන්ම දිගින් දිගට පවත්නා නොසැලකිලිමත්භාවයකට එවැනි අවසරයක් ලබාදිය නොහැකි බවයි."

*ශ්‍රී ලංකා පොදු සේවක සංගමය එ. සමරනායක* (1996) 2 SriLR 268) යන නඩුවේදී අධිකරණය පෙන්වා දුන්නේ "නියමිත කාල සීමාව ඇතුළත අධිකරණයේ/පර්ෂදයේ බලය ක්‍රියාත්මක කරලීමට අපොහොසත් වීම හරහා අධිකරණයට/පර්ශදයට අදාළ කරුණ තීරණය කිරීමට ඇති බලය අහිමි වී යයි." නමුත් එයට අදාළවද යම් යම් ව්‍යතිරේකයන් පවතී. මූලික අයිතිවාසිකමක් කඩවීමක් සම්බන්ධයෙන් වූ අයැදුමක් මාසයක කාලයක් ඉක්මවා ගියද (*lex non cogit ad impossibillia* නීතිය මඟින් කළ නොහැක්ක කිරීමට බල නොකරයි) යන ලතින් ආප්තය අදාළ වේ. තවදුරටත් බලන්න *කාරියවසම් විදානාරච්චිලාගේ ගතිඳු උගීශ්වර පෙරේරා හා තවත් අය එ. උපාලි ගුණසේකර, විදුහල්පති, රාජකීය විද්‍යාලය හා තවත් අය* (S.C.F.R. Application 27/11, SCM 18.09.2014) මෙම නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවල එන 44(1)(ආ) රීතිය හා අනුගත නොවීම ප්‍රශ්නගත වූ අතර අධිකරණය අභිමතය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කළේය.

අධිකාරී නඩුතීරණයක් වන *කිරිවන්ති හා තවත් අය එ. නවරත්න හා තවත් අය* (1990 2SLR 393) හිදී පෙන්වා දුන්නේ යම් අනුගත නොවීමකට අදාළ ආනුෂංගික ප්‍රතිඵල කවරේද යන්න තාක්ෂණික ලෙස අදාළ කරගත නොහැකි බවය. අභිමතය ප්‍රතික්ෂේප කිරීමක් හෝ යම් තහංචියක් පැනවීම හරහා ක්‍රියාත්මක කළ හැකිය. අධිකරණය විසින් නිරීක්ෂණය කළ ආකාරයට ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ උපරිම විශ්වාසයෙන් කටයුතු කර නොමැති වේද (*uberrima fides*) හා එහි සිතාමතා වූ කරුණු සැඟවීමක් හෝ වංචාසහගත තත්ත්වයක් තිබුණේද යන්නයි

*නිකොලාස් එ. මර්කන් මාකර්* (SC/Appeal No 30/81; SCM 24.3.1982; (1986) B. L. R.. Vol. 1. part VI at 245) යන නඩුතීරණය කෙරෙහි අවධානය යොමුකිරීමද වැදගත් වන අතර එහිදී තීරණය වූයේ (ප්‍රතික්ෂේප කිරීමේ සැරපරුෂ වූ තීරණය එහි වූ අදාළ කරුණු

ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම තුළ සිදු නොකළ යුතු බවත් වැදගත් වනුයේ එකී කරුණ සම්බන්ධව යම් දෙවන නියෝගයක් ලබා දීම වැලැක්වීමත් බවය.)

ඉහත සඳහන් තත්වය සත්‍ය නම් උසාවිවල පවතින නීති හා රීතිවලට අදාළව තොරතුරු පනතින් ස්ථාපිත කළ කොමිෂන් සභාව විසින් අනුගතවීම්වලට අනුව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වඩාත් නම්‍යශීලිව ක්‍රියාකළ යුතු බව ප්‍රත්‍යක්ෂ තර්කනයකි. විශේෂයෙන්ම එය පුරවැසිභාවය පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමට අදාළ විය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පෙත්සම්වලට අදාළව පවතින දෘඪ රීතීන් එලෙසින්ම තොරතුරු පනතේ වූ වෙනස් සිද්ධිමය සාධක මත ක්‍රියාකරන කොමිෂන් සභාවට අදාළ කරගත නොහැකිය.

තවදුරටත් අපගේ මතය වනුයේ පනතේ 32(2) වගන්තියේ දක්වා ඇති කාලසීමාවන්වලට පිටින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සැළකිල්ලට ගැනීමේදී කොමිෂන් සභාව විසින් ස්වංක්‍රීය ලෙසම එකී අභිමතය ක්‍රියාත්මක කිරීම පුරවැසිභාවය පිළිබඳ කරුණු දැක්වීමට සංස්ථාගත කළ හෝ නොකළ දේහයක් තොරතුරු ඉල්ලා අයැදුමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කළ විට ඉවත් විය යන්න නොවේ. එහිදී පනත මඟින් වාචිකව තොරතුරු ඉල්ලා සිටීමටද ඉඩ ප්‍රස්ථාව සළසා දීම සැලකිය යුතු අතර (බලන්න 24(1) වගන්තිය) එමඟින් පුරවැසිභාවය සඳහන් නොකිරීම යළි යථාතත්වයට පත්කළ නොහැකි දෝෂයක්ය යන තර්කය බිඳ දැමීමට සමත් වන්නකි.

*අත්තනායක එ. මැතිවරණ කොමසාරිස්* (2011 1 Sri LR, 220) *හා ප්‍රනාන්දු එ. සිබිල් ප්‍රනාන්දු* (1996 2 SLR, 169) යන නඩු තීරණ උගත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් අනිවාර්ය ප්‍රතිපාදන හා අනුගත නොවීම කොමිෂන් සභාවේ නෛතික බල සීමාවට නොහැකියාවක් ඇති කරන බවටත් හා ඒ අනුව අභියාචනය ඉවත් කළ යුතු බවට වූ තර්කනයට අධිකාරීන් වන බවත් ප්‍රකාශ කරන ලදි. එහිදී මතක තබාගත යුත්තේ අත්තනායක නඩුවේදී අධිකරණ බලය නිවැරදි ලෙස අයැද සිටියද එහි වූ දෝෂය වූයේ ශ්‍රේෂ්ඨාධිකරණ රීතින් ප්‍රකාරව වග උත්තරකරුවන්ට නියමිත දැන්වීම් යවා නොතිබීම වන

අතර කාලය දිගු කිරීමට අවශ්‍ය වූයේ නම් එය උචිත වූ අයැදුමකින් සිදුකළ හැකි විය. ප්‍රනාන්දු නඩුව තීරණය කළේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ අභියාචනය පිළිබඳව ලියාපදිංචි නීතිඥයා විසින් සිය අත්සන තැබිය යුතුය යන ප්‍රතිපාදනය කෙරෙහිය.

ඉහත කී තීන්දු තීරණ අප හමුවේ ඇති අභියාචනාවල පවතින මූලික කරුණු හා සම්බන්ධව වෙන්කොට හඳුනාගත හැකි අතර එය පුරවැසිභාවය සඳහන් කිරීමට අපොහොසත්වීම හා බැඳේ. ඒ අනුව අප තීරණය කරනුයේ පුරවැසිභාවය සඳහන් කිරීමට නොහැකි වීම යන්නම පමණක් අධිකරණයේ නෛතික බලය අහිමි කිරීමට හැකියාවක් නොමැති බවත් මෙම කරුණ නෛතික බල සීමාව පිළිබඳ පවතින ආනුෂංගික කරුණක් බවත් එහිදී අනුශංගික වගඋත්තරකරුවන් විසින් මෙකී කරුණ අත්හැර දැමීම, අනුගතව ක්‍රියා කිරීම හෝ ක්‍රියා නොකර සිට පසුව මෙකී කරුණ පෙන්වමින් කොමිෂන් සභාවේ නෛතික බල සීමාව නොමැති බවට තර්ක කිරීම නවත්වනු බවයි.

මෙම අවස්ථාවේදී කොමිෂන් සභාව සතුව මෙකී අභියාචනය විමසීමට නෛතික බලයක් නොමැතිය යන්න ප්‍රකාශ කිරීම ආරම්භයේ සිට පැවති දෝෂයක් නිවැරදි කිරීමට පොදු අධිකාරියක් සතුව පැවති වගකීම සීමා කිරීමක් වැනිය.

ප්‍රශ්නගත අභියාචනා මඟින් අභිමතය ක්‍රියාත්මක කරලීම හරහා අභියාචකයින්ගේ අතපසුවීම නිවැරදි කිරීමට ඉඩ ලබා දිය හැකිද?

මෙකී ප්‍රශ්නය ඉතා සංකීර්ණ වන අතර එය අපගේ පුළුල් විමර්ශනයට ලක් වේ. ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මඟින්ම තොරතුරු අයැද සිටීමකට අදාළව අභියාචනයක් ඉදිරිපත් කිරීමේදී පිළිපැදිය යුතු කාර්යපටිපාටිය පැහැදිලිවම දක්වා ඇත. ඒ අනුව තොරතුරු නිලධාරියෙකු ඉදිරියේ හා ඔහුගේ තීරණය පිළිබඳව වූ අභියාචනයක් විමසන නම්කළ නිලධාරියා යන දෙපාර්ශ්වයම ස්වාධීන තීරණක් ගැනීම සඳහා ඔහු/ඇය වෙත ඉදිරිපත් කරන මූලික කරුණු ඉතා වැදගත් වේ. කෙසේ හෝ කොමිෂන් සභාවටද මෙයට අදාළව වගකීමක් පවතින අතර එහිදී කොමිෂන් සභාව විසින් සාධාරණත්වය කරුණු සළකා බැලිය යුතු අතර තවදුරටත් ඉහතින් පෙන්වා දුන්

ආකාරයට අභියාචනය සඳහා ලබා දී ඇති ව්‍යවස්ථාපිත අයිතිය පහසුවෙන් ඉවතලීම නොකළ යුතුය. (රණසිංහ විනිසුරුවරයා විසින් *කරුණාදාස එ. විජේසිංහ* (1986, 1 SriLR, 358) නඩුවේදී තීරණය කළ ආකාරයට)

> "අභියාචනය සඳහා ඇති අයිතියක් අර්ථකථනයේදී අධිකරණය විසින් එකී අයිතිය ආරක්ෂා වන පරිදි පුළුල් වූ අර්ථකථනයකට යාම වඩාත් ප්‍රිය කොට සළකයි. ඒ වෙනුවට දෘඪ අර්ථකථනයක් හරහා එකී අයිතිය නැති වී යාමට ඉඩ ඇත."

පනතේ මුඛ්‍ය අරමුණ වන විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුතු මහජන අධිකාරීන්ගේ සංස්කෘතියක් බිහිකිරීමට අදාළ කරුණු සළකා බැලීමේදී ඉහත කී කරුණද නිසි බර තැබීමකට ලක් කළ යුතුය.

එක් අතකින් අභියාචකගේ නෛතික ස්ථිතිය යන්නද තොරතුරු අයදුම්පතට අදාළව අපැහැදිලිතාවයක පවතී. අභියාචක සංස්ථාගත කළ හෝ නොකළ දේහයක්ද? 2017.02.03 දින අභියාචක විසින් පොදු අධිකාරීන් දෙකක් වෙත ලියා යවන ලිපි තුළ තමා සංස්ථාපිත ආයතනයක්ය යන්න නොදක්වයි. අප කොමිෂන් සභාව ඉදිරියේ අභියාචක වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් ඉදිරිපත් කළේ අභියාචක විසින් තමාගේ සංස්ථාගත කිරීමේ සහතිකය අදාළ පොදු අධිකාරීන් වෙත තොරතුරු ඉල්ලීමේ අයැදුමත් සමඟ ගොනුකළ බවය. මෙකී කරුණ පොදු අධිකාරීන් දෙකම ප්‍රතික්ෂේප කරයි.

මෙකී අභියාචනය සඳහා ඉදිරිපත් කරන ලද ඇමුණුම්වලද සංස්ථාගත කිරීමේ සහතිකය ඉදිරිපත් කර නොමැත. මේ කරුණට අදාළව අභියාචකගේ අවධානය 13(4)(v) වෙත යොමුකරනු ලබන අතර එහි සඳහන් වන්නේ අභියාචක විසින් එල්බගෙන ක්‍රියාකළ ලිපි ලේඛනවල පිටපත් අභියාචකගේ අභියාචනයත් සමඟ කොමිෂන් සභාව වෙත ගොනුකළ යුතු බවය. කරුණු අනුව පෙනී යන්නේ මෙකී තොරතුරු අයදුම්පත්‍ර නිසි පිළිවෙළකින් තොරව හදිසියේම පනත බලාත්මක කළ 2017.02.03 දිනම ඉදිරිපත් කර ඇති බවය. අභියාචක විසින් පනත යටතේ සිය අයිතීන් බලාත්මක කර ගැනීමට ඉතා උද්යෝගයෙන් ක්‍රියා කිරීම අගය කළ හැකි නමුත් තොරතුරු ඉල්ලීම් සිදුකරන විට නිසියාකාරයෙන් එය සිදු කිරීමද වැදගත් වන අතර එහිදී විශේෂයෙන්ම කිවයුත්තේ අභියාචක ආයතනය තොරතුරු

පනත පිළිබඳව පුද්ගලයින් පුරුදු පුහුණු කරන ආයතනයක් ලෙස ක්‍රියාකරන බවය.

ඕනෑම අවස්ථාවකදී වුවද, අභියාචක ප්‍රකාශ කරන පරිදි තමා සංස්ථාගත කිරීමේ ලේඛනය නිසි ලෙස ඉදිරිපත් කළේය යන්න අවස්ථාපිත සාධක මත හෝ ලබා දී ඇති ලේඛන මත හෝ අපැහැදිලි තත්ත්වයක පවතී. කෙසේ හෝ එකී කරුණම තාක්ෂණික දෝෂයක් වන අතර එය වේතන හා අභියාචන කාර්යපටිපාටීන් වූ 17 රීතිය යටතේ අභියාචකට නිවැරදි කර ගැනීමට හැකියාවක් තිබූ තත්වයකි. එසේ ප්‍රකාශ කළද, උගත් නියොජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා ප්‍රකාශ කළ ආකාරයට හුදෙක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම පමණක් ව්‍යවස්ථාපිතමය නෛතික බල සීමාව පිළිබඳව වූ (කොමිෂන් සභාවේ) අවශ්‍යතාවය සපුරාලීමට එය ප්‍රමාණවත් නොවේ. (හෝ අමුණන ලද සංස්ථාගත කිරීමේ සහතිකය අනුව) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සේවකයින් සඳහා වූ දීමනා සම්බන්ධ අයවැය සහන ලබා දීමට වූ පනත් කෙටුම්පත පිළිබඳ තීරණය කළ නඩුව මඟින් ඉදිරිපත් කළ මූලධර්මය නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව යටතේ පුරවැසිභාවය අයැද සිටින විට නඩු පැවරීමට හා නඩු පැවරීමට යටත් විය හැකි බවට කරනු ලබන ප්‍රකාශන පුරවැසිභාවය සඳහා ප්‍රමාණවත් නොවන බවයි.

විශේෂයෙන්ම, පුරවැසිභාවය පිළිබඳව ප්‍රකාශ කිරීමට අපොහොසත් වන තැනක අභියාචක විසින් එසේ අපොහොසත්වීමට හේතු දක්වා නොමැති අතර ඒ අනුව කොමිෂන් සභාවට තීරණය කිරීමට සිදු වනුයේ මෙය අත්‍යන්තයෙන්ම වැරදීමක් හෝ කරුණු නොදැනීමක් ලෙසය. එය තොරතුරු අයදුම්කිරීමේදී නිවැරදිව සඳහන් නොකළ අතර නම්කළ නිලධාරියාට අභියාචනා කිරීමේදීද පනතේ 31 වගන්තිය යටතේ හෝ පනතේ 32(1) වගන්තිය යටතේ 2017.05.12 හා 19 යන දිනවල කොමිෂන් සභාව වෙත යොමුකිරීමේදීද නිවැරදි කර නොතිබුණි. මුලසිටම අභියාචකගේ තර්කය වූයේ එවැනි කියාපෑමකට තමාට වගකීමක් නොමැති බවය. එහිදී ඔවුන් විසින් ඉදිරිපත් කළ තර්කය වූ තොරතුරු අයදුම්පත් යොමුකිරීමේදී වඩාත් විමසිලිමත් ලෙස කටයුතු කළ යුතුය යන්න සම්බන්ධයෙන් පමණක් එකඟතාවය පළ කරන ලදි. තවදුරටත්, කොමිෂන් සභාව වෙත ලැබුණු ලිඛිත සැළකිරීම්වල

30 වන ඡේදයේ දක්වා තිබුණේ "ගෞරවාන්විතව ඉදිරිපත් කරනුයේ අභියාචක පනතේ 3(1) හා 43 වගන්ති එක්ව කියවූ විට පුරවැසියෙකු වන බවත් හා 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද දේහයක් වන බවත් හා එහි සාමාජිකයින්ගෙන් හතරෙන් තුනකට වැඩි පිරිසක් ශ්‍රී ලාංකික පුරවැසියන් වන බවත්ය." ඉන් පසුව දක්වා ඇති වාර්තාවන්හි දී අභියාචකගේ නීතිඥවරයා පෙන්වා දී ඇත්තේ තොරතුරු අයැද සිටින්නා මත කිසිඳු වගකීමක් නොමැති බවත් මුළු වගකීම ම පොදු අධිකාරිය මත පවතින බවත් එහිදී ඔවුන් සද්භාවය යන්න උපකල්පනය කළයුතු බවත්ය.

එහිදී අප ප්‍රකාශ කළ යුතු වන්නේ යහපත් හෘද සාක්ෂියක් මත වුවද එකී ඉදිරිපත් කිරීම් සමඟ අපට එකඟ විය නොහැකි බවය. කොමිෂන් සභාව විසින් තවදුරටත් හඳුනාගනු ලබන්නේ තොරතුරු අයැද සිටින විට රාජ්‍ය හා පෞද්ගලික පුරවැසියෙකු අතර පවතින බලයේ අසමතුලිතභාවය මත සිට සැළකිය යුතු බවයි.

ඉහත සඳහන් කළ හේතුව නිසාම මෙකී රීතින් නිර්මාණය කිරීමේදී ඉතාමත්ම සැලකිලිමත් ලෙස කටයුතු කරන ලදි. (2017.02.03 දින දරණ ගැසට් අංක 2004/66 හි සඳහන්) එය එසේ සිදු කරන ලද්දේ පනත යටතේ යම් පුද්ගලයෙකු තොරතුරු අයැද සිටින විට එමඟින් අදාළ පුද්ගලයාට අනවශ්‍ය බලපෑමක් ඇතිවීම හා අනවශ්‍ය විධිමත්භාවයන්ගේ අවශ්‍යතාවය අවම කරලීම සඳහාය. කෙසේ හෝ ඒ මඟින් පනතේ 24(1) යටතේ තොරතුරු සඳහා ඉල්ලීමක් සිදු කිරීම හෝ කොමිෂන් සභාවට පනතේ 32(1) හරහා අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන විට දැක්විය යුතු අවධානයේ යුතුකමට ව්‍යතිරේකයක් ලෙස එය සැලකීමට නොහැකිය.

අභියාචක විසින් කොමිෂන් සභාවේ තීරණ දෙකක්ද : *ජී. දිලිප් අමුතන් එ. උතුරු පළාත් සභා ප්‍රධාන අමාත්‍ය ලේකම් කාර්යාලය,* (RTIC Appeal 21/2017 of 10.07.2017) හා *වෛද්‍ය කුමාරසිරි මානගේ එ. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,* (RTIC Appeal No 65/2017 of 16.10.2017) පෙන්වා දෙමින් අවසාන තීරණයට අදාළව කොමිෂන් සභාවේ තීරණය වූ කොමිෂන් සභාවේ "පනතේ වචනවල හා ජීවයේ මුඛ්‍යාර්ථය වන උපරිම හෙළිදරව් කිරීමේ මූලධර්මය ආරක්ෂා කළ යුතුය" යන්න පෙන්වා දෙන ලදි. අප විසින් 2017.02.03 පනත ක්‍රියාත්මක

කරලීම ආරම්භ වූ දිනයේ සිට මෙකී තීරණ හා වෙනත් සමාන වූ තීරණ ඇසුරින් තොරතුරු දැනගැනීමේ පනතේ මුඛ්‍ය හරය වන උපරිම ලෙස තොරතුරු හෙළිදරව් කිරීමේ මූලධර්මය ක්‍රියාත්මක කරන ලද අතර එය හරයාත්මක තොරතුරු නිදහස් කරන ලෙස කරනු ලබන ඉල්ලීමකට අදාළව සිදුකරන ලදි. නමුත් නෛතික බලය සම්බන්ධව දෝෂ පවතින අවස්ථාවක් සළකා බලන කළ ඉහත කී කරුණම ඉතා ප්‍රවේසම්ව සැලකිල්ලට ගතයුතු අතර එහිදී විශේෂයෙන්ම හරයාත්මක අභියාචන කාර්යපටිපාටියේ සුමට පැවැත්මට අගතිදායක ලෙස බලපෑම් කරන බව මෙතෙක් පවතින සාක්ෂි මඟින් පෙනී යයි.

කෙසේනමුත්, අප ඉදිරියේ ඇති කරුණු අනුව අභියාචකගේ ක්‍රියාකාරීත්වය තුළ උපරිම විශ්වාසය කඩකිරීමක් හෝ සිතාමතා සිදුකරන ලද තොරතුරු හෙළිනොකිරීමක් හෝ වංචනික ස්වභාවයක් හෝ (ඉහතින් දැක්වූ කිරිවන්ති නඩුව) අභියාචකගේ ක්‍රියාකලාපය තුළ දක්නට නොමැති අතර කෙසේ හෝ එකී ක්‍රියා කලාපය තුලම නොසැළකිලිමත්භාවයද අවිවාදාත්මකව දක්නට ලැබේ. අභියාචකගේ මෙකී දෝෂ සහිතභාවය නිවැරදි කරගන්නා ලෙස කිසිඳු අවස්ථාවක වගඋත්තරකරුවන් විසින් විමසා නොමැති අතර එය තොරතුරු අයැද සිටීමේ සිට කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම දක්වාම සිදුකර නොමැත. යම් අවස්ථාවක එවැනි ඉල්ලීමක් සිදුකර තිබුණද අභියාචකට ඒ අනුව ක්‍රියාකළ නොහැකි වුණු නම් අභියාචකගේ එකී නොහැකියාව මත සිය අයිතිය බලාත්මක කර ගැනීමට නොහැකිවීම සම්බන්ධයෙන් සිය අභිමතය ක්‍රියාත්මක කර කොමිෂන් සභාවට සහන ලබා දීමට හැකියාවක් හට නොගන්නේය.

අනෙක් අතට, පොදු අධිකාරීන්ද නිසි අවධානයෙන් යුතුව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව පැහැදිලිවම පෙනේ. තොරතුරු නිලධාරීන් දෙදෙනා හා නම්කළ නිලධාරියා පනතේ 24(2)(ආ) වගන්තිය මඟින් දක්වන පරිදි තොරතුරු ඉල්ලා සිටින්නා නිසිලෙස තොරතුරු ඉල්ලා නොමැති බවට සන්නිවේදනය කිරීමක් සිදුකර නොමැත. 2017.02.03 දින පනත ගැසට් කරන ලද රෙගුලාසිවල 4වන රෙගුලාසිය ප්‍රකාරව තොරතුරු නිලධාරිය විසින් තොරතුරු අයැද සිටින්නාගේ නම් වැරදීමක් හෝ නොගැළපීමක් පිළිබඳව අවශ්‍ය වෙනස්කම් සිදුකරන ලෙසට දැනුම්දීමක් සිදුකර ඇති බවට සාක්ෂි නැත. පනතේ 24(1)(ආ)

වගන්තිය මඟින් තොරතුරු නිලධාරියා වෙත තොරතුරු අයැද සිටින පුද්ගලයා නිවැරදි ආකාරයට එය සිදුකර නොමැති විට තොරතුරු නිලධාරියා විසින් පනත ප්‍රකාරව එකී ඉල්ලීම අදාළ පුරවැසියාට කළ හැකි ආකාරයට වෙනස් කරලීමට අවශ්‍ය උපදෙස් ශාස්තු අයකිරීමකින් තොරව ලබාදීමේ අත්හළ නොහැකි වගකීමකින් බැඳ තබනු ලබයි. මෙකී කරුණ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයේ චේතනාව වූ ඉහළ මට්ටමක පවතින්නා වූ අවධානයේ යුතුකම 32(4) වගන්තිය හරහා ඉස්මතු වේ. එහි දැක්වෙන්නේ පොදු අධිකාරිය විසින් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව තොරතුරු ඉල්ලීම සකස්කළ බවට ඔප්පුකිරීමේ භාරය ඔවුන් සතුව පවතින බවය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ පොදු වගකීම් අතරට එන පොදු අධිකාරීන් මඟින් තොරතුරු දැනගැනීමේ නීතින්ට අදාළව යහපත් පරිචයන් පවත්වාගැනීම, දිරිමත් කිරීම කොමිෂන් සභාවේ නොයෙකුත් තීරණ මඟින් මෙන්ම අධිකරණ මඟින්ද විවිධ රාජ්‍යන්හි තොරතුරු නීතින් පිළිබඳව ලබා දී ඇති තීරණ මඟින් පෙන්වා දේ. තොරතුරු කොමසාරිස්වරුන් විසින් පොදු අධිකාරීන් සතුව පවතින තොරතුරු අයැද සිටින්නන්ට සහාය දැක්වීමේදී පවතින වගකීම පිළිබඳව සළකා බැලීම අවශ්‍ය වන අතර එය තොරතුරු සකස් කිරීම තුළ ඉතා වැදගත් වේ. එක්සත් රාජධානියේ තොරතුරු දැන්ගනීමේ පනත යටතේ එන වගකීම් දෙස බලන විට පෙනී යන්නේ තොරතුරු කොමසාරිස් විසින් ලබාදුන් තීරණය සමඟ තොරතුරු පර්ෂදයට එකඟ විය නොහැකි බවත් එහිදී රාජ්‍ය ආයතන සතුව පැහැදිලි ලෙස ඉදිරිපත් නොකළ තොරතුරු ඉල්ලීමකට අදාළව වගකීමක් නොපවතින බවත්ය. කෙසේ හෝ පර්ෂදය තීරණය කළේ තොරතුරු ඉල්ලීම ප්‍රමාණවත් ලෙස පැහැදිලි බවය. පර්ෂදය විසින් ආගන්තුක ලෙස ප්‍රකාශ කළේ කොමසාරිස් විසින් විවේචනාත්මක ලෙස ආණ්ඩුව විසින් තොරතුරු ඉල්ලන්නා වෙත ලබාදුන් සහාය සළකා බැලිය යුතු බවත් ප්‍රශ්නගත අවස්ථාවේදී එය අවශ්‍ය පමණින් සිදු නොවූ බවත්ය.

ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය සළකා බලන කළ, කොමිෂන් සභාවේ කෘත්‍යයන් හා වගකීම් පනතේ 32(1) යටතේ එන අභියාචනා විමර්ශනයට පමණක් සීමා නොවන අතර පනතේ 15(ඊ) යටතේ එන පොදු අධිකාරීන් විසින් ඔවුන්ට පනත මඟින් පවරා ඇති කාර්යයන්

නිසිලෙස ඉටුකරන්නේද යන්න විමර්ශනය සම්බන්ධයෙන්ද අදාළ වේ. පනත ක්‍රියාත්මක වීමේ මුල් කාලයේදීම මෙකී වගකීම් පැහැදිලිව පෙන්වා දීම හා ඒවාට අනුගතව කටයුතු කිරීම වැදගත් වේ.

## කොමිෂන් සභාවේ තීරණය

මෙකී හේතුන් හා කාරණා සැළකිල්ලට ගැනීමේදී නීතිය පිළිබඳව පැන නැගුණු මූලික ප්‍රශ්න ද්විත්වය සඳහා පහත පරිදි පිළිතුරු සපයනු ලැබේ.

> පනතේ 3(1) හා 43 යන වගන්තීන් එක්ව කියවූ විට තොරතුරු අයැද සිටින්නා විසින් පුරවැසිභාවය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වන්නේද? යන වග තොරතුරු අයැද සිටින්නා සංස්ථාගත කළ හෝ නොකළ දේහයක් වන විට පුරවැසිභාවය සඳහන් කිරීම නෛතික බලසීමාව පිළිබඳ කරුණක් වන අතර එය පළමු අවස්ථාවේදී තොරතුරු නිළධාරියා විසින් නිශ්චිත කරගත යුතු කරුණකි.
>
> ඉහත කී අතපසුවීම බරපතල අනනුකූල කරුණක්ද නැතිනම් කොමිෂන් සභාව ඉදිරියේ ඇති අභියාචනයක දෙවන අවස්ථාවේදී යථාතත්ත්වයට පත්කළ හැකි කරුණක්ද? යන වග මෙය ඉතාමත් විශේෂ අවස්ථාවන්වලදී යොදාගනු ලබන අභිමතය හරහා යථාතත්වයට පත්කළ හැකි තත්වයකි.

අභියාචක විසින් ඒත්තුගන්වන ආකාරයට කොමිෂන් සභාව විසින් ගාස්තු ගෙවීම හා අභියාචනා කාර්යපටිපාටිය දක්වන 17 වන රීතිය යටතේ සිය ආයාචනය සංශෝධනය කිරීමට ඉඩලබා දිය යුතු බව දක්වයි. මෙකී රීතිය මඟින් දක්වන්නේ යම් අභියාචනයක් අවශ්‍ය තොරතුරු පැහැදිලිව දැක්වීමට අපොහොසත් වන විටක හෝ වෙනත් ආකාරයකට ප්‍රමාණාත්මකව දෝෂ සහගත විටක එවැනි අභියාචනයක් යළි අභියාචකට හරවා යැවිය යුතු බවයි. අපට පෙනෙන ආකාරයට, මෙකී අභියාචනයේ පෙන්වා දී ඇති ලෙස පවතින නෛතික බල සීමාව පිළිබඳ දෝෂ මෙකී රීතිය අදාළ කරගනිමින් නිවැරදි කළ නොහැකි අතර එයට හේතුව නම් මෙය අදාළ වන්නේ අදාළ දෝෂය හරයාත්මක කරුණු හෝ ගැටලු මත පවතින කුසලතා මත

පමණක් වන නිසාය. (උදාඃ අභියාචනය මඟින් අයැද සිටින තොරතුරු නිශ්චිත නොවන විට හා අවශ්‍ය ලේඛන එවා නොමැති විටක). ඒ අනුව මෙම අවස්ථාවේදී, කොමිෂන් සභාව විසින් ප්‍රශ්නය විමසන විටදී ඉහත කී කරුණුවල පැවැත්මක් නොතිබුණි. කෙසේ නමුත් යම් අවස්ථාවකදී කොමිෂන් සභාව විසින් අභියාචනා අවස්ථාවේදී පුරවැසිභාවය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙන්නේ නම් එය කොමිෂන් සභාව විසින් තමාට ආවේණික වූ පනත මඟින් ලබා දී ඇති බලය යටතේ අභියාචක වෙත නෛතික බලය සම්බන්ධ වූ කරුණ පිළිබඳව අභියාචනා කිරීමේ අයිතියක් ඇති බවට කරුණු නිශ්චිත කර ගැනීමකට සමාන තත්වයක් ඇති කරයි. මෙම කොමිෂන් සභාව අධිකරණයක් ලෙස ස්ථාපිත නොකළ අතර එය පනතේ අරමුණ සඳහා ස්ථාපිත කරන ලදි. (බලන්න පනතේ 11(1) වගන්තිය). එමගින් බලාපොරොත්තු වූයේ පොදු අධිකාරීන් තුළ විනිවිදභාවයෙන් හා වගවීමෙන් යුත් සංස්කෘතියක් බිහි කිරීමය. (බලන්න පනතේ පූර්විකාව). ඒ අනුව කොමිෂන් සභාව විසින් අත්‍යාවශ්‍යයෙන්ම එකී ව්‍යවස්ථාපිත චේතනාව ක්‍රියාත්මක කරලිය යුතුය. මේ යටතේ කොමිෂන් සභාවද වඩාත් අවධානයෙන් යුතුව සළකා බලනුයේ පනත මඟින් ලබා දී ඇති අභියාචනයේ අයිතිය උපරිම පුළුල් තත්වයෙන් පවත්වා ගැනීම වන අතර එය සීමාකිරීම පිළිබඳව නොවේ. *(කරුණාදාස එ. විජේසිංහ)*

ඒ අනුව මෙකී ගැටලුවේ පවතින සාධාරණත්වයේ නියමයන් සළකා බැලීමේදී හා මෙම අභියාචනාවල ඇති කුසලතා පිළිබඳව සැළකීමේදී හා පනතේ 32(1) ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති ආවේණික බලතල අනුව අප විසින් අභියාචක හට සිය ලේඛන වෙනස්කරමින් පුරවැසිභාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ සළසා දෙනු ලබයි. තවද, 14අ ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත ලැබෙන බලාධිකාරිය අනුව අප තීරණය කරනුයේ පනතේ 24(2)(ආ) හා වර්ෂ 2017.02.03 දින නිකුත් කළ රෙගුලාසී 04 යටතේ එන අවශ්‍යතාවන් සමඟ අනුගතවීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බවත් ඒ අනුව කටයුතු කිරීම හරහා පනතේ චේතනාව හා ජීවයට පරස්පර වන අයුරින් කටයුතු කර ඇති බවත්ය.

අප විසින් අදාළ තොරතුරු නිලධාරීන්ට නියම කරනුයේ පනතේ 3(1) වගන්තිය, 24(1) හා 43 යන වගන්තීන් සමඟ එක්ව කිය වූ විට

තොරතුරු සඳහා ඉල්ලීමක් සංස්ථාගත කළ හෝ නොකළ දේහයක් ඉල්ලා සිට ඇති විටක එයට අදාළ නීතිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසත්ය. එවැනි දේහයක් විසින් තොරතුරු ඉල්ලා ඇති විටක පනතේ 24(2)(ආ) හා රෙගුලාසි 04 යටතේ තොරතුරු නිලධාරීන් විසින් තොරතුරු අයැද සිටින්නාට නිවැරදි උපදෙස් ලබා දී අයදුම්පතේ වන වැරදි හා නොගැලපීම් ඉවත් කිරීමට ක්‍රියාකළ යුතු බවය.

තොරතුරු පනතේ වපසරිය දෙස අවධානය යොමුකරමින් කොමිෂන් සභාව විසින් අවධාරණය කරනුයේ හුදෙක් සංස්ථාගත කළ හෝ නොකළ දේහයක් විසින් බැලූ බැල්මට පුරවැසිභාවය සඳහන් කර තිබීම පනතේ 3 වගන්තිය 24(1) හා 43 වගන්තිය සමඟ එක්ව කිය වූ විට පැන නගින අවශ්‍යතා සපුරාලීමට එය ප්‍රමාණවත් වන බවයි. ඒ අනුව ඉතාමත්ම සීමිත අවස්ථාවලදී පමණක් විෂය මූලික ලෙස තොරතුරු නිලධරයාට සද්භාවය මත පදනම් වූ යම් සැකයක් යටතේ එලෙස පුරවැසිභාවය සඳහන් කරන දේහයකයට පනතේ 24(1) යටතේ එහි පුරවැසිභාවය සනාථ කිරීම සඳහා එහි සාමාජිකයින්ගෙන් හතරෙන් තුනකට වැඩි පිරිසක් පුරවැසියන් වනබව පෙන්වීමට ඉල්ලීමක් කිරීම නීතිය මඟින් සාධාරණීකරණය කළ හැකි වේ. මෙහිදී අපට රජය විසින් මූලික විරෝධතාවක් ලෙස පෙන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ(1) යටතේ පෙන්වා දෙන අදාළ තොරතුරු අයැද සිටීම පුරවැසියන්ගේ ආරක්ෂාව සඳහා අයැද සිටින්නක් බව පෙන්වීම එනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රකාශකරන ආකාරයට තොරතුරු අයැද සිටීමට ඇති අයිතිය පුරවැසියෙකුගේ අයිතියක් ආරක්ෂා කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට සීමාවන බව හා හුදෙක් එකී තොරතුර මහජනයාගේ යහපත සඳහා හෙළිදරව් කළ යුතුය යන්න ප්‍රමාණවත් නොවේ.

අපගේ මතය අනුව මෙකී විරෝධතාවය ඉදිරියට ගෙන යා නොහැකි අතර ඊට හේතුව නම් එය ගැටලුවේ කුසලතා වෙත ගමන් කරන බවත් එය වෙන්කළ නොහැකි ආකාරයට "පොදු යහපත" යන සංකල්පය හා බැඳී ඇති බවත් හා එය එවැනි අවස්ථාවක තීරණය කළ යුතු බවත්ය. මෙකී තීරණයේ අරමුණු උදෙසා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ අයිතිය හා අයැද සිටි තොරතුරු "තොරතුරු හා තොරතුරු දැනගැනීමේ අයිතිය" ලෙස පනත මඟින් අර්ථකථනය කළ වපසරියන්ට අයත් වීම ප්‍රමාණවත් බවත් එය සෑම විටම වඩාත් වටිනා

සංකල්පයක් වන පොදු යහපතට යටත්ව පවතින බවත්ය. ඉහත කී තත්ත්වය යටතේ ඉන්දීය අධිකරණය *බිහාර් රාජ්‍ය සේවා කොමිසම එ. සයිඩ් හුසේන් අබ්බාස් රිස්වි හා තවත් අය*, [2013-2-L.W. 293 (Part 4)] at 301; යන නඩුවේදී සිදුකරන ලද අදහස් දැක්වීම වෙත අවධානය යොමුකිරීම වැදගත්ය.

පොදු යහපත යන වරණය තේරුම්ගත යුත්තේ එහි සත්‍ය ලෙසම ගැබ් වී තිබෙන පනත ප්‍රකාරව පවතින අර්ථය යටතේය. පොදු යහපත යන වරණය දෙස එහි පටු වූ අර්ථය මඟින් සළකා බැලිය යුතු අතර එය තුළ එකී වරණයට පවතින සියලුම ව්‍යතිරේක සැළකිය යුතු අතර එය සිදුකළ යුත්තේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවල දක්වා ඇති ව්‍යතිරේක ඉවත් කිරීම සාධාරණීකරණය කිරීම සඳහාය. පොදුවේ ගත්කළ මහජන යහපත යන්න මහජන අරමුණු මෙන් කිසිඳු නිශ්චිත අර්ථකථනයකට ලක් කළ නොහැකිය. එයට නිත්‍ය වූ අර්ථයක් නොමැති අතර එය නම්‍යශීලී වන අතර එහි වර්ණය එය අඩංගු වන ව්‍යවස්ථාව මඟින් ලබාගනී. [*බිහාර් ප්‍රාන්තය එ. කාමේශ්වර් සිං* (AIR 1952 SC 252) = (1952) 62 L.W. 527] තවද, එය කාලය, සමාජයේ තත්ත්වය හා එහි මහජනයාගේ පොදු සුබසාධනය අදහස් වන අතර එය පිළිගැන්වීම හා ආරක්ෂණයද ඊට අදාළ වන අතර එය තුළ මහජනයාට පිරිසක් ලෙස අයිතියක්ද පවතී. [Black's Law Dictionary (Eighth Edition)]

<u>ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂල් ශ්‍රී ලංකා - කුසලතා මත නියෝගය</u>[15]

පනතේ 31(3) වගන්තිය ප්‍රකාරව නම්කළ නිලධාරියා හට තමා ලබාදෙන්නා වූ තීරණය සඳහා අදාළ කරගනු ලැබූ නිශ්චිත පදනම් කවරේද යන්න හේතු සාධක ලෙස දැක්වීමේ ඇති වගකීම පිළිබඳව පළමුව අවධානය යොමුකළ යුතුය. එමෙන්ම තොරතුරු අයදුම්කරුවකුගේ තොරතුරු ලබාදීම හෝ නොදීම පිළිබඳව කරනු ලබන සළකා බැලීමක් නම්කළ නිලධාරියා විසින් බැරෑරුම් ලෙස සැළකිල්ලට ගෙන කළ යුත්තක් වන අතරම එහිදී හුදෙක් පනතේ 5 වන වගන්තියේ උපවගන්තීන් කෙරෙහි සැළකිල්ලක් දැක්වීම පමණක් ප්‍රමාණවත් නැත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව කෙරෙහි අවධානය යොමුකරන විට පැහැදිලිවම පෙනී යන්නේ තොරතුරු දැනගැනීමේ

15 2018 දෙසැම්බර් 04 වන දින ලබාදෙන ලදි.

ඉල්ලීම් හා අදාළව එය බැහැර කිරීමක් සම්බන්ධයෙන් වන කරුණකදී ව්‍යවස්ථාදායකයේ චේතනාව වී ඇත්තේ හුදෙක් නෛතික ප්‍රතිපාදන දැක්වීම හා බැහැර කිරීමට අදාළ නිශ්චිත කරුණු දැක්වීම යන දෙක අතර වෙනස්කමක් ඇති කිරීමත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමේ ඇති වැදගත්කම මත නිශ්චිත හේතු දැක්වීම වැදගත්වන බවත්ය. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමේ පදනම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මඟින් පමණක් හට (නොගන්නා) අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එන 14අ ව්‍යවස්ථාව මඟින් පැන නගින්නකි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මඟින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේදී භාවිත කළ යුතු කාර්යපටිපාටිය දක්වා ඇති අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෑතකදී පෙන්වා දුන් ආකාරයට එකී පනත සතුව "අර්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය තත්වයක්" පවතී (බලන්න ශ්‍රේෂ්ඨාධිකරණයේ වන්දිගෙ වීමේ පනත් කෙටුම්පතෙහි තීරණය). මෙකී පනතේ මුඛ්‍ය අරමුණ නම් පුද්ගලයින් හට අවශ්‍ය තොරතුරු ලබාදීම හරහා ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළ අර්ථවත් ලෙස දායක වෙමින් පාලකයින් වගවීමට ලක්කිරීම හරහා ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කිරීමට දායක කිරීමය.

ඉහත ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අර්ථකථනය කිරීම 2017.02.03 දින ගැසට් කරන ලද රෙගුලාසි අනුව ඉතාමත්ම පැහැදිලි වන අතර එහි කිසිඳු සීමාවකින් තොරව දක්වා ඇත්තේ තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන විට ඒ සඳහා හේතු සාධක "වඩාත් විස්තරාත්මකව" ලබාදිය යුතු බවයි. පොදු අධිකාරියේ තොරතුරු නිළධාරියා හා නම්කළ නිලධාරියා විසින් කටයුතු කරන ලද ආකාරය පිළිබඳව කොමිෂන් සභාව විසින් සැළකිල්ලට ගනු ලබන අතර එකී නිළධාරීන් එම ඉල්ලීම් කෙරෙහි සළකා බලනු ලැබුවේ පනත සකස් කොට කෙටි කාලයකින් වන අතර යම් නොහැකියාවක් අනවබෝධය මත සිදු වුවා යැයි සැළකිය හැකි වුවද ඉහතින් සඳහන් කළ ආරක්ෂණ ක්‍රමවේදයන් ඉතා අත්‍යාවශ්‍ය වන බැවින් ඒවා අනාගතයේදී ආරක්ෂා කිරීම අත්‍යාවශ්‍ය වේ.

**1). අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ වර්ෂ 2015 හා 2016 ට අදාළව වත්කම් හා වගකීම් පිළිබඳ සහතික කළ පිටපත් ලබා ගැනීම සම්බන්ධයෙන් වූ කරුණ.**

තීරණාත්මක ගැටලුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 03 වගන්තියේ අවශ්‍යතා ඉටුකිරීම.

පනතේ 03 වගන්තියේ අදාළත්වය එක්ව ගෙන කියවිය යුතු (තොරතුරු දැනගැනීම සඳහා අවශ්‍යතාවයක් හටගනුයේ අදාළ තොරතුරු යම් පොදු අධිකාරියක භුක්තියේ, සන්තකයේ හෝ පාලනයේ පවතින විටකය) 1975 අංක 01 දරණ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන නීතිය (සංශෝධිත) පනත පිළිබඳව පළමුකොටම අවධානය යොමුකළ යුතුය. මෙකී ගැටලුව අපට සිතෙන ආකාරයට මෙම තොරතුරු ඉල්ලීමට අදාළව පවතින මූලිකම ගැටලුවකි.

ශ්‍රී ලංකාව විසින් වත්කම් හා වගකීම් පිළිබඳව ප්‍රකාශ ලබාදීම සම්බන්ධව එක්තරා කණ්ඩායමකට අයත්වන පුද්ගලයින්ට විශේෂිත වූ නීතියක් පනවා ඇති අතර (විශේෂ අවධාරණය කිරීම අපගේය) එය 1975 අංක 01 දරණ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන ලබාදීමේ නීතිය (සංශෝධිත) මෙම නීතිය (මින් මතුවට DALL) මඟින් අදාළ ප්‍රකාශනයන් ලබාදිය යුතු නිශ්චිත ආකාරයක් දක්වමින් එය ලබාදිය යුතු පුද්ගලයින් කවුරුන්ද යන්න හා එය ලබාදිය යුත්තේ කවුරුන් හටද යන්න දක්වා ඇත. එබැවින්, වත්කම් හා වගකීම් පිළිබඳව කරනු ලබන ප්‍රකාශන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ හෙළිදරව් කිරීමට අදාළව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පමණක් අදාළ කරගත නොහැකි අතර එයට අදාළව පවතින නිශ්චිත වූ නීති ප්‍රතිපාදන ද අදාළ කරගත යුතු අතර එය කලාපයේ පවත්නා අනෙකුත් රාජ්‍යයන්ටද අදාළ පරිචයක් වේ.

DALL හි 04(අ) වගන්තිය මඟින් දක්වා ඇත්තේ අදාළ තොරතුරු දැක්වීම ජනාධිපතිවරයා වෙත සිදුකළ යුතු බවත් එය සිදුකළ යුත්තේ (i) කථානායකවරයා, (ii) කැබිනට් අමාත්‍යවරුන්, අනෙකුත් ඇමතිවරුන්, උප ඇමතිවරුන්, (iii) ජනාධිපතිවරයා විසින් පත්කළ විනිසුරුවරුන් හා අනෙකුත් මහජන බලධාරීන් විසින් බවය. පනතේ 4(ආ) මඟින් දක්වා සිටින්නේ 4(අ) මඟින් සඳහනක් නොකළ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කථානායකවරයා වෙත මෙය දැක්විය යුතු බවයි. 4(අ) මඟින් දක්වා ඇත්තේ පහත සඳහන් පුද්ගලයින් අදාළ ප්‍රකාශන මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලබාදිය යුතු බවය;

(i) 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනත, 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 02 දරණ පළාත් සභා මැතිවරණ පනත, 1981 අංක 20 දරණ සංවර්ධන කම්ටු (මැතිවරණ) පනත හෝ පළාත් පාලන මැතිවරණ ආඥා පනත යන පනත්වල අරමුණු සඳහා වූ යම් පිළිගත් දේශපාලන පක්ෂයක නිලතල දරන්නන්.

(ii) 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනත, 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 02 දරණ පළාත් සභා මැතිවරණ පනත, 1981 අංක 20 දරණ සංවර්ධන කම්ටු (මැතිවරණ) පනත හෝ පළාත් පාලන මැතිවරණ ආඥා පනත යන පනත්වලට අදාළව එකී මැතිවරණයන්ට තරඟකිරීම සඳහා යෝජනා කර ඇති තරඟකරුවන්.

වත්කම් හා වගකීම් පිළිබඳව වූ ප්‍රකාශන ඉතා සරල ලෙස අදාළ ධූර දරන්නන් පොදු අධිකාරීන් වෙත ලබා නොදේ. අදාළ ප්‍රශ්නය යම් අවස්ථාවක, එක්තරා අමාත්‍යවරයෙකු විසින් නව පනතක් කෙටුම්පත් කිරීමට යෑමේදී එය සත්‍ය ලෙසම පවතීද නැතිනම් එවැන්නක් නොපවතීද යන ප්‍රශ්නයට වඩා වෙනස් වූ ප්‍රශ්නයක් වන අතර එය සිද්ධියක් පිළිබඳව වූ ගැටලුවක් බවට පත් වේ. අදාළ DALL පනත මඟින් ව්‍යවස්ථාපිත වගකීමක් මෙකී ප්‍රකාශන සම්බන්ධව පනවා ඇති අතර කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳව අවධානය යොමුකළ යුතු වේ. කෙසේ හෝ අවධානය යොමුකළ යුතු කරුණ වන්නේ අදාළ පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා හෝ නම්කළ නිලධාරියා මෙකී තොරතුරු තමා සතුව නොපවතින බවට කිසිඳු විටකත් ප්‍රකාශ නොකිරීමය (අවධාරණය කිරීම අපගේය).

වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයා කොමිෂන් සභාව හමුවේ සඳහන් කර සිටියේ  පනත මඟින් නම්කළ නිලධාරියා පනතේ 4 වගන්තිය ප්‍රකාරව දක්වා ඇති නියමිත අධිකාරිය ලෙස හඳුනාගෙන නොමැති ලෙසත් හා එබැවින් එකී තොරතුරු, තොරතුරු අයැද සිටින්නා හට ලබාදීම සඳහා තොරතුරු පනත ප්‍රකාරව එම තොරතුරු ඔහුගේ භුක්තියේ, සන්තකයේ හෝ පාලනයේ නොපවතින බවයි. කෙසේනමුත්, මෙකී තීරණය DALL පනතේ ඇතැම් ප්‍රතිපාදන විශේෂයෙන්ම 5 වගන්තිය සළකා බලන විට පරාජයට ලක් වේ.

5(1) වගන්තිය මඟින් දක්වා ඇති ආකාරයට, "රාජ්‍ය නිලධාරියෙකු පොදු සංස්ථාවක සේවකයෙකු හෝ පළාත් පාලන ආයතනයක නිලධාරියෙකු පත් කිරීමට, උසස් කිරීම, මාරු කිරීමට හෝ අනුයුක්ත කිරීම් සම්බන්ධයෙන් බලය පවතින පුද්ගලයෙකු, දේහයක් හෝ අධිකාරියකට එවැනි යම් රාජ්‍ය නිලධාරියෙකුගේ හෝ සේවකයෙකුගේ වත්කම් හා වගකීම් පිළිබඳව ප්‍රකාශන කැඳවීමට බලය පවතින්නේය." පනතේ 5(2) වගන්තියෙන් දක්වා ඇත්තේ නීතිපතිවරයා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා හා විදේශ විනිමය පාලනය කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හට ඕනෑම වත්කම් හා වගකීම් පිළිබඳ වන්නා වූ ප්‍රකාශනයක් කැඳවා කරුණු සළකා බැලීමට කරුණු ඇතිබව දක්වයි. මෙම අභියාචනය සම්බන්ධයෙන් සළකා බලන විට පනතේ 5(3) වගන්තිය ප්‍රකාරව (1988 දී ගෙන ආ සංශෝධනය පරිදි) ඕනෑම පුද්ගලයෙකුට නියමිත ගාස්තු ගෙවා නියමිත ආකෘතියක් යටතේ නිශ්චිත අධිකාරියකින් අදාළ තොරතුරු ඉල්ලා සිටිය හැකි අතර තවත් අමතර නිශ්චිත ගාස්තු ගෙවා අදාළ තොරතුරුවල සහතික කළ පිටපත් ලබාගැනීමටද හැකියාව ඇත.

එය එසේ වුවද DALL පනතෙහි 8(1) මඟින් දක්වා ඇත්තේ මෙලෙස තොරතුරු ලබාගත් අයෙකුට එකී තොරතුරු අදාළ ගැටලුවට සම්බන්ධ වන පුද්ගලයා හැර වෙනත් පාර්ශ්වයකට සන්නිවේදනය කළ නොහැකි බවය. පනතේ 8(1) වගන්තියට අනුගත නොවීම වරදක් වන බවත් එය 8(4) වගන්තිය අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට ලක් කිරීමට යටත් විය හැකි බවත් දක්වා ඇත. 5(3) යටතේ ඉහත ආකාරයට ලබාගත් තොරතුරු අධිකරණයක් හමුවේ ගොනුකළ හැක්කේ DALL යටතේ හෝ අල්ලස් පනත හෝ විනිමය පාලන පනත හෝ දේශීය අදායම්බදු පනත හෝ රේගු ආඥා පනත යටතේ ගෙන එනු ලබන නඩුවලදී පමණය.

DALL පනත සරලව ගත්කළ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනවල තොරතුරු යම් අයෙකුට, නිලධාරීන්ට හා ගෙවීමකට යටත්ව සාමාන්‍ය පුරවැසියන්ටද ලබාගත හැකිය. ඒ අනුව මෙකී නීතිය යටතේ එකී ප්‍රකාශන ලබාදීමේ වගකීම පවතිනුයේ කාටද? නතිනම් පොදු අධිකාරියේ එහි ප්‍රධානියාගේ මඟපෙන්වීම යටතේ එහි සිටින නම්කළ නිලධාරියාට වගකීමක් පවතීද?

එය එසේනම්, තොරතුරු පනතේ 3 වගන්තිය ප්‍රකාරව එකී නිලධාරියා සතුව එම තොරතුරු භාරයේ, සන්තකයේ හෝ පාලනයේ පවතින බවට සැලකිය නොහැකිද? මෙකී අභියාචනයට අදාළව (අග්‍රාමාත්‍යවරයාගේ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනය) අපගේ තීරණය නම් එවැනි ප්‍රකාශන මෙම අභියාචනයේ නම්කර ඇති පොදු අධිකාරිය සතුව පවතින බවත් නම් වශයෙන් එය ජනාධිපති ලේකම් කාර්යාලය හා අභියාචනය මඟින් නම්කර ඇති නම්කළ නිලධාරියා සතුව ඒවා පවතින බවය. මෙය අපට හැඟීයන පරිදි අදාළ තොරතුරු යම් ආයතනයක් සතුව පවතින අවස්ථාවක් වන අතර එය තොරතුරු පනතේ 3 වගන්තියෙන් දක්වා ඇති භාරයේ, භුක්තියේ හෝ පාලනයේ යන අවශ්‍යතා සපුරාලනු ලබයි.

ජනාධිපතිවරයා සතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී ඇති සියලු බලතල, වගකීම් හා යුතුකම් පවතිනුයේ ඔහු ජනාධිපතිවරයෙකු ලෙස කටයුතු කරනු ලබන නිලය තුළය. එය ඔහු මෛත්‍රීපාල සිරිසේන ලෙස කටයුතු කරන පුද්ගල හෝ පෞද්ගලික තත්වයෙන් රඳා නොපවතිනු ඇත. එබැවින් මෙම අවස්ථාවේදී වූවද වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනයක් ජනාධිපතිවරයා වෙත ලබාදී ඇති විට එය ඔහුවෙත ලබා දී ඇත්තේ ඔහුගේ නිලයට වන අතර එයට හේතුව වන්නේ ඔහු ජනාධිපති ධූරය දැරීමය. ඒ අනුව මෛත්‍රීපාල සිරිසේන යන පුද්ගලයා තවදුරටත් ජනාධිපතිවරයා ලෙස කටයුතු කිරීම අත්හිටවනු ලබන විටක එකී තොරතුරු ඔහු සමඟ ඔහුට ගෙනයා නොහැකිය.

තවද, භාරය, භුක්තිය හා පාලනය යන කරුණුවලට අදාළව ඒවා ජනාධිපතිවරයා යන නිලය තුළ පවතින අතර අදාළ නිලය දරන පුද්ගලයා එහිදී අදාළ නොවේ. ජනාධිපති ලේකම් කාර්යාලීය වෙබ් අඩවියේ දක්වා ඇති ආකාරයට එය ජනාධිපතිවරයාගේ බලයන්, වගකීම් හා කාර්යයන් ඉටු කිරීමට අදාළව පරිපාලන හා ආයතනික ව්‍යූහයක් සකසා දෙනබව දක්වයි. එමනිසා යම් තොරතුරක් ජනාධිපතිවරය සතුව නිලබලය යටතේ නෛතිකව භුක්තියේ, භාරයේ හෝ පාලනයේ පවතින විටක එය ජනාධිපති ලේකම් කාර්යාලයේ භෞතිකව පවතින බවට සැළකිය හැකි අතර එමඟින් අදාළ තොරතුරු ආයතනයක් සතුව පවතින බව වඩාත් තහවුරු කෙරේ.

## කථානායකවරයාගේ තීන්දුව

2017.02.27 දින කථානායකවරයා විසින් ලබාදුන් තීන්දුව ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ වත්කම් හ වගකීම් පිළිබඳ තොරතුරු නිකුත් කරනු ලබනුයේ DALL යටතේ වන අතර එය 2018.06.26 දින කොමිෂන් සභාව වෙත ඔවුන් ලබාදුන් නියෝගයක් හරහා ලබාදෙන ලදි.

පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා විසින් කථානායකවරයාගේ අදාළ තීරණය තොරතුරු ලබා නොදීමට හේතුවක් ලෙස දක්වා තිබුණද (2017.03.06 දින ප්‍රතිචාරය), 2018.03.20 දින නම්කළ නිලධාරියා විසින් ලබාදුන් ප්‍රතිචාරයෙහි (කථානායකවරයා විසින් 2018.02.27 දින තීන්දුව ලබාදීමෙන් පසුව) එකී කථානායකවරයාගේ තීන්දුව කෙරෙහි අවධානය නොදක්වා තිබූ අතර ඒ වෙනුවට පනතේ 5(1)(අ) හා (උ) යන වගන්ති තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට අදාළව පෙන්වා දී ඇත. නම්කළ නිලධාරියා විසින් තොරතුරු ප්‍රතික්ෂේප කිරීම වෙනත් පදනමක් මත සිදුකර තිබුණද යහපත් නියෝගයක් ලබා දීමට දෙපාර්ශ්වයේම සාධාරණත්වයන් සළකා බලා නම්කළ නිළධාරියා විසින් මුලදී මතු කිරීමට අපොහොසත් වූ කරුණක් වූ මෙකී කථානායකවරයාගේ තීන්දුව ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයා වෙත මතු කිරීමට තොරතුරු පනතේ 5(1) යටතේ අවස්ථාව සළසා දුණි.

තවද, කථානයාකවරයාගේ තීරණය දක්වමින් රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා තොරතුරු පනතේ 3(2) වගන්තියද (පනත පාර්ලිමේන්තුවේ බලයන්, පරිචයන් හා වරප්‍රසාදයන්වලට අනනුකූලව කටයුතු නොකරන බව) පනතේ 5(1)(ඔ) වගන්තියේ, පාර්ලිමේන්තුවේ සහ පළාත් සභා වරප්‍රසාද කඩකිරීමක් වන විට තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සාධාරණීකරණයට යොදාගන්නා ලදි.

මීට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තු සාමාජිකයින්ගේ වරප්‍රසාද, විනිර්මුක්තීන් හා බලයන් අධිකරණමය භාජනයට ලක් කිරීම සම්බන්ධයෙන් ඒවා නොමැති බව දැක්වීම හා ස්ථාවර නියෝග 142 යටතේ ස්ථාවර නියෝගයන් පාර්ලිමේන්තුවේ කථානායකවරයා විටින් විට වෙනස් කරන ආකාරයට යොදාගත හැකිය යන්න පිළිබඳවද අවධානය යොමුකරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවල සමස්ථය සළකා බැලූවිට කථානායකවරයාගේ තීන්දුව මඟින් පනතේ 5(1)(ඔ) වගන්තිය ප්‍රකාරව

අදාළ තොරතුරු පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝණය කිරීමක් වන බවට දක්වා තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි බවට තර්කයක් විය.

පොදු අධිකාරියෙහි මෙකී රඳා පැවතීම ගැන කරුණු සළකා බලන විට අපට පෙනී යන්නේ පනතේ 4(ආ) වගන්තිය ප්‍රකාරව "4(1) මඟින් දක්වා නොමැති පුද්ගලයින්" ඔවුන්ගේ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශයන් කථානායකවරයා වෙත ලබාදිය යුතු බවය. "දක්වා නොමැති පුද්ගලයින්" යන වචනයේ යෙදීම තුළ කැබිනට් අමාත්‍යවරු අදාළ තොරතුරු ජනාධිපතිවරයා වෙත ලබාදිය යුතු බවය. වෙනත් ආකාරයකට දක්වන්නේ නම් ඉහත තර්කනය හා එකඟ වූවද කථානායකවරයාගේ අධිකාරය බලාත්මක වනුයේ අදාළ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන තමා වෙත යොමුකරන පුද්ගලයින්ට මිස ජනාධිපතිවරයා වෙත යොමුකරන පුද්ගලයින්ට නොවේ. අප මෙය විකාරරූපී අවස්ථාවක් වන අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රකාශන දෙකක් ජනාධිපතිවරයා හා කථානායකවරයා යන දෙදෙනාටම ලබාදුන් අවස්ථාවකදීද සැළකිල්ලට ගත යුතුය. ඒ අනුව, කථානායකවරයා විසින් ලබාදුන් තීන්දුව අග්‍රාමාත්‍යවරයාට අදාළ නොවන අතර ඊට හේතුව නම් ඔහුගේ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනය DALL 4(අ)(ii) අනුව ජනාධිපතිවරයාට සිදු කිරීමය. එමනිසා පොදු අධිකාරිය විසින් එකී කථානායකවරයාගේ තීන්දුව මත රැඳී ක්‍රියා කිරීම නීතිය ප්‍රකාරව නොමග යාමකි.

ඉහත කථානායකවරයගේ තීරණය අනුව DALL පනතේ 4(ආ) ප්‍රකාරව එවැනි වත්කම් හා වගකීම් ප්‍රකාශන ලබාදීම බැහැර කළ හැකි වේද යන්න කොමිෂන් සභාව විසින් උචිත අවස්ථාවකදී තීරණය කළ යුතුය.

**පනතේ 5(1)(අ) මත රඳා පැවැත්ම**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම හා පෞද්ගලිකත්වයේ අයිතිය අතර ගැටුමක් ඇතිවන විට තීරණාත්මක සාධකය වනුයේ මහජන සුභසිද්ධිය යන්නයි. ඒ අනුව ප්‍රශ්නය වනුයේ අග්‍රාමාත්‍යවරයා වැනි ඉහළ නිලධාරියෙකුගේ තොරතුරු හෙළිදරව් කිරීමෙන් මහජනයාට සුභසෙතක් වේද යන්නයි.

ප්‍රේමලාල් අබේසේකර එ. අධ්‍යාපන ඇමති (2018.04.20 දින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ වාර්තා වූ) යන තීරණයේදී කොමිෂන් සභාව විසින් තීරණය කළේ ඡන්දයෙන් තෝරා පත්වන මහජන නිලධාරීන් හා එසේ නොවන නිලධාරීන් අතර වෙනසක් ඇතිකළ යුතු බවත් ඡන්දයෙන් තෝරා පත්වන නිලධාරීන් ඉහළ මහජන පරීක්ෂණයකට ලක්විය යුතු බවත් එම තත්වයම ඡන්දයෙන් තේරී පත්නොවන නිලධාරීන්ටද අදාළ කරගත යුතු නමුත් එහිදී වඩාත් ප්‍රවේශම් වියයුතු බවය. ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය 2002 දී තීරණය කළ *ඉන්දියානු සංගමය එ. වගඋත්තරකරුඃ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ සඳහා සංසදය හා තවත් අය; සමග සිවිල් නිදහස සඳහා ජනතා සංගමය හා තවත් අය එ. ඉන්දියානු සංගමය හා තවත් අය,* (2 May, 2002, 2002 AIR 2112; 2002 (3) SCR 294) යන නඩු තීන්දු ප්‍රකාරව වත්කම් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම හා සම්බන්ධයෙන් පවතින ඉතා දෘඪ වගකීම කිසිඳු ව්‍යතිරේකයකට යටත් නොවී මහජන ඡන්දයෙන් තේරීපත්වන නිලධාරීන්ට (දේශපාලනඥයින්ට) විනිවිදභාවය ආරක්ෂා කිරීමට අදාළවන බව පෙන්වා දෙන ලදි.

මෙහිදී, (2005 දී ඉන්දීය තොරතුරු පනත පැනවීමට පෙර තීරණය කරන ලද) අධිකරණය විසින් ඡන්දයෙන් තේරීපත් වූ නිලධාරීන්ට ඔවුන්ගේ සියලුම චංචල හා නිශ්චල දේපළ පිළිබඳවත් ඔවුන්ගේ කලත්‍රයන්ගේ හා යැපෙන්නන්ගේ මෙකී තොරතුරුද, රාජ්‍ය අංශයේ බැංකුවලින් ලබාගත් ණය පිළිබඳ තොරතුරුද විදුලිය, ජලය හා දුරකතන වැනි උපයෝගිතා සේවා සඳහා මෙතෙක් ගෙවා නැති බිල්පත් පිළිබඳ තොරතුරු සැපයීමටත් ඒ පිළිබඳව දිව්රුමක් ලබාදීමටත් නියෝග කරන ලදි.

වගඋත්තරකරුවන් දක්වා සිටින ආකාරයට මෙවැනි ප්‍රකාශන සම්බන්ධයෙන් ඉතා දෘඪ වූ පෞද්ගලිකත්වයේ අයිතිය හා බැඳුණු කරුණු පවතින බවත් තොරතුරු හෙළිදරව් කළ හැක්කේ ඉතා සීමිත අවස්ථාවන්වලදී පමණක් යන්නත් DALL සළකා බලන විට පිළිගත නොහැකිය. DALL මඟින් 5(3) වගන්තිය යටතේ ලබාගත් තොරතුරු සන්නිවේදනය කිරීම පිළිබඳව සීමා දක්වා තිබුණද පුද්ගලයින්ට මෙකී ප්‍රකාශන අදාළ ගාස්තු ගෙවා ලබාගත හැකිය. එමඟින්ම පෙනී

යන්නේ, පරිපූර්ණ ලෙස මෙකී තොරතුරු මහජනයාගෙන් ඉවත්කර තැබීම මෙකී නීතියෙන් බලාපොරොත්තු වූ කරුණක් නොවන බවය.

එසේ වුවද, මෙම කොමිෂන් සභාව මඟින් තොරතුරු පනතේ මූලධර්ම භාවිත කළයුතු අතර එම පනත පමණක් අදාළ කරගත යුතුය. DALL හා තොරතුරු පනත යන දෙකෙන්ම පොදුවේ අරමුණු කරගත්තේ මහජන වගවීම වුවද මෙකී පනත් දෙක එකී අරමුණු ළඟා කරගන්නේ වෙනස්ම මාර්ග වලිනි. එහිදී තොරතුරු පනතේ ඇති උපරිම හෙළිදරව් කිරීමේ මූලධර්මය හා ලබාගත් තොරතුරු බාධාවකින් තොරව සන්නිවේදනය කිරීමේ හැකියාව විශේෂයෙන්ම කැපී පෙනෙයි. වඩාත් ප්‍රචලිත "*generalia specialibus non derogant*" ආප්තය මඟින් දක්වා සිටින්නේ පසුව පැනවූ සාමාන්‍ය නීතියකින් පෙර පැවති විශේෂ නීතියක් අවලංගු කළ නොහැකිය යන්නය. කෙසේ හෝ මෙය පරම රීතියක් නොවේ. *දේශීය ආදායම් කොමසාරිස් එ. වුඩ්ලන්ඩ් රබර් හා තේ සමාගම* (S.C. 3/66-Income Tax Case Stated, BRA/333) යන නඩුවේදී අධිකරණය ප්‍රකාශ කළේ මෙකී ආප්තය පූර්ව නිගමනයක් වන බවත් එය නීතියේ රීතියක් නොවන බවත්ය. එයට හේතුව නම් ශ්‍රී ලංකාවේ කිසිඳු පාර්ලිමේන්තුවකට අනාගත පාර්ලිමේන්තුවක් බැඳ තැබීමට නොහැකි බවය. සත්‍ය ලෙසම පසුව පනවන ලද සාමාන්‍ය නීතියක් මඟින් පෙර පැනවූ විශේෂ නීතියක් අභිබවා යා හැකි බව *ලංකා පොල් නිෂ්පාදන සමූපාකාර සමිතිය එ. සී. ජයකොඩි* (S. C. 14 of 1960-Labour Tribunal Case No. 2/1915) යන නඩුවේදී පෙන්වා දී ඇත;

> "ව්‍යවස්ථාදායකයක් පසුව පැනවූ සාමාන්‍ය නීතියකින් විශේෂිත නීතියක ප්‍රතිපාදන වෙනස් කිරීමට බලාපොරොත්තු නොවන බව උපකල්පනය කරයි. කෙසේ නමුත්, පනතේ වචන තුළ එවැනි චේතනාවක් තිබේ නම් හෝ ව්‍යවස්ථාදායකය අදාළ විශේෂිත ප්‍රතිපාදනය කෙරෙහි අවධානය යොමුකළ බවට කරුණු ඇති විට හා සාමාන්‍ය නීතිය මඟින් විශේෂිත නීතියෙහි දැක් වූ අවස්ථාවක් කෙරෙහි අවධානයක් යොමුකර ඇත්නම් හෝ සාමාන්‍ය නීතියේ එන ප්‍රතිපාදන ප්‍රකාරව විශේෂ නීතියට යම් අවස්ථාවක් ලබාදීමට සිතූ බව දැකගත නොහැකි නම් උපකල්පනය අදාළ නොවේ." (අවධාරණයන් එක්කර ඇත).

*අජෝ කුමාර් බැනර්ජි එ. ඉන්දියානු සංගමය* (1984 3 SCC 127, 153) යන නඩුවද මෙකී කරුණට අදාළ වන අතර එහිදී පෙන්වා දුන්නේ,

"පහත සඳහන් කොන්දේසීන් සපුරාලනු ලබයි නම් පෙර තිබූ විශේෂ නීතියක් පසුව එන සාමාන්‍ය නීතියකට යටත් වේ.

(i) අදාළ නීති දෙක එකිනෙකට නොගැළපීම.

(ii) පසුව ගෙන එනු ලැබූ පනතෙහි පෙර පනත පිළිබඳව පැහැදිලි සඳහනක් තිබීම.

ඉහත කී කොන්දේසිවලින් එකක් හෝ ඉටු වේ නම් පසුවට එන නීතිය සාමාන්‍ය නීතියක් වූවද එය බලාත්මක වේ."

මෙකී තත්වය අර්ථනිරූපණ මූලධර්මවල එන *leges posteriores priores contrarias abrogant*, මඟින්ද සනාථ කරයි. එයින් ප්‍රකාශ කරන්නේ යම් අවස්ථාවක නව නීතියක් හා පැරණි නීතියක් අතර එකම කරුණ හෝ සමාන කරුණු පිළිබඳව ගැටීමක් ඇතිවන විට පසුවට පනවන ලද නීතිය බලාත්මක වන බවත් ගැටුමට මැදිවන පෙර නීතියේ කොටස් බලරහිත වන බවයි. *රණවනගෙදර මුදියන්සේ එ. මහනුවර මහා නගර සභාව* (7 NLR 167) නඩුවේදී පෙන්වා දුන් ආකාරයට (උපුටා දක්වමින් 1 L. R. Q. B., 1892, 658, *වෙස්ට් හැම්හි පල්ලිවල පූජකයින් එ. සිව්වන නගර අන්‍යෝන්‍ය ගොඩනැගීමේ සංගමය)*

> "ව්‍යංග ලෙස යම් පනතක් සංශෝධනය වී තිබේද යන්න තීරණය කරන පරීක්ෂණය නම්: පසුවට ගෙන එන ලද පනත කලින් පනත හා සසඳන කළ එහි ඇති නොගැළපෙන හා ගැටෙන සුළු බව නිසා පනත් දෙකට එකවිට පැවැත්මක් නොමැතිද? එසේ වේ නම් leges posteriores contrarias abrogant යන ආප්තය අදාළ වේ."

ඉන්දීය නඩුවක් වන *එම්.ආර්. මිස්‍රා එ. ඉන්දීය ශේෂ්ඨාධිකරණය,* (CIC/SM/A/2011/000237/SG) හිදී අධිකරණය විසින් තොරතුරු පනත හා ගැටෙන නීතින් පිළිබඳව සළකා බලන ලදි.

"යම් නීතියක තොරතුරු ලබාදීම හා යම් නොගැළපීමක් පවතී නම් එවැනි නීතියක් තොරතුරු පනත මඟින් ඉවත් කරනු ලබයි. තොරතුරු පනතේ 22 වගන්තිය මඟින් බාධාවිරහිත නැතිනම් 'වෙනත් පනතක කුමක් දැක්වූවද' ලෙස යෙදීම හරහා පාර්ලිමේන්තුව විසින් තොරතුරු දැනගැනීමට ඇති මූලික අයිතිය ආරක්ෂා කිරීමට විමසිලිමත්ව කටයුතු කර ඇත. තොරතුරු නිලධාරියා වෙත තොරතුරු සඳහා ඉල්ලීමක් ලැබී ඇත්නම් තොරතුරු ලබාදිය යුත්තේ තොරතුරු පනතට අදාළව වන අතර තොරතුරු ප්‍රතික්ෂේප කරයි නම් එය සිදුකළ යුත්තේ තොරතුරු පනතේ 8 හා 9 යන වගන්තීන්ට අනුව පමණි."

ඉහත කරුණු අනුව කොමිෂන් සභාවට අවස්ථාවන් දෙකක් උපකල්පනය කළ හැකිය.

1. කලින් පවතින නීතියක හෝ රීතියක තොරතුරු ලබා ගැනීම සඳහා වන ප්‍රතිපාදනයන් තොරතුරු පනත හා නොගැටෙන විටක; මෙහිදී කිසිඳු ගැටීමක් නොමැති බැවින් පුරවැසියෙකුට තොරතුරු පනත යටතේ හෝ අදාළ වෙනත් නීතිය හෝ රීතිය යටතේ හෝ තොරතුරු අයැද සිටිය හැකිය. යම් හෙයකින් තොරතුරු නිලධාරියා හට තොරතුරු පනත යටතේ තොරතුරු අයැදීමක් කර ඇත්නම් තොරතුරු පනතේ ප්‍රතිපාදන අනුව තොරතුරු ලබාදීම සිදුකළ යුතු අතර තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරයි නම් එය පනතේ 8 හා 9 වගන්තීන්ට අනුව කළ යුතුය; හා
2. කලින් පවතින නීතියක හෝ රීතියක තොරතුරු දැනගැනීමේ ප්‍රතිපාදනයන් තොරතුරු පනත හා නොගැළපෙන විටඃ යම් හෙයකින් තොරතුරු පනත හා වෙනත් නීතියක හෝ රීතියක ප්‍රතිපාදන එකිනෙකට ගැටේ නම් තොරතුරු පනතේ 22 වගන්තියට අනුව තොරතුරු පනත බලාත්මක වන අතර තොරතුරු නිලධාරියා ලබාදිය යුත්තේ තොරතුරු පනත ප්‍රකාරව පමණි."

ඉහත සඳහන් තර්කනයන් ශ්‍රී ලංකාවේ තොරතුරු පනතට එලෙසින්ම අදාළ වන බවට පිළිගනිමු. නැතිනම්, මෙකී අභියාචනය විමර්ශනය කරන අතරතුර කොමිෂන් සභාවට පෙනීගිය ආකාරයට, (2018.10.31 වන දින වාර්තාව ප්‍රකාරව), විශේෂ නීතින්හි පවතින

ප්‍රතිපාදනවලට තොරතුරු පනතේ ඇති ප්‍රතිපාදන අතික්‍රමණයට ඉඩදීම මඟින් අවසානයේදී තොරතුරු පනත නිරර්ථකභාවයට පත් වේ. මෙකී කරුණ කෙරෙහි අප අත්‍යන්තයෙන්ම අවධානය යොමුකළ යුතුය.

ඒ අනුව අපගේ මතය වනුයේ ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත ග්‍රන්ථ වෙත 2016 ගෙන එනු ලැබූ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ ගැබ් වී ඇති නූතන අරමුණ වන අක්‍රමිකතා මැඩපවත්වමින් වගවීම හා යහපාලනය දිරිමත් කිරීම (බලන්න තොරතුරු පනතේ පූර්විකාව) යන්න DALL පනතේ 8(1) වගන්තියද එකම අවස්ථාවේ වලංගුව පවතින බවට දැක්වීමෙන් ළඟාකරගත නොහැකි බවය. මෙකී තත්වයට මුහුණදීම සඳහා තොරතුරු පනතේ 4 වගන්තිය දක්වන්නේ "වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතුය." මෙය generalia specialibus non derogant ආප්තයට එන ව්‍යතිරේකයක් වන "සාමාන්‍ය පනතේ දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව විශේෂ පනතට ව්‍යතිරේකයක් සපයන බව සිතීමට නොහැකි විට" යටතේ අදාළ නොවන බවය. (ඉහතින් පෙන්වා දුන් *ලංකා පොල් නිෂ්පාදන සමූපාකාර සමිතිය එ. සී. ජයකොඩි)*

පනතේ 4 වගන්තිය සාධාරණ ලෙස අදාළ කරගැනීම වැදගත්වන අතර එයට හේතුව නම් තොරතුරු දැනගනීමේ පනත මඟින් "විනිවිදභාවය හා වගවීමේ සංස්කෘතියක්" ඇති කිරීම පනතින් අරමුණු කරන නිසාය. (බලන්න පනතේ පූර්විකාව). පාර්ලිමේන්තුව විසින් වත්කම් ප්‍රකාශනයන් තොරතුරු පනතේ ක්‍රියාදාමයෙන් බැහැර කිරීමට අදහස් කළේ නම් එය පනතේ 5 වගන්තියේ පැහැදිලි ලෙසම දැක්වීමට ඉඩ තිබිණි. කෙසේ හෝ එවැන්නක් දැකිය නොහැකිය. එවැනි අවස්ථාවක කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාදායකයේ චේතනාව නිසිලෙස සළකාබැලිය යුතුය.

මෙහිදී වගඋත්තරකරුවන් විසින් තර්ක කරන ආකාරයට පවත්නා නීතිය මඟින් අක්‍රමිකතාවයන් වළක්වාලමින් පැහැදිලි කිරීමකට ලක් නොකළ ධනය එක් රැස් කර ගැනීම්වලට අදාළව තේරීපත්වන මහජන නියෝජිතයින්ගේ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශන හරහා ඔවුන්ව පරීක්ෂාවට ලක් කිරීමට හැකි බවත් ඒ සඳහා තොරතුරු පනතේ

ප්‍රතිපාදන අනවශ්‍ය බව පිළිගත නොහැකි කරුණකි. DALL වැනි පවත්නා නීතිවල වැදගත්භාවය මතු වනුයේ පුද්ගලයින්ගේ අක්‍රමිකතා පිළිබඳව පැමිණිලි ලැබෙන විටක හෝ ඒවා අහඹුවෙන් සොයාගනු ලබන අවස්ථාවන්වලදීය. පරිචයන්ට අනුව මේවා සිදුවන්නේ තෝරාගත් අවස්ථාවන්වලදී පමණි. කෙසේනමුත් තොරතුරු පනත හරහා අනාගතයේ ඇතිවිය හැකි අක්‍රමිකතා පිළිබඳව වුවද පුළුල් විමර්ශනයකට ලක්කළ හැකි අතර එමගින් පොදු දේපළ එක් රැස් කරගන්නන් අධෛර්යයට පත්කළ හැකිය.

පනතේ 5(1)(අ) වගන්තිය තොරතුරු බැහැර කිරීමට යොදාගන්නා විට පොදු මහජන සුභසිද්ධිය යන්න අදාළ වගන්තියේ ඇති ව්‍යතිරේකවල දක්වා තිබීම වැදගත් කරුණකි. පනතේ 5(1)(අ) වගන්තිය සළකන විට මෙම කරුණට අදාළව පවතින මහජන සුභසිද්ධිය යන්න පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය යන්නට වඩා වැදගත් වන බව පැහැදිලිව පෙනී යයි. කෙසේවුවද, පනතේ 5(4) වගන්තිය මගින් දක්වා ඇති පොදු මහජන උන්නතිය යන කරුණ මෙකී තොරතුරු නිදහස් කිරීමට අදාළව බලපාන බව සැළකිය හැකිය.

පනතේ 5(1)(උ) මත රඳා පැවත්ම

පොදු අධිකාරිය විසින් පනතේ 5(1)(උ) හි එන විශ්වසීනයත්වයේ වගකීම යන කරුණ තොරතුරු ලබා නොදීමට හේතුවක් ලෙස දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන කෙරෙහි සළකා බලන විට (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි ප්‍රතිපාදන අනුව) අග්‍රාමාත්‍යවරයා, ජනාධිපතිවරයා සමඟ විශ්වසනීයත්වයේ බැඳියාවකින් නොසිටින බව පැහැදිලි වේ. මෙම අභියාචනය විභාගකරන අතරතුරදී වග උත්තරකරුවන් තර්ක කරසිටියේ ජනාධිපති ලේකම්වරයා විසින් රඳවාගෙන තිබූ තොරතුරුව රහසිගතව තබාගැනීමේ විශ්වසනීයත්වයේ බැඳියාවක් පවතින බවත් එය ජනාධිපතිවරයා විසින් සිදුකළ යුතු බවත් තවද, DALL හි 8(1) දක්වන රහස්‍යභාවය යන්න තොරතුරු පනතේ 5(1)(උ) මගින්ද අන්තර්ග්‍රහණය කරන බවය.

*ඉන්දියානු සංචිත බැංකුව එ. ජයන්තිලාල් එන්. මිස්ට්‍රි* (2015.12.16) යන ඉන්දීය නඩුවේදී විශ්වසනීයත්වයේ බැඳියාව හටගනු ලබන සම්බන්ධතාවයන් කවරේද යන්න පහත පරිදි විස්තර කරදෙන ලදි.

(1) එක් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකුගේ ඒකාග්‍රතාවය මත විශ්වාසය තබන විට එහි ප්‍රතිඵලයක් ලෙස දෙවන පුද්ගලයා පළමු පුද්ගලයා සම්බන්ධව යම් බලපෑමක් හෝ යම් ඉහළ තලයක් හෝ ලබා ගන්නා විටක,

(2) එක් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙකු වෙනුවෙන් පාලනය කිරීම හා වගකීම භාර ගන්නා විට,

(3) එක් පුද්ගලයෙක් මත අනෙක් පුද්ගලයා වෙනුවෙන් කටයුතු කිරීමට හෝ, ඔවුන් දෙදෙනාගේ සබඳතාවයේ වපසරිය මත කටයුතු කිරීමට වන විට (උදාඃ නීතිඥයෙකු හා සේවාදායකයෙකු අතර සබඳතාවය)

(4) සාම්ප්‍රදායික ලෙස අදාළ විශේෂිත සබඳතාවය මත දෙපාර්ශ්වය අතර විශ්වසනීයත්වයේ බැඳියාවක් පවතින බවට සළකන විට (වෛද්‍යවරයා හා රෝගියා අතර සබඳතාවය, උදාහරණයක් ලෙස නීතිඥයෙකු හා සේවාදායකයෙකු අතර හෝ කොටස් තැරැව්කරුවෙකු හා පාරිභෝගිකයෙකු අතර)

ඉහත සියලුම කරුණු අනුව පැහැදිලි වන්නේ ජනාධිපති ලේකම්වරයා (නම්කළ නිලධාරියා) හා ජනාධිපතිවරයා අතර කිසිඳු විශ්වසනීයත්වයේ වගකීමක් හට නොගන්නා බවය. සත්‍ය ලෙසම කොමිෂන් සභාව විසින් ඉහළ නිලධාරියෙකු හා ඔහුගේ අනුගාමිකයෙකු අතර විශ්වසනීයත්වයේ බැඳියාවක් හටගන්නා බවට තීරණය කරයි නම් අනුගාමිකයා සතුව පවතින තොරතුරු පරිපාලනමය හේතු උදෙසා මෙය සිදුවන බවට දක්වයි නම් තොරතුරු පනතේ අරමුණු ව්‍යර්ථ වී යන අතර උදාහරණ ලෙස මෙකී ව්‍යතිරේකය අමාත්‍යවරයෙකුගේ ලේකම්වරයෙකුට, අදාළ අමාත්‍යවරයාට අදාළව යොදාගත හැකිය.

පනතේ 5(3) වගන්තිය ප්‍රකාරව වත්කම් හ වගකීම් පිළිබඳ ප්‍රකාශන පොදු අධිකාරියකට නියමිත ගාස්තු ගෙවා පුරවැසියන්ට ලබාගත හැකි අවස්ථාවක මෙකී තොරතුරුම විශ්වසනීයත්වයේ යුතුකමක් නිසා තොරතුරු පනත යටතේ ජනාධිපතිවරයාගේ ලේකම් විසින් ලබාදීම තහනම් කරන බව පිළිගැනීම සාධාරණීකරණය කළ නොහැකිය. ඒ අනුව අප තීරණය කරනුයේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට පනතේ

5(1)(උ) අදාළ නොවන බවය. ඉන්දීය මධ්‍යම තොරතුරු කොමිසමේ තීරණයක් වූ *එස් සී අග්‍රවාල් එ. අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාල* නඩුව (Appeal No. CIC/WB/A/2009/00038 & WB/C/08/868 dated 7-2-09 & 25-8-2008) හිදී දැක්වූයේ කැබිනට් අමාත්‍යවරුන්ගේ වත්කම් පිළිබඳ ප්‍රකාශන අග්‍රාමාත්‍ය කාර්යාලයට ලබාදීම හා වූ සිද්ධිය මෙකී අභියාචනයටද උචිත බවය;

> "අදාළ තොරතුරු අග්‍රාමාත්‍ය කාර්යාලයට භාරදීමේදී විශ්වසනීයත්වයේ බැඳියාවක් ඇති බවට ප්‍රකාශ කිරීම, එකී වාර්තා කුමන අවස්ථාවකදී හෝ නීතිය ප්‍රකාරව මැතිවරණයකදී ඉන්දියාවේ මැතිවරණ කොමසාරිස්වරයාට ලබාදිය යුතු නිසා එය සාධාරණ තර්කයක් බවට පිළිගත නොහැකිය."

## නිගමනය

ඒ අනුව පෙතියන්නේ පොදු අධිකාරිය විසින් පෙන්වා දුන් කිසිඳු ව්‍යතිරේකයක් අදාළ නොවන බවය.

තොරතුරු පනතේ 6 වන වගන්තිය මඟින් පොදු අධිකාරියකට එයට සිතෙන ආකාරයට තොරතුරු සංස්කරණය කළ හැකිය. කොමිෂන් සභාව හමුවේ අභියාචකයින් විශේෂයෙන්ම සඳහන් කරන ලද්දේ තමාට අග්‍රාමාත්‍යවරයාගේ වත්කම් පිළිබඳ තොරතුරු පමණක් දැනගැනීම ප්‍රමාණවත් වන බවත් එම ප්‍රකාශනයේ ඇති වෙනත් කරුණු 6 වන වගන්තිය යටතේ සංස්කරණය කර ලබාදිය හැකි බවත්ය. මෙයට අදාළව වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ආකාරයට එමඟින් අයැද සිටින තොරතුරුවල ස්වභාවය මූලිකවම වෙනස්කරන බවට වූ තර්කය හරයකින් තොර බවය. එය යම් ආකාරයකින් පිළිගනු ලැබුවේ නම් හා අප හමුවේ ඇති නොයෙකුත් අභියාචන සළකා බැලීමේදී (උදා: 2018.06.12 දින ලබාදුන් ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය එ. ශ්‍රී ලංකා ගුවන් සේවය) තොරතුරු වෙන්කිරීමේ ගැටලුව කොමිෂන් සභාව මත ඇතිවන්නක් වන අතර ඒ අනුව පනත යටතේ කුමන තොරතුරු අනාවරණය කරයිද? නොකරයිද? යන්න තීරණය කරයි නම් ඒ හරහා අභියාචනා සළකා බලීමේ ක්‍රියාදාමය තදබල ලෙස සීමාවනු ඇත.

පනතේ 6 වන වගන්තිය මඟින් ප්‍රමාණාත්මක ලෙස තෝරාපත් කරනු ලබන පොදු නිළධාරීන්ගේ අයැද සිටිනු ලබන වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනවල පෞද්ගලිකත්වය ආරක්ෂා වනු ඇති අතර පොදු අධිකාරිය විසින් අභියාචක වෙත අග්‍රාමාත්‍යවරයාගේ එකී ප්‍රකාශනයේ අයැද සිටින ලද උද්ධෘතයන් 2015 හා 2016 යන වර්ෂවලට එම ප්‍රකාශනයේ ඇති අනෙකුත් කොටස් සංස්කරණය කර ලබාදෙන ලෙසට නියෝග කරනු ලබයි. පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු කොටස් කරලීම මෙකී අභියාචනය යටතේ අභියාචකගේ ඉල්ලීම අනුව සිදුකරනු ලබන්නක් වන අතර අනාගතයේ මේ හා සමාන අභියාචනාවලදී එය සාමාන්‍ය මූලධර්මයක් ලෙස යොදගනු ඇති බවට එමඟින් ගම්‍ය නොවිය යුතුය.

අවසානාත්මකව, පොදු අධිකාරිය විසින් අදාළ තොරතුරු අයැද සිටීමේදී අභියාචක විසින් අදාළ අයැද සිටි තොරතුරු පුද්ගලයෙකුගේ අයිතියක් ආරක්ෂා කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට අයැද සිටින බව පෙන්වීමට අපොහොසත් වීම අතිරේකව අයැද සිටින කරුණක් බවත් එය පනතේ 5(1) යටතේ එන ව්‍යතිරේකයන්ට අදාළව තොරතුරු බැහැර කිරීම සඳහා ව්‍යාතිරේකයක් ලෙස යොදාගත නොහැකි බවත්ය.

**(2) මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ වර්ෂ 2015 හා 2016 යන වර්ෂවලට අදාළ වත්කම් හා වගකීම් පිළිබඳ සහතික කළ පිටපත් පිළිබඳව.**

ඉහතින් පෙන්වා දුන් ආකාරයට DALL මඟින් සිය වත්කම් හා වගකීම් හෙළිදරව් කළයුතු පුද්ගල කාණ්ඩ හා විස්තර දක්වා සිටී.මෙකී කාණ්ඩය තුළ ජනාධිපතිවරයා විසින් ඔහුගේ තත්වය මත අදාළ තොරතුරු ලබාදීමේ වගකීමෙන් ඉවත් කරනු ලබයි. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයෙකු මෙලෙස තොරතුරු සැපයීමට බැඳී ඇත්තේ ඔහු/ඇය ජනාධිපති අපේක්ෂකයෙකු ලෙස තරඟවදින විටය. එවැනි පුද්ගලයෙකු ජනාධිපති ලෙස තේරිපත් වූ විට ධූරය දරන තාක්කල් එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් මුක්තිය ලබයි.

ඒ අනුව අප වග උත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටින රජයේ නීති නිලධාරීන් ගෙනහැර දක්වන තර්කය වන 4(a)(ii) ජනාධිපතිවරයා 2015.01.09 දින සිය ධූරය භාරගත් පසුව අදාළ නොවන බව පිළිගත යුතුය.

අභියාචක විසින් කොමිෂන් සභාව හමුවේ කරන ලද අභියාචනයේ දැක්වූයේ අදාළ තොරතුරු මැතිවරණ කොමසාරිස්වරයා සතුවිය යුතු බවත් එයට හේතුව නම් ජනාධිපතිවරයා විසින් පිළිගත් දේශපාලන පක්ෂයක සාමාජිකයෙකු වන නිසා එකී තොරතුරු හෙළිදරව් කළයුතු බවත්ය. මෙහිදී තොරතුරු දැනගැනීමේ 4 වන රෙගුලාසියේ 6 වන වගන්තිය අනුව (2017.2.03 දින අංක 2004/66 ලෙස ගැසට් කරන ලද)

> "අදාළ අයැද සිටින ලද තොරතුරු වෙනත් පොදු අධිකාරියක් සතුව පවතින බවට තොරතුරු නිලධාරියා කරුණු දන්නේ නම් ඒ බව ලිඛිතව අදාළ තොරතුරු පවතින අධිකාරිය වෙත යොමුකළ යුතු අතර ඒ බව අදාළ තොරතුරු අයැද සිටින පුරවැසියා හට දින 07ක් ඇතුළත සන්නිවේදනය කළ යුතුය."

කෙසේවෙතත්, මෙය ජනාධිපති අපේක්ෂකයෙකුගේ වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනයකට අදාළ නොවන අතර එය ජනාධිපතිවරයාගේ නැත්නම් 2015 හා 2016 යන වර්ෂවල ජනාධිපති ලෙස කටයුතු කළ පුද්ගලයා සම්බන්ධයෙන් වූ බැවින් එකී නිළධාරියාට අදාළ තොරතුරු රඳවා ගැනීමට හෝ ලබාදීමට වගකීමක් නොමැත. කුමන හෝ අවස්ථාවකදී වූවද එවැනි ලියවිල්ලක් මැතිවරණ කොමසාරිස්වරයාගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති වනු ඇත.

එබැවින්, කිසිඳු නීතියක් මඟින් ජනාධිපතිවරයාට හෝ ජනාධිපති ධූරය දැරූ පුද්ගලයෙකුට තමාගේ වත්කම් හා වගකීම් පිළිබඳව ප්‍රකාශනයක් ලබාදිය යුතු බවට නොදක්වන නිසා අභියාචක විසින් ඉල්ලා සිටින ලද වර්ෂ 2015 හා 2016ට අදාළ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ අදාළ ප්‍රකාශනවල සහතික කළ පිටපත් නීත්‍යානුකූල ලෙස ජනාධිපතිවරයාගේ හෝ වෙනත් පොදු අධිකාරියක හෝ භුක්තියේ, භාරයේ හෝ පාලනයේ තිබිය නොහැකිය.

එය එසේ වූවද, වර්ධනය වෙමින් පවත්නා පරිචයන්ට අනුව විනිවිදභාවය හා පොදු වගවීම යන පරිචයන් දියුණු කරලීම සඳහා රාජ්‍ය නායකයින් සක්‍රීය ලෙස ඔවුන්ගේ වත්කම් හා වගකීම් හෙළිදරව් කිරීම කර ඇත. එමනිසා නීතිය මඟින් ජනාධිපතිවරයාට සිය වත්කම් හා වගකීම් ප්‍රකාශ කිරීමට අවශ්‍යතාවයක් නොදැක්වූවද පවත්නා නීතියට

සංශෝධන එක් කරමින් එසේ සිදුකිරීමට අවශ්‍ය කිරීම පොදු වගවීම හා යහපාලනය යන තොරතුරු පනත මඟින් දක්වන යහපත් සංස්කෘතියක් ඇති කරලීමට එය ඉවහල් වනු ඇත. එමී නීතියේ පවත්නා හිඩැස කඩිනමින් පිරවිය යුත්තකි.

මෙම තොරතුරු කොටසට අදාළව නම්කළ නිලධාරියාගේ තීරණය මින් අනුමත කරනු ලබයි.

# ඩයලොග් ඇක්සියාටා එ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)[16]

'ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන පනත මඟින් සංඛ්‍යාත ධාරාවන් ප්‍රදානයේදී පොදු අධිකාරිය වෙත අභිමතයක් ප්‍රදානය කර තිබෙන බව නිසැක වුවද, (වෙන්දේසිය මඟින් හෝ මෙහිදී සිදු වී ඇති පරිදි පරිපාලන තීරණයක් මඟින්) එබඳු අභිමතයක් විලංගු රහිත එකක් නොව "නීතියට අනුව භාවිතා කළ යුත්තක්" වේ'

**තීරණය:** රජය මගින් පාලනය කරනු ලබන සේවා සැපයුම්කරු වන මොබිටෙල් (පුද්ගලික) සමාගම වෙත සංඛ්‍යාත වෙන් කිරීමේ ශ්‍රේණාවලිය සහ එහිදී නිසි කාර්ය පටිපාටිය අනුගමනය කර තිබේද යන්න හෙළිදරව් කිරීම පිළිබඳ තොරතුරු සැපයීමට පොදු අධිකාරිය අධිකාරිය බැඳී සිටියි.

**මූලික පද:** වාණිජ රහස් (5(1)(ඈ) වගන්තිය/රාජ්‍ය නිළධාරීන්ගේ අභිමතානුසාරී බලය/පොදු යහපත (5(1)(ඈ) වගන්තිය), (5(4) වගන්තිය)

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

අභියාචක විසින් 2017.06.02 වන දින කරනු ලැබූ තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු විමසා තිබුණේය.

1. රජය විසින් පාලනය කරන සේවා සපයන්නෙකු වන මොබිටෙල් (පුද්) සමාගම වෙත මෑතකදී 7.5MHz ක වර්ණාවලියක්/ප්‍රේක්ෂාවලියක් 1800MHz සංඛ්‍යාත පරාසය තුළ ප්‍රදානය කළේද නැතිද යන්න පිළිබඳ තහවුරු කිරීම.
2. එබඳු ප්‍රදානය කිරීමක් සිදු කර ඇත්නම් එකී වෙන් කිරීම සම්බන්ධයෙන් නිසි කාර්ය පටිපාටිය අනුගමනය කර තිබේද සහ, විශේෂයෙන්ම පහත දැක්වෙන කාර්යපටිපාටීන්ගෙන් කිසියම් එකක් හෝ සියල්ල, මෙකී අගනා සහ විරල රාජ්‍ය සම්පත්වල භාරකරු වශයෙන් සිය ධාරිතාව තුළ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අනුගමනය කර තිබේද යන්න.

16 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /09/2018, 2018.03.16 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. නියෝගය 2018.04.03 දින ලබාදෙන ලදි.

අ. ශ්‍රී ලංකා ආණ්ඩුවේ "යහපාලනය" සඳහා කැපවීමට අනුකූල වෙමින් තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් සිදුවූ බවට සාක්ෂි

ආ. විරල රාජ්‍ය සම්පතෙහි වටිනාකමට අදාළව අනුගමනය කළ කාර්ය පටිපාටිය පිළිබඳ සාක්ෂි සහ මේ සම්බන්ධයෙන් දැනට යෙදෙන ගාස්තු පිළිබඳ සාක්ෂි

ඇ. එකී විරල සම්පත සඳහා සිදු කරන ලද ගෙවීම් පිළිබඳ සාක්ෂි

ඈ. එබඳු වර්ණාවලි ප්‍රෙක්ෂාවලි වෙන්කිරීමක් සඳහා පහත දැක්වෙන වෙනත් කරුණු අතර සේවා සපයන්නන්ගේ සාධනීයත්වය ඇගයීම සඳහා අනුගමනය කළ නිසි ක්‍රියාදාමය

i. සේවා සපයන්නන් දැනට ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආදායම වෙත දක්වන දායකත්වය, මේ දක්වා සමුච්චිත ආයෝජන සහ තරඟකාරී සේවා සපයන්නන්ගේ ග්‍රාහක පදනම පිළිබඳ ඇගයුම

ii. තරඟකාරී සේවා සපයන්නන් වෙත අ සිට ඈ(ස) අනන්‍යාභිමුඛව, දැනටමත් ලබා දී ඇති වර්ණාවලී සම්පත් පිළිබඳ ඇගයීමක්

3. පහත සඳහන් දෑ හි පිටපත්

අ. ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ සංඛ්‍යාත ප්‍රදානය කිරීමේ කමිටුව (FAC) සහ/හෝ වෙනත් ඕනෑම විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ නිලධාරියෙකු විසින් 2017 ජනවාරි 1 වනදා පටන් මේ දක්වා 1800MHz සංඛ්‍යාත පරාසය තුළ 7.5MHz වෙන් කිරීමක් සිදු කර ඇත්නම් සහ/හෝ එකී 1800 කලාපය තුළ 7.5MHz වෙන් කිරීමට අදාළ ක්‍රමවේදය සහ ක්‍රියාවලිය වෙන් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති සියලු පත්‍රිකා, වාර්තා, තීරණ සහ නිර්දේශ සහ ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව ගත් තීරණ/ය

ආ. 2017.01.01 දිනෙන් ආරම්භ වී මේ දක්වා (2017.06.29) කාල පරිච්ඡේදය තුළ 1800 MHz පරාසයට අදාළ කොමිෂන් සභාවේ සියලු පත්‍රිකා, රැස්වීම්/සාකච්ඡා සටහන් සහ තීරණ

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරයඃ</u>

2017.08.01 දින ලැබුණු ප්‍රතිචාරයෙන් අභියාචක වෙත දැනුම් දෙනු ලැබුවේ මෙම ඉල්ලීම 2016 අංක 12 දරන පනතේ 5(1)(ඈ) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කළ බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් ඩයලොග් සමාගම 2017.08.14 දින නම්කළ නිලධාරී වෙත අභියාචනය කළ අතර, 2017.08.28 දින තොරතුරු නිලධාරියාගේ තීරණය අනුමත කරමින් එයට ප්‍රතිචාර ලැබිණි. ඉන්පසු ඩයලොග් සමාගම 2017.10.26 දින තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවට අභියාචනය කළේය.

<u>අභියාචනා අවස්ථාවේදී උද්ගත වූ ගැටලු</u>

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතට (සංශෝධිත) අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ජංගම දුරකතන ජාලයන්ට වර්ණාවලීන්/ප්‍රේක්ෂාවලීන් වෙන් කිරීමට බලයක් ඇති අතර ජාත්‍යන්තර විදුලිසංදේශ සංගමයේ එකඟතාවයන්ට අනුව ශ්‍රී ලංකාව විසින් ජාතික වත්කම් හා විරල සම්පත් ලෙස සැලකෙන වර්ණාවලීන්/ප්‍රේක්ෂාවලීන් වෙන් කිරීමේදී පැහැදිලි, සාධාරණ හා විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීමට බැඳී සිටින බව අභියාචක විසින් පෙන්වා දේ. අභියාචක පෙන්වා දෙන්නේ, 1800 4G විශේෂිත වර්ණාවලිය/ප්‍රේක්ෂාවලිය නිකුත් කරනුයේ මූලිකවම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සඳහා වන බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව විසින් ඒ සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ අවස්ථාවක් ලබාදිය යුතු බවයි. අභියාචක තර්ක කර සිටින්නේ තොරතුරු ඉල්ලීම මඟින් මොබිටෙල් පෞද්ගලික සමාගමට වෙන්කරන ලද වර්ණාවලීන්/ප්‍රේක්ෂාවලීන් සම්බන්ධව ඉල්ලා සිටින ලද තොරතුරු ලබාදීම පනතේ 5(1)(ඈ) යටතේ ප්‍රතික්ෂේප කිරීමට තරම් වාණිජ්‍යමය රහස්‍යභාවයක් ඊට අයත් නොවන බවයි. අවසානයේදී අභියාචක සඳහන් කරනුයේ, වර්ණාවලීන්/ප්‍රේක්ෂාවලීන් යනු ජාතික වත්කම් මිස වාණිජ්‍යමය හෝ කාර්මික රහස් නොවන බවත් එමනිසා තරඟකාරී ලංසු කැඳවීම මඟින් රාජ්‍යට ස්වයංක්‍රීයව වෙන් කරන ලද ආදායම හා සැසඳීමේදී ඉහළ ආදායමක් උපයාගත හැකි බවයි.

මෙම ඉදිරිපත් කිරීම්වලට ප්‍රතිචාර රජයේ අධිකාරිය තර්ක කළේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු රටේ මේ සම්බන්ධ කර්මාන්තය නියාමනය කිරීම සඳහා ඇති තනි ආයතනය

වන අතර එබැවින් වර්ණාවලි/ප්‍රේක්ෂාවලි වෙන් කරන ලද සමාග මට සමාන ක්ෂේත්‍රයේ තරඟකරුවෙකුට තොරතුරු සැපයීමට ඔවුන්ට නොහැකි බවයි. තවදුරටත් සඳහන් කළේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 10 වන වගන්තිය (ගුවන්විදුලි සංඛ්‍යාත) යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට 2013 වසරට පෙර වෙන්දේසි කරන ලද වර්ණාවලිය ප්‍රේක්ෂාවලිය කළමණාකරණය කිරීමට තනි අයිතියක් පවතින බවත් වෙනත් වසරවලදී එය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තීරණය කරන ලද මුදලක් සඳහා පරිපාලන ක්‍රියාවලියකින් ලබා දී ඇති බවයි.

**නියෝගයඃ**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන පනත මඟින් සංඛ්‍යාත ධාරාවන් ප්‍රදානයේදී පොදු අධිකාරිය වෙත අභිමතයක් ප්‍රදානය කර තිබෙන බව නිසැක වුවද, (වෙන්දේසිය මඟින් හෝ මෙහිදී සිදු වී ඇති පරිදි පරිපාලන තීරණයක් මඟින්) එබඳු අභිමතයක් විලංගු රහිත එකක් නොව "නීතියට අනුව භාවිතා කළ යුත්තක්" වේ. තවද එම අභිමතය තොරතුරු පනතේ යෙදීමට විෂය විය යුතු අතර, මහජන සුභසිද්ධිය ප්‍රමුඛ වීම (5(4) සහ 5(1)(ඈ)) පරයා යාම සඳහා පැහැදිලිවම අදාළ වන්නේ පනතේ 5(1) වගන්තිය මඟින් දක්වන ව්‍යතිරේකයන්ය.

"යම් තැනැත්තෙකුට කවර හෝ ආකාරයකින් බලපාන තීරණයක් ලබා දෙන යම් පොදු අධිකාරියක සෑම නිලධාරයෙකුම," පනතේ 35 වන වගන්තියෙන් නියම කර තිබෙන පරිදි තීරණය සඳහා හේතු දැක්වීමට යුතුකමකින් බැඳී සිටියි. මෙකී ව්‍යවස්ථාපිත විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී කිසිදු විනිර්මුක්තියක් පොදු අධිකාරිය වෙත ලබා දී නැති අතර මෙම කොමිෂන් සභාව, කිසිදු විශේෂිත පොදු අධිකාරියකට වරප්‍රසාදයක් ලබා නොදීමට නීතියෙන් බැඳී සිටියි.

මේ අවස්ථාවේදී ඉල්ලා සිටින තොරතුරු ලබා දීම පොදු අධිකාරිය විසින් සාධාරණීකරණය කරන්නේ, තොරතුරු පනතේ 5(1)(ඈ) වගන්තියේ දැක්වෙන පහත ව්‍යතිරේඛය උපුටා දක්වමිනි.

5 වගන්තිය (1) එහි (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මේ පනත යටතේ වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැක්කේ

"එම තොරතුරු හෙළිදරවු කිරීම විශාල වශයෙන් මහජන සුබසිද්ධිය සඳහා හේතුවන බවට පොදු අධිකාරිය විසින් සෑහීමට පත්වන්නේ නම් මිස, 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂා කර ඇති වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු හෙළිදරවු කිරීම යම් තුන්වන පාර්ශවයක තරගකාරී තත්ත්වයකට අහිතකර ලෙස බලපානු ලබන්නේ නම්"

කෙසේවෙතත්, මෙම තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේදී පනතේ දක්වා ඇති මහජන සුභසිද්ධිය අප්‍රධාන වන්නේද කෙසේද යන්නට හේතු දැක්වීම "තුන්වන පාර්ශ්වයක තරගකාරී තත්ත්වය"ට අහිතකර ලෙස බලපාන ආකාරය පනතේ දක්වා ඇති ආරක්ෂා කිරීම සඳහා විවාදාත්මක අවශ්‍යතාවක් වන අතර, එය ඉටු කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇත. විශේෂයෙන්ම 1997 වසරේ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැක්වූ පරිදි ජාතික වැදගත්කමක් සහිත "සංඛ්‍යාත ධාරා වෙත සීමාසහිත උපයෝජනයක් ලබා දීම" යන මෙම තොරතුරු ඉල්ලීමට විෂයවන ගැටලුව සහ අධිකරණමය ප්‍රත්‍යාදේශය සමඟ සලකා බලන විට සංඛ්‍යාතයන් භාවිතා කිරීමට අවසර දිය හැක්කේ සීමිත තැනැත්තන් සංඛ්‍යාවකට පමණි; (*අතුකෝරාළ සහ තවත් අය එ. නීතිපති* SD 1/97-15/97, SCM 1997 මැයි 5)

5(1)(ඈ) වගන්තිය තොරතුර ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලෙස දක්වන පරිදි මහජන සුභසිද්ධිය පිළිබඳ පරීක්ෂණයේ යෙදීම සම්බන්ධයේදී "එම තොරතුරු හෙළිදරවු කිරීම විශාල වශයෙන් මහජන සුබසිද්ධිය සඳහා හේතුවන බවට පොදු අධිකාරිය විසින් සෑහීමට පත්වන්නේ නම්" යන මහජන සුභසිද්ධිය පිළිබඳ පරීක්ෂණයේ යෙදීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වඩාත් අවධාරණයෙන් යුතුව සොයා බලයි. මෙය බලාත්මක වීමේදී "මහජන සුභසිද්ධිය" පිළිබඳ පරීක්ෂණය 5(1)(ඈ) වගන්තියට මෙන්ම පනතේ 5(4) වගන්තිය යන වගන්ති දෙක සඳහාම යෙදෙයි. තවද, විදුලි සංදේශ නියාමන පනත යටතේ සංඛ්‍යාත ධාරාවන් ප්‍රදානය කිරීම සඳහා පවතින අභිමතය, සැකයට බඳුන් වී ඇති තීරණය සඳහා හේතු දැක්වීමට ඇති යුතුකමින් බැහැරවීම සමඟ සමාන කරමින් ඒ සම්බන්ධයෙන්, පනතේ 35 වන වගන්තියට අනුකූල නොවන ස්ථාවරයක් සමඟ සාවද්‍ය අවබෝධයක සිටින බවද මෙම කොමිෂන් සභාව ඉදිරියේ පැවැත්වූ විභාගවලදී පෙනී යයි.

හේතු දක්වන හුදු ප්‍රතික්ෂේප කිරීම්වලින් වැළකෙන ලෙසත්, තොරතුරු ඉල්ලීමෙහි කුමන ප්‍රමාණයක් දක්වා තොරතුරු ලබාදිය හැකිද යන්න විමසා බලන ලෙසටත්, තවද 5 වගන්තිය යටතේ නෛතිකව අදාළ වන ව්‍යතිරේකය, 5(1)(ඇ) සහ 5(4) වගන්ති එක්ව ගෙන එම ඉල්ලා සිටින තොරතුරු හෙළිදරවු කිරීම "විශාල වශයෙන් මහජන සුභසිද්ධිය සඳහා හේතු නොවන" ආකාරය සවිස්තරාත්මකව දක්වන ලෙසටත් පොදු අධිකාරියට මෙයින් නියෝග කෙරේ.

නම්කළ නිලධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

# ඩිලංගනී නිරෝෂිකා එ. බෝගම්බර බන්ධනාගාරය[17]

**'අභියාචක තොරතුරු පනත ප්‍රකාරව පොදු අධිකාරියකින් තොරතුරු ඉල්ලීමක් සිදු කිරීමේදී, අභියාචක විසින් එම තොරතුරු ලබා ගැනීම සඳහා හේතු පෙන්වීමේ අවශ්‍යතාවක් නොවන්නේය'**

**තීරණය:** බන්ධනාගාර රැඳවියන් පිළිබඳ තොරතුරු සැපයීමට පොදු අධිකාරිය බැඳී සිටියි.

**මූලික පද:** තොරතුරු අයදුම්කරන්නා ඊට හේතු දැක්විය යුතු නැත

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

අභියාචක, 2018.01.05 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් බෝගම්බර බන්ධනාගාරය පිළිබඳ සහ පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. 1. 2017.12.13, 2017.12.20 හා 2018.01.02 දිනයන් වන විට රැඳවියන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පහත දැක්වෙන අයිතම වල තොරතුරු.
   1.1. රක්ෂිත බන්ධනාගාර කර ඇති සිරකරුවන්
   1.2. අච්චු විදින සිරකරුවන්
   1.3. මරණීය දණ්ඩනය සඳහා රඳවා ඇති සිරකරුවන්
   1.4. මරණීය දණ්ඩනය සඳහා රඳවා ඇති සිරකරුවන්ගේ විස්තර

2. පහත දැක්වෙන විස්තර පිළිබඳ සංඛ්‍යා දත්ත
   2.1. වයස අවුරුදු 16ට අඩු රැඳවියන්
   2.2. අවුරුදු 16-22ත් අතර රැඳවියන්
   2.3. අවුරුදු 5ට අඩු දරුවන්

---

17 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /228/2018, 2018.05.30 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. 2018.05.30 දින නියෝගය ලබා දෙන ලදි.

2.4. අවුරුදු 05-10ත් අතර දරුවන්

2.5. ගර්භනී තත්ත්වයෙන් පසුවන රැඳවියන්

3. අවුරුදු 16-22ත් අතර රැඳවියන්ගේ සංඛ්‍යා දත්ත ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව

4. බන්ධනාගාරයේ රඳවා තැබිය හැකි සම්පූර්ණ සිරකරුවන් ගණන

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය:</u>

තොරතුරු නිලධාරියාගෙන් අභියාචක වෙත ප්‍රතිචාරයක් නොලැබුණු අතර 2018.02.14 වන දින නම්කළ නිලධාරී වෙත අභියාචනය කරන ලදී. සිය ප්‍රතිචාරයෙදී නම්කළ නිලධාරියා බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් වෙත යැවීමට, අභියාචක අයත් වන ආයතනයේ ප්‍රධානියාගේ අනුමැතිය සහිත ලිපියක් ඉල්ලා සිටින ලදි. එම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.02.23 දින කොමිෂන් සභාව වෙත අභියාචනය කළාය.

**නියෝගය:**

අභියාචක තොරතුරු පනත ප්‍රකාරව පොදු අධිකාරියකින් තොරතුරු ඉල්ලීමක් සිදු කිරීමේදී, අභියාචක විසින් එම තොරතුරු ලබා ගැනීම සඳහා හේතු පෙන්වීමේ අවශ්‍යතාවක් නොවන්නේය (තොරතුරු පනතේ 24(5)(ඇ) වන වගන්තිය ප්‍රකාරව). අභියාචක වෙත ඉල්ලා සිටි තොරතුරු භාර දීමට පොදු අධිකාරිය වෙත උපදෙස් දෙන ලදී. පොදු අධිකාරිය එයට එකඟ වීමෙන් පසු, එම තොරතුරු 2018.06.13 දින හෝ ඊට පෙර, එම සියලු තොරතුරුවල පිටපත් සහ කොමිෂන් සභාව වෙත ආවරණ ලිපියක් සහිතව, ලබාදීමට එකඟ විය.

නම්කළ නිලධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

# තරිඳු ජයවර්ධන එ. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය[18]

*'මීට පෙර කාලපරිච්ඡේදයකට අදාළව සමාන තොරතුරු පොදු අධිකාරිය විසින් නිකුත් කර ඇති බවද සැලකිල්ලට ගැනීමේදී, තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සංඛ්‍යාලේඛන (පුද්ගලයින්ගේ පෞද්ගලික තොරතුරු වලට අදාළ නොවන) හා ජාතික ආරක්ෂාව අතර සුළු වශයෙන් තර්කානුකූල සම්බන්ධයක් දැකීම අපහසුය. දැනටමත් පොදු සන්තකයේ ඇති තොරතුරු සහ මෙම අවස්ථාවේ 5(1)(අ) සහ (ආ) (ස) වැනි වගන්ති යටතේ ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු අතර, නෛතික ලෙස සලකා බලන කල, වටහාගත හැකි හා තාර්කික පදනමක් නොමැත......*

*5(1)(අ) වගන්තිය යටතේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීම යන තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාව අදාළ වන්නේ පුද්ගලයින්ට පමණි. ඒ අනුව පොදු අධිකාරියට සමාජ කොට්ඨාසයක පෞද්ගලිකත්වයට බලපෑම් ඇති විය හැකි බව පවසමින් උත්තරවාද ඉදිරිපත් කළ නොහැකිය. තවද, පොදු යහපත සම්බන්ධවූ කල, තොරතුරු හෙළිදරව් කිරීම පොදු අධිකාරියේත් රජයේත් කාර්යභාරය සඳහා වාසිදායක වන (අවාසියක් වෙනුවට) බව පෙනී යයි'*

**තීරණය:** අභියාචකගෙන් තමන් තොරතුරු ඉල්ලා සිටින්නේ ඇයිද යන්නට හේතු විමසීම පනතේ 24 (5) (ඇ) වගන්තිය උල්ලංඝණය කිරීමකි/2017 දක්වා පුනරුත්ථාපනය කරන ලද එල්ටීටීඊ සාමාජිකයින් පිළිබඳ සංඛ්‍යානමය දත්ත නිකුත් කිරීම සඳහා පොදු අධිකාරියට නියම කර සිටියි. පුද්ගලිකත්වය යන ව්‍යතිරේකය 5(1)(අ) වගන්තිය යටතේ තනි පුද්ගලයන්ට මිස ප්‍රජාවන්ට අදාළ නොවේ.

**මූලික පද:** තොරතුරු අයදුම්කරු හේතු දැක්විය යුතු නැත (24(5) (ඇ) වගන්තිය)/ජාතික ආරක්ෂාව (5(1)(ආ) වගන්තිය)/පෞද්ගලිකත්වය (5(1)(අ) වගන්තිය)/පොදු යහපත/සංඛ්‍යාත්මක දත්ත

---

18 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /119/2017, 2017.11.27 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. නියෝගය 2018.01.22 දින ලබාදෙන ලදි.

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

__අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරුː__

අභියාචක 2017.05.08 දිනැති තොරතුරු ඉල්ලීමෙන්, පුනරුත්ථාපනය වූ LTTE සාමාජිකයින් (වාර්ෂිකව), ඔවුන්ගේ වයස් කාණ්ඩය, ඔවුන්ගේ පදිංචිය (දිස්ත්‍රික්කයට අනුව), සහ ස්ත්‍රී පුරුෂ භාවයට අනුව පුනරුත්ථාපනය වූ සංඛ්‍යාව, (මේ සියලු දත්ත වාර්ෂිකව වාර්තාගතවූ පරිදි) 2017 වර්ෂය දක්වා ඉල්ලා සිටින ලදී.

__පොදු අධිකාරියේ ප්‍රතිචාරයː__

තොරතුරු නිලධාරියා කිසිඳු ප්‍රතිචාරයක් නොදැක්වූ බැවින්, නම්කළ නිලධාරියා හට 2017.06.23 දින අභියාචනයක් යොමු කරන ලදී. තොරතුරු නිලධාරියා 2017.07.04 දින තොරතුරු ඉල්ලීම ලැබුණු බව දන්වා සිටියද එම ඉල්ලීමේ හරයාත්මක කරුණට කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. නම්කළ නිලධාරියාද ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2017.08.29 දින කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදී.

__අභියාචනය අවස්ථාවේදී උදගත වූ කරුණුː__

විභාගයට ලක්වන අවස්ථාවේදී මීට සමාන ස්වභාවයකින් යුත් තොරතුරු දැනටමත් ජාත්‍යන්තර සංවිධාන වලට ලබා දී ඇති බැවින් මෙම තොරතුරු නිකුත් කිරීමට පොදු අධිකාරිය පසුබට වීමට හේතුව විමසා සිටි විට පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරියා පවසා සිටින ලද්දේ මෙම තොරතුරු පුනරුත්ථාපනය වූ පුද්ගලයින්ගේ නැවත සමාජයට අන්තර්ග්‍රහණය වීමට බලපෑම් ඇති කරන බවයි. ඉල්ලා ඇති තොරතුරු තනි පුද්ගලයකුගේ පෞද්ගලික විස්තර වලට කිසිඳු සම්බන්ධයක් නොමැති සංඛ්‍යාලේඛන වලට සීමාවූවක් බවත්, මෙවිට කොමිෂන් සභාව පොදු අධිකාරියෙහි අවධානයට ගෙන එන ලදී.

2014 දක්වා දිස්ත්‍රික්කය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස යනාදිය මත පදනම්ව පුනරුත්ථාපනය කරන ලද පුද්ගලයින්ගේ තොරතුරු දැනටමත් ප්‍රසිද්ධ කර ඇත්නම් 2014 න් පසුව මෙම තොරතුරු නිකුත් කළ නොහැකි වන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටින ලදී.

තොරතුරු නිලධාරියා පවසා සිටින ලද්දේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද්දේ පුනරුත්ථාපනය වුවන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා බවයි. පුනරුත්ථාපනය වූ පුද්ගලියින් නැවත පදිංචි කර තිබුනේ ඔවුන් මුලින් පදිංචිව සිටි දිස්ත්‍රික්ක වල නොවන බවත්, ඊට අදාළ සංඛ්‍යාලේඛන හෙළිදරව් කළහොත් ඕනෑම පුද්ගලයෙකුට පුනරුත්ථාපනය වූ පුද්ගලයින් සිටින ස්ථානය සහ සාමාන්‍ය ජනගහණය තුළ විසිරී ඇති ආකාරය සොයා ගැනීමට හැකිවන බැවින් එමගින් පුනරුත්ථාපනයෙන් පසුව නැවත සමාජයට අන්තර්ග්‍රහණය වීමට තැත් කරන්නන්ට (හිටපු ළමා සොල්දාදුවන් ඇතුළුව) අහිතකර ලෙස බලපෑම් ඇති කළ හැකි බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී.

**නියෝගය:**

මෙම අභියාචනයේදී තොරතුරු ඉල්ලීම හා පොදු අධිකාරියෙහි ප්‍රතිචාරයට අදාළව විසඳිය යුතු ප්‍රශ්න දෙකක් හඳුනාගත හැකිය. පළමුව අභියාචකගෙන් තොරතුරු ඉල්ලීමට හේතු විමසීමෙන් පොදු අධිකාරිය පනතේ 24 (5) (ඈ) වගන්තිය උල්ලංඝණය කර ඇත.

24 (5) (ඈ) වගන්තිය පහත පරිදිය;

තොරතුරු සඳහා යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන පුරවැසියකු විසින්... ඔහු හෝ ඇය සම්බන්ධ කරගත හැකි අවශ්‍ය විස්තර හැර, තොරතුරු ඉල්ලා සිටීමට හේතු කිසිවක් හෝ වෙනත් පුද්ගලික විස්තර ලබා දීම අවශ්‍ය නොවන්නේ ය.

දෙවනුව පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තර්කය වන, පනතේ පෞද්ගලිකත්වයට අදාළ 5 (1) (අ) වගන්තිය ප්‍රකාරව සහ ජාතික ආරක්ෂාවට අදාළ 5 (1) (ආ) (ස) වගන්තිය ප්‍රකාරව සංඛ්‍යාලේඛනවලට අදාළ තොරතුරු ප්‍රතික්ෂේප කිරීම, අප වෙත ඉදිරිපත් කර ඇති කරුණු මත පදනම්ව පිළිගත නොහැකිය.

5(1)(අ) වගන්තිය යටතේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීම යන තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථාව අදාළ වන්නේ පුද්ගලයින්ට පමණි. ඒ අනුව පොදු අධිකාරියට සමාජ කොට්ඨාසයක පෞද්ගලිකත්වයට බලපෑම් ඇති විය

හැකි බව පවසමින් උත්තරවාද ඉදිරිපත් කළ නොහැකිය. තවද, පොදු යහපත සම්බන්ධවූ කල, තොරතුරු හෙළිදරව් කිරීම පොදු අධිකාරියේත් රජයේත් කාර්යභාරය සඳහා වාසිදායක වන (අවාසියක් වෙනුවට) බව පෙනී යයි.

අප ඉදිරියේ ඇති කරුණු සලකා බලන කල, පනතේ 5 (1) (ආ) (i) වගන්තිය යටතේ තොරතුරු ප්‍රතික්ෂේප කිරීමද ඒ හා සමානව පවත්වාගෙන යා නොහැකි අවස්ථාවකි. මීට පෙර කාලපරිච්ඡේදයකට අදාළව සමාන තොරතුරු පොදු අධිකාරිය විසින් නිකුත් කර ඇති බවද සැලකිල්ලට ගැනීමේදී, තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති සංඛ්‍යාලේඛන (පුද්ගලයින්ගේ පෞද්ගලික තොරතුරුවලට අදාළ නොවන) හා ජාතික ආරක්ෂාව අතර සුළු වශයෙන් තර්කානුකූල සම්බන්ධයක් දැකීම අපහසුය. දැනටමත් පොදු සන්තකයේ ඇති තොරතුරු සහ මෙම අවස්ථාවේ 5 (1) (අ) සහ (ආ) (i) වැනි වගන්ති යටතේ ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු අතර, නෛතික ලෙස සලකා බලන කල, වටහාගත හැකි හා තාර්කික පදනමක් නොමැත. එවැනි තර්කානුකූල වෙනසක් පොදු අධිකාරිය විසින් සිදු කරනු ලැබුවහොත්, මෙම අභියාචනයෙහි සලකා බැලිය හැකිය.

2014 දක්වා වාර්තාගත, වාර්ෂිකව වර්ගීකරණය කර ඇති, පොදු සන්තකයේ දැනට නිකුත්ව පවතින තොරතුරු/ දත්ත, හෙළිදරව් කරන ලෙසට පොදු අධිකාරියට නියෝග කර සිටී. මෙයට පොදු අධිකාරිය අවනත වීමට එකඟ බව පවසා සිටී.

2014 සිට 2017 දක්වා කාල සීමාවට අදාළව, තොරතුරු ඉල්ලීම මගින්, ඉල්ලා ඇති තොරතුරු ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමටද පොදු අධිකාරියට නියෝග කර සිටී. එම තොරතුරු සහ පාර්ශ්වයන්ගේ ලිඛිත දේශනද සලකා බලා, එම තොරතුරු හෙළිදරව් කිරීම පනත යටතේ හා ඊට අනුකූලව පොදු යහපත උදෙසා අදාළ වේද යන්න කොමිෂන් සභාව තීරණයකට එළඹෙනු ඇත. පොදු අධිකාරිය වාර්තාගත කිරීම සඳහා පවසා සිටියේ කොමිෂන් සභාවේ නියෝගයක් මත තොරතුරු හෙළිදරව් කිරීමට එකඟ බවයි.

නම්කළ නිලධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

## තිලක් රංජිත් සිල්වා එ. ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය[19]

*'පනතේ 5(1) (ඒ) වගන්තියේ ව්‍යාතිරේකය තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අයැද සිටින්නේ නම්, අධිකරණයට අපහාස කිරීම් තුළ හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට අගතියක් සිදුවීම් යනුවෙන් බාධා කිරීමක් හෝ අගතියක් ප්‍රතිඵලය විය හැකි යැයි දුරස්ථභාවයක් දක්වමින් විරුද්ධ වීමේදී සැබෑ අවදානමක් (අවධාරණය අපගේ ය) තිබිය යුතුය'*

**තීරණය:** ලොරි රථ රියදුරු අධිකරණයට ඉදිරිපත් කරන ලද නෝට්ටුවල සහතික පිටපත් සහ රියදුරු විසින් අධිකරණය ඉදිරියේ සිදු කරන ලද අනෙකුත් ඉදිරිපත් කිරීම්, විමර්ශන සිදු කරන ලද පොලිස් නිලධාරීන් විසින් එදින සිය තොරතුරු පුස්තකයේ සටහන් කරන ලද සටහන් වල සහතික පිටපත්, එදිනම විමර්ශන සිදු කරන ලද පොලිස් නිලධාරීන් විමර්ශනය සිදු කිරීමෙන් අනතුරුව පිටව ගිය වේලාවන් සහ හදිසි අනතුර සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් ලබා ගත් ඡායාරූප යනාදිය හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියම කර සිටියි

**මූලික පද:** අධිකරණයට අපහාස කිරීම, අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම (5(1)(ඒ) වගන්තිය)/පෙනී සිටීමට අපොහොසත්වීම වරදකි (39(1)(ඇ) වගන්තිය/වරදවල්/පොලිස් විමර්ශනය/පොදු යහපත/විනිශ්චයට භාජනය වී ඇති

<u>පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්:</u>

අභියාචක, 2017.11.21 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් 2017.02.13 දින මඩකළපුව පොළොන්නරුව මාර්ගයේ වැලිකන්ද පොලිස් වසමේ රුහුණුකෙත මංසන්ධියේ සිදුවූ රිය අනතුර පිළිබඳව පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. අනතුර සිදුවූ ස්ථානය සහ අනතුර සිදුවූ ආකාරය වාර්තා කළ දළ සටහන්වල හා විමර්ශන වාර්තාවේ සහතික කළ පිටපත්.

---

19 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /142/2018, 2018.05.09, 2018.05.03 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි

2. ලොරි රථ රියැදුරා සහ/හෝ ඔහුගේ සහායකයා අත්අඩංගුවට ගත් දිනය සහ වේලාව දක්වන උද්ධෘතවල සහතික කළ පිටපත්

3. වෛද්‍ය වාර්තාව ලබාගැනීම සඳහා ලොරි රථ රියැදුරා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළ වේලාව සටහන් කළ උද්ධෘතයන්ගේ සහතික කළ පිටපත්

4. ලොරි රථ රියැදුරාගේ වෛද්‍ය වාර්තාව ඇතුළත් ජී.එච්.ටී. පිටපතේ සහතික කළ පිටපත්

5. චූදිත ලොරි රථ රියැදුරා අධිකරණයට ඉදිරිපත් කිරීමට සහ වෙනත් ඉදිරිපත් කිරීම්වලට අදාළ උද්ධෘත සටහන්වල සහතික කළ පිටපත්

6. පොළොන්නරුව රෝහලේ 2017.02.14 දින සිදුකළ පශ්චාත් මරණ පරීක්ෂණයේ අදාළ වාර්තාවේ උද්ධෘතවල සහතික කළ පිටපත්

7. යතුරුපැදිය සහ ලොරිය සම්බන්ධයෙන් නඩු භාණ්ඩ පොතෙහි යෙදූ සටහන්වල සහතික කළ පිටපත්

8. මෝටර් රථ පරීක්ෂකතුමා විසින් විමර්ශනයට අදාළව කරන ලද විමර්ශනයේ වාර්තාව.

9. එදින විමර්ශනය පැවැත්වූ පොලිස් නිලධාරීන් සිය සාක්කු සටහන් පොත්වල යොදන ලද සටහන්වල සහතික කළ පිටපත්

10. විමර්ශනය අවසන් කිරීමෙන් පසු එම පොලිස් නිලධාරීන් එදින සේවයෙන් බැහැර වූ වේලාවන්

11. රියැදුරා හට නිකුත් කර තිබූ තාවකාලික රියැදුරු බලපත්‍රයේ අංකය සහ නිකුත් කළ දිනය ඇතුළත්ව එම බලපත්‍රයේ සහතික කළ පිටපතක්

12. රිය අනතුර සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් ලබාගත් ඡායාරූපවල පිටපත්

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය</u>

තොරතුරු නිලධාරියාගෙන් ප්‍රතිචාරයක් නොවූ හෙයින් අභියාචක විසින් 2017.12.30 දින නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබිණි. නම්කළ නිලධාරියාගෙන් ප්‍රතිචාරයක් නොවූ හෙයින් අභියාචක විසින් 2018.01.09 දිනැති ලිපියක් මගින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් සිදුකර තිබිණි.

<u>අභියාචනය විභාග කරන අවස්ථාවේ උද්ගත වූ කරුණු:</u>

2017 පෙබරවාරි 3 වැනිදා කොමිෂන් සභාව විසින් ගැසට් කළ 20 වන රීතිය යටතේ (ගැසට් අංක 2004/66) පොදු අධිකාරියට මෙම විභාගය සඳහා පෙනී සිටින ලෙස නොතීසි කර තිබුණ ද පොදු අධිකාරිය පැමිණ සිටියේ නැත.

අභියාචක කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ, තමන් විසින් කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමෙන් පසු 2017.11.21 දිනැති සිය තොරතුරු ඉල්ලීමට පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා විසින් 2018.01.17 දින ප්‍රතිචාරයක් ලබාදුන් බවයි. අයිතම 1, 2, 4, 6, 7, 8 සහ 11 සම්බන්ධයෙන් ලද තොරතුරු පිළිබඳ තමන් සෑහීමකට පත් වන බව අභියාචක කියා සිටියේය. තොරතුරු ඉල්ලීමේ 3, 5 සහ 11 අයිතම සම්බන්ධයෙන් අභියාචක කියා සිටියේ පොදු අධිකාරිය විසින් සපයන ලද තොරතුරු අසම්පූර්ණ සහ නොමග යවනසුලු බවත්, 9 සහ 12 අයිතම යටතේ තොරතුරු සැපයීමට පොදු අධිකාරිය අසමත් වී ඇති බවටත් ය.

පොදු අධිකාරිය 2018.05.08 දිනැති ලිපියක් ෆැක්ස් මාර්ගයෙන් කොමිෂන් සභාව වෙත එවමින්, අභියාචක වෙත පිටපත් කරමින් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත්තේ අභියාචක විසින් කරනු ලැබූ තොරතුරු ඉල්ලීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) (ඒ) යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ බවයි. පොදු අධිකාරිය තවදුරටත් කියා සිටියේ ඉල්ලා සිටි තොරතුරුවලට අදාළව පැවැත්වෙන විමර්ශනය තුළ මනම්පිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ චූදිත රියැදුරාට එරෙහිව නඩු කටයුත්තක් ආරම්භ කර ඇති බවත්, පොදු අධිකාරිය විසින් විමර්ශනයේදී පවත්වාගෙන ගිය ලිපි ගොනු 3 ම, ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලෙසට 2018.04.23 දින මහේස්ත්‍රාත්වරයා නියම කර ඇති බවත් ය. මේ අනුව, අභියාචක විසින් ඉල්ලා සිටි තොරතුරු ලබාදීම අධිකරණයේ අපක්ෂපාතී නඩු කටයුතුවලට අගතියක් සහ හානිකර බලපෑමක් විය හැකි බවට පොදු අධිකාරිය කරුණු දක්වා සිටියේය.

## නියෝගය[20]

මෙම අවස්ථාවේ උද්ගතව ඇති ගැටළුව තුළ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ 2017 පෙබරවාරි 3 වැනිදා ගැසට් කළ (ගැසට් අංක 2004/66) තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ රෙගුලාසි විසින් විධාන කර තිබෙන නිසි කාර්යපටිපාටියට අනුකූල වීමට සමත් වී නැති බව, පොදු අධිකාරියේ පාර්ශ්වයෙන් ප්‍රකට වන්නකි.

තොරතුරු පනත සහ 2017 පෙබරවාරි 3 දින ගැසට් කළ කොමිෂන් සභා රීති ප්‍රකාරව (ගැසට් අංක 2004/66) පළමු අවස්ථාවේදී නම්කළ නිලධරයා මෙම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට හෝ තමන් වෙනුවෙන් නියෝජිතයෙකු එවීමට අසමත් වී ඇත. එසේ කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය කිසිදු පැහැදිලි කිරීමක් ද සපයා නැත. මෙයින් පනතේ 39 (1) (ඇ) වගන්තිය අනුව වරදක් ස්ථාපනය වන අතර, එම වගන්තිය යටතේ විශේෂිත නෛතික විපාකවලට යටත් කරවයි.

එවැනි අවස්ථාවකදී පනතේ 39(4) වගන්තිය යටතේ නිසි අධිකරණයේ අපරාධ නඩු කටයුත්තක් ආරම්භ කිරීමට කොමිෂන් සභාවට බලය ඇත. 39 වගන්තිය මගින් තවදුරටත් විශේෂිතව සඳහන් කරන්නේ එවැනි වරදකට වරදකරු වීම මගින් දඩයක් සහ/හෝ දෙවසරකට නොඅඩු සිරගත කිරීමක් දඬුවම් වශයෙන් නියම වනු ඇති බවයි.

පොදු අධිකාරිය පහත දැක්වෙන පරිදි කියැවෙන, තොරතුරු පනතේ 5 (1) (ඒ) වගන්තිය යටතේ අභියාචක විසින් කරන ලද තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇතः

> එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාසයක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට අගතියක් සිදුවන අවස්ථාවකදී

ලංකා බැංකු සේවක සංගමය එ. මහජන බැංකුව (2018.01.30 දිනැති තොරතුරු කොමිෂන් සභා සටහන්) හිදී මෙම කොමිෂන් සභාව

---

20 2018.05.09 දින ලබාදෙන ලදි.

නිරීක්ෂණය කරන්නේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ හැක්කේ 5(1) වගන්තියේ හැම පැත්තෙන්ම, එම ප්‍රතික්ෂේප කිරීම අවසානාත්මක වශයෙන් පනතේ 5(4) වගන්තියේ දැක්වෙන මහජන සුබසිද්ධිය ප්‍රමුඛ වීමට විෂය වන අතර, තොරතුරු හෙළිදරව් කිරීම මගින් සැලසෙන මහජන සුබසිද්ධිය, එය තොරතුරු හෙළිදරව් කිරීමෙන් විය හැකි හානියට වඩා බරෙන් වැඩි වනවිට තොරතුරු ප්‍රතික්ෂේප කළ නොහැකි බවය.

පනතේ 5(1) (ඒ) වගන්තියේ ව්‍යතිරේකය තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අයැද සිටින්නේ නම්, අධිකරණයට අපහාස කිරීම තුළ හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට අගතියක් සිදුවීම් යනුවෙන් බාධා කිරීමක් හෝ අගතියක් ප්‍රතිඵලය විය හැකි යැයි දුරස්ථභාවයක් දක්වමින් විරුද්ධ වීමේදී සැබෑ අවදානමක් (අවධාරණය අපගේ ය) තිබිය යුතුය.

පනතේ 5(1) (ඒ) මගින් දක්වන ව්‍යතිරේකයන්හි අදාළත්වය කෙරෙහි අප දැඩි සේ සැලකිලිමත් වන අතර, පනත මගින් අවධාරණය කරනු ලබන උපරිම ලෙස හෙළිදරව් කිරීමේ මූලධර්මය ප්‍රකාරව, 5(1) වගන්තිය මගින් දක්වා ඇති පටු ලෙස අර්ථනිරූපණය කළ යුතු ව්‍යතිරේකවලට එරෙහිව තොරතුරු දැනගැනීමේ අයිතියේ මූලික මූලධර්මය යොදාගැනීමට මෙම කොමිෂන් සභාව කටයුතු කරයි.

මේ සම්බන්ධයෙන් පොදු අධිකාරියේ කරුණු කියාපෑම, මෙකී ඉල්ලා සිටින තොරතුරු සහ එයින් අධිකරණයේ අධිකාරී බලයට සහ අපක්ෂපාතිත්වයට සැබෑ අවදානමක් ජනිත වීම අතර සම්බන්ධතාවයක් ස්ථාපිත කිරීමට පැහැදිලි ලෙසම ප්‍රමාණවත් නොවේ.

ඉල්ලා සිටි තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සනාථ කිරීමට වඩාත් පූර්ණ වශයෙන් කටයුතු කරන ලෙසට ඉහත සඳහන් කළ වාතාවරණය තුළ පොදු අධිකාරියට නියම කරනු ලබන අතර, කොමිෂන් සභාවේ පරීක්ෂාකාරී කියවීම සඳහා මීළඟ විභාග දිනයේදී අවශ්‍ය ලිපි ලේඛන ද සමග කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට දැඩි සේ ඉල්ලා සිටියි.

## නියෝගය[21]

චූදිත ලොරි රථ රියැදුරා අධිකරණයට ඉදිරිපත් කිරීම සහ වෙනත් ඉදිරිපත් කිරීම්වලට අදාළ උද්ධෘත සටහන්වල සහතික කළ පිටපත්, එදින විමර්ශනය පැවැත්වූ පොලිස් නිලධාරීන් විසින් සිය සාක්කු සටහන් පොත්වල යෙදූ සටහන්වල සහතික කළ පිටපත්, විමර්ශනය පැවැත්වූ පොලිස් නිලධාරීන් විමර්ශනයෙන් පසු එදින සේවයෙන් බැහැරව ගිය වේලාවන් සහ රිය අනතුර සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් විසින් ගත් ඡායාරූපවල පිටපත් ඇතුළු අභියාචක විසින් ඉල්ලා සිටි තොරතුරු සම්බන්ධයෙන් ප්‍රතිචාර ලබාදීමට පොදු අධිකාරියට උපදෙස් දෙන ලදී.

පොදු අධිකාරියේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

21 2018.05.30 දින ලබාදෙන ලදි

# පී.යූ. රංගබණ්ඩාර එ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය[22]

*'එය අධිකරණයේ පවත්නා නඩුවක්ය යන පදනම මත, සරලවම, තොරතුරු පනතේ 5(1)(ඊ) වගන්තියේ ප්‍රතිලාභයට හිමිකම් නොකියයි. 5(1)(ඊ) වගන්තිය අදාළ වන්නේ "යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ" තොරතුරුවලට හා ඊට අදාළව ඉතාමත් සීමා සහිතවය*

***නීතිය මඟින් කිසිඳු හෝ පොදු අධිකාරියකට "යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති" තොරතුරු කාණ්ඩයට ඕනෑම තොරතුරක් වරප්‍රසාද ලත් තොරතුරක් බවට පත් නොකරයි. එය නීතිය මඟින් නියම කරන ලද ලේඛණ කාණ්ඩයට අයත් වේ'***

**තීරණයඃ** පොදු අධිකාරිය විසින් නිකුත් කරන ලද බලය පැවරීමේ සහතිකය, 5(1) (ඊ) සහ (ඒ) වගන්ති යටතේ ව්‍යතිරේකයන් ගෙන ඒම නිශේධනය කරන වරප්‍රසාදලත් ලේඛනයක් නොවන හෙයින් ඉඩම් කැබැල්ලක් සම්බන්ධයෙන් අභියාචනකරු විසින් ඉල්ලුම් කරන ලද තොරතුරු හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියම කර සිටියි.

**මූලික පදඃ** විධානාත්මක කාර්යපටිපාටි තොරතුරු නිලධාරියාට සභය ලබා දීමට අපොහොසත් වීම, ප්‍රතිවිපාක (39(2) වගන්තිය)/අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙනයාම (5(1)(ඒ) වගන්තිය)/ වරදවල්/වෘත්තිමය සන්නිවේදන ලිඛිත නීතිය (5(1)(ඊ) වගන්තිය, සාක්ෂි ආඥා පනතේ 126, 129 වගන්ති)/මහජන ලේඛන/විනිශ්චයට භාජනය වී ඇති

## පසුබිම් වූ සිද්ධිමය සාධක සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

අභියාචක විසින් 2017.03.15 දරණ තොරතුරු ඉල්ලීම මගින්, පොදු අධිකාරිය විසින් පවරාගැනීමට නියමිත/පවරාගන්නා ලද බව කියන මෙම ඉඩම සම්බන්ධයෙන් පහත තොරතුරු ඉල්ලා තිබිණි.

22 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /55/2017, 2017.09.14, 2017.10.23, 2017.11.27 හා 2017.12.19 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.

1. එකී ඉඩම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පවරාගත්තේ කුමන නීතිය යටතේද සහ එකී ලිඛිත නීතියේ විශේෂිත ප්‍රතිපාදන මොනවාද?
2. එසේ සිදුකළේ යම් විධිමත් සහ විශේෂිත නියෝගයක් යටතේද? එසේ නම් එම නියෝගය තවමත් බලාත්මකද?
3. සත්‍ය බවට ඔබ විසින් සහතික කළ එම නියෝගයේ සහතික කළ පිටපතක්
4. පහතින් සඳහන් කරන ඉඩමේ හිමිකම නොතිබුණේනම් මහවැලි අධිකාරිය විසින් අදාළ ඉඩම පවරා ගත්තේ ලිඛිත නීතියේ කුමන විශේෂිත විධි විධාන අනුවද?
5. ඔව් නම්, එවැනි පවරාගැනීමක් සිදුකළේ ලිඛිත නීතියේ කුමන ප්‍රතිපාදනය යටතේද?
6. එබඳු අත්පත් කර ගැනීමක් සිදුකළේ යම් ගැසට් නිවේදනයක් යටතේ නම් එම ගැසට් නිවේදනයේ සහතික කළ පිටපතක්

## පොදු අධිකාරියේ ප්‍රතිචාරය

තොරතුරු ඉල්ලා සිටින ඉඩම් කොටස ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුවකට සෘජුවම සම්බන්ධ හෙයින් තොරතුරු ලබාදීම 2017.05.03 දින ප්‍රතික්ෂේප කළ තොරතුරු නිලධරයා විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1) (ඊ) සහ 5(1)(ඒ) වගන්ති යටතේ ව්‍යතිරේක විශේෂිතව සඳහන් කර තිබිණි. පනතේ 5(1)(ඊ) වගන්තියට "සේවා සැපයීමේ දී නීතිපතිවරයා හෝ නීතිපතිවරයාට සහාය දක්වන යම් නිලධරයකු සහ පොදු අධිකාරීන් අතර පවතින යම් සන්නිවේදනයක් ඇතුළුව, යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ, වෘත්තිකයන් සහ එම වෘත්තිකයන් විසින් සේවා සපයනු ලබන යම් පොදු අධිකාරියක් අතර පවතින යම් සන්නිවේදනයක සංයුක්ත වන්නා වූ තොරතුරක්" ඇතුළත් වන අතර, 5(1)(ඒ) වගන්තියට, "හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරි බලය හා අපක්ෂපාතීව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන තොරතුරක්" යන්න ඇතුළත් වේ.

නම්කළ නිලධරයා 2017.05.25 දින සඳහන් කළේ ඉල්ලා සිටි තොරතුර අභියාචකට සැපයිය හැකි බව සහ තමන් විසින් පොදු අධිකාරිය ඒ සඳහා යොමු කළ නමුත්, අදාළ නිලධාරීන් ඒවාට අනුගත වීම ප්‍රතික්ෂේප කළ බවයි. අභියාචක 2017.07.24 දින කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

## අතුරු නියෝගය[23]

මෙම අවස්ථාවේදී 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඊ) සහ 5(1)(ඒ) වගන්ති මත පදනම් ව තොරතුරු නිලධරයා (ප්‍රධාන කාර්යාල අධ්‍යක්ෂමෙහෙයුම්) විසින් මුල් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත්තේ ඉල්ලා සිටි තොරතුරු පිළිවෙළින් වරප්‍රසාද ලත් තොරතුරු සහ එකී තොරතුරු නිදහස් කිරීම අධිකරණයේ අධිකාරිත්වය සහ අධිකරණයේ අපක්ෂපාතිත්වය පවත්වාගෙන යාමට අගතියක් වේ ය. යන පදනම මත ය. කෙසේ නමුත් ලේඛන පරීක්ෂාවෙන් කියවීම සහ විභාගය සඳහා පැමිණ සිටි නම්කළ නිලධරයා තවදුරටත් ප්‍රශ්න කිරීම මගින් පෙනී යන්නේ ඉහත කී ව්‍යාතිරේකයන් අයැද සිටීම එකලාම ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය (පොදු අධිකාරිය) විසින් ගම්පොළ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුව මත රඳා පවතින බවයි.

අධිකරණයක හුදෙක් නඩුවක් විභාග වෙමින් පැවතීම පමණක් පනත යටතේ තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නොව බව සහ පනතේ 5(1)(ඊ) වගන්තියට අදාළව තොරතුරු හෙළිකළ නොහැකි වෘත්තීය වරප්‍රසාද සමන්විත වන්නේ යම් ලිඛිත නීතියක් යටතේ හෙළි කළ නොහැකි තොරතුරුවලට බවද මෙහිදී සඳහන් කළ යුතුය. මෙකී ප්‍රතික්ෂේප කිරීමේ පදනම්, ප්‍රසිද්ධ ලේඛන වන පවරාගැනීමේ නියෝග සහ ගැසට් නිවේදන සම්බන්ධයෙන් නොයෙදේ. තොරතුරු නිලධරයා විසින් සිදුකළ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම වැරදිසහගත බව නම්කළ නිලධරයා විසින් පිළිගැනීම සහ තොරතුරු නිලධරයාට තොරතුරු ලබාදෙන ලෙස ඔහු විසින් මගපෙන්වීම් සිදුකිරීම ප්‍රශංසනීය වේ.

පොදු අධිකාරියේ අවධානය, "23 (3) වගන්තිය යටතේ තොරතුරු නිලධරයකු විසින් සහාය ඉල්ලා සිටියේ යම් නිලධරයෙකුගෙන් ද,

23 2017.09.14 දින ලබා දෙන ලදි

ඒ නිලධරයා විසින් සාධාරණ හේතුවක් නොමැතිව ඒ සහාය ලබා දීම පැහැර හරින විට, ඒ නිලධරයා මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය" යැයි සඳහන් පනතේ 39(2) වගන්තියට සහ "මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තිවල සඳහන් කරන ලද යම් වරදක් සිදු කිරීම වෙනුවෙන් පනවන ලද දඩය, මේ පනත යටතේ පනවන ලද කාර්යයක් කරගෙන යාම පැහැර හැරීම වෙනුවෙන්, විනය ක්‍රියා මාර්ගයක් ගැනීමට බලය පවරා ඇති අදාළ අධිකාරිය විසින් ඒ නිලධරයාට එරෙහිව ගනු ලැබිය හැකි යම් විනය ක්‍රියා මාර්ගයකට හානියක් නොවන අමතර දඩයක් විය යුතු ය" 39(3) යන වගන්ති වෙත යොමු කරනු ලැබීය. මෙහිදී තවදුරටත් නිරීක්ෂණය වූයේ 39(1)(අ) වගන්තිය අනුව "තොරතුරු සැපයීම සිතාමතා අවහිර කරනු ලබන හෝ චේතනාන්විතව වැරදි සහගත, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු සපයනු ලබන" සහ 39(1)(ඉ) වගන්තිය ප්‍රකාරව "කොමිෂන් සභාවේ තීරණයකට අනුකූලවීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන" සෑම අයෙක්ම මෙම පනත යටතේ වරදක් කරන බව සහ "මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාග යකින් පසු වරදකරු කිරීමේ දී රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතු" බව ය.

2017.09.12 දින මෙකී පොදු අධිකාරියේ තොරතුරු නිලධරයා විසින් නම්කළ නිලධරයා වෙත යවන ලද ලිපිය තවදුරටත් පරීක්ෂාකාරී ලෙස කියවා බැලීමේදී එකී ලිපියේ අන්තර්ගතයෙන්, නම්කළ නිලධරයාගේ මගපෙන්වීම යටතේ අදාළ තොරතුරු මුදාහරින ලෙසට ඉල්ලා තිබුණ ද, එකී පොදු අධිකාරියේ අධ්‍යක්ෂ(ඉඩම්) වෙතින් ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාරයක් ලැබී නැති බව ද පෙනී ගියේය. මේ අනුව ඉහත කී ඉඩම සම්බන්ධයෙන් එබඳු පවරා ගැනීමේ නියෝගයක් වේ නම්, එය සත්‍ය පිටපතක් ලෙස සහතික කර එම පිටපත තොරතුරු ඉල්ලීම අනුව මුදා හරින ලෙසට පොදු අධිකාරිය වෙත මගපෙන්වනු ලැබීය. තවදුරටත්, ලිපිගොනු අංක DL/06/02/146 හි 2017.09.12 දරණ, අධ්‍යක්ෂ (ඉඩම්) විසින් අධ්‍යක්ෂ මෙහෙයුම් වෙත ලියනු ලැබූ ලිපියේ අන්තර්ගතයෙන් පැහැදිලිව පෙනී යන්නේ ඉහත කී ඉඩමට අදාළව කිසිදු පවරා ගැනීමේ නියෝගයක් නිකුත් කර නොමැති බව ය.

මේ අනුව ඉහතින් විස්තර කළ (මෙහි පහත නැවත විස්තර කරන) ඉඩමට අදාළ සියලු ගැසට් නිවේදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට පොදු අධිකාරියට නියම කරන ලදී.

## අතුරු නියෝගය[24]

එය අධිකරණයේ පවත්නා නඩුවක්ය යන පදනම මත, සරලවම, තොරතුරු පනතේ 5(1)(ඊ) වගන්තියේ ප්‍රතිලාභයට හිමිකම් නොකියයි. 5(1)(ඊ) වගන්තිය අදාළ වන්නේ "යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති වූ" තොරතුරුවලට හා ඊට අදාළව ඉතාමත් සීමා සහිතවය.

මෙම සිදුවීමේ ඉදිරිපත් අරමුණ සඳහා, 1895 අංක 14 දරණ සාක්ෂි ආඥා පනතේ 129 වගන්තිය දක්වන රහසිගතව හුවමාරුකරගත් කාරණා අන්තර්ගත වේ.

> "යම් තැනැත්තෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් ඉදිරිපත් වුවහොත් මිස, ඔහු සහ ඔහුගේ නීති වෘත්තීය උපදේශක අතර ඇති වූ රහස්‍ය සන්නිවේදන අධිකරණයට අනාවරණය කිරීමට ඔහුට බල නොකළ යුතුය. ඔහු එසේ ඉදිරිපත් වුවහොත් ඔහු විසින් දෙන ලද යම් සාක්ෂියක් පැහැදිලි කිරීම සඳහා දැන ගැනීම අවශ්‍ය බව අධිකරණයට පෙනී යන සන්නිවේදන අනාවරණය කිරීමට ඔහුට බලකළ හැකිය. එහෙත් අන් කිසිවක් අනාවරණය කිරීමට බලකළ නොහැකිය."

සාක්ෂි ආඥා පනතේ 126 වගන්තිය පහත පරිදි වේ.

> "126 (1) අධිනීතිඥයෙකු, නීතිඥයෙකු හෝ නොතාරිස් කෙනෙකු, වශයෙන් තම සේවය කරගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා ස්වකීය සේවාදායකයා විසින් හෝ ඔහු වෙනුවෙන් තමා වෙත දන්වන ලද යම් ලියුම් කියුම් සේවාදායකයාගේ ප්‍රකාශිත කැමැත්ත ඇතිව මිස නොඑසේව, අනාවරණය කිරීමට හෝ, ස්වකීය වෘත්තීය සේවය කරගෙන යාමේදී හෝ එම සේවයේ කාර්යය සඳහා තමා දැනගත් යම් ලේඛනයක අන්තර්ගත කරුණු හෝ කොන්දේසි සඳහන්

24 2017.11.27 දින ලබා දෙන ලදි

කිරීමට හෝ එම සේවය කරගෙන යද්දී හෝ එම සේවයේ කාර්යය සඳහා තමා විසින් තම සේවාදායකයාට දෙන ලද යම් අවවාදයක් අනාවරණය කිරීමට කිසිම නීතිඥයෙකුට, අධිනීතිඥයෙකුට හෝ නොතාරිස් කෙනෙකුට කිසිවිටක අවසර නොදිය යුතුය"

126 වගන්තිය කෙසේවෙතත්, මෙම කරුණට සුළු වශයෙන් හෝ අදාළව ඇතැම් ප්‍රතිපාදනයන්ට යටත් වනබව දැක්වීම උචිත වේ.

මෙම පැමිණිල්ලේ සිද්ධිමය සාධක මත, පනතේ 5(1)(ඊ) වගන්තියේ අදාළත්වය පවත්වාගත නොහැකිය. එපමණක් නොව පැවරීමේ නියෝගයක් නිසැකවම පොදු ලියවිල්ලක් වන අතර සිදුවීමේ සත්‍ය තත්ත්වය නිකුත් කිරීම හෝ නොකිරීම, අභියාචක ඉල්ලුම්කළ ලේඛන පිළිබඳව හා තොරතුරු ඉල්ලීමට මූලිකවම පොදු අධිකාරිය විසින් පැහැදිලි කිරීමක් කළ යුතු අතර රාජ්‍යයේ නිලධාරියාගේ හුදු අසත්‍ය ප්‍රකාශයෙන් එම අරමුණට ප්‍රමාණවත් නොවේ. ඒ අනුව ඉල්ලා සිටි තොරතුරුවල තත්ත්වය පිළිබඳව තහවුරු කිරීම සඳහා ඊළඟ අභියාචනා දිනයේදී අදාළ ලිපිගොනු ඉදිරිපත් කිරීමට පොදු අධිකාරියට මින් නියෝග කරනු ලැබේ.

## නියෝගය

තොරතුරු ඉල්ලීමට අදාළව පවතින්නේ කොමිෂන් සභා නියෝගයන්හි සවිස්තරව දක්වා ඇති සහ පැවරීමේ සහතිකයක්/නියෝග යක් මත පොදු අධිකාරිය විසින් අත්පත් කරගනු ලැබූ ඉඩම සම්බන්ධවය.

අප ඉදිරියේ පොදු අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා සිදුකළ සැළකිරීම් සම්බන්ධව සළකා බැලීමේදී අයදුම්කරන ලද තොරතුරු, තොරතුරු පනතේ 5(1)(ඊ) ව්‍යතිරේකයට යටත්වන බවට වන හේතු දැක්වීම සම්බන්ධව නැවතත් අවධාරණය කර සිටිනුයේ තවමත් විභාග වෙමින් පවත්නා නඩුවකට අදාළව, අදාළ පොදු අධිකාරිය විසින් නීතිපති දෙපාර්තමේන්තුවට යවන ලද ලියවිලි සම්බන්ධයෙන් අදාළ වගන්තිය ස්වයංක්‍රියවම හා සම්පූර්ණයෙන්ම අදාළ නොවන බවයි.

මෙම අභියාචනයේදී, කොමිෂන් සභාව විසින් ගනු ලැබූ පෙර නියෝගයන්ට අනුව, ව්‍යතිරේකය යාචනය කරන්නේ නම් අදාළ

තොරතුරු වරප්‍රසාදිත බව පෙන්වා දිය යුතුය. වගන්තියේ අදාළ කොටස අදාළ තොරතුරු සම්බන්ධයෙන් විස්තර කර දක්වනුයේ "යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති" වූ තොරතුරු ලෙසයි. තවද, නීතිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද සෑම ලේඛනයක් සඳහාම සඳහන් කරන ලද ව්‍යතිරේකයෙන් ආවරණය නොවේ.

මෙම අවස්ථාවේදී, පැවරීමේ නියෝගයක් පොදු ලියවිල්ලක් වන බැවින් එය වරප්‍රසාදිත විය නොහැකිය. එවැනි නියෝගයක් නිකුත් කරන ලද්දේ නම් සහ එම නියෝගය ඉඩමේ කුමන කොටසකට අදාළ වන්නේද යන තොරතුරු මහජනයාට විවෘතව පැවතිය යුතුය.

එකී ඉඩම සම්බන්ධයෙන් නිකුත්කරන ලද පැවරීමේ නියෝගය වරප්‍රසාදිත ලියවිල්ලක් නොවන බව පොදු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එයාකාරයෙන්ම පිළිගෙන තිබේ. මේ ආකාරයට, නීතිය මඟින් කිසිඳු හෝ පොදු අධිකාරියකට "යම් ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දී නොමැති" තොරතුරු කාණ්ඩයට ඕනෑම තොරතුරක් වරප්‍රසාද ලත් තොරතුරක් බවට පත් නොකරයි. එය නීතිය මඟින් නියම කරන ලද ලේඛණ කාණ්ඩයට අයත් වේ. එය එසේ වන්නේ නම්, අභියාචනා විභාගයේදී පොදු අධිකාරියෙහි නිලධාරීන් තහවුරු කළ පරිදි අදාළ ඉඩම සම්බන්ධයෙන් රජය විසින් නිකුත් කරන ලද පැවරීමේ සහතිකය/නියෝගයක් සම්බන්ධ තොරතුරු අභියාචක වෙත ලබාදීමට නියෝග කරනු ලැබේ.

මෙම අභියාචනා විභාගය අවසන් වන දින සිට සතියක් ඇතුළත අභියාචක වෙත ප්‍රශ්නගත තොරතුරු ලබාදීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව ඉදිරියේ සහතික වූ බව අප විසින් සඳහන් කරනු ලැබේ. ඉහත කී තොරතුරු ලබා නොදෙන්නේ නම් හෝ ඒවා ප්‍රමාණවත් නොවන්නේ නම්, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39(1)(ඉ) වගන්තිය අනුව කොමිෂන් සභාවේ තීරණය හා අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම මත අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත අභියාචක හට අයදුම්කිරීමට හැකියාවක් ඇති බව අවධාරණය කර සිටී.

නම්කළ නිලධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

# පුරුජෝත්තමන් තංගමයිල් එ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය[25]

*'පොදු අධිකාරිය තොරතුරු නිලධාරියෙකු පත්නොකිරීම සහ ඒ පිළිබඳ ප්‍රසිද්ධ කිරීමට පියවර නොගැනීම අධිකාරියේ අදාළ නම්කළ නිලධාරියා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 23(1)(ආ) වන වගන්තිය සහ 23(1)(අ) වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීමකි'*

**තීරණය:** පොදු අධිකාරියට, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුකූල වන පරිදි තොරතුරු නිලධාරීන් පත් කිරීමට ඇති ව්‍යවස්ථාපිත බැඳීම් පිළිබඳව මතක් කර සිටියි. එසේ සිදු කිරීමට අපොහොසත් වීම මත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 37(1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තාවේ පොදු අධිකාරිය නම් කිරීමට හේතු වේ.

මූලික පද : තොරතුරු නිලධාරී හා නම්කළ නිලධාරී පත් කිරීම (23(1)(අ) වගන්තිය හා 23(1)(ආ) වගන්තිය), විධානාත්මක කාර්යපටිපාටි ප්‍රතිවිපාක, පාර්ලිමේන්තුවට වාර්තා කිරීම (37(1) වගන්තිය)

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

අභියාචක, 2017.04.27 දින සඳහන් ලිපි මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. කරදියෙන් ලවණතාවය ඉවත් කිරීම පිළිබඳව මරුතාන්කේනි, තලෙයාඩි, යාපනය ප්‍රදේශවල සිදුකිරීමට නියමිත පර්යේෂණ වල ව්‍යාපෘති වාර්තා
2. ඉහත 1 හි සඳහන් ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සහ පාරිසරික කළමනාකරණ සැලසුම් වාර්තාව

25 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /78/2017 , 2017.10.23 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි

3. මරුතාන්කේනි ප්‍රදේශය මෙම ව්‍යාපෘතියට තෝරාගැනීම සඳහා පාදක වූ යෝග්‍යතා අධ්‍යයන වාර්තාව

4. අනෙකුත් නම්කළ ප්‍රදේශ මෙම ව්‍යාපෘතියට තෝරාගැනීම සඳහා පාදක වූ යෝග්‍යතා අධ්‍යයන වාර්තාවන්

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරයඃ</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධාරියා අභියාචක සම්බන්ධ කරගනිමින් ඔහුට ප්‍රකාශ කරන ලද්දේ අදාළ තොරතුරු ඉල්ලීම 2017.02.03 දින නිකුත් කරන ලද, අංක 2004/66 දරන ගැසට් පත්‍රයේ 6 වන වගන්තියේ, 4 වන රෙගුලාසිය ප්‍රකාරව උතුරු පළාත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලයට යොමුකරන බවයි.

<u>විභාගය අතරතුරදී පැන නැගුණු ගැටලු</u>

පොදු අධිකාරියේ අවිධිමත් හා හිතාමතාම තොරතුරු ලබාදීම ප්‍රමාද කිරීම පිළිබඳව අභියාචක විසින් කොමිසමට අභියාචනය කරන ලද අතර පසුකාලීනව එම තොරතුරු අන්තර්ජාලයට මුදාහරින ලදි. පොදු අධිකාරිය තර්ක කර සිටියේ ඔවුන්ගේ නිලධාරීන් වෙනත් කරුණු අතර අදාළ යෝග්‍යතා අධ්‍යයන වාර්තාව නිකුත් කිරීම සම්බන්ධයෙන් සැකසහිත බවකින් පසුවූයේ එය රහසිගතව තබාගත යුතු මූල්‍යමය තොරතුරු ගණයට අදාළ විය හැකි නිසා බවයි.

**නියෝගය**[26]

පොදු අධිකාරිය තොරතුරු නිලධාරියෙකු පත්නොකිරීම සහ ඒ පිළිබඳ ප්‍රසිද්ධ කිරීමට පියවර නොගැනීම අධිකාරියේ අදාළ නම්කළ නිලධාරියා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 23(1)(ආ) වන වගන්තිය සහ 23(1)(අ) වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත වගකීම් පැහැර හැරීමකි.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 2017.02.03 දින සිට භාවිතයට පැමිණ මාස 9 කටත් අධික

26 2017.10.23 දින ලබාදෙන ලදි.

කාලයක් ගතවී ඇත. මෙම කාලය තුලදී තොරතුරු නිලධාරියෙක් පත් කිරීමට අපොහොසත් වූ විට පනතේ 23(1)(ආ) වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියේ සභාපති/ප්‍රධානියා එම තනතුරට නිතැතින් පත්වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මෙම පනත යටතේ තම වගකීම් නැවතත් සිහි කරන අතර, 2017.02.03 නිකුත් කරන ලද 2004/66 දරන ගැසට් පත්‍රයට අනුකූලව පොදු ආයතන තම වගකීම් පැහැර හැරීම පිළිබඳව කොමිෂන් සභාව විසින් පනතේ 37(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවේ මේ පිළිබඳව සඳහන් කරනු ලැබේ.

# බෂීර් සේගු දාවුද් එ. ජනාධිපති ලේකම් කාර්යාලය[27]

*'ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, 1948 පනත (සංශෝධිත) යටතේ පිහිටුවනු ලබන කොමිෂන් සභාවන් හි සියලු වාර්තා වල භාරකරු වේ. එබඳු කොමිෂන් සභාවක වාර්තාවක් එකී නීතිය තුළ හා නීතිය යටතේ මූලික වාර්තාවකින් සමන්විත විය යුතුය. මේ අනුව, කොමිෂන් සභාවක හෝ කමිටුවක වාර්තාව නීතියට අනුව දෙපාර්තමේන්තුව වෙත එවා තිබේද යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා වාර්තා තැන්පත් කිරීමේ ව්‍යූහය හෝ තැනැත්තන් (අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ එබඳු කොමිෂන් සභාවක හෝ කමිටුවක ලේකම්වරයා) විධිමත් අයුරින් කැඳවීමට දෙපාර්තමේන්තුවට හැකියාව තිබේ'*

**තීරණය:** ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නිර්මාතෘ හා හිටපු නායක, එම්. එච්. එම්. අෂ්රෆ් මහතාගේ මරණය පිළිබඳ විමර්ශන කොමිසමේ වාර්තාව, ජනාධිපති ලේකම් කාර්යාලයේ (තැන්පත් කිරීමේ ආයතනය) හෝ ජාතික ලේඛනාරක්ෂකයේ/1948 පනත (සංශෝධිත) යටතේ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවන්හි භාරකරු වශයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරිය වන්නේ අදාළ තැන්පත් කරන ආයතනයෙන් විමර්ශන කොමිෂන් වාර්තා කැඳවීම සහ ලබා ගැනීමයි. නොමැති තත්වයක් තුළ කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයකින් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් (CID) ලබාගෙන මහජනතාව වෙත හෙළිදරව් කරන ලදී.

**මූලික පද:** පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව (4 වන වගන්තිය)/මූලික වාර්තා/වාර්තා (පරීක්ෂණ කොමිෂන් සභාවේ)

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

අභියාචක 2017.02.08 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

27 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /22/2017, 2017.10.16, 2017.11.20, 2018.01.16 හා 2018.02.27 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

2000 වසරේ හෙලිකොප්ටරය කඩාවැටීමෙන් මියගිය ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නිර්මාතෘ සහ හිටපු නායක එම්.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණයට අදාළ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව.

**පොදු අධිකාරියේ ප්‍රතිචාරය**

2017.03.02 දිනැති ලිපිය මගින් ජනාධිපති ලේකම් කාර්යාලයේ තොරතුරු නිලධාරියා සඳහන් කළේ එම වාර්තාවට අදාළ ලිපිගොනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව ය.

ඉන් අනතුරුව අභියාචක වෙත පොදු අධිකාරිය විසින් 2017.03.20 දිනැති තවත් ලිපියක් යවමින් සඳහන් කළේ තොරතුරු සොයාගත නොහැකි බැවින් ඔහුගේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කෙරුණු බවයි. ඉන්පසු අභියාචක, එම පොදු අධිකාරියේ නම්කළ නිලධරයා වූ අතිගරු ජනාධිපතිවරයා වෙත 2017.03.27 දින අභියාචනය කළේය. නම්කළ නිලධාරයා, 2017.04.25 දිනැති ලිපිය මගින්, ඔහු ඉල්ලා සිටින තොරතුර සොයාගත නොහැකි හෙයින් සහ, ඔහුගේ තොරතුරු ඉල්ලීමේ අන්තර්ගතය වසර 12කට වඩා පැරණි හෙයින් ඒ අනුව ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව නම්කළ නිලධාරියා අභියාචක වෙත දැනුම් දී තිබිණි. අභියාචක 2017.05.08 වන දින කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදී.

## නියෝගය[28]

නීතියට අනුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට පරීක්ෂා කිරීමට බලයක් නැති මෙකී ලේඛන රහසිගත/විශ්වාසනීය ලේඛන බවත් ඒවා පරීක්ෂා කිරීම හෝ ඒවා මහජනයා අතරින් අයෙකුට ලබාදීම සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සහ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් විමසා විධිමත් අවසරය ලබාගත යුතු බවට ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් සිදුකළ කරුණු කියාපෑම වෙතට මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු වෙයි.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වැනි වගන්තිය සඳහන් කරනුයේ,

28 2017.11.20 දින ලබාදෙන ලදි.

"වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය" යනුවෙනි.

මෙහිදී, ජාතික ලේඛනාරක්ෂණ නීතිය සහ එයට අදාළ රහසිගතභාවය ට සම්බන්ධ රෙගුලාසි අභිබවා සහ ඒවාට ඉහළින්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රමුඛවන බව පැහැදිලි ය.

මේ ගැටලුව සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව නොමැති වීම, සැලකිය යුතු මහජන සුබසිද්ධියට අදාළ කාරණයක් වීම ද මෙහිදී සලකා බැලීමට උචිත කාරණයකි. තවද, තොරතුරු පනතේ 5 වැනි වගන්තියට අනුව මේ ගැටලුව සම්බන්ධයෙන් අදාළ පොදු අධිකාරිය විසින් තොරතුරු මුදාහැරීම පිළිබඳ නගනු ලැබූ ව්‍යතිරේකයක් ද මෙම තොරතුරු කොමිෂන් සභාව වෙත දැනුම් දී නැත. 2017.03.20 දිනැති ලිපිය මගින් මෙන්ම 2017.08.18 දින මෙම කොමිසම වෙත ඉදිරිපත් කළ ලිඛිත කරුණු කියාපෑම් මගින් ද දැක්වෙන පරිදි, ඉල්ලා සිටි තොරතුරු අභියාචක වෙත ලබාදීමට අසමත් වීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් දක්වන හේතුව, තොරතුර සොයාගත නොහැකි බැවින් එය ලබාදිය නොහැකි බව දැක්වීමට පමණක් සීමා වේ.

මහජන සුබසිද්ධිය ප්‍රමුඛතර වීම සහ මහජන සුබසිද්ධිය තුළ මෙම ගැටලුව අදාළ වන්නේ 1948 අංක 17 දරණ පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධිත) පනත යටතේ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත පරීක්ෂණ ව්‍යුහයක වාර්තාවකට අදාළ තොරතුරක් සම්බන්ධයෙන් වන අතර, මේ කොමිෂන් සභාව විසින් මෙයින් පසු විස්තර විභාග වශයෙන් දක්වන ලේඛන මුදාහරින ලෙස නියෝග කරනු ලබයි.

අ) ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම්වරයා විසින්, මේ සිද්ධියට අදාළ පරීක්ෂණ කොමිෂන් සභාවේ සොයාගැනීම් සාරාංශගත කරමින් 2002.08.12 දින යොදනු ලැබූ, 2007.05.18 දින ජනාධිපති ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබූ ගොනුවේ, ලකුණු කර ඇති පරිදි පිටපතක්,

ආ) ඉහත කී ගොනුවේ අන්තර්ගත, නිශ්චිත තැනැත්තන් වෙත වන්දි වශයෙන් සිදුකළ ගෙවීම්වලට අදාළ නිර්දේශයන් හා සබැඳිව මෙම තොරතුරු ඉල්ලීමට විෂය වන කොමිෂන් සභා වාර්තාවේ පිටු 3 හි පිටපතක්

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, 1948 පනත (සංශෝධිත) යටතේ පිහිටුවනු ලබන කොමිෂන් සභාවන් හි සියලු වාර්තා වල භාරකරු වේ. එබඳු කොමිෂන් සභාවක වාර්තාවක් එකී නීතිය තුළ හා නීතිය යටතේ මූලික වාර්තාවකින් සමන්විත විය යුතුය. මේ අනුව, කොමිෂන් සභාවක හෝ කමිටුවක වාර්තාව නීතියට අනුව දෙපාර්තමේන්තුව වෙත එවා තිබේද යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා වාර්තා තැන්පත් කිරීමේ ව්‍යූහය හෝ තැනැත්තන් (අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ එබඳු කොමිෂන් සභාවක හෝ කමිටුවක ලේකම්වරයා) විධිමත් අයුරින් කැඳවීමට දෙපාර්තමේන්තුවට හැකියාව තිබේ. එබඳු ඉල්ලීමක් සමග අනුගත නොවන්නේ නම් දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳ නිල වශයෙන් සටහන් තැබීම, යම් නිශ්චිත වාර්තාවක් කොතැනක තිබෙන්නේදැයි සවිස්තරාත්මකව පැහැදිලි කර ගැනීමේදී ප්‍රයෝජනවත් වනු ඇත.[29]

නම්කළ නිලධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

29 (2018.02.27 දින) ජනාධිපති ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම් (නීති), කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේ ජනාධිපති ලේකම් කාර්යාලය විසින්, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නිර්මාතෘ ඒ.එච්.එම්. අෂ්රොෆ් මහතාගේ මරණයට අදාළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ සහතික කළ පිටපතක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් (CID) ලබාගත් බවයි. එය සිදුකර තිබෙන්නේ පෙර විභාගයේදී තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් නියම කළ පරිදි ජයවික්‍රම මහත්මිය විසින් එකී වාර්තාවේ පිටපතක් ඉල්ලා සිටිමින් රජයේ මුද්‍රණාලයෙන් සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලිපියක් මාර්ගයෙන් ඉල්ලා සිටීමෙන් පසුව ය. 2018.02.05 දිනැති ජයවික්‍රම මහත්මියගේ ලිඛිත ඉල්ලීම අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය භුක්තියේ පැවති එකී වාර්තාවේ පිටපතක් යවා ඇති අතර. එය 2018.02.14 දින ජනාධිපති ලේකම් කාර්යාලය විසින් භාරගෙන තිබිණි. ජනාධිපතිවරයාගේ එවකට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වූ ඩබ්.ජේ.එස්. කරුණාරත්න විසින් එම වාර්තාව සත්‍ය පිටපතක් බවට 2003.03.36 දින සහතික කර තිබූ අතර, එය අභියාචක වෙත ලබාදෙන ලදී.

# බී. ඒ. ජේ. ඉන්ද්‍රතිලක එ. විසාකා විද්‍යාලය/ අධ්‍යාපන අමාත්‍යාංශය[30]

**'තොරතුරු නිලධාරියා ගේ සහ නම්කළ නිලධාරියාගේ නිශ්ශබ්දතාවය ව්‍යවස්ථාපිත තෝරාගැනීමක් නොවන අතර, එය පනත උල්ලංඝනය කිරීමේදී ප්‍රතිඵල වූ, එම පනතේ විධිවිධානවලට අනුගත වීමට දිගින් දිගටම අසමත් වීමකි'**

**තීරණය:** පාසැල් වලට සිසු දරුවන් ඇතුළත් කර ගැනීම/සමාන තොරතුරු කලින් නිකුත් කරනු ලැබූ සන්දර්භයක් තුළ වුවද එම දත්ත 4 වැනි ශ්‍රේණි සම්බන්ධයෙන් වන නිසා (ඉහත තොරතුරු හෙළිදරව් කිරීමෙන් පසුව නිකුත් කරන ලද තොරතුරු සම්බන්ධයෙන් අදාළ වේ) 2014 තුන්වන වාරයේ අවසන් දිනය වන විට පළමු ශ්‍රේණියේ සිට තුන් වන ශ්‍රේණිය දක්වා වන ශිෂ්‍යයින්ගේ නම් සහිත නාමලේඛනය හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් නම්කළ නිලධාරියාගේ තීරණය අනුමත නොකරන ලදි.

**මූලික පද:** විනය ක්‍රියාමාර්ග/විධානාත්මක කාර්යපටිපාටි (තොරතුරු නිලධාරියෙකු හා/හෝ නම්කළ නිලධාරියෙකු තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර නොදැක්වීමේ ඵලවිපාක)/පෞද්ගලිකත්වය (බාලකයින්ගේ)/5(1)(අ) වගන්තිය

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

2017.10.23 වැනි දින අභියාචක විසින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී. තවද, මෙම ලේඛන විදුහල්පතිනියගේ අත්සන, නිලමුද්‍රාව සහ වලංගු කළ දිනය ද සහිතව, සත්‍ය පිටපත් ලෙස සහතික කර දෙන ලෙසට ද අභියාචක ඉල්ලා ඇත.

1. 2014 තෙවැනි පාසල් වාරයේ අවසාන දිනය වන විට, පළමු ශ්‍රේණියේ A, B, C, D හා E පන්තිවල සියලු සිසුන්ගේ නාමලේඛණය
2. 2014 තෙවැනි පාසල් වාරයේ අවසාන දිනය වන විට, දෙවැනි ශ්‍රේණියේ A, B, C, D හා E පන්තිවල සියලු සිසුන්ගේ නාමලේඛණය

30 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /63/2018, 2018.03.23 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.

3. 2014 තෙවැනි පාසල් වාරයේ අවසාන දිනය වන විට, තෙවැනි ශ්‍රේණියේ A, B, C, D හා E පන්තිවල සියලු සිසුන්ගේ නාමලේඛණය

4. 2014 තෙවැනි පාසල් වාරයේ අවසාන දිනය වන විට, සිව්වැනි ශ්‍රේණියේ A, B, C, D හා E පන්තිවල සියලු සිසුන්ගේ නාමලේඛණය

ඉහත ඉල්ලීමට තොරතුරු නිලධාරියාගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලද හෙයින්, අභියාචක 2017.11.07 වැනි දින නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියාගෙන් ද අභියාචනයට ප්‍රතිචාරයක් නොලද හෙයින්, අභියාචක විසින් 2017.11.28 වැනි දින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමුකරන ලදී.

<u>අභියාචනය විභාග කරන අවස්ථාවේ උද්ගත වූ කරුණු:</u>

ඉහත තොරතුරු ඉල්ලීමෙහි දක්වා ඇති දිනයන්ට අදාළ පැමිණීමේ නාමලේඛණයන් තමන් විසින් ඉල්ලා සිටි බවට අභියාචක කරුණු කියා සිටියේය. මෙම ඉල්ලීමේ පදනම විමසූ විට අභියාචක එයට පිළිතුරු ලෙස දක්වා ඇත්තේ, 2014 වසරේදී වෛද්‍යවරුන් සත් දෙනෙකු (07) අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයාගෙන් අදාළ සිසුන් පොදු අධිකාරියට (විසාකා විද්‍යාලය) ඇතුළත් කරගැනීමට උපදෙස් සහිත ලිපි ලබාගත් බව ය. මෙම අවස්ථාවේ දී විදුහල්පතිනිය මෙම උපදෙස් පිළිපැද නොමැති වුවත්, 2015 වසරේ දී එම සිසුන් දෙවැනි ශ්‍රේණියට ඇතුළත්කරගන්නා බවට සහතික වී ඇති අතර අභියාචක ඇතුලු පිරිස එයට එකඟ විය. නමුත් 2016 දී විදුහල්පතිනිය මෙම සහතිකය මත ක්‍රියා නොකළාය. අනතුරුව, අභියාචක විසින් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්වරයාගෙන් 2015 වසරේ දී දෙවැනි ශ්‍රේණියට ඇතුළත් කරගන්නා ලෙස විදුහල්පතිනියට උපදෙස් සැපයූ ලිපියක් ලබාගැනීමට උත්සාහ කළ ද, මෙම ඉල්ලීම අමාත්‍යංශය මගින් ප්‍රතික්ෂේප කරන ලදී. පසුව විදුහල්පතිනිය විසින් මෙම සිසුවියන් සත් දෙනාගෙන් එක අයෙකු ඇතුළත් කරගන්නා ලදී.

**නියෝගය:**[31]

1-3 දක්වා අයිතමයන්හි සදහන් වන, 2014, 2015 හා 2016 වර්ෂයන් හි තෙවැනි වාරය අවසානයේදී 1, 2 සහ 3 වැනි ශ්‍රේණි වල සියලු දරුවන්ගේ පැමිණීමේ නාමලේඛණයන්හි තොරතුරුවලට

31 2018.023.23 දින ලබාදෙන ලදි.

අදාළව අප මතය වනුයේ, කුමාරසිරි මානගේ එ. ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය (RTIC Appeal/65/2017, 2017.10.16 RTIC වාර්තාව) හි දී, පහත කරුණු වලට අදාළ තොරතුරු දැනටමත් මුදාහැර ඇති අතර එය දැනටමත් පොදු වාර්තාවන්හි කොටසක් බවට පත්ව ඇති බවයි.

1. 2017.04.22 දිනට විසාකා විද්‍යාලයේ සිව්වැනි ශ්‍රේණියේ එක් එක් පන්තියේ සිසුන් සංඛ්‍යාව.

2. පළමු ශ්‍රේණියට ඇතුළත් කරගැනීමට අදාළ පහත තොරතුරුඃ

   අ.) 2014 දී සම්මුඛ පරීක්ෂණ මගින් පළමු වසරට ඇතුළත් කරගන්නා ලද සිසුන් ගේ නාම ලේඛණය සහ ඇතුළත් කරගන්න ලද සිසුන් සංඛ්‍යාව;

   ආ.) 2014 දී විශේෂ අභියාචනා මණ්ඩලය විසින් ඇතුළත් කරගැනීමට නිර්දේශ කරන ලද සිසුන් ගේ නාම ලේඛණය සහ ඇතුළත් කරගන්න ලද සිසුන් සංඛ්‍යාව (අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ උපදේශය/නියෝගය මත ඇතුළත් කරගන්න ලද සිසුන්);

   ඇ.) 2014 දී අධ්‍යාපන අමාත්‍යංශයෙන් නිකුත් කරන ලද ලිපි මත ඇතුළත් කරගන්නා ලද සිසුන් ගේ නාම ලේඛණය සහ ඇතුළත් කරගන්න ලද සිසුන් සංඛ්‍යාව; සහ

   ඈ.) 2014 ජනවාරි සිට මෙතෙක් ඉහත දැක්වූ කාර්යයපටිපාටිය හැර වෙනත් ආකාරයකින් ඇතුළත් කරගන්නා ලද සිසුන් ගේ තොරතුරුඃ

      i. සිසුවාගේ නම

      ii. ඇතුළත් වීමේ දිනය

      iii. ඇතුළත් කරගැනීමට හේතුව

මෙම අවස්ථාවේ දී, 2014 වර්ෂයේ දී කොළඹ 5, විසාඛා විද්‍යාලයට ඇතුළත් කරගන්නා ලද දරුවන් පිළිබඳව නම් ලැයිස්තුවකට සහ ලිපිනයන්ට පමණක් සීමා වූ තොරතුරු ලබා දීමට කොමිෂන් සභාව මගින් නියෝග කරන ලදී. එම තොරතුරු අනෙක් පාසල්වල ද පළමු වසරට දරුවන් ඇතුළත් කරගැනීම සම්බන්ධව ද, අධ්‍යාපන

අමාත්‍යාංශය මගින් ප්‍රේමලාල් අබේසේකර එ. අධ්‍යාපන අමාත්‍යාංශය (RTIC Appeal/25/2017, 2017.07.21 RTIC වාර්තාව) හි දැක්වෙන පරිදි නිකුත් කර ඇති බවත්, බාලවයස්කරුවන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිවාසිකමත් කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගන්නා ලදී.

මෙම අභියාචනයේදී, අභියාචක විසින් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති, අදාළ පාසලේ දරුවන් සෑම වසරකදීම ඇතුළත් කරගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ පැමිණීම සම්බන්ධ තොරතුරු ලබාදුනහොත් එමගින් බාලවයස්කරුවන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිවාසිකම උල්ලංඝනය වීමක් සිදුවන අතර, එමගින් පනතේ 5(1)(අ) වැනි වගන්තිය ද කඩ වනු ඇත. මෙම අභියාචනයෙහි 1-3 දක්වා වන අයිතමයන් හි ඉල්ලුම් කර ඇති තොරතුරු වල මහජන අර්ථසාධන අගය ද, මානගේ අභියාචනය (ඉහත) හි තොරතුරු නිදහස් කිරීම හේතුවෙන් ශූන්‍ය වී ඇත. පොදු අධිකාරිය විසින් දැනටමත් අදාළ වසර වල අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද, අනතුරුව දරුවන් ඇතුළත් කරගැනීමට හේතු වූ, ලිපි පිළිබඳව තොරතුරු ලබා දී ඇති බවට පොදු අධිකාරිය (විසාඛා විද්‍යාලය) විසින් කොමිෂන් සභාව ඉදිරියේ තහවුරු කොට ඇත. තවද, එම තොරතුරු මෙම අවස්ථාවේ දී ලබා ගැනීමට අභියාචක පදනම වන්නේ එකී ලිපි මගින් සත්‍ය තත්වය නිරාවරණය නොවන බවට ඔහුට ඇති සැකය වන නමුත්, ඔහු විසින් මෙය තහවුරු වන ආකාරයේ නිශ්චිත තොරතුරු සපයා නොමැත.

මෙම ආකාරයේ තොරතුරු ඉල්ලා සිටීම් පොදු අධිකාරිය වෙත අනවශ්‍ය බරක් ඇති කරයි. තවද, මෙමගින් දිවයිනේ අනෙකුත් කොටස්වල, අනෙකුත් පාසල් වලට අදාළව ද, එක් එක් ශ්‍රේණියෙහි එක් එක් වසර වලට අදාළ පැමිණීමේ නාමලේඛණ සම්බන්ධ මේ හා සමාන තොරතුරු ඉල්ලීම් සඳහා පූර්වාදර්ශයක් සැපයීමේ ඇති අනතුරුදායක බව පිළිබඳව ද, මෙම තොරතුරු බාල වයස්කරුවන් පිළිබඳ වීම හේතුවෙන්ම අපි සැලකිල්ලට ගනිමු. එහෙයින්, තොරතුරු ඉල්ලීමෙහි 1-3 දක්වා අයිතමයන්හි වන තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී.

එසේ වුවද, මෙම සිදුවීමේ දී, අදාළ තොරතුරු නිලධාරියා සහ නම්කළ නිලධාරියා විසින් කටයුතු කරන ලද ආකාරය පනතේ 23 සහ 29 වගන්ති මගින් නියම කරන ලද, තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම

සම්බන්ධ කාර්යයපටිපාටියට පටහැනි ය. තොරතුරු නිලධාරියා ගේ සහ නම්කළ නිලධාරියාගේ නිශ්ශබ්දතාවය ව්‍යවස්ථාපිත තෝරාගැනීමක් නොවන අතර, එය පනතක් උල්ලංඝනය කිරීමේදී ප්‍රතිඵල වූ, එම පනතේ විධිවිධානවලට අනුගත වීමට දිගින් දිගටම අසමත් වීමකි.

තොරතුරු ඉල්ලීමෙහි 4 වන අයිතමයෙහි දැක්වෙන 2017.10.25 දිනට (ඉහත මානගේ අභියාචනයට පසු දින) 04 ශ්‍රේණියේ දරුවන්ගේ පැමිණීමේ නාමලේඛණය පිළිබඳ ඉල්ලීමෙන් දක්වන තොරතුරු, ළමයෙකු පාසලට ඇතුළත් කරගැනීමේදී අක්‍රමිකතාවයක් සිදුවී ඇත්දැයි දැනගැනීම සඳහා අත්‍යවශ්‍ය බවට අභියාචක විසින් දක්වන තර්කය කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගනු ලැබේ. ඒ මත දැඩි වශයෙන් පදනම් වී හා සීමා වී සහ, එකී තොරතුරු නිශ්චිත දිනයකට අදාළ, ඇතුළත් කරගැනීමේ අක්‍රමිකතාවයක් පිළිබඳ චෝදනාවක් සම්බන්ධයෙන් වීම සහ සාමාන්‍යකරණය නොවූ ස්වභාවයක් සහිත වීම සැලකිල්ලට ගනිමින් 04 වැනි අයිතමයට අදාළ තොරතුරු ලබා දීමට කොමිෂන් සභාව විසින් නියෝග කරනු ලැබේ.

1-3 දක්වා වන අයිතමයන් ආශ්‍රිත නම්කළ නිළධාරියාගේ තීරණය ස්ථිර කරණ අතර 4 වන අයිතමයට අදාළ තීරණය මින් ප්‍රතිවර්ථනය කෙරේ.

අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

## ආචාර්ය මාරියෝ ගෝමස් එ. මහජන සවිබලගැන්වීම, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය[32]

*'ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පත ඉදිරියේදී සංශෝධනයන් හට යටත් වීමට ඉඩ ප්‍රස්තාව තිබුනද, එහි දැනට පවත්නා කෙටුම්පතෙහි පිටපතක් අභියාචකහට ලබාදීමට පොදු අධිකාරිය බැඳී සිටින අතර අදාළ කෙටුම්පත ගැසට් කරනතෙක් සිටීමට අවශ්‍යතාවයක් නොමැත'*

**තීරණය:** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 43 වැනි වගන්තියේ "තොරතුරු"යන්නට දී ඇති නිර්වචනය පරිදි 'කෙටුම්පතක්' යන්න පනතෙහි විෂය පථයට ප්‍රකාශිතවම ඇතුළත් කර ඇති නිසා "ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පත" ප්‍රකාශයට පත් කිරීමට පොදු අධිකාරිය බැඳී සිටියි.

මූලික පදඃ නිර්වචන/අර්ථ නිරූපන (43 වගන්තිය)/නීති කෙටුම්පත්

### අභියාචනයට පසුබිම් වූ කරුණුඃ

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරුඃ</u>

2017.07.13 වැනි දින අභියාචන විසින් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පතෙහි නවතම සංස්කරණයෙහි පිටපතක් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ බ්‍රේල්) සහ එම නීති කෙටුම්පතෙහි වර්තමාන තත්ත්වයට අදාල තොරතුරු ඉල්ලා සිටින ලදි.

තවද අදාළ නීති කෙටුම්පතට කැබිනට් අනුමැතිය ලැබී පාර්ලිමේන්තුවේ ලැයිස්තුගත වීම කෙදිනක විය හැකිද යන්නද අභියාචක විමසා ඇත.

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය</u>

තොරතුරු නිලධාරියා 2017.11.10 දිනැති ලිපිය මගින් අභියාචක වෙත පවසා ඇත්තේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පත රජයේ නීති සම්පාදක විසින් අමාත්‍යාංශයේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇති බවත් අදාළ නිරීක්ෂණ සැපයීම සඳහා අවශ්‍ය පියවර රැගෙන ඇති බවත්ය. එමෙන්ම අදාළ නීති කෙටුම්පත ගැසට්

---

32 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /51/2018, 2018.02.27 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.

කරන තුරු එය අභියාචක ඉල්ලන ලෙස සැපයීමට නොහැකි බවද තොරතුරු නිලධාරීවරයා  වැඩි දුරටත් දන්වා ඇත.

ඉක්බිතිව අභියාචක 2017.10.25 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කරන ලදී. අභියාචක තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාරයම දක්වමින් 2017.08.11 දිනැතිව පිළිතුරු සපයන ලදී. නම් කළ නිලධාරී වැඩි දුරටත් පවසා ඇත්තේ අදාළ සංශෝධනයන් පිළිබඳව වාර්තාවක් දැනටමත් සකස් කොට අවසන්ව ඇති බවද එය සමාජ සංවර්ධන ආයතනයේ ජාතික පාලක සභාවෙහි (Governing Council of National Institute of Social Development) අනුමැතිය ලබාගැනීම සඳහා 2017.11.15 වන දිනට ප්‍රථමව යොමු කර ඉනික්බිතව 2017.11.30 දිනට ප්‍රථමව නීති සම්පාදක වෙත දැන්වීමට පොදු අධිකාරිය කටයුතු කරනු ඇති බවය.

2017.11.30 දිනට අනතුරුව පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීම පිළිබඳව ප්‍රතිචාරයක් නොදැක්වූ හෙයින් අභියාචක 2017.12.05 දිනැතිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදී.

<u>අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:</u>

නම්කළ නිලධාරි විසින් ඔහුගේ ප්‍රතිචාරයෙහි සඳහන් කළ දින වකවානු ඉකුත් වී ඇති හෙයින්, කෙටුම්පතේ දැනට පවත්නා තත්ත්වය පිළිබඳව කොමිෂන් සභාව විමසූ අවස්ථාවේදී, පොදු අධිකාරිය නියෝජනය කරමින් පැමිණ සිටි මහජන සවිබලගැන්වීම, සුභසාධන සහ කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්.ඩී.උඩවත්ත මහතා විසින් පැහැදිළි කර සිටියේ ජාතික නීති සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කළ අමාත්‍යංශයේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇති කෙටුම්පත පාලක සභාවේ රැස්වීම් වල කිහිපවතාවක් ලැයිස්තුගත කර තිබුනද එය මේ දක්වා සමාලෝචනය කිරීමට නොහැකි වී ඇති බවයි. එම නිසාවෙන් අභියාචක හට පනත් කෙටුම්පතේ පිටපතක් ලබා දීමට නොහැකි වූ බව පොදු අධිකාරිය වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පවත්නා ක්‍රියාවලියේ අවිනිශ්චිතභාවය තුළ කෙදිනකදී පනත් කෙටුම්පතට කැබිනට් අනුමැතිය ලැබී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද යන්න සම්බන්ධව පොදු අධිකාරියට නිශ්චිතවම ප්‍රකාශ කිරීමට නොහැකි බව උඩවත්ත මහතා දන්වන ලදී.

මෙම තොරතුරු ඉල්ලීම පොදු මහජන සුභසිද්ධිය උදෙසා මහත්සේ බලපාන අතර කෙටුම්පතේ අන්තර්ගතය විශේෂයෙන් ගත් කළ අබාධිත පාර්ශ්වයන්ට ප්‍රයෝජනවත් බව අභියාචක ප්‍රකාශ කරන ලදී.

**නියෝගයඃ**

අදාළ පාලක සභාව තොරතුරු ඉල්ලීමෙන් විමසා ඇති නීති කෙටුම්පත සළකා නොතිබීම 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ දක්වා ඇති තොරතුරු වලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා වලට අයත් නොවේ. එමෙන්ම 43 වගන්තිය යටතේ දක්වා ඇති "තොරතුරු" අර්ථනිරූපණය යටතේ නීති කෙටුම්පත් යන්නද එහි විෂයසීමාව යටතේ විශේෂයෙන්ම දක්වා ඇති බවද සඳහන් කිරීම සුදුසුය. දකුණු ආසියාවේ මෙන්ම ලෝකයේ බොහෝ රටවල්වල නීති කෙටුම්පත් ගැසට් කිරීමට ප්‍රථමව මහජනයාට ඉදිරිපත් කළ යුතුව ඇත්තේ කෙටුම්පතෙහි අන්තර්ගතය පිළිබඳව මහජන ප්‍රතිචාර ලබා ගැනීම මාර්ගයෙන් අදාළ කෙටුම්පත සකස් කිරීම සම්බන්ධයෙන් ජන සම්මතියකට එළඹගැනීම උදෙසා එය ඵලදායී ක්‍රියාමාර්ගයක් ලෙස සැළකෙන බැවිනි.

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පත ඉදිරියේදී සංශෝධනයන්හට යටත් වීමට ඉඩ ප්‍රස්තාව තිබුනද, එහි දැනට පවත්නා කෙටුම්පතෙහි පිටපතක් අභියාචකහට ලබාදීමට පොදු අධිකාරිය බැඳී සිටින අතර අදාළ කෙටුම්පත ගැසට් කරනතෙක් සිටීමට අවශ්‍යතාවයක් නොමැත.

ඒ අනුව, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ නීති කෙටුම්පතෙහි පිටපතක් අභියාචක සහ පොදු අධිකාරියෙහි නියෝජිත එකඟ වූ පරිදි සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන ත්‍රිවිධ භාෂාවෙන්ම අභියාචක වෙත 2018.03.16 වන දිනට ප්‍රථමව ලබාදීමට පොදු අධිකාරියට නියෝග කර සිටී.

නම්කළ නිළධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්ථනය කෙරේ

අභියාචනය මෙසේ අවසන් කරන ලදී.

# රයිසා වික්‍රමතුංග එ. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව[33]

***2017.02.03 දින ගැසට් කරන ලද (ගැසට් අංක 2004/66) RTI රෙගුලාසිවලින් නියම කරන ලද නීතිය සහ ක්‍රියාපටිපාටියේ රෙගුලාසි 4 හි 6 යටතේ පොදු අධිකාරියට ඇති වගකීම තොරතුරු ඉල්ලුම්කරුවෙකු තොරතුරුවලට අදාළවන පොදු අධිකාරිය නිර්ණය කරගැනීම සම්බන්ධයෙන් පත්වන අපහසුතාවය වළක්වාලීමට පවරා ඇත....***

***... මෙම අභියාචනයෙහි විමසා ඇති තොරතුරු 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ඇති තොරතුරු ප්‍රදානය මුක්ත කර ඇති අවස්ථාවකට යටත්ව මෙන්ම ඉන් අනතුරුව එහිලා මහජන සුබසිද්ධියට අදාළ නොවන බවත් ඔප්පු කර දැක්වීමර පොදු අධිකාරියට නොහැකි වන්නේ නම්, තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ලබාගත හැකි නීත්‍යනුකූල තොරතුරු වේ'***

**තීරණය:** 2017 නොවැම්බර් මස දී ලංකා ඊ නිවුස් වෙබ් අඩවිය අවහිර කිරීමට හේතු හෙළදරව් කිරීමට පොදු අධිකාරියට නියම කරනු ලබයි. නියෝගය ලබා දෙන අධිකාරියේ අනන්‍යතාවය සහ එමගින් දී ඇති හේතු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ සුජාත ලෙස හෙළිදරව් කළ හැකි හෙයින් වෙබ් අඩවිය අවහිර කිරීමට පවතින හේතු ජාතික ආරක්ෂාව යන විෂය පථය තුළට නොවැටෙන බව ප්‍රකාශ කරන ලදි.

**මූලික පද:** මාරුකර යැවීමේ යුතුකම (තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රෙගුලාසිවල 4 වන රෙගුලාසියේ 6 වන වගන්තිය)/ජාතික ආරක්ෂාව (5(1)(ආ)(i) වගන්තිය)

## අභියාචනයට පසුබිම් වූ කරුණු:

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

අභියාචක 2017.11.10 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

---

33 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /106/2018, 2018.02.27 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. නියෝගය 2018.03.23 දින ලබාදෙන ලදි.

1. 2015 ජනවාරි මාසයේ සිට මේ දක්වා ප්‍රවෘත්ති වාර්තා කරන වෙබ් අඩවි සම්බන්ධව පොදු අධිකාරියට ලැබී ඇති පැමිණිලි සහ අදාළ පැමිණිලි ගොනුකර ඇති අධිකාරීන්ගේ අනන්‍යතාවය

2. 2015 සිට පැමිණිලි හේතුවෙන් ශ්‍රී ලංකා අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්හට අවහිර කර ඇති වෙබ් අඩවි සහ එම අවලංගු කිරීම් සඳහා දක්වා ඇති හේතු සාධක.

3. ලංකා ඊ නිව්ස් වෙබ් අඩවියට එරෙහිව 2017 වර්ෂයේදී ගොනුකරන ලද පැමිණිලි සහ අදාළ රාජ්‍ය අධිකාරියෙහි අනන්‍යතාවය.

4. ලංකා ඊ නිව්ස් වෙබ් අඩවිය අවහිර කිරීම සම්බන්ධව නිකුත් කළ නියෝගය, නියෝගය නිකුත් කර ඇති අධිකාරිය එම තීරණයට එළඹීම සම්බන්ධව දක්වා ඇති හේතු

5. ලංකා ඊ නිව්ස් වෙබ් අඩවිය අවහිර කිරීම උදෙසා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මැදිහත්වීම දක්වන වාර්තා ඇත්නම් ඒවා.

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය:</u>

තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් 2017.11.28 දින තොරතුරු නිලධාරී ප්‍රකාශ කර ඇත්තේ පොදු අධිකාරිය විසින් අවහිර කරන ලද වෙබ් අඩවිය සම්බන්ධ ලේඛන ලබාදීමට පොදු අධිකාරිය තීරණය කර ඇති අතර 01 වන අයිතමය යටතේ විමසා ඇති තොරතුරු පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බවයි. ඊට අමතරව, තොරතුරු ඉල්ලීමේ අයිතම 3,4,5 ට අදාළව තොරතුරු ප්‍රදානය කිරීම 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ආ)(i) වගන්තියට අනුව හෙළිදරව් කිරීම රාජ්‍ය ආරක්ෂාවට හෝ ජාතික ආරක්ෂාවට අගතිදායක වන බැවින් ප්‍රතික්ෂේප කර ඇත.

අභියාචක, තමාට ලැබුණු ප්‍රතිචාර සම්බන්ධයෙන් සෑහිමකට පත් නොවීම මත 2017.12.07 දිනැතිව නම්කළ නිලධාරියා හට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනයට ප්‍රතිචාර ලෙස 2017.12.15 දින නම්කළ නිළධාරියා 2 වන අයිතමය යටතේ විමසා ඇති තොරතුරු ප්‍රදානය කර ඇති අතර 3 වන අයිතමයට අදාළව තොරතුරු නිලධාරියාගේ තීරණය ස්ථිර කර ඇත. ඊට අමතරව, 01 වන අයිතමයට

අදාළව නම්කළ නිලධාරියා ප්‍රතික්ෂේප කර ඇත්තේ ජනමාධ්‍ය අමාත්‍යංශයේ උපදෙස් පරිදි ස්ථිර සහ ජංගම ක්‍රියාකරුවන් හට අදාළ ප්‍රවෘත්ති වෙබ් අඩවිය අවහිර කිරීමට පොදු අධිකාරියට දැනුම් දී ඇති හෙයින් එම පැමිණිලි හෝ අදාළ වාර්තා කිසිවක් පොදු අධිකාරිය සන්තකයේ හෝ භාරයේ නොමැති බවයි.

<u>අභියාචනා අවස්ථාවේදී උද්ගත වූ කරුණු:</u>

පොදු අධිකාරියෙහි තොරතුරු නිලධාරියා ප්‍රකාශ කරන ලද්දේ පොදු අධිකාරිය විදුලි සංදේශන අදාළ පැමිණිලි පමණක් සළකා බලන බවත් වෙබ් අඩවි සම්බන්ධව පැමිණිලි සළකා නොබලන බවත්ය. වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කරන නිසාවෙන් එම අමාත්‍යංශය ඊට අදාළ පැමිණිලි සළකා බලන බව ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය. එම අවස්ථාවේදී තොරතුරු නිලධාරියා හට 2017.02.03 දින ගැසට් කරන ලද (ගැසට් අංක 2004/66) RTI රෙගුලාසිවලින් නියම කරන ලද නීතිය සහ ක්‍රියාපටිපාටියේ රෙගුලාසි නියෝග අංක 4 හි 6 වගන්තිය යටතේ විමසා සිටින තොරතුරු වෙනත් ආයතනයක් සතුව ඇති බව තොරතුරු නිලධාරියා දැනුවත් නම් අයදුම්පත එකී පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා වෙත පවරා දීමට වගකීමක් ඇතිබව අවධාරණය කරන ලදි.

## අතුරු නියෝගය:

2017.02.03 දින ගැසට් කරන ලද (ගැසට් අංක 2004/66) RTI රෙගුලාසිවලින් නියම කරන ලද නීතිය සහ ක්‍රියාපටිපාටියේ රෙගුලාසි 4 හි 6 යටතේ පොදු අධිකාරියට ඇති වගකීම තොරතුරු ඉල්ලුම්කරුවෙකු තොරතුරුවලට අදාළවන පොදු අධිකාරිය නිර්ණය කරගැනීම සම්බන්ධයෙන් පත්වන අපහසුතාවය වළක්වාලීමට පවරා ඇත. එම නිසාවෙන් සියලු පොදු අධිකාරීන් මෙම වගකීම ඉටු කිරීමට කටයුතු කළ යුතු අතර තොරතුරු ප්‍රදානය කිරීමට ඇති ව්‍යවස්ථාපිත වගකීම මගහැරීමට මෙවලමක් ලෙස භාවිත නොකළ යුතුය.

මෙම අභියාචනයෙහි විමසා ඇති තොරතුරු 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ඇති තොරතුරු ප්‍රදානය මුක්ත කර ඇති අවස්ථාවකට යටත්ව මෙන්ම ඉන් අනතුරුව එහිලා මහජන සුබසිද්ධියට අදාළ නොවන බවත් ඔප්පු කර දැක්වීමර

පොදු අධිකාරියට නොහැකි වන්නේ නම්, තොරතුරු අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ලබාගත හැකි නීත්‍යානුකූල තොරතුරු වේ.

අභියාචක අයදුම්කරන ලද තොරතුරු අතුරින් ජනමාධ්‍ය අමාත්‍යාංශය භාරයේ, සන්තකයේ හෝ පාලනය යටතේ ඇති තොරතුරු පරීක්ෂා කිරීමට හා ඒ පිළිබඳව කොමිසම දනුවත් කිරීමටද පොදු අධිකාරියට නියෝග කර සිටී.

**නියෝගය:**[34]

ජනාධිපති කාර්යාලයෙන් ගොනුකර ඇති පැමිණිල්ල සහ අමුණා ඇති ප්‍රවෘත්ති වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව, මෙම තොරතුරු අභියාචක වෙත ප්‍රදානය නොකිරීමට හේතු සාධක ඇති බව අපි නොදකිමු. මෙම ප්‍රවෘත්ති වාර්තාවල නිරවද්‍යතාවය තීරණය කිරීම කොමිෂන් සභාවේ විෂය පථයට අදාළ වන්නේ නැත. ජනාධිපති කාර්යාලයෙන් 2017.11.06 දිනැතිව ගොනුකර ඇති පැමිණිල්ල, මෙම ප්‍රවෘත්ති වාර්තා පොදු අධිකාරියේ අවධානයට යොමුකර ඇති අතර ඒ අනුව සුදුසු නීත්‍යානුකූල තීරණයකට එළඹෙන ලෙස ඉල්ලා ඇත. මෙය තොරතුරු පනතට අනුකූලව නිකුත් කළ හැකි තොරතුරක් වේ.

අදාළ පැමිණිල්ලේ සහ අමුණා ඇති ප්‍රවෘත්ති වාර්තාවල පිටපත් අභියාචක හට ලබා දෙන මෙන් පොදු අධිකාරියට නියෝග කරනු ලැබේ. මෙම තොරතුරු, තොරතුරු ඉල්ලීමේ 3,4 සහ 5 අයිතමයන් යටතේ විමසා ඇති තොරතුරුවලට අදාළ වන බව කොමිෂන් සභාව නිර්ණය කරයි. තොරතුරු ඉල්ලීමේ 01 වන අයිතමය යටතේ විමසා ඇති තොරතුරු සම්බන්ධව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිචාරය ලැබීමෙන් පසු අභියාචක වෙත දන්වන ලෙස පොදු අධිකාරියට නියෝග කරනු ලබයි.

නම්කළ නිලධාරියාගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

34 2018.03.23 දින ලබාදුන් නියෝගය

## ලංකා බැංකු සේවක සංගමය එ. මහජන බැංකුව [35]

*'මෙම තීරණය ගැනීමේ වැදගත් සාධකයක් වන්නේ මහජන සුබසිද්ධිය තුළ ඇති පොදු නියෝජකත්වය සහ පොදු මුදල් භාවිතය පිළිබඳ අන්තර්ගතයයි. රාජ්‍ය බැංකු සමග කරනු ලබන ගනුදෙනු වලදී මහජන සුබසිද්ධිය ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරයි. මේ මහජන මුදල් සම්බන්ධව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට පොදු අධිකාරීන් පනතේ සඳහන් ව්‍යතිරේක යොදාගනු ලබයි නම්, කොමිෂන් සභාව ඔවුන්ව දැඩි ඔප්පු කිරීමේ භාරයකට යටත් කරනු ලබයි'*

**තීරණය:** පොදු අධිකාරියේ අභ්‍යන්තර මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් විරෝධතා පළ කළ වෘත්තීය සමිති සාමාජිකයින්ට එරෙහිව නඩු පැවරීම සඳහා පෞද්ගලික නීතිඥයන් තබා ගැනීමට මහජන අරමුදල්වලින් වැය කළ මුදල් ප්‍රමාණ පොදු අධිකාරිය විසින් හෙළිදරව් කළ යුතු බවට නියෝග කර තිබේ. නීතිපතිවරයා තබා නොගනිමින්/පෞද්ගලික නීතිඥයන් තබා ගැනීමට තීරණය කරන ලද නිර්ණායකයන්, තොරතුරු දැනගැනීමට යටත් 'ආයතනික තීරණයක්' ලෙස සැලකිය හැකි බවත් ඒ අනුව සම්බන්ධ වූ පෞද්ගලික නීතිඥයන්ගේ පෞද්ගලික නම්/තොරතුරු/සංශෝධනයන්ට යටත්ව හෙළිදරව් කිරීමට/විගණකාධිපති වෙත වාර්තා කිරීමේ පොදු වාර්තාකරණ අවශ්‍යතා වලට අනුගතව (එවැන්නක් තිබේ නම්) හෙළිදරව් කිරීමට/ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ/හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයෙකු මෙම නඩු කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කර තිබේද යන්න/උප විනිශ්චයකාරවරයෙකු පනත යටතේ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සඳහා පදනමක් නොවිය යුතු යැයි දැක්වූ කරුණක් සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීමට යටත් වේ. (එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන අවස්ථාවකදී හැර, තොරතුරට අදාළව නඩුවක් පැවතීම යන හේතුව නිසාම පමණක් තොරතුරු ඉල්ලීම් වලට ඉඩ නොදී නොසිටිය යුතුය, 5 (1) (ඒ) වගන්තිය).

---

35 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම)/58/2018, 2018.01.30, 27.03.2018 හා 2018.05.22 දිනයන්හි පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. නියෝගය 2018.07.17 දින ලබාදෙන ලදි.

බැංකුවේ නීති උපදේශකවරයෙකු විසින් ලබා දී ඇති මතයක් පිළිබඳ අභ්‍යන්තර සාකච්ඡාවන්/ඒ හා සම්බන්ධ වූ අය හැර අනෙක් නීතිඥයින්ගෙන් ද්‍රව්‍යමය තොරතුරු කැඳවීම සහ එකම මට්ටමක සිටින නීතිඥයින් විසින් අය කරන ගාස්තු වල අධික ස්වභාවය පිළිබඳව සනාථ කිරීම් පිළිබඳ සාකච්ඡා හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් නම්කළ නිලධාරියාගේ තීරණය අනුමත නොකරන ලදි.

**මූලික පද:** නිසි උද්‍යෝගය/භාරකාර සබඳතාව (5(1)(උ) වගන්තිය)/ විධානාත්මක කාර්යපටිපාටි අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙනයාම/ප්‍රතිවිපාක (5(1)(ඒ) වගන්තිය)/පෞද්ගලිකත්වය (5(1)(අ) වගන්තිය)/වෘත්තිමය සන්නිවේදන ලිඛිත නීතිය (5(1)(ඊ) වගන්තිය)/මහජන අරමුදල් (5(1)(ඒ) වගන්තිය/පොදු යහපත (5(4) වගන්තිය)/විනිශ්චයට භාජනය වී ඇති

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්:

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

2017.08.29 දින අභායාචක විසින් තොරතුරු ඉල්ලීමක් හරහා පහත සඳහන් තොරතුරු ඉල්ලීම් කරන ලදී.

A. එස් එම් ඒ ආර් සේනානායක, ඒ. එම්. එම්. එස්. රුවයිස් සහ එස්. කේ. ඩී. හේවාපතිරණ යන අභියාචක සංගමයේ සාමාජිකයන් තිදෙනාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් වැලකී සිටීමට මහජන බැංකුවේ නීති උපදේශිකා මිනෝලි ජිනදාස මහත්මිය විසින් ලබා දුන් නීති උපදෙස් නොසලකා හැරීමට බැංකුව මගින් ගනු ලැබූ තීරණයෙහි සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

B. කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DSP 179/2016, 183/2016 සහ 184/2016 සඳහා, ගරු නීතිපතිතුමා ගේ උපදෙස් පැතීමකින් හෝ සේවා ලබාගැනීමකින් තොරව පෞද්ගලික නීතිඥ මණ්ඩලයෙන් ලේඛනගත නීතිඥවරයෙකු සහ නීතිඥවරයෙකුගේ සේවාවන් ලබා ගැනීමට මහජන බැංකුව මගින් ගනු ලැබූ තීරණයෙහි සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

C. එස්. එම්. ඒ. ආර්. සේනානායක, ඒ. එම්. එම්. එස්. එම්. රුවයිස් සහ එස්. කේ. ඩී. හේවාපතිරණ යන අභියාචක සංගමයේ සාමාජිකයන් තිදෙනාට එරෙහිව මහජන බැංකුව විසින් ගොනුකරන ලද අංක WP/HCCA/COL/15/2017 (LA), WP/HCCA/COL/16/2017 (LA) සහ WP/HCCA/COL/17/2017 (LA) දරන නඩු මෙන්ම අංක WP/HCCA/COL/04/2017 දරන නඩුව සඳහා ගරු නීතිපතිතුමා ගේ උපදෙස් පැතීමකින් හෝ සේවා ලබාගැනීමකින් තොරව පෞද්ගලික නීතිඥ මණ්ඩලයෙන් ලේඛනගත නීතිඥවරයෙකු සහ නීතිඥවරයෙකුගේ සේවාවන් ලබා ගැනීමට මහජන බැංකුව මගින් ගනු ලැබූ තීරණයෙහි සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

D. මහජන බැංකුවට එරෙහිව සිවිල් අභියාචනා මහාධිකරණයේ ගොනුකරන ලද අංක WP/HCCA/COL/15/2017 (LA), WP/HCCA/COL/16/2017 (LA) සහ WP/HCCA/COL/17/2017 (LA) දරන නඩු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමට අදාලව SC HCCA LA 316/2017, 318/2017 සහ 319/2007 දරන අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා, ගරු නීතිපතිතුමා ගේ උපදෙස් පැතීමකින් හෝ සේවා ලබාග ැනීමකින් තොරව මහජන බැංකුව මගින් ගනු ලැබූ තීරණයෙහි සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

E. කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DSP 179/2016, 183/216 සහ 184/2016, සිවිල් අභියාචනා මහාධිකරණයේ ගොනුකර ඉවත් කර ගන්නා ලද WP/HCCA/COL/04/2017 සහ එම අධිකරණයේම ගොනුකරන ලද අංක WP/HCCA/COL/15/2017 (LA), WP/HCCA/COL/16/2017 (LA) සහ WP/HCCA/COL/17/2017 (LA) දරන නඩු සහ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමට අදාළව SC HCCA LA 316/2017, 318/2017 සහ 319/2007 දරන අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මහජන බැංකුව ඉදිරිපත් කළ ගෙවීම් වවුචර වල ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

F. කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DSP 179/2016, 183/216 සහ 184/2016, සිවිල් අභියාචනා මහාධිකරණයේ ගොනුකර ඉවත් කරන ලද

WP/HCCA/COL/04/2017 සහ එම අධිකරණයේම ගොනුකරන ලද අංක WP/HCCA/COL/15/2017 (LA), WP/HCCA/COL/16/2017 (LA) සහ WP/HCCA/COL/17/2017 (LA) දරන නඩු සහ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීමට අදාලව SC HCCA LA 316/2017, 318/2017 සහ 319/2007 දරන අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මහජන බැංකුව විසින් ලේඛනගත නීතිඥවරයෙකු සහ නීතිඥවරයෙකු හට ගෙවීම් වවුචර ඉදිරිපත් කිරීමට විගණකාධිපතිවරයාගේ අනුමැතිය සහ/හෝ තාවකාලික අනුමැතිය ලබා ගැනීමට අදාළ මහජන බැංකුවේ ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

G. ඉහත අයිතම (f) හි සඳහන් ලේඛනගත නීතිඥවරයෙකු සහ නීතිඥවරයෙකු තෝරා ගැනීමේදී මහජන බැංකුව අනුගමනය කරනු ලැබූ නිර්ණායක සම්බන්ධ ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

H. ඉහත අයිතම (f) හි සඳහන් තොරතුරු සම්බන්ධව විගණකාධිපතිවරයා දැනුවත් කිරීම සහ එය විගණනය කර වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම පිණිස විගණකාධිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අදාළ මහජන බැංකුවේ ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

I. ඉහත අයිතම (f) හි සඳහන් ලේඛනගත නීතිඥවරයෙකු සහ නීතිඥවරයෙකු හට ගෙවීම් අනුමත කිරීම සම්බන්ධ මහජන බැංකුවේ ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

J. ඉහත අයිතම (f) හි සඳහන් ලේඛනගත නීතිඥවරයා සහ නීතිඥවරයා අයකරගත් ගාස්තු සම තත්ත්වයෙන් සිටින අනෙකුත් නීතිඥවරුන්ගේ නීතිමය ගාස්තු අයකිරීම් සමඟ සැසඳීමේදී එම අයකිරීම අධික වීම/නොවීම පිළිබඳ මහජන බැංකුව තීරණය කිරීමට අදාළ ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

K. කොළඹ දිස්ත්‍රික් උසාවියේ ගොනු කරන ලද නඩු අංක DSP 179/2016, 183/216 සහ 184/2016, සිවිල් අභියාචනා මහාධිකරණයේ අභියාචනා නඩු ගොනු කිරීමෙන් අනතුරුව (ගොනුකර ඉවත් කරන ලද WP/HCCA/COL/04/2017 සහ එම අධිකරණයේම ගොනුකරන ලද අංක

WP/HCCA/COL/15/2017 (LA), WP/HCCA/COL/16/2017 (LA) සහ WP/HCCA/COL/17/2017 (LA) දරන නඩු) මහජන බැංකුව සමතයකට එළඹීමට උත්සහ කිරීම සම්බන්ධ ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

L. ඉහත සඳහන් නඩු වල ප්‍රගතිය පිළිබඳව මහ බැංකුවේ අධිපති/බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ දැනුවත් කිරීමට අදාළව මහජන බැංකුව සතු ලේඛන සහ/හෝ අදාළ උපුටාගැනීම් සහ/හෝ වෙනත් ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්;

පොදු අධිකාරියේ ප්‍රතිචාරයඃ

තොරතුරු නිලධාරී 2017.09.19 දිනැති ලිපිය මඟින් අභියාචක සංගමයට තොරතුරු ලබාදීම පනතේ 5 වන වගන්තියේ ව්‍යතිරේකයන්වලට යටත්ව ප්‍රතික්ෂේප කරන ලදී. තොරතුරු නිලධාරී පනතේ නිශ්චිත උප වගන්තියක් සඳහන් නොකළ ද, "විභාග වෙමින් පවතින නඩු නිමිති හේතුවෙන්" තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. ඉන් සෑහීමකට පත් නොවූ අභියාචක, 2017.09.25 දින නම්කළ නිලධාරී හට අභියාචනයක් යොමු කළ අතර, නම්කළ නිලධාරී අභියාචනයට පිළිතුරු දැක්වීමට අපොහොසත් වූ හෙයින්, අභියාචක 2017.11.23 දින කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදී.

## අතුරු නියෝගය[36]

2018.03.27 දිනැති කොමිෂන් සභා නියෝගය මගින් කොමිෂන් සභාව, විභාග වෙමින් පවතින නඩු නිමිත්තක් හේතුවෙන් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ පොදු අධිකාරියේ විරෝධතාව සලකා බලන ලදී (තොරතුරු නිලධාරී 2018.09.19 දින ලබා දුන් පිළිතුර ප්‍රකාරව). මෙම පනත මගින් විනිවිදභාවය හා වගවීම පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දරන අතර ගැටලුකාරී අවස්ථාවන්හී දී අනෙකුත් නීතීන් අභිබවා මෙම පනතේ විධිවිධාන බලාත්මක වේ (4 වන වගන්තිය). ඒ අනුව, පනත මගින් ස්ථාපිත අභියාචනා මණ්ඩලය ලෙස

36 2018.03.23 දින ලබාදෙන ලදි. අභියාචක වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ඃ නීතිඥ නලීන් අමරජීව, නීතිඥ ඉන්දුල හේවගේ. පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ඃ නීතිඥ සඳුන් ගමගේ (2018.03.27 දින), නීතිඥ දුසිත් ජෝන්දාසන් (2018.05.22 දින), නීතිඥ නවෝද් හේවගේ, නීතිඥ චමින්දි ලියනගේ.

කොමිෂන් සභාව පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියකට එරෙහිව යම් කිසි පුද්ගලයෙකු අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක දී කොමිෂන් සභාව පොදු අධිකාරිය විසින් ගනු ලබන තීරණයන්, මහජන මුදල් භාවිතයේ විනිවිදභාවය සහ වගවීම සැලකිල්ලට ගනිමින් "ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතිවර්තනය කිරීම" සිදු කළ යුතුය. විභාග වෙමින් පවතින නීතිමය කටයුත්තක් හේතුවෙන් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට අදාළව, කොමිෂන් සභාව අවධාරණය කර සිටියේ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම පනතේ 5(1) වගන්තියේ රාමුවට පමණක් යටත්ව සිදු කළ හැකි බවත්, මෙම ව්‍යතිරේක පනතේ 5(4) වගන්තියේ සඳහන් මහජන සුභසිද්ධි මූලධර්මයට යටත් වන බවයි. ඒ අනුව, "මහජන සුභසිද්ධිය එම තොරතුරු හෙළිදරවු කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතුය"

විනිවිදභාවය හා වගවීම පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට කොමිෂන් සභාව වෙත පනවා ඇති නෛතික වගකීමට අනුව, විභාග වෙමින් පවතින නීතිමය කටයුත්තක් පමණක් හේතු වශයෙන් දක්වමින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සිදු නොකෙරේ (*මැක්ස්වෙල් එ. ප්‍රෙස්ඩ්‍රම් ලිමිටඩ්* ((1987) 1 All ER 656)). මෙහි ස්ථාපිත මූලධර්මය වන්නේ තොරතුරු හෙළිදරවු කිරීම මඟින් යුක්තියේ විධිමත් පරිපාලනයක් සිදු කිරීමට "දුර්වල ඉඩ ප්‍රස්ථාවක්" නොව "සැබෑ අවදානමක්" (අවධාරණය කෙරේ) තිබිය යුතු බවයි. *ද සන්ඩේ ටයිම්ස් එ. බ්‍රිතාන්‍ය රාජ්‍යය* (1979.04.26 නොම්බර 30 මාලාව A, 14 EHRR 229)හි තීරණය කළ ලෙස, ගැටලුව වූයේ එකිනෙකට පටහැනි මූලධර්ම දෙකක් වන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා යුක්තිය පසිඳලීම පිළිබඳ පොදු යහපත "සමතුලනය කිරීම" නොව, නිවැරදි පරීක්ෂණය විය යුත්තේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳ මූලධර්මය පටු ලෙස අර්ථ දැක්විය යුතු ව්‍යතිරේක ගණනාවක් යටතට පත් කිරීමයි.

එම නියෝගයේ සඳහන් වූ පරිදි, මෙම වෙනස් කර දැක්වීම පනතේ දැක්වෙන 5(1)(ඒ) ව්‍යතිරේකයේ අදාළත්වය තහවුරු කිරීම සඳහා භාවිතා කරන ලදී. *මැක්ස්වෙල් එ. ප්‍රෙස්ඩ්‍රම් ලිමිටඩ්* (supra) සහ පහත සඳහන් මූලධර්ම එකිනෙකට වෙනස් නමුත් සන්සන්දනාත්මක සන්දර්භයක් ලෙස සලකන කල්හි, පනතේ මූලික මූලධර්මය වන, හැකි උපරිමයෙන් තොරතුරු අනාවරණය කිරීමට යටත්ව තොරතුරු

දැනගැනීමේ අයිතිය සහ පනතේ 5(1) ව්‍යතිරේක සැලකිල්ලට ගැනීමේදී, කොමිෂන් සභාව, මෙම පනතේ කෙටුම්පත් සම්පාදකයින්ගේ අභිප්‍රාය පටු ලෙස අර්ථ දැක්විය යුතුය.

මෙම අභියාචනයේ පොදු යහපත නැමති සාධකය තක්සේරු කිරීමට, 2018.03.27 දිනැති කොමිෂන් සභා නියෝගය මඟින්, "අභියාචනා සංගමයේ සේවක සාමාජිකයින් තිදෙනෙකු වන එස්. එම්. ඒ. ආර්. සේනානායක, ඒ එම් එම් එස් එම් රුවයිස් සහ එස් කේ ඩී හේවාපතිරණ යන අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම හෝ එම ක්‍රියාමාර්ග ආරම්භ කිරීම වැළැක්වීම" සම්බන්ධව පොදු අධිකාරියේ නීති උපදේශකයින්ගේ මතය ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව පොදු අධිකාරියට නියෝග කරන ලදී.

<u>නම්කළ නිලධාරී අභියාචනයට පිළිතුරු සැපයීමට අපොහොසත් වීම සහ පොදු අධිකාරිය තම වගකීම් සැලකිලිමත්ව ඉටු කිරීම</u>

මෙම පනතට යටත් සෑම පොදු අධිකාරියක්ම, පනතේ විධිවිධාන ප්‍රකාරව තම නෛතික වගකීම පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද නීති වලට යටත්ව ඉතාමත් සැලකිලිමත්ව ඉටු කළ යුතුය.

පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක නම්කළ නිලධාරියෙක් දෙන ලද තීරණයකට අදාළව කොමිෂන් සභාවට පනතේ 32 වන වගන්තිය ප්‍රකාරව අභියාචනයක් යොමු කළ හැකිය. නම්කළ නිලධාරියා අභියාචනා විභාග කිරීමට සහභාගී නොවන අවස්ථාවන්හී දී පනතේ 32(4) වගන්තිය ප්‍රකාරව, පොදු අධිකාරිය පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර තිබෙන බවට වන ඔප්පු කිරීමේ භාරය සනාථ කිරීම සඳහා වෙනත් නිලධාරියෙකු ඔහු වෙනුවෙන් පෙනී සිටීමට නිර්දේශ කිරීමට නම්කළ නිලධාරියා නෛතිකව බැඳී සිටියි.

පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට යොමු කරන ලද අභියාචනයට නම්කළ නිලධාරී පිළිතුරු සැපයීමට අපොහොසත් වීම, පරිපාලනමය අධීක්ෂණ අත්වැරදීමකින් සිදුවූ බවට පැවසීම සෑහීමකට පත් විය හැකි හේතුකාරකයක් නොවේ. මෙය පනතේ 31(2) සහ (3) වන වගන්ති ප්‍රකාරව පොදු අධිකාරියට පනවන ලද නෛතික වගකීමක් පැහැර හැරීමක් වේ. අනෙකුත් රාජ්‍ය බැංකු ඇතුළු පොදු අධිකාරීන් පනත යටතේ තම නෛතික වගකීම් ඉටු කර ඇති

අවස්ථාවක මෙම අභියාචනයෙහි පොදු අධිකාරිය වන රාජ්‍ය බැංකුව පනතේ විධිවිධාන ප්‍රකාරව තම නෛතික වගකීම පැහැර හැරීම කනස්සල්ලට හේතුවන කරුණකි.

නියෝගය:

මෙම අභියාචනයේ ඉදිරිපත් කර ඇති කරුණු සැලකීමේදී, මෙහි විසඳිය යුතු මූලික කාරණය ලෙස සැලකිය හැකි වන්නේ පොදු අධිකාරියක් විසින් මහජන මුදල් භාවිතයේදී වගවීම සහ විනිවිදභාවය ආරක්ෂා කෙරෙන ආකාරයකට කටයුතු කිරීම පිළිබඳවයි.

තොරතුරු ඉල්ලීමේ **(A)** අයිතමය

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(ඒ) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී.

ඉහතින් සඳහන් "සැබෑ අවදානම" ට අදාළ මූලධර්මවලට යටත්ව මෙම තොරතුරු හෙළිදරවු කිරීම, "අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට" අගතියක් සිදු කළ හැකි බව කොමිෂන් සභාවේ මතයයි. පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ අවධාරණයට ලක් කළ නඩු නිමිතිවලට මෙම තොරතුරුවල ඍජු සම්බන්ධතාවක් ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එම නිසා මෙම අයිතමය සම්බන්ධව පනතේ 5(1)(ඒ) ප්‍රකාරව, "අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතී බව පවත්වාගෙන යාමට" අගතියක් සිදුවිය හැකි බැවින් පොදු අධිකාරිය විසින් ගනු ලැබූ තීරණය සනාථ කිරීමට කොමිෂන් සභාව නියෝග කරන ලදී.

තොරතුරු ඉල්ලීමේ **(B)** සහ **(C)** අයිතම

මෙම අයිතමයන්ට අදාළ තොරතුරු පොදු අධිකාරිය නීතිපති උපදෙස් නොලබා පුද්ගලික නීති උපදේශනයන් ලබා ගැනීමට අදාළ තීරණයට එළඹීමට සහාය වූ කරුණු සම්බන්ධ වේ.

2018.03.27 දිනැති කොමිෂන් සභා නියෝගයේ සඳහන් කළ පරිදි, තම අභිමතය පරිදි නීතිමය කටයුතු සඳහා පුද්ගලික නීති උපදේශකයින්ගේ සේවය ලබා ගැනීමට පොදු අධිකාරියට හැකියාවක්

ඇත. මේ සම්බන්ධව පොදු අධිකාරියේ නීතිඥවරුන් අභියාචනා විභාග කිරීම්වලදී ඉල්ලා සිටි තොරතුරු ලබා දීමට පැවසීම පොදු අධිකාරිය අසවල් නීතිඥවරයාගේ සේවාව ලබාගත යුතුයැයි පැවසීමක් වන බවට සිදු කරන ලද සැලකිරීම දෝෂ සහිත වේ.

මෙහි අන්තර්ගත ප්‍රශ්නය වන්නේ පොදු අධිකාරිය විසින් සේවාවන් ලබාගත යුතු නීතිඥවරයා සහ ඒ සඳහා වියදම් කරන ලද මහජන මුදල් ප්‍රමාණය තීරණය කිරීම පිළිබඳ ගන්නා ලද අභ්‍යන්තර තීරණ සම්බන්ධව වේ. පොදු අධිකාරිය මේ කටයුත්ත සඳහා මහජන මුදල් භාවිතා කළ හෙයින්, සහ මහජන මුදල් භාවිතයේදී වගවීම සහ විනිවිදභාවය ආරක්ෂා කෙරෙන ආකාරයකට කටයුතු කළ යුතු නිසාවෙන්, මෙයට මහජන සුබසිද්ධිය අදාළ නොවන බවට පැවසිය නොහැකිය. එම නිසා මෙම තොරතුරු ලබා දීම මඟින් පනතේ 5(1)(ඒ) වගන්තිය ප්‍රකාරව අගතියක් සිදු නොවන බව කොමිෂන් සභාවේ මතයයි.

නීතිඥවරයා/නීතිඥවරු සහ සේවාදායකයා (පොදු අධිකාරිය) අතර ඇති සම්බන්ධතාව සහ, තීරණය ගැනීමට හේතු පාදක වූ කාරණා හෙළිදරවු කිරීම අතර සම්බන්ධතාවක් නොමැති බවට කොමිෂන් සභාව මත දරයි. මෙය "විශ්වසනීය සම්බන්ධතාවක්" යටතට ගැනීමට උත්සහ දරා ඇති අවස්ථාවන් වල දී එම තොරතුරු හෙළිදරවු කිරීමට කොමිෂන් සභාව නියෝග කර ඇත. දුෂ්‍යන්ති සුරියප්පෙරුම එ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම) /36/2017) එවැනි වූ අවස්ථාවක් වන අතර මෙම අභියාචනයේ නියෝගයට අදාළව පොදු අධිකාරිය කටයුතු කරන ලදී.

මෙම හේතුන් නිසා පුද්ගලික නීතිඥවරුන්ගේ සේවය ලබා ගැනීමට අදාළව පොදු අධිකාරිය ගනු ලැබූ අභ්‍යන්තර තීරණ පනතේ 5(1)(උ) හෝ (ඒ) යන ව්‍යතිරේකවලට යටත් නොවන බවත් පුද්ගලික නීතිඥවරුන්ගේ නම්/අනෙකුත් පුද්ගලික කරුණු සංස්කරණයට භාජනය කිරීමෙන් අනතුරුව ඉතිරි තොරතුරු අභියාචකට ලබා දීමට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු.

<u>තොරතුරු ඉල්ලීමේ (D) අයිතමය</u>

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1) (උ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී

මෙය පොදු අධිකාරියේ අභ්‍යන්තර ආයතනික තීරණයකට අදාළ වන බැවින්, අයිතම (B) සහ (C) වලට අදාළව සිදු කරන ලද නියෝග යේ හේතු හුවා දක්වමින්, පනතේ 5(1)( උ) වගන්තියේ සඳහන් භාරකාර සම්බන්ධතාව පිළිබඳ වන ව්‍යතිරේකය මෙම අයිතමයට අදාළ නොවන බවට නියෝග කර සිටිමු.

මෙම පදනමින්ම, අයිතම (B) සහ (C) වලට අදාළව සිදු කරන ලද නියෝගයේ හේතු හුවා දක්වමින් ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම විභාග වෙමින් පවතින නඩු නිමිති අගතියකට පත් නොකරන බවත් 5(1)(ඒ) වගන්තිය මේ සම්බන්ධව පිළිගත නොහැකි ව්‍යතිරේකයක් බවටත් නියෝග කර සිටිමු. තවද, තම අධිකාරිය නියෝජනය කිරීමට නීතිපතිගේ සේවාවන් ලබා නොගැනීමට පොදු අධිකාරිය තීරණයට එළැඹි පදනම පනතේ 5(1)(උ) සහ (ඒ) වගන්ති යටතට අදාළ නොවන හෙයින් නම්කළ නිලධාරීගේ තීරණය මෙයින් ප්‍රතිවර්තනය කෙරේ.

<u>තොරතුරු ඉල්ලීමේ **(E)** අයිතමය</u>

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(අ), (ඊ), (උ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී. තොරතුරු ඉල්ලීමේ මෙම අයිතමය විභාග කරන කල්හි, සැලකිය යුතු මූලික කාරණය වන්නේ පොදු අධිකාරිය මහජන මුදල් භාවිත කර පුද්ගලික නීතිඥවරුන්ගේ සේවය ලබා ගැනීම සම්බන්ධයෙන්, ඉල්ලුම්කරුට පනත යටතේ නීත්‍යානුකූල ලෙස මෙම තොරතුරු ඉල්ලීම සිදු කළ හැකිද යන්නයි.

<u>*5(1)(අ) වගන්තියට අදාළ ව්‍යතිරේකය - පුද්ගලිකත්වය*</u>

මෙය පොදු අධිකාරිය විසින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට ඉතා වැදගත් සේ සලකා ඉදිරිපත් කර ඇති පදනමකි (24(vi) ඡේදයට අදාළව). මෙම ව්‍යතිරේකයේ අදාළත්වය පිළිබඳ වලංගුභාවය තක්සේරු කිරීමට පනතේ 5(1)(අ) වගන්තිය පූර්ණ ලෙස සැලකිල්ලට ගත යුතුය. එම වගන්තිය මෙසේ සඳහන් කරයි;

"පුද්ගලික තොරතුරු වලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදරවු කිරීම යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවක

> දී හෝ යම් තනි පුද්ගලයෙකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදු වේ නම්, එම තොරතුරු හෙළිදරවු කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරණීකරණය කරයි නම්, හෝ අදාළ තැනැත්තා විසින් එම හෙලිදරවු කිරීම සඳහා ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස;"

මෙහිදී පැන නඟින ප්‍රශ්න මෙමඅභියාචනය නිර්ණය කිරීම සඳහා කේන්ද්‍රීය වේ. ඉල්ලා සිටි තොරතුරුවල "යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක්" පවතීද? ඉල්ලා සිටි තොරතුරු "විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරණීකරණය" කරයිද? එම තොරතුරු ලබා දීම "තනි පුද්ගලයෙකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක්" සිදු කරයිද?

මෙම තීරණය ගැනීමේ වැදගත් සාධකයක් වන්නේ මහජන සුබසිද්ධිය තුළ ඇති පොදු නියෝජකත්වය සහ පොදු මුදල් භාවිතය පිළිබඳ අන්තර්ගතයයි. රාජ්‍ය බැංකු සමඟ කරනු ලබන ගනුදෙනු වලදී මහජන සුබසිද්ධිය ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරයි. මේ මහජන මුදල් සම්බන්ධව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට පොදු අධිකාරීන් පනතේ සඳහන් ව්‍යතිරේක යොදාගනු ලබයි නම්, කොමිෂන් සභාව ඔවුන්ව දැඩි ඔප්පු කිරීමේ භාරයකට යටත් කරනු ලබයි. ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය එ. ශ්‍රී ලංකා ගුවන් සේවය (RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම) ) /99/2017) හි සිදු කරන ලද නිරීක්ෂණයන් මේ සම්බන්ධව අදාළ වේ.

> "එබැවින් මහජන මුදල් භාවිතය සැලකිල්ලට ගැනීමේදී පොදු අධිකාරිය විසින් සිදු කර ඇතැයි පවසන මූල්‍ය අක්‍රමිකතා කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂාවට ලක් වන බව පැහැදිලිය. කොමිෂන් සභාව මෙම නියෝගය ලබා දීමේදී මහජන සුබසිද්ධිය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරනු ඇත."

ස්වාධීන සේවක සංගමය එ. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම) /112/2018) හි, "නීතිඥවරුන්ගේ සේවාවන් ලබා ගැනීමට අදාළව වියදම් කරන ලද

මහජන මුදල් වලට අදාළ තොරතුරු" හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියෝග කරන ලද අතර ඔවුන් එම තොරතුරු හෙළිදරව් කරන ලදී. කොමිෂන් සභාව මෙහිදී නිරීක්ෂණය කරමින් පවසා සිටියේ "මෙම අවස්ථාවන්හී දී පනත යටතේ වැදගත් වන්නේ නීතීඥවරුන්ගේ නම් නොව ඔවුන්ගේ සේවා ලබා ගැනීමට වියදම් කළ මුදල් ප්‍රමාණයයි"...

...මෙහිදී ඉල්ලා සිටින ලද තොරතුරු වල "යම් පොදු කටයුත්තක් හෝ සම්බන්ධතාවක්" සහ "විශාල වශයෙන් මහජන සුභසිද්ධිය" අතර සෘජු සම්බන්ධතාවක් ඇති බවට කොමිෂන් සභාවේ මතයයි.

ඉල්ලා සිටින ලද තොරතුරු, *ස්වාධීන සේවක සංගමය එ. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (supra)* ප්‍රකාරව "නීතීඥවරුන්ගේ සේවාවන් ලබා ගැනීමට අදාළව වියදම් කරන ලද මහජන මුදල් වලට අදාළ තොරතුරු" වන හෙයින් එය "තනි පුද්ගලයෙකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක්" සිදු නොකරන බව කොමිෂන් සභාවේ මතයයි.

### *5(1)(ඊ) වගන්තියට අදාළ ව්‍යතිරේකය - වෘත්තීය වරප්‍රසාද*

...ලිපිගොනු පොදු අධිකාරියක් සහ නීතීඥවරයෙක් සම්බන්ධ සන්නිවේදනයක් වූ පමණින් මෙම ව්‍යතිරේකය ස්වයංක්‍රීයව පූර්ණ වශයෙන් භාවිත කළ නොහැකි බවට අවධාරණය කළ යුතුය. කොමිෂන් සභාව මේ පිළිබඳව මීට ප්‍රථම සිදු කළ නියෝගයට අදාළව, පොදු අධිකාරිය මෙම ව්‍යතිරේකය මත තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඉල්ලා සිටි තොරතුරු මෙම වරප්‍රසාදයට යටත් වන අයුරු සහ එය "කිසිදු ලිඛිත නීතියක් යටතේ හෙළිදරව් කිරීමට අවසර නොමැති තොරතුරක් බවට" පෙන්විය යුතුය.

...මෙසේ නීතීඥවරයෙක් සඳහා මහජන මුදල් භාවිතා කර ගෙවීම් සිදු කිරීම පනතේ 5(1)(ඊ) වගන්තියට යටත්වන බවට හෝ ඒ සම්බන්ධ වෙනත් කිසිදු "ලිඛිත නීතියක්" පෙන්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇත. තවද, මෙම තොරතුරු හෙළිදරව් කිරීම විභාග වෙමින් පවතින නඩු නිමිති වල අදාළ පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් අගතියකට පත් කරන බව පෙන්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති අතර, එම තොරතුරු "ගාස්තු නියාමනයක් සිදු කිරීම" මත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සාධාරණ තර්කයක් ලෙසට පිළිගත නොහැක.

***5(1)(උ) වගන්තියට අදාළ ව්‍යතිරේකය - විශ්වසනීය සම්බන්ධය***

*පොදු අධිකාරිය වීරසූරිය එ. ෆුවාඩ් (supra)* නඩුව උපුටා දක්වමින් පවසා සිටියේ ගරු අධිකරණය නීතීඥවරයෙකු සහ තම සේවාදායකයා අතර පවතින විශ්වසනීය සම්බන්ධතාව පිළිගත් බවයි. කෙසේවෙතත්, මෙහි විශ්වසනීය පාර්ශ්වය තම සේවාදායකයාගේ යහපත තකා කටයුතු කළ යුතු බවට පමණක් පවසන අතර එය මෙම අභියාචනාවෙන් වෙන්කර දැක්විය හැකිය.

තවද, නීතීඥවරුන්ගේ සේවාවන් ලබා ගනීමට අදාළව වියදම් කරන ලද මහජන මුදල් වල මහජන සුබසිද්ධිය අන්තර්ගත වන බවට නැවතත් අවධාරණය කළ යුතුය.

***5(1)(ඒ) වගන්තියට අදාළ ව්‍යතිරේකය - අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදුවීම***

අයිතම (B),(C) සහ (D) වලට අදාළව සිදු කරන ලද නියෝග යේ හේතු හුවා දක්වමින් ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම විභාග වෙමින් පවතින නඩු නිමිති අගතියකට පත් නොකරන බව කොමිෂන් සභාවේ මතයයි.

ඉහත සඳහන් කරුණු දැක්වීමට අදාළව, පොදු අධිකාරිය පෞද්ගලික නීතීඥවරුන්ගේ සේවාවන් ලබා ගැනීමට අදාළව වියදම් කරන ලද මහජන මුදල්වල ප්‍රමාණය සමුච්චිත ගාස්තුවක් ලෙස දක්වමින් එම තොරතුරු අභියාචකට ලබා දීමටත්, පුද්ගලික නීතීඥවරුන්ගේ නම්/අනෙකුත් පුද්ගලික කරුණු සංස්කරණයට භාජනය කිරීමෙන් අනතුරුව ඉතිරි තොරතුරු ලබා දීමට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු. මෙමඟින් පුද්ගලිකත්වය, වෘත්තීය වරප්‍රසාද සහ භාරකාරත්ව සම්බන්ධතාවට අදාළ විරෝධතා පැන නොනගින අතර, 2017 වර්ෂයේ පොදු අධිකාරියේ වාර්ෂික වාර්තාවේ (පිටු අංක 267), පොදු අධිකාරියට එරෙහිව පැවති නඩු නිමිති සඳහා "43.5. බැංකුව සහ සමාගමට එරෙහිව සමූහයෙන් නඩු පැවරීම" මැයින් පසුගිය සහ වෙනත් අවස්ථා වලට අදාළ තොරතුරු පොදු අධිකාරිය මහජනයා අතට පත්කර ඇති හෙයින්, නම්කළ නිලධාරීගේ තීරණය මෙයින් වෙනස් කෙරේ.

<u>තොරතුරු ඉල්ලීමේ (F) සහ (H) අයිතම</u>

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(උ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී. මෙම තොරතුරු විගණකාධිපතිවරයා ලේඛනගත නීතීඥයින්ට කරන ලද ගෙවීම් අනුමත කිරීම සහ වාර්ෂික වාර්තාවට විභාග වෙමින් පවතින නඩු නිමිති ඇතුලත් කිරීම පිණිස විගණකාධිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කරුණු වලට අදාළ වේ.

...විගණකාධිපතිවරයාට කරුණු දැක්වීමේදී අනුගමනය කළ යුතු සාමාන්‍ය වාර්තාකරණ අවශ්‍යතාවන් සම්බන්ධ තොරතුරු මෙහිදී සැලකිය යුතු කාරණා වේ. ඉහතින් සඳහන් කළ පරිදි 2017 වර්ෂයේ පොදු අධිකාරියේ වාර්ෂික වාර්තාවේ (පිටු අංක 267), පොදු අධිකාරියට එරෙහිව පැවති නඩු නිමිති සඳහා "43.5. බැංකුව සහ සමාගමට එරෙහිව සමූහයෙන් නඩු පැවරීම" මැයින් විගණකාධිපතිවරයාට කරුණු දැක්වීමේදී පොදු අධිකාරිය සාමාන්‍ය වාර්තාකරණ අවශ්‍යතාවන් අනුගමනය කරන බවට සනාථ වුවත්, එය අභියාචක විසින් ඉල්ලා සිටින ලද අනුමත කිරීම් වලට අදාළ කරුණු විය හැකි බවට පැවසිය නොහැකිය.

ඒ අනුව, වාර්ෂික වාර්තා පිළියෙළ කිරීමේදී/ විගණකාධිපතිවරයාට කරුණු දැක්වීමේදී අනුගමනය කළ යුතු සාමාන්‍ය වාර්තාකරණ අවශ්‍යතාවන් හා විභාග වෙමින් පවතින නඩු නිමිති අතර සම්බන්ධතාවක් නොමැති බවට කොමිෂන් සභාව මත දරයි. අයිතම (B), (C) සහ (D) වලට අදාළව සිදු කරන ලද නියෝගයේ හේතු හුවා දක්වමින් ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම පනතේ 5(1)(උ) වගන්තිය ප්‍රකාරව විභාග වෙමින් පවතින නඩු නිමිති අගතියකට පත් නොකරන බව කොමිෂන් සභාවේ මතයයි. මෙම අයිතමයට අදාළව අභියාචක ඉල්ලා සිටි තොරතුරු හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියෝග කර සිටින අතර, නම්කළ නිලධාරීගේ තීරණය මෙයින් ප්‍රතිවර්තනය කෙරේ.

<u>තොරතුරු ඉල්ලීමෙ (G) අයිතමය</u>

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(උ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී.

මෙමගින් ඉල්ලා සිටි තොරතුරු ලේඛනගත නීතිඥයින් සහ නීතිඥයින් තෝරාගැනීමේදී පොදු අධිකාරිය අනුගමනය කරනු ලැබූ නිර්ණායක සම්බන්ධවේ. මෙම පනත මගින් විනිවිදභාවය හා වගවීම පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දරන බවට නැවතත් අවධාරණය කෙරේ.

මෙම ඉල්ලීම නඩු නිමිති සඳහා නීතිඥයින් තෝරාගැනීමේදී පොදු අධිකාරිය අනුගමනය කරනු ලැබූ නිර්ණායක සම්බන්ධයෙන් වන නිසා විශ්වසනීය සම්බන්ධතාව පිළිබඳ ව්‍යතිරේකය මෙයට අදාල නොවේ. මෙය ආයතනය අභ්‍යන්තරව සැලකිල්ලට ගත යුතු සහ ආයතනික තීරණයක් සම්බන්ධව වේ. එම නිසා පුද්ගලික නීතිඥවරුන්ගේ නම්/අනෙකුත් පුද්ගලික කරුණු සංස්කරණයට භාජනය කිරීමෙන් අනතුරුව ඉතිරි තොරතුරු ලබා දීමට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු. අයිතම (B), (C) සහ (D) වලට අදාළව සිදු කරන ලද නියෝගයේ හේතු හුවා දක්වමින් නම්කළ නිලධාරීගේ තීරණය මෙයින් ප්‍රතිවර්තනය කෙරේ.

<u>තොරතුරු ඉල්ලීමේ (I) සහ (J) අයිතම</u>

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(අ), (ඊ), (උ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී.

මෙමගින් ඉල්ලා සිටි තොරතුරු මෙහි සම්බන්ධ කාරණා වලට අදාළ නීතිඥයින් හැර අනෙකුත් සම තත්ත්වයෙන් සිටින නීතිඥයින්ගේ නීතිමය ගාස්තු අයකිරීම් සම්බන්ධ කරුණු දැනගැනීමට අදාළ වේ.

අභියාචක විසින් කරන ලද මෙම ඉල්ලීමේ යෝග්‍යතාවක් නොමැති බව කොමිෂන් සභාව අදහස් කරයි. මෙම තොරතුරු සංසන්දනාත්මක ඇගයීමකට අදාළ වන අතර, එය මෙම අභියාචනාවට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොවේ. පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(අ) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලද අතර මෙම තොරතුරු හෙළිදරව් කිරීම "සම තත්ත්වයේ" සිටින අනෙකුත් නීතිඥයින්ගේ නීතිමය ගාස්තු අයකිරීම් හෙළිදරව් කිරීමට හේතුවන නමුත්, මෙය අභියාචනාවට සම්බන්ධ වන අයුරු අපැහැදිලි වීම හේතුවෙන් නම්කළ නිලධාරීගේ තීරණය මෙයින් ස්ථිර කර සිටිමු.

<u>තොරතුරු ඉල්ලීමේ (K) අයිතමය</u>

අයිතම (A) ට අදාළව සිදු කරන ලද නියෝගයේ හේතු හුවා දක්වමින්, නම්කළ නිලධාරී තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට ගනු ලැබූ තීරණය මෙයින් ස්ථිර කර සිටිමු.

<u>තොරතුරු ඉල්ලීමේ (I) අයිතමය</u>

පොදු අධිකාරිය මෙම තොරතුරු ලබා දීම පනතේ 5(1)(උ) සහ (ඒ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී. මෙම තොරතුරු ඉල්ලීම මෙම නඩුවේ ප්‍රගතිය පිළිබඳව මහ බැංකුවේ අධිපති/බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ දැනුවත් කිරීමට අදාළ කරුණු සහ සාධක සම්බන්ධ වේ.

අයිතම (B), (C) සහ (D) ට අදාළව සිදු කරන ලද නියෝගයේ හේතු හුවා දක්වමින්, ඉල්ලා සිටින ලද තොරතුරට අදාළව මෙම අභියාචනයේ කරුණු සැලකිල්ලට ගනිමින්, මෙම තොරතුරු, පනතේ 5(1)(උ) වගන්තියේ සඳහන් ව්‍යතිරේකයට යටත් නොවන බව කොමිෂන් සභාවේ මතය වේ.

නම්කළ නිලධාරිගේ තීරණය මෙයින් ප්‍රතිවර්තනය කෙරේ.[37]

---

37 2018.08.16 වනදින පොදු අධිකාරිය (මහජන බැංකුව) මෙම තීරණයට එරෙහිව පනතේ 34 වන වගන්තියට අදාළව අභියාචනාධිකරණයට අභියාචනයක් ගොනු කළ අතර මෙය කොමිෂන් සභාවේ තීරණයක් සම්බන්ධයෙන් ගොනුකළ පළමු අභියාචනය වේ.

# වෙරිටේ රිසර්ච් පුද්ගලික සමාගම එ. ශ්‍රී ලංකා මහා බැංකුව[38]

*'ශ්‍රී ලංකා වාතාවරණයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව ප්‍රකාරව ලබා දී ඇති මූලික අයිතිවාසිකමක් බව අවධාරණය කළ යුතුයි. ඒ මත ව්‍යවස්ථාව මගින් හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 5 වගන්තිය වැනි අනෙකුත් පනතක වගන්තියක් මගින් හෝ යම්කිසි සීමා පැමිණවීමක් සිදුවන්නේ නම් එම යෙදීම හෝ අර්ථකථනය හෝ සිදු විය යුත්තේ සමානුපාතිකත්වය වැනි මූලධර්ම වලට අනුකූලව, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අවශ්‍යතාවය මත සහ එම සීමා පැනවීමට තර්කානුකූල සම්බන්ධතාවයක් ඇති නෛතික අරමුණක් පෙරදැරි කොටගෙනය'*

**තීරණය:** මිලදී ගැනීමේ දිනය, බිල්පත්/බැඳුම්කර නිකුත් කළ දිනය, බිල්පත්/බැඳුම්කරයට අදාළ ISIN අංකය, බිල්පත/බැඳුම්කරයේ කූපන් අනුපාතය, බිල්පත/බැඳුම්කරයේ කල්පිරීම් සඳහා බදු (ශුද්ධ බදු) බිල්පතේ/බැඳුම්කරයේ මුහුණත් වටිනාකම, වෙන්දේසි හා ඍජු ස්ථානගත කිරීම් හරහා සිදු කරන ලද ප්‍රාථමික වෙළෙඳපොළ ගනුදෙනුවල බිල්පත්/බැඳුම්කරවල මිල ගණන් සහ 2015 සහ 2016 සඳහා ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු හෙළිදරව් කිරීමට පොදු අධිකාරියට නියම කර සිටියි.

**මූලික පද:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව/වෙළඳ රහස් (5(1)(ඈ) වගන්තිය/සේවක අර්ථසාධක අරමුදල/වෙළඳපොළ සංවේදී තොරතුරු/සිදුකෙරෙමින් පවත්නා විමර්ශන (5(1)(ඌ)(i) වගන්තිය/ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බරපතල අගතියක් සිදුවිය හැකි අවස්ථා (5(1)(ඇ) වගන්තිය)/පෞද්ගලිකත්වය (5(1)(අ) වගන්තිය)/මහජන අරමුදල්/පොදු යහපත බලපැවැත්ම (5(4) වගන්තිය)/මහජන අරමුදල්

## අභියාචනයට පසුබිම් වූ කරුණු:

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

අභියාචක විසින් 2017.05.15 දිනැතිව පහත තොරතුරු ඉල්ලා සිටිමින් පොදු අධිකාරිය වෙත තොරතුරු ඉල්ලීමක් යොමු කරන ලදී

38 RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/26/2018, 2018.03.16, 2018.05.09, 2018.07.03, 2018.08.07 සහ 2018.09.04 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීම්හි දී විභාග කරන ලදී.

1. සියලු කමිටු හා ආයතන, අනුමත කර ගැනීමේ ක්‍රියාපටිපාටි හා ව්‍යුහ, සහ පිළිපැදිය යුතු මාර්ගෝපදේශ හා රීති ඇතුළු EPF අරමුදල ආයෝජනය කිරීම සම්බන්ධ සියලු තීරණ ගැනීමේ ක්‍රියා පටිපාටි. (නිල ව්‍යුහ සහ ක්‍රියා පටිපාටි නොපවත්නේ නම්, EPF අරමුදල කළමනාකරණය කරන සියලු විකල්ප ව්‍යුහයන් හා ක්‍රියාපටිපාටීන් පිළිබඳ විස්තර)

2. ආයෝජනා කමිටුව පාලනය වන මාර්ගෝපදේශ සහ රීතීන්

3. ආයෝජන කමිටුවේ සාමාජිකයින්ගේ නම් සහ තනතුරු

4. EPF දෙපාර්තමේන්තුවේ 2014, 2015 සහ 2016 වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා

5. EPF අරමුදලෙහි 2017.04.30 දිනට පැවති පහත වත්කම්

   - සියලු රජයේ සුරැකුම්පත්
   - පරිණත කාලය සහ පරිණත කාලයට ඉපයුම (YTM) අනුව වර්ග කොට
   - සියලු ලැයිස්තුගත සහ ලැයිස්තු නොගත කොටස් (සමාගමෙහි නම, මිලට ගත් මුදල සහ වත්මන් වෙළඳපල වටිනාකම සහිතව)
   - සියලු රුපියල් ණය
   - සියලු ආයතනික ණයකර

6. සියලු රජයේ සුරැකුම්පත් EPF අරමුදලට අදාළව 2015 ජනවාරි සිට 2017.04.30 දක්වා වෙළඳපළේ සිදුකර ඇති ගනුදෙනුවන්හි ලැයිස්තුවක්. පහත වෙළඳපළ ක්‍රියාවන් එම ලයිස්තුවේ අඩංගු විය යුතුයි.

   - වෙන්දේසි මාර්ගයෙන් සිදුවූ ප්‍රාථමික වෙළඳපළ ගනුදෙනු
   - ඍජුව සිදුවූ ප්‍රාථමික වෙළඳපළ ගනුදෙනු
   - ද්විතීයික වෙළඳපළ ගනුදෙනු

ඉහත සඳහන් ගනුදෙනුවන්හි පහත තොරතුරුද ඇතුළත් විය යුතුයි.

අ. මිලදී ගත් දිනය

ආ. බිල්පත/බැඳුම්කරය නිකුත් කළ දිනය (මිලදී ගත් දින වෙනත් දිනයක් නම්)

ඇ. බිල්පතෙහි/බැඳුම්කරයෙහි ISIN අංකය

ඈ. බිල්පතෙහි/බැඳුම්කරයෙහි

ඉ. බිල්පතෙහි/බැඳුම්කරයෙහි පරිනත කාලයට ඉපයුම (YTM) (බදු ඇතුළුව)

ඊ. බිල්පතෙහි/ බැඳුම්කරයෙහි ප්‍රකාශිත අගය

උ. බිල්පත/ බැඳුම්කරය මිලදී ගත් මුදල

ඌ. බිල්පතෙහි/ බැඳුම්කරයෙහි මිල

එ. අනෙකුත් පාර්ශ්වයන් (ගනුදෙනුව සිදු කළ අනෙකුත් පාර්ශවය)

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය:</u>

තොරතුරු නිලධරයා විසින් 2017.06.30 දිනැතිව අංක 4 සහ අංක 6 දරණ අයිතමයන් හැරුණු කොට අනෙකුත් සියලු අයිතමයන්ට පිළිතුරු සපයන ලදී. අයිතම අංක 6ට අදාළව 5 (1) (අ) වගන්තිය සඳහන් කර සිටින ලදී. අයිතම අංක 4 ට අදාළව පොදු අධිකාරිය පවසා සිටියේ 2016යෙහි සේවක අර්ථසාධක අරමුදලට අදාළ වාර්ෂික වාර්තාව සාදා අවසන් කර නොමැති බවයි.

අභියාචක විසින් නම්කළ නිලධරයාට 2017.07.24 දිනැතිව අභියාචනා කරන ලදී. නම්කළ නිලධාරී විසින් පිළිතුරු සපයමින් පවසා සිටින ලද්දේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසු අයිතම අංක 4 ලබා දෙන බවත් අයිතම අංක 6 හි සඳහන් 2015 ජනවාරි 1 දින සිට 2016 මාර්තු 31 දක්වා රජයේ සුරැකුම්පත්හි ද්විතීයික වෙළඳපළ ගනුදෙනු වලට අදාළව විමර්ශනය කොට විමසා වාර්තා කිරීමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් විමර්ශනයක් සිදු වන

බවත් සඳහන් කර ඇත. මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවද මීට සමාන තොරතුරු ඉල්ලා සිටි අතර පොදු අධිකාරිය විසින් මෙම තොරතුරු රහසිගත සහ ප්‍රකාශයට පත් කළ නොහැකි තොරතුරු ලෙස වර්ග කොට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දෙන ලදී. එම නිසා පොදු අධිකාරිය පවසා සිටියේ ජනාධිපති කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු අවසන් වූ විට අභියාචකගේ තොරතුරු ඉල්ලීම සලකා බලන බවයි.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවට 2017.11.06 දිනැතිව අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කරුණු:**

පාර්ශ්ව දෙකෙහිම එකඟතාවය මත RTICAppeal/25/2018 සහ RTICAppeal/26/2018 යන අභියාචනා දෙකම එකට සලකා බැලීමට තීරණය කරන ලද අතර අදාළ නියෝග වෙන වෙනම නිකුත් කිරීමට තීරණය කරන ලදී.

2018.03.16 දින පොදු අධිකාරිය අයිතම අංක 6හි (පහත ඉස්මතු කර ඇති) අ සහ ආ එනම් වෙන්දේසි මාර්ගයෙන් සිදුවූ ප්‍රාථමික වෙළඳපළ ගනුදෙනු, ඍජුව සිදුවූ ප්‍රාථමික වෙළඳපල ගනුදෙනු, සහ ද්විතීයික වෙළඳපල ගනුදෙනුවලට අදාළ මිලදී ගත් දිනය සහ බිල්පත/ බැඳුම්කරය නිකුත් කළ දිනය (මිලදී ගත් දින වෙනත් දිනයක් නම්) අඩංගු තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය එකඟ විය. අයිතම අංක 4ට අදාළව පොදු අධිකාරියට නියෝග කර සිටියේ සාමාන්‍යයෙන් වාර්ෂික වාර්තාවන්හි පවතින අදාළ වර්ෂයට අදාළ තොරතුරු ලබා දීමටත් අවශ්‍ය නම් පනතේ 6 වගන්තිය ප්‍රකාරව එම තොරතුරු වෙන්කොට ලබා දෙන ලෙසටත් ය.

ඉක්බිතිව 2018.04.06 දිනැති ලිඛිත දේශන මගින් පොදු අධිකාරිය පවසා සිටියේ ඉල්ලා ඇති සියලු තොරතුරු ලබා දීමට නොහැකි වුව ද, සේවක අර්ථසාධක අරමුදලෙහි අයිතිවාසිකම් වලට බලපෑමක් සිදු නොවන ආකාරයෙන් පහත දක්වා ඇති, අභියාචකට තෝරාගත හැකි, එක් සංයෝජනයකින් තොරතුරු නිකුත් කළ හැකි බවයි.

I. අ, ආ, ඇ, ඈ

II. අ, ආ, ඉ

III. අ, ඊ

IV. අ, උ

V. අ, ඌ

අභියාචක විසින් මෙම සංයෝජනයෙන් තොරතුරු ලබා ගැනීමට අකමැති වූවද තව දුරටත් ගනුදෙනු කර සිටි අනෙකුත් පාර්ශ්වයෙහි තොරතුරු අවශ්‍ය නොවන බව පවසා සිටින ලදී (RTIC වාර්තාගත කාර්යය පටිපාටිය 2018.07.03). කොමිෂන් සභාව විසින් කිහිප වතාවක්, සට්ඨනය වන අවශ්‍යතා, එනම් සේවක අර්ථ සාධක අරමුදල හැසිරවීමේදී පවතින පොදු යහපත හේතුවෙන් විනිවිදභාවයෙන් සහ වගවීමකින් යුතුව කටයුතු කිරීම සහ මුල්‍යමය වෙළඳපලෙහි සේවක අර්ථ සාධක අරමුදලට පවතින තරගකාරීත්වය පවත්වාගෙන යාම, සලකා බලමින් සාධාරණ ලෙස නිකුත් කළ හැකි තොරතුරු සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර සම්මුතියක් ඇති කිරීමට උත්සාහ කරන ලදී. 2018.08.07 දින අභියාචක පවසා සිටින ලද්දේ පහත සංයෝජනයන් දෙකෙන් එකක් ලබා දීමට පොදු අධිකාරිය එකඟ වේ නම් සම්මුතියකට එළඹිය හැකි බවයි.

1. අ, ආ, ඇ, ඈ, ඊ, උ සහ ඉ හෝ

2. අ, ආ, ඇ, ඈ, ඊ, උ සහ ඌ

පොදු අධිකාරිය වෙත තවදුරටත් ප්‍රශ්න යොමු කිරීමෙන් අනතුරුව පොදු අධිකාරිය විසින් තොරතුරු ඉල්ලීමෙහි 2016 වර්ෂය දක්වා, 2017 වර්ෂයෙහි බාහිර විගණනය සිදුවීම හේතුවෙන් එම වර්ෂය සඳහා තොරතුරු අසම්පූර්ණ බැවින්, සියලු තොරතුරු (එ. අයිතමය හැර) ලබා දීමට එකඟ විය (RTIC 2018.08.07 වාර්තාගත කාර්යය පටිපාටිය ප්‍රකාරව).

එනමුත් 2018.08.17 දිනැති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති අචාර්ය පී. එන්. වීරසිංහ මහතාගේ අත්සනින් යුත් ලිපිය මගින් සහ 2018.09.04 දින විභාග කිරීමේදී පොදු අධිකාරිය තම මුල් මතයම නැවත ප්‍රකාශ කරමින් ඉ, ඌ, උ සහ එ යන අයිතමයන් හෙළිදරව් කිරීම මගින්

සේවක අර්ථසාධක අරමුදලෙහි තරගකාරීත්වයට අවාසියක් සිදු කරමින් ප්‍රාථමික සහ ද්විතීක වෙළඳපළවල්හි ක්‍රියාකාරීත්වයට බලපාන අතර එමගින් සේවක අර්ථසාධක අරමුදලට අප්‍රතිකාර්ය හානියක් සිදුවන හෙයින් අ, ආ, ඇ, ඈ අයිතමයන් පමණක් ලබා දීමට එකඟ විය.

කොමිෂන් සභාව විසින් තම 2018.07.03 දිනැති නියෝගය මගින් පහත සඳහන් ප්‍රශ්න ඇතුළුව දෙපාර්ශ්වය වෙත විස්තරාත්මක ප්‍රශ්න කිහිපයක් යොමු කරන ලද අතර ඉන් සමහරක් පොදු අධිකාරිය වෙත පමණක් යොමු වන ලදී.

1. සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතෙහි 'වෙළඳපල සංවේදී තොරතුරු' ලෙස කිසිදු ව්‍යතිරේඛයක් නොපවතින බැවින්, එම පනතේ නෛතික අවශ්‍යතා සපුරාලමින්, විශේෂයෙන් පනතේ 5 (1) (ඏ) වගන්තියේ සඳහන් 'එක් එක් ආයෝජනයන්' ට අදාළ, ශ්‍රී ලංකා මහ බැංකුව වෙළඳපල සංවේදී යයි පවසන තොරතුරු හෙළිදරව් කිරීම වළක්වා සිටින්නේ කෙසේ ද?
2. 'වෙළඳපල සංවේදීතාවය' මත හෙළිදරව් නොකළ යුතු තොරතුරු සහ රාජ්‍ය ණයට අනුබද්ධව විනිවිදභාවය සඳහා වූ අවශ්‍යතා ඉටු කරලීම තුලනය කිරීම උදෙසා ශ්‍රී ලංකා මහා බැංකුව නියම කර ඇති මාර්ගෝපදේශන/රෙගුලාසි කවරේ ද?
3. විනිවිදභාවය සහ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනත ප්‍රකාරව හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය ආරක්ෂා කරමින් යම්කිසි තොරතුරක් වෙළඳපල සංවේදී යයි නම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව භාවිත කරන නිර්ණායක කවරේ ද?
4. එම නිර්ණායක මත පදනම්ව අභියාචක සංවිධානය විසින් ඉල්ලා ඇති තොරතුරු අතරින් වෙළඳපල සංවේදී ලෙස හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (ඈ) වගන්තියට ඇතුළත් කළ හැකි හෝ තොරතුරු කවරේ ද සහ එසේ කළ නොහැකි වන්නේ මන්ද?
5. පොදු අධිකාරිය ප්‍රකාශ කර ඇති පරිදි පනතේ 5 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව 'වාණිජමය රහස්' ලෙස සලකා මුක්ත වන තොරතුරු මුදල් ප්‍රවාහයට සම්බන්ධ වන්නේ කෙසේ ද?
6. පොදු අධිකාරිය පවසන පරිදි සේවක අර්ථසාධක අරමුදලට අදාළ ගණුදෙනු ගණනාවක් තිබීම හේතුවෙන් තොරතුරු ලබා

දීමේ ප්‍රායෝගික අපහසුතා පවතින්නේ නම්, මෙසේ ගණුදෙනු ගණනාවක් පැවතීම නිශ්චිත කරුණු සහිතව, කොමිෂන් සභාවට මෙම තොරතුරු පනත ප්‍රකාරව නෛතිකව හෙළිදරව් කළ හැකි තොරතුරු දැයි තීරණයකට එළඹීම සඳහා, පොදු අධිකාරිය ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන්ම, තොරතුරු ඉල්ලීමෙහි සඳහන් කාල පරිච්ඡේදය තුළ, සාමාන්‍ය රටාවක් හුවා දක්වමින්, සේවක අර්ථසාධක අරමුදල, ද්විතීක වෙළඳපලෙහි බැඳුම්කර මිලට ගත්තේ ද/නැත්ද, කාගෙන් සහ කුමන මිලකටද සහ මෙම බැදුම්කර ප්‍රාථමික වෙළඳපලෙහි ගණුදෙනු වූ මිල ගණන් පෙන්වා දිය යුතුයි.

මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිඛිත දේශන තුළින් පොදු අධිකාරිය(2018.08.17 දිනැතිව) සහ අභියාචක පාර්ශ්වය (2018.08.06 දිනැතිව) විසින් ගොනු කරන ලදී. විශේෂයෙන්ම සහ ප්‍රශ්න අංක එකට, එනම් පොදු අධිකාරිය වෙත පැවරී ඇති නෛතික වගකීම් කවරේද යන්නට පිළිතුරු සපයමින් පොදු අධිකාරිය පවසා සිටියේ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතේ 5 (1) (උඉ) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන්නේ මුහුණත් වටිනාකම, වෙළඳපල වටිනාකම, ගැනුම් මිල අඩංගු ආයෝජන පිළිබඳ ප්‍රකාශනයක් බවත් (ඒ අනුව නෛතිකව අවශ්‍ය තොරතුරු වාර්ෂික වාර්තාවල පවතින බවත්) එයින් අර්ථකථනය වන්නේ අභියාචක ඉල්ලා සිටින පරිදි එක් එක් ගනුදෙනුවෙහි විස්තර නොවන බවත් ය.

තවද පොදු අධිකාරිය ප්‍රකාශ කර සිටියේ (ලිඛිත දේශනයන්හි 28 ඡේදය ප්‍රකාරව) අංක 6හි අ සිට ඈ සහ ඊ යන්න හෙළිදරව් කිරීම වෙළඳපල සංවේදීත්වය ට බලපෑම් නොකරන බවත් ඉ, උ, උඉ සහ එ හෙළිදරව් කිරීම මගින් අයෝජන ක්‍රමෝපායන් සඳහා බලපෑම් ඇතිවන බවත් සහ තවදුරටත් විරුද්ධ පාර්ශ්වයේ/අනෙකුත් පාර්ශ්වයේ හෙළිදරව් නොකිරීම සිදුවන්නේ නම් එම ප්‍රතිපත්තියම සේවක අර්ථසාධක අරමුදලට බලපැවැත්විය යුතු බවත්ය.

**නියෝගය:**

RTIC Appeal 26/2018 හි තොරතුරු ඉල්ලීම ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ සුරැකුම්පත් ක්‍රමවේදයක් වන (<http://www.epf.lk/>) සහ සාමාජිකයින්ගේ සැබෑ ඉතිරුම්වලින් සංයුක්තවූ සාමාජික ගිණුම් අඩංගු වූ සේවක අර්ථසාධක අරමුදලට අදාළව වේ.

සේවක අර්ථසාධක අරමුදල රුපියල් ට්‍රිලියන දෙකකින් යුත් සහ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට අසූවක් පමණවූ සාමාජික ගිණුම් මිලියන17.3 යුත් ශ්‍රී ලංකාවේ පවතින විශාලතම අරමුදල වන හෙයින් අභියාචක තර්ක කර සිටියේ මෙම තොරතුරු පොදු යහපතට විශාල වශයෙන් බලපාන බවයි. 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනත ප්‍රකාරව (පනතේ 5 (1) (ඉ) වගන්තිය) මෙම අරමුදල මුදල් මණ්ඩලය සුදුසු යයි නිර්ණය කරන සුරැකුම්පත්හි ආයෝජනය කිරීමට පොදු අධිකාරිය බැඳී සිටින අතර (සේවක අරමුදල් පණත 5(1)(ඉ) වගන්තිය පරිදි)

<u>මුක්ත වගන්ති 5 (1) (අ), 5 (1) (ඈ) සහ 5 (1) (එ) (i) හි අදාළභාවය</u>

<u>සාමාන්‍ය නිරීක්ෂණ</u>

පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වයට අදාළ අයිතිවාසිකම් කිසිවකට මෙම අවස්ථාවේදී බලපෑමක් සිදු නොවන බැවින් සහ ඒ අනුව පනතේ 5 (1) (අ) වගන්තිය අදාළ නොවන බැවින් පොදු අධිකාරිය වෙත කරන ලද මුල් අභියාචනයේ තොරතුරු ප්‍රතික්ෂේප කිරීමේ පදනම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ප්‍රකාරව, දෝෂ සහිත වේ. කෙසේ වුවද තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සඳහා, 5 (1) (එ) (ස) සහ 5 (1) (ඈ) වගන්ති අදාළ මුක්ත වීමේ අවස්ථා ලෙස, කොමිෂන් සභාව ඉදිරියේ විභාග කිරීමේ අවස්ථාවලදී, පොදු අධිකාරිය මතු කර ඇත.

ප්‍රශ්නගතව ඇත්තේ 2015 සහ 2016 ට අදාළ තොරතුරු, අභියාචනය විභාග කරන අවස්ථාවේදී, පොදු අධිකාරිය ලබා දීමට එකඟව අභියාචක පාර්ශ්වය ද ඉන් සෑහීමකට පත් වුව ද (2018.08.07 දිනැති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි වාර්තාගත කාර්යය පටිපාටිය) පසුව පොදු අධිකාරිය විසින් නැවත එම එකඟතාවයෙන් ඉවත් වන ලදී.

පොදු අධිකාරිය දැඩි සේ තර්ක කරමින් අවධාරණය කර සිටියේ, තොරතුරු හෙළිදරව් කිරීම මගින් සේවක අර්ථ සාධක අරමුදලෙහි තරඟකාරීත්වයට නිත්‍ය අගතියක් සිදුවන බවය. කෙසේ වුව ද අවසන් වූ ගණුදෙනු/අතීත දත්ත යන්ට අදාළ තොරතුරු ඉල්ලීම්වලට, යම්කිසි සංවේදීතාවයකින් යුතු පවත්නා ගනුදෙනු අදාළ තොරතුරු

ඉල්ලීම්වලට සාපේක්ෂව වෙනත් අයුරකින් ප්‍රතිචාර දැක්වීම පිළිගත් මූලධර්මයකි. මෙම මූලධර්මය කොමිෂන් සභාව *ශ්‍රී ලංකා ගුවන් නියමු සංසදය එ. ශ්‍රී ලන්කන් ගුවන් සේවය සමාගම* අභියාචනයෙහි ද පිළිගන්නා ලදී. (2018.06.12 දිනැති නියෝගය)

මෙම අභියාචනයේ, මුලින් හෙළිදරව් කිරීමට එකඟවූ තොරතුරු වලට අදාළ ගනුදෙනු (එනම් 2016 වර්ෂය දක්වා) සිදුව දැනට වසර දෙකකට වඩා වැඩි කාලයක් ගතව ඇත. තෙවන පාර්ශ්වයක එනම් සේවක අර්ථ සාධක අරමුදලේ (සේවක අර්ථ සාධක අරමුදල 5 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව තෙවන පාර්ශ්වයක් යයි උපකල්පනය කළහොත්) තරඟකාරීත්වය සඳහා අගතියක් සිදුවන ආකාරය පෙන්වා දීමට පොදු අධිකාරියට වී ඇත. තවද, කොමිෂන් සභාව ඉදිරියේ දැක්වී ඇති කරුණු මත පදනම්ව, මෙම වැඩිදුර හෙළිදරව් කිරීම මගින් වඩාත් යෝග්‍ය ආයෝජන සහ වඩාත් හෝ සමාන වැදගත්කමින්, අවාසිදායක ගනුදෙනු වැළැක්වීමක් සිදු වන බව පෙනී යයි. පොදු අධිකාරිය, සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයින්ට වඩාත් වගකීමකින් යුතුව කටයුතු කිරීමට යෙදෙයි. ඒ අනුව අපගේ මතය වන්නේ මෙම තර්කය ප්‍රමාණවත් අයුරින් ගුණාගුණ මත සනාථ නොකර ඇති බවයි.

තවද සේවක අර්ථ සාධක අරමුදල පිළිබඳ පනතේ 5 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව, අරමුදලේ පවතින, ක්ෂණිකව අවශ්‍ය නොවන මුදල් පමණක්, මුදල් මණ්ඩලය සුදුසු යයි නිර්ණය කරන සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට සහ විකිණීමට හැකි බව අවධානයට පැමිණ ඇත. එයින් අදහස් වන්නේ සේවක අර්ථ සාධක අරමුදලේ පරමාර්ථ වන්නේ කෙටි කාලීන ආයෝජන වලට වඩා වෙළඳපල සංවේදීතාවය සාපේක්ෂව ඉතා අඩු දීර්ඝ කාලීන ආයෝජන කිරීම් බව පැහැදිලි වේ. එම වගන්තිය මගින් "සුරකුම්පත්හි" "ආයෝජනය" කිරීමට බලය පැවරෙයි. මෙය, සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයින්ගේ දෘෂ්ඨී කෝණයෙන්, විවිධ අවස්ථාවන්හි ආයෝජන ගණනාවක්, තනි සුරකුම්පතක සිදු කිරීම ලෙසද අර්ථනිරූපනය කළ හැකිය. මෙම වෙනස මෙම නියෝගයෙහි පසුව සාකච්ඡාවට භාජනය වන අයුරින් අදාළ වේ.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (ඈ) වගන්තියේ අදාළත්වය

අභියාචක පාර්ශ්වයෙහි ප්‍රධාන තර්කය වුයේ සේවක අර්ථ සාධක අරමුදල රජයේ සියයට 90ක පමණ දේශීය ණය දරණ රටෙහි පවතින විශාලතම තනි අරමුදල සහ ප්‍රාථමික වෙළඳපළෙහි පමණක් බොහෝවිට ක්‍රියාත්මක වන බැවින් (එනම් ද්විතීයික වෙළඳපළෙහි තෙවන පාර්ශ්වයන්ගෙන් නොව රජයෙන් ඍජුවම මිලට ගැනීමෙන්) කෙබදු හෝ ද්විතීයික වෙළඳපළ ක්‍රියාකාරකම් සැලකිය යුතු පොදු කටයුත්තක් වේ;

> මන්ද එයින් පොදු මුදල් පෞද්ගලික අතට මාරු වීම සිදු විය හැකි බැවින් (ප්‍රථමික ගනුදෙනු වලදී පිරිවැය හෝ ප්‍රතිලාභය සිදු වන්නේ රජයට පමණි රජය අනෙක් අතට මහජන බදු මුදල් වලින් ණය පියවයි) (අභියාචකගේ 2018.04.13 දිනැති ලිඛිත දේශන, 14 ඡේදය)

මෙය ප්‍රතික්ෂේප කරමින් පොදු අධිකාරිය තර්ක කර සිටියේ තොරතුරු ලබා දීම මගින් සේවක අර්ථ සාධක අරමුදල විසින් අනුගමනය කරන ආයෝජන ක්‍රමෝපායන් සහ රටාවලට තරගකාරීන්ට ප්‍රවේශ වීමට හැකි වන බවය. කෙසේද යත් ගනුදෙනු හෙළිදරව් කිරීම මගින් කොටස් මිල ගණන්වල චලනය වීම සිදු වීමෙන් වෙළඳපල සංවේදී තොරතුරු බවට පත් වීමෙනි. අභියාචක පාර්ශ්වයේ කරුණු කියාපෑම් වලට අනුව තොරතුරු දැනටමත් බ්ලූම්බර්ග් වේදිකාව (Bloomberg Platform) ඔස්සේ පොදු වසමට එකතුවී ඇත යන්නට ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය පවසා සිටියේ වෙළඳපළෙහි සහභාගිවන පුද්ගලයින් යම්කිසි බැඳුම්කරයක් ගනුදෙනු වන බව දැන සිටිය ද, එම ගනුදෙනුව සිදු කරන පාර්ශ්වකරුවන් හඳුනාගත නොහැකි බවයි.

දෙපාර්ශ්වයේම කරුණු කියාපෑම් සැලකිල්ලට ගනිමින් පෙනීයන්නේ පොදු අධිකාරිය නැවත නැවතත් තොරතුරු වෙළඳපළ සංවේදී යයි පවසමින් එය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (ඈ) වගන්තියට ඇතුළත් වන බව පවසා සිටියද මෙම තොරතුරු සේවක අර්ථසාධක අරමුදලෙහි වෙළඳපළ තරගකාරීත්වයට සිදු වන බලපෑම <u>නිශ්චිතව පෙන්වා දීමට</u> (අපි අවධාරණය කර සිටිමු) නැතහොත් 5 (1) (ඈ) වගන්තියට ඇතුලත් වන්නේ කෙසේද යනු පෙන්වීමට අපොහොසත් වී ඇත.

තවද සැලකිය යුතු කරුණක් වන්නේ මෙම කොමිෂන් සභාව විසින්, මෙම කරුණ නිශ්චය වශයෙන් දැනගැනීම සඳහා විශේෂ ප්‍රයත්නයක් යොදමින්, මහා බැංකුව විසින් විනිවිදභාවය සහ සේවක අර්ථ සාධක අරමුදල පිළිබඳ පනත ප්‍රකාරව සිදු කළ යුතු හෙළිදරව් කිරීම් තහවුරු කරමින්, යම්කිසි තොරතුරක් "වෙළඳපළ සංවේදී" යයි නම් කිරීම සඳහා භාවිත කරන නිශ්චිත නිර්ණායක, විමසා සිටින ලදී. පොදු අධිකාරියෙන් ඉල්ලා සිටි තොරතුරු අතුරින් කවර අයිතමයන් "වෙළඳපල සංවේදී" යයි වර්ගීකරණය කළ හැකි වන්නේ ද යන්නත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (ඈ) වගන්තියට ඇතුළත් වන්නේ ද යන්නත් එම තොරතුරු වෙළඳපළ සංවේදී වන්නේ ඇයිද යන්නත් විමසන ලදී. මෙයට ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය පවසා සිටියේ (පොදු අධිකාරියෙහි 2018.08.17 දිනැති ලිඛිත දේශන ප්‍රකාරව);

> සේවක අර්ථ සාධක අරමුදලේ එදිනෙදා ආයෝජන ක්‍රමෝපායන් සහ ආයෝජන රටා, එවැනි තොරතුරු හෙළිදරව් කිරීම හේතුවෙන් අනෙකුත් පාර්ශ්වයන් විසින් අයුතු ලෙස ප්‍රයෝජනයට ගත හැකි අතර එය සේවක අර්ථසාධක අරමුදලේ වෙළඳපළ තරඟකාරීත්වයට අහිතර ලෙස බලපෑ හැකිය. මෙම තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් ඕනෑම පාර්ශ්වයකට සේවක අර්ථ සාධක අරමුදලේ ස්ථාවරය එනම් සුරකුම්පතක ප්‍රතිශත හිමිකම හඳුනා ගත හැකිය. එසේම, ලඟාන්තිකය වැනි ආයෝජන සහ වෙළදාම් ක්‍රමෝපායන් තරගකරුවන්ට තම වාසියට භාවිත කළ හැකි අතර පෙර විකිණීම් සඳහා ද භාවිත කළ හැකිය. ඒ අනුව වෙළඳපළ තරඟකරුවන්ට සේවක අර්ථ සාධක අරමුදලෙහි අවශ්‍යතා සහ අනාගත ගනුදෙනු වල උපායමාර්ගයන් ද නිශ්චය කිරීමට හැකි වනු ඇත. එම නිසා, සේවක අර්ථ සාධක අරමුදලෙහි ගනුදෙනු අපේක්ෂා කරමින් අනෙකුත් පාර්ශ්වයන්ට ද මිලදී ගැනීම් සිදු කිරීමට උත්සාහ කළ හැකි අතර එයින් සේවක අර්ථ සාධක අරමුදලට සහ එහි සාමාජිකයින්ට අනවශ්‍ය මිල ඉහළ යාමක් සිදු විය හැකි අතර එම ක්‍රියාවලියෙහි ම ප්‍රතිවිරුද්ධ දෙයද සිදු විය හැකිය. අවසන් වශයෙන් මෙම තත්ත්වය අරමුදලෙහි සාමාජිකයන්ට අවාසිදායක තත්ත්වයක් උදා කරනු ඇත.

පොදු අධිකාරිය නැවත නැවතත් පවසා සිටියේ සේවක අර්ථ සාධක අරමුදලට අදාළ තොරතුරු තෙවන පාර්ශ්වයකගේ සන්තකයට යන්නේ නම් සේවක අර්ථ සාධක අරමුදලට ඵලදායි ලෙස තරග කිරීමට හෝ ගනුදෙනු කිරීමට ඇති හැකියාව හීන වන බවත් අනෙකුත් තරගකරුවන් සේවක අර්ථ සාධක අරමුදලෙහි ආයෝජන සිදු වීමට ප්‍රථමව එය සිදු කරන බවත් එමගින් අහිතකර ලෙස වෙළඳපළ මිල ගණන් චලනය වන බවත්ය. තවද, කරුණු කියාපාමින් සඳහන් කර සිටියේ 'වෙළඳපළෙහි සේවක අර්ථ සාධක අරමුදල තෙවන පාර්ශ්වයක් වන අතර තෙවන පාර්ශ්වයන්ට අයත් තොරතුරු හෙළිදරව්කිරීම මගින් බාහිර තරගකරුවන්ට උපරිම ලාභ ලබමින් කටයුතු කිරීමට හැකි වන බවයි. මිල මට්ටම් වලට බලපෑම් ඇති කළ හැකි ගනුදෙනු හෙළිදරව් කිරීම මගින් සේවක අර්ථ සාධක අරමුදල මගින් භාවිත වන ආයෝජන ක්‍රමෝපායන් සහ රටා වන්ට තරගකරුවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව ලැබීම නිසා වෙළඳපල/මිල සංවේදී තොරතුරු වේ. (2018.01.17 දිනැති පොදු අධිකාරිය විසින් යොමු කරන ලද ලිඛිත දේශන ප්‍රකාරව)

එසේම, පොදු අධිකාරිය පවසා සිටියේ තොරතුරු තරගකරුවන්ට තම වාසියට භාවිත කළ හැකි අතර පෙරමුණු දිවීමේ ක්‍රියාකාරකම් සඳහා ද භාවිතකරමින් ඒ අනුව වෙළඳපළ තරගකරුවන්ට සේවක අර්ථ සාධක අරමුදලෙහි අවශ්‍යතා සහ අනාගත ගනුදෙනු වල උපායමාර්ගයන් ද නිශ්චය කිරීමට හැකි වනු ඇති බවයි.

පොදු අධිකාරිය පවසන ආකාරයට තොරතුරු හෙළිදරව් කිරීම මගින් කවර පුද්ගලයෙකුට හෝ සේවක අර්ථ සාධක අරමුදලෙහි තත්ත්වය හඳුනාගත හැකි වුව ද, මෙම ප්‍රශ්න වලට පොදු අධිකාරියෙහි ප්‍රතිචාර විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ, වෙළඳපළෙහි සුරැකුම්පතක ප්‍රතිශත අයිතිය අනුව සේවක අර්ථ සාධක අරමුදලෙහි තත්ත්වය හඳුනා ගැනීමෙන්, විශේෂයෙන්ම පොදු අධිකාරිය පවසන් ආකාරයෙන් සේවක අර්ථ සාධක අරමුදල වෙළඳපළෙහි ආධිපත්‍ය දරණ පාර්ශ්වයක් වීමේදී, එහි තරගකාරීත්වයට බලපෑම් <u>සිදු වන්නේ කෙසේ ද යන්න</u> (අප විසින් උපුටා දැක්වීමකි) පෙන්වා දීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇති බවයි.

අපගේ මතය වන්නේ මෙම අවස්ථාවේදී පොදු අධිකාරිය, අවසන් වූ ගනුදෙනු/අතීත දත්ත, තරගකරුවන් විසින්, ස්ථිර වශයෙන් තම වාසියටත් සේවක අර්ථසාධක අරමුදලෙහි අවාසියටත්, භාවිත කළ

හැකි වන්නේ කෙසේද යන්න පෙන්වා දීමට අපොහොසත් වී ඇති බවයි. පොදු අධිකාරියෙහි ප්‍රතිචාරය සමග ලබා දී ඇති උදාහරණය, නිශ්චිත ප්‍රතිචාරයක් නොවන බැවින් ඒ අංශයෙන් උපකාරී නොවන අතර අපගේ මතය වන්නේ එය අනාගත/පවත්නා ගනුදෙනු සඳහා වඩාත් යෝගී වූ පිළිතුරක් වන බවයි.

තවද කොමිෂන් සභාව විසින් යොමු කරන ලද ප්‍රශ්නයට පොදු අධිකාරියෙහි ප්‍රතිචාරය එනම් සීමාසහිත හෙළිදරව් කිරීම සහ/හෝ හෙළිදරව් නොකිරීම් හේතුවෙන් ඇතිවන අසාධාරණ තරගකාරී වාසිය වැලැක්වීම සඳහා තොරතුරු හෙළිදරව් කිරීම අනිවාර්ය කළ යුතුද යන්නට, පොදු අධිකාරිය වක්‍රාකාරව පහත පරිදි පිළිතුරු සපයා ඇත.

> තොරතුරු හෙළිදරව් කිරීමේ අරමුණ වන්නේ අසමමිතිය අඩු කර එමගින් අසාධාරණ තරගකාරී වාසිය වැළක්වීමයි. එනමුත්, වෙළඳපළ තරගකාරීත්වයට බලපෑම් සිදු නොවන අවස්ථාවේදී, අනෙකුත් පාර්ශ්වය, හිමිකම සහ ගනුදෙනු හෙළිදරව් නොකිරීම මගින් බලාපොරොත්තු වන්නේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය ආරක්ෂා කිරීමයි. (පොදු අධිකාරියෙහි 2018.08.07 දිනැති ලිඛිත කරනු කියාපෑම්හි 26 ඡේදය)

අභියාචකගේ ප්‍රතිචාරය මගින් බ්ලූම්බර්ග් වේදිකාව සංස්ථාපිත වීමෙන් පසුව සියලු වෙළඳපළ සහභාගීවන්නන්ට දත්ත වලට ප්‍රවේශය ඇති බව තහවුරුවේ. (මෙහි අනෙක් පාර්ශ්වයේ තොරතුරු හැර, ඉල්ලා ඇති අනෙක් තොරතුරු ඍජුව හෝ වක්‍රව ප්‍රවේශය අඩංගු වේ). එම නිසා පැරණි ගණුදෙනු (එනම් ජනවාරි 2015 සිට 2016 ජූලි15 දක්වා වූ තොරතුරු) වඩාත් වෙළඳපළ සංවේදීය යනුවෙන් පැවසීම තර්කානුකූල නොවේ. සාමාන්‍යයෙන් පිළිගත් දෙයක් වන්නේ තරගකාරී වෙළඳපලක ගනුදෙනුවක් රහසිගත නොවන බවත් පාර්ශ්වයන්ට තොරතුරු හුවමාරු කරගත හැකි බවත් ය.

තවද අභියාචක විසින් විභාග කිරීම්වලදී යොමු කරන ලද තර්කය වන, කාර්යක්ෂම වෙළඳපළෙහි සමාන හෙළිදරව් කිරීම වෙළඳපළ නිසියාකාරව ක්‍රියාකරවීමට සුදුසුම දෙයක් බවත්, එසේ ප්‍රසිද්ධ හෙළිදරව් කිරීමක් නොසිදුවන අවස්ථාවලදී දත්ත පුද්ගලිකව හුවමාරු කරගැනීම සහ අසමාන ලෙස ප්‍රයෝජනයට ගැනීමක් සිදු වන බවත්, සමග එකඟවීමට කොමිෂන් සභාව නැඹුරු වෙයි.

කොමිෂන් සභාව තවද සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතේ 5 (1) (උෟ) වගන්තිහි සඳහන්.... හෙළිදරව් කිරීමේ අවශ්‍යතා, නීතිය පැහැදිලිව පනවා ඇති අයුරින් අරමුදල සම්බන්ධව වූ ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශයක්, අදායම් සහ වියදම් ප්‍රකාශයක්, වත්කම් සහ බැරකම් ප්‍රකාශයක්, සහ සඳහන් වටිනාකම, ගැනුම් මිල, සහ වෙළඳපළ මිල අඩංගු ආයෝජන ප්‍රකාශයක් යනාදියට අවධානය යොමු කර සිටියි. මෙයින් අදහස් වන්නේ සුරකුම්පතක කරන ලද එක් එක් ආයෝජනයක් බව අපගේ අදහස වේ...

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (එ) වගන්තියේ අදාළත්වය

පොදු අධිකාරිය 2015 ජනවාරි 1 දින සිට 2016 මාර්තු 31 දක්වා රජයේ සුරකුම්පත් හි ද්විතීයික වෙළඳපළ ගනුදෙනුවලට අදාළව විමසා වාර්තා කිරීමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විමර්ශනයක් පැවැත්වෙන බැවින් අභියාචක වෙත තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර සිටින ලදී. පොදු අධිකාරිය තවදුරටත් පවසා සිටියේ පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සමාන තොරතුරු ඉල්ලා සිටි බවත් එම තොරතුරු පොදු අධිකාරිය විසින් 'රහසිගත සහ පළ කළ නොහැකි' ගණයට යටත් කොට පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ලබා දුන් බවත් ජනාධිපති කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු අවසන් වූ විට අභියාචකගේ තොරතුරු ඉල්ලීම සලකා බලන බවත් ය.

කොමිෂන් සභාව ඉදිරියේ පැවති විභාග කිරීම් වලදී ද පොදු අධිකාරිය නැවතත් 5 (1) (අ) වගන්තිය ඉදිරිපත් කර සිටි අතර ඒ සමග 5 (1) (උෟ) වගන්තිය ප්‍රකාරව එනම් 'යම් අපරාධයක් වැළැක්වීම හෝ ඒ පිළිබඳව සොයා ගැනීම හෝ වරදකරුවන් අල්ලා ගැනීම හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදුවන අවස්ථාවක...' තොරතුරු හෙළිදරව් කිරීමෙන් මුක්ත වන බව ඉදිරිපත් කර සිටින ලදී (2018.03.16 දිනැති තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ වාර්තාගත කාර්යය පටිපාටිය). මෙම අවස්ථා දෙකේදීම නිදහස් කිරීමට සිදුවන පොදු අධිකාරිය මත පැවරෙන නෛතික භාරයක් ඇත. මෙය ශ්‍රී ලංකාවේ නීතියට පමණක් සීමා වුණු අවශ්‍යතාවයක් නොවන අතර අනෙකුත් අනුරූපී බල සීමාවන් ඇති රටවල් හි ද මෙම නෛතික වගන්තිය පවතියි.

*Smt. අශ්වින් ඩික්සිත් එ. ඉන්දියානු සංචිත බැංකුව* (2012මාර්තු 12 තීරණය කරන ලද) හි ඉන්දියානු මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව වෙහි මත වුයේ පනතේ 8 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව තොරතුරු මුක්ත බව අර්ධව තර්ක කර සිටීම ප්‍රමාණවත් නොවන බවත්, පනතේ 19 (5) වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය වෙත පැවරී තිබෙන ඔප්පු කිරීමේ භාරය නිදහස් කළ යුතු බවත් ය. කොමිෂන් සභාව පවසා සිටියේ;

> *තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව තොරතුර මුක්ත වීම සඳහා රජයේ තොරතුරු නිලධරයා (PIO) ඉල්ලා සිටින තොරතුර (මෙයට වාණිජමය හෝ වෙළඳ රහස්, බුද්ධිමය දේපල හෝ ඒ හා සමාන තොරතුරු ඇතුළත් විය හැකිය) හෙළිදරව් කිරීම මගින් තෙවන පාර්ශ්වයෙහි තරගකාරී ස්ථාවරයට හානියක් වන බව තහවුරු කළ යුතුයි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 19 (5) වගන්තිය ප්‍රකාරව, ව්‍යතිරේකය අදාළ බව ඔප්පු කිරීමේ භාරය පවතින්නේ රජයේ තොරතුරු නිලධරයා (PIO) මතය.*

5 (1) (උ) වගන්තියේ අදාළත්වය තහවුරු කිරීමේ දී ඉන්දියානු පනතේ අනුරූපී වගන්තිය (2005 අංක 22 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත) වන 8 (1) (උ) ප්‍රකාරව එනම් 'යම් අපරාධයක් වැලැක්වීම හෝ ඒ පිළිබඳව සොයා ගැනීම හෝ වරදකරුවන් අල්ලා ගැනීම හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදුවන අවස්ථාවක...' තොරතුරු හෙළිදරව් කිරීමෙන් මුක්ත කර සිටීම ශ්‍රී ලංකා තොරතුරු පනතේ 5 (1) (උ) වගන්තිය හා සංසන්දනය කළ හැකිය. සංසන්දනාත්මක අවස්ථාවලදී ඉන්දියානු නීතිය ප්‍රකාරව දැඩි ස්ථාවරයක් අදාළ නෛතික ආයතන විසින් ගෙන ඇත.

*රාජීව් කුමාර් ජෛයින් එ. දිල්ලි ජාල් මණ්ඩලය* Gnctd (2011 ජනවාරි 19 තීරණය කරන ලද) හි ඉන්දියානු මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව පොදු අධිකාරිය 8 (1) (උ) වගන්තියෙහි ප්‍රතිලාභය තකා සිටි අවස්ථාවකදී තොරතුරු නිදහස් කරන ලෙසට නියෝග කර ඇත. මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව තීරණය කර සිටින ලද්දේ 'රජයේ තොරතුරු නිලධරයා තොරතුරු හෙළිදරව් කිරීම මගින්

විමර්ශනයට සිදු විය හැකි බාධාව විශේෂිත පදනමක් සහිතව පෙන්වා නොමැත.' මෙයට පාදක වුයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 (1) (උෟ) වගන්තිය බාධාවක් 'සිදුවිය හැකි' යන පද මාලාව නොව 'සිදුවන' යන වචනය භාවිත කිරීමයි. එසේ හෙයින් නිගමනය වුයේ 'විමර්ශනයට බාධාවක් සිදුවීමට සාධාරණ හැකියාවක් ඇති බවත් වැඩිදුර පරීක්ෂණයක් පැවැත්විය හැකි බවත් එයට බාධාවක් පැමිණිය හැකි බවත් යන හුදෙක් අනුමානයෙන් තොරතුරු පනතේ 8 (1) (උෟ) වගන්තියේ අවශ්‍යතාවයන් සම්පුර්ණ නොවන බවයි.'

*බී එස් මාතුර් එ. රජයේ තොරතුරු නිලධරයා දිල්ලි මහාධිකරණය* (2011 ජුනි 03 තීරණය කරන ලද) හි දිල්ලි මහා අධිකරණ තීරණය කර සිටින ලද්දේ,

> තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 (1) (උෟ) වගන්තිය, එනම් වගඋත්තරකරු විසින් පෙත්සම්කරු වෙත තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට භාවිත කළ එකම වගන්තිය සම්බන්ධයෙන්, පොදු අධිකාරිය විසින් පෙන්වා දිය යුතු වන්නේ ඉල්ලා ඇති තොරතුරු මගින් "'විමර්ශන ක්‍රියාවලියට බාධාවක් සිදු වන්නේ" කෙසේ ද යන්න පෙන්වා දීමය. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 (1) (උෟ) වගන්තියේ ආවරණය පතා සිටින අවස්ථාවේදී එම වගන්තියේ පද මාලාව උපුටා දැක්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. විමර්ශනයට "බාධාවක්" සිදුවන ආකාරය ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය මත පැවරෙයි.

*තවද ශ්‍රී එස් සත්‍යනාරයන එ. ඉන්දියානු සංචිත බැංකුව* (2011 අගෝස්තු 24 තීරණය කරන ලද) හි මධ්‍යම තොරතුරු කොමිෂන් සභාව නිරීක්ෂණය කළ පරිදි;

> විමර්ශන ක්‍රියාවලිය හෝ අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පැවැත්වෙන බැවින් පමණක්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 8 (1) (උෟ) ව්‍යතිරේකය බල පැවැත්වෙන්නේ නැත. රජයේ තොරතුරු නිලධරයා විසින් තොරතුරු හෙළිදරව් කිරීම මගින් විමර්ශන ක්‍රියාවලියට හෝ වරදකරුවන්

අල්ලාගැනීමට හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීමට හෝ බාධාවක් සිදු විය යුතුයි...

ඉහත සඳහන් මූලධර්මයන් අභියාචනයේ කරුණු වලට අදාළ කිරීමෙන් පෙනී යන්නේ 'වරදකරුවන් අල්ලා ගැනීම හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීමට... බලවත් අගතියක් සිදුවන බව' ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය මත පවතින බවයි. එනමුත් ප්‍රතිචාරයක් නොලද, විමර්ශනයේ තත්ත්වය විමසා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇති ප්‍රශ්නය හැරුණු කොට, කරනු කියාපෑම් අවසානයේද සිදු විය හැකි අගතිය ප්‍රත්‍යක්ෂ ලෙස පෙන්වා දීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇත.

පොදු අධිකාරිය තම 2018.06.19 දිනැති ලිඛිත දේශනා මගින් ගෙන ඇති පියවර සේ දක්වා ඇත්තේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන් විසින් ලබාගත් අයුතු ලාභ නැවත ලබා ගැනීමට සහ සේවක අර්ථසාධක අරමුදලේ ද්විතීක වෙළඳපළ ගනුදෙනු අක්‍රමිකතා වලින් තොරව සිදු කිරීමට අපරාධ විමර්ශනයක් සිදු කිරීමටත් පියවර ගෙන ඇති බවයි. මෙම පදනම මත පොදු අධිකාරිය තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. අපට පෙනී යන්නේ මෙම හුදු ප්‍රතික්ෂේප කිරීම පදනම් කොට ගෙන පනතේ 5 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ නොහැකි බවයි.

පොදු අධිකාරිය ව්‍යතිරේකයේ හුදු උපුටනයක් පමණක් සිදු කිරීම ප්‍රමාණවත් නොවන අතර, ඉල්ලා ඇති නිශ්චිත අයිතමයන්ට අදාළ තොරතුරු හෙළිදරව් කිරීම මගින්, 'දැඩි අගතියක්' සිදුවිය හැක්කේ කෙසේද යන්න වගන්තිය ප්‍රකාරව නිශ්චිතව දැක්වීම පොදු අධිකාරියෙහි වගකීම වේ (තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙහි 2018.03.16 දිනැති නියෝගය).

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වාර්තාවක් නිකුත් කිරීමෙන් පසුව එම බැදුම්කර කොමිෂන් සභාව මෙම අභියාචනය පවත්වාගෙන යන කාලය තුළදී අවසන් වූ අතර, පොදු අධිකාරිය පවසා සිටියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයන් සිදුවෙමින් පවතින බවත් ඇතැම් පුද්ගලයින් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයේ සිටින බවත් ය (RTIC 2018.07.03 වාර්තාගත කාර්යය

පටිපාටිය ප්‍රකාරව). මෙම කොමිෂන් සභාව ඉදිරියේ පවතින අභියාචනා දෙකට අදාළව තොරතුරු නිදහස් කිරීම මගින්, පනතේ 5 (1) (ඌ) (ස) වගන්තිය ප්‍රකාරව 'යම් අපරාධයක් වැළැක්වීම හෝ ඒ පිළිබඳව සොයා ගැනීම හෝ වරදකරුවන් අල්ලාගැනීම හෝ ඔවුනට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් බලවත් අගතියක් සිදුවන' අවස්ථාවන්ට නිශ්චිත උදාහරණ, අදාළ නීති ආයතන/නඩු පවරන ආයතන වලින් ලබා දෙන ලෙසට අප නියෝග කර සිටි අතර (RTIC 2018.07.03 වාර්තාගත කාර්යය පටිපාටිය ප්‍රකාරව) පොදු අධිකාරිය පවසා සිටියේ මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයේ තත්ත්වය පිළිබඳව, 2018.06.12 දිනැති ලිපිය මගින් විමසා සිටි බවත් මේ දක්වා ඒ සඳහා ප්‍රතිචාරයක් නොලද බවත්ය (RTIC 2018.09.04 වාර්තාගත කාර්යය පටිපාටිය ප්‍රකාරව).

## තොරතුරු හෙළිදරව් කිරීමෙන් සිදුවන මහජන සුබසිද්ධිය

මෙම අභියාචනයේ කරුණු මත පදනම්ව අපගේ මතය වන්නේ පනතේ 5 (4) ප්‍රකාරව තොරතුරු හෙළිදරව් කිරීමෙන් සිදුවන 'මහජන සුබසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි' බවයි.

2015 ජනවාරි 1 දින සිට 2016 මාර්තු 31 දක්වා සේවක අර්ථ සාධක අරමුදලේ රජයේ සුරැකුම්පත් හි ද්විතීයික වෙළඳපළ ගනුදෙනු වලට අදාළව විමර්ශනය කොට වාර්තා කිරීමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කොට විමර්ශනයක පවත්වාගෙන යාම මෙම අභියාචනය මගින් සිදුවන පොදු යහපතට තවදුරටත් බලපායි.

පොදු අධිකාරිය විසින් හෙළිදරව් කරනු ලබන්නේ තමා ක්‍රියා කිරීමට බැඳී සිටින්නේ සේවක අර්ථ සාධක අරමුදලට වෙළඳපළෙහි අනෙකුත් පාර්ශ්වයකට මෙන් තිබෙන තරගකාරී වාසිය ආරක්ෂා කරමින් බවට පැහැදිලි වන අතර, එම අවශ්‍යතාවය තුලනය විය යුත්තේ සේවක අර්ථසාධක අරමුදලේ සහ එහි සාමාජිකයින්ගේ ම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වන විනිවිදභාවය සහ වගවීම පවත්වා ගෙන යමිනි. මන්ද මෙහිදී නෛතිකව මෙම විශ්‍රාම අරමුදලට ලබාදීමට බැඳී සිටින, වෙනත් ආකාරයකින් අවශ්‍ය ලෙස තම මුදල් ආයෝජනය කිරීමට නොහැකි, සේවක අර්ථසාධක

අරමුදලේ සාමාජිකයින් මිලියන් 17.3 ගේ ධනය එනම් පොදු ධනය, පොදු අධිකාරිය විසින් ආයෝජනය කරනු ලැබේ. එබැවින් සේවක අර්ථ සාධක අරමුදල ක්‍රියාත්මක වන සන්දර්භයම පොදු යහපත සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත්ය. පොදු අධිකාරිය සේවක අර්ථ සාධක අරමුදලේ කළමනාකරණ හා ආයෝජක ලෙසත්; වෙළඳපළ සංවර්ධක සහ බැංකු නියමක සහ රාජ්‍ය වැය සඳහා බැඳුම්කර වෙළඳපළෙහි මුල්‍යමය ඉපයුම් සිදු කරන රජයේ නියෝජිතයා ලෙසත් විවිධ චරිතවලට අදාළ කාර්යයන් ඉටු කරනා බව කොමිෂන් සභාවට සැලකිල්ලට ගැනීමට සිදු වෙයි. පොදු අධිකාරිය කැමැත්තෙන් හෝ පැවරීමෙන් මෙම බහුචරිතයන් වල නියැලෙන්නට සිදු වන්නේ නම්, එම චරිත වලට අවේනික වූ පොදු සහ විශේෂිතවූ වාර්තා කිරීම් සහ වගවීම් සපුරාලන අවශ්‍යතා ඉටු කිරීමට සිදු වන බව පිළිගෙන එම ක්‍රියාවලීන් ක්‍රියාත්මක කළ යුතුවේ.

සේවක අර්ථ සාධක අරමුදල 2015 සහ 2016 වසරේ ද්විතීයික වෙළඳපළෙහි ගණුදෙනු සිදු කිරීම මගින් තොරතුරු හෙළිදරව් කිරීමෙන් ඇති පොදු යහපත තවදුරටත් තහවුරු වේ. පොදු අධිකාරියෙහි කියාපෑම වූ 'සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන අඩු ගනුදෙනු සංඛ්‍යාවකින් යුතුව දීර්ඝ කාලීනව පවත්වාගෙන යන බවට' අභියාචකගෙන් පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීමට පහත පරිදි වේ (RTIC 2018.07.03 වාර්තාගත කාර්යය පටිපාටිය ප්‍රකාරව);

> ...... සේවක අර්ථසාධක අරමුදල සාමාජිකයින්ගෙන් මාසික දායකත්වයක් ලබාගෙන, විශ්‍රාම ලද සාමාජිකයින්ට නැවත ගෙවීම් කරන විශ්‍රාමික අරමුදලක්, අවුරුදු 2030 කින්;
>
> විශ්‍රාම අරමුදල් වල ආයෝජනය කිරීමේ න්‍යාය වන්නේ අරමුදලට සිදුවන බැර කිරීම් දීර්ඝ කාලීන ප්‍රතිලාභ ඉලක්ක කරගෙන බවත් කෙටි කාලීන ප්‍රතිලාභ ඉලක්ක කරගෙන නොවන බවත් ය. සාමාන්‍යයෙන් දීර්ඝ කාලීන ආයෝජන බොහෝ විට කල් පිරෙන තෙක් තබා ගන්නා බවත් නිතර ගණුදෙනුවලට ලක් නොකරන බවත් මුල්‍යමය භාෂාවෙන් පවසා සිටින්නේ නම් කෙටි කාලීන ප්‍රතිලාභ ඉලක්ක කරගෙන සිදු කරන ආයෝජන "වෙළඳ කලාපයක" පවත්වාගෙන යන

> අතර දීර්ඝ කාලීන ප්‍රතිලාභ ඉලක්ක කරගත් ආයෝජන " ආයෝජන කලාපයක" පවත්වාගෙන යයි. නිතර ගනුදෙනු වලට භාජනය වන්නේ "වෙළඳ කලාපයෙහි" පවත්වාගෙන යන යෝජනා පමණි

ශ්‍රී ලංකා වාතාවරණයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ව්‍යවස්ථාවේ 14අ ව්‍යවස්ථාව ප්‍රකාරව ලබා දී ඇති මූලික අයිතිවාසිකමක් බව අවධාරණය කළ යුතුයි. ඒ මත ව්‍යවස්ථාව මගින් හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 5 වගන්තිය වැනි අනෙකුත් පනතක වගන්තියක් මගින් හෝ යම්කිසි සීමා පැමිණවීමක් සිදුවන්නේ නම් එම යෙදීම හෝ අර්ථකථනය හෝ සිදු විය යුත්තේ සමානුපාතිකත්වය වැනි මූලධර්ම වලට අනුකූලව, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අවශ්‍යතාවය මත සහ එම සීමා පැනවීමට තර්කානුකූල සම්බන්ධතාවයක් ඇති නෛතික අරමුණක් පෙරදැරි කොටගෙනය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට ප්‍රථමව ද, ශ්‍රේෂ්ඨාධිකරණය මෙම අයිතිවාසිකම අදහස් පළ කිරීමේ නිදහසට අතවශ්‍ය සාධකයක් බව හඳුනාගෙන ඇත (*සීමාසහිත පාරිසරික පදනම එ. නාගරික සංවර්ධන අධිකාරිය* SC (FR) Application No. 47/04: SCM 28.11.2005)

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අයිතිවාසිකමක් වන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමට ආසන්න වූ භාෂා භාවිතයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය *සුනිලා අබේසේකර එ. ආරිය රූබසිංහ, නිසි බලධරයා සහ අනෙක් පාර්ශව* [2000] 1 Sri LR 314 හි, අයිතිවාසිකම් වලට පනවන සීමා 'එම සීමා පැනවීමට අවශ්‍යතාව ගෙන එන යුක්තිසහගත රාජ්‍ය පරමාර්ථය ඉටු කිරීම සඳහා සමීපව සමානුපාතික විය යුතුය' (පිටු අංක 75 හි). මෙම සීමා ප්‍රජාතාන්ත්‍රික සමාජයක අවශ්‍ය විය යුතුයි. තවද අධිකරණය නිරීක්ෂණය කරන ලද්දේ,

> ඡන්ද දායකයන් විසින් අවශ්‍ය වූ දේශපාලන, සමාජයීය සහ ආර්ථිකමය පියවර ක්‍රියාත්මක කිරීම සඳහා, ඉදිරිපත් කරන ලද යෝජනා වලට වෙනස්කම් සිදු කළ හැකි වන්නේ, දැනුවත් සාකච්ඡා තුළින් පමණි...

... තවද නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක පරීක්ෂාවට සහ ඵලදායී විවේචනයට ලක්වන රජයේ ක්‍රියාවලියෙහි අඛණ්ඩ මහජන සුබසිද්ධියක් තිබිය යුතුයි.

මෙම මතයන් ප්‍රශංසනීය වන අතර, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ පූර්විකාවෙහි සඳහන් ඉලක්ක එනම් 'පොදු අධිකාරීන්හි විනිවිදභාවය සහ වගවීම යන සංස්කෘතිය' පෝෂණය කිරීම/ගොඩනැගීම හා සමගාමීව තොරතුරු හෙළිදරව් කිරීමට ගන්නා තීරණය ට ද බලපෑ යුතුයි.

ඉහත තත්ත්වය යටතේ අපගේ මතය වන්නේ 2015 සහ 2016 වර්ෂයන්ට අදාළ අයිතම අංක 6 හි අ, ආ, ඇ, ඈ, ඉ, ඊ සහ උ යන තොරතුරු හෙළිදරව් කිරීම මගින් තොරතුරු පනතේ පූර්විකාවේ සඳහන් විනිවිදභාවය සහ වගවීමේ අවශ්‍යතා සැපිරෙන බවත්, පනතේ 5 (1) (අ), 5 (1) (ඈ) සහ 5 (1) (ඌ) වගන්ති එම හෙළිදරව් කිරීමට බාධාවක් නොවන බවත් සහ කෙසේ වුව ද 5 (4) වගන්තියේ මහජන සුභසිද්ධිය සියල්ල අභිබවා පවතින බවත්ය. ඒ අනුව ඉහත සඳහන් තොරතුරු හෙළිදරව් කරන ලෙසට නියෝග කර සිටිමින් නම්කළ නිලධාරිගේ ඊට අදාළ තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශ්වය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

නම්කළ නිළධාරියාගේ තීරණය මෙයින් ප්‍රතිවර්ථනය කෙරේ.

අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

## ශ්‍රී ලංකා ගුවන් නියමුවන්ගේ සංසදය එ. ශ්‍රී ලංකා ගුවන් සේවය[39]

*'මහජන මුදල් භාවිතය සැලකිල්ලට ගැනීමේදී පොදු අධිකාරිය විසින් සිදු කර ඇතැයි පවසන මූල්‍ය අක්‍රමිකතා කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂාවට ලක් වන බව පැහැදිලි වන අතර මෙම කොමිෂන් සභාව නියෝගය ලබා දීමේදී මහජන සුබසිද්ධිය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරනු ඇත'*

**තීරණයඃ** (නෛතික බල සීමාව) වගඋත්තරකාර ජාතික වාහකයා (carrier), තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 43 (ඉ) වගන්තියේ සඳහන් පරිදි 'පොදු අධිකාරිය'යන අර්ථනිරූපණය අයත්වන බවට තීරණය කරනු ලැබීය. (සමගම් පනතේ (2007) 485 (6) වගන්තිය යටතේ සීමිත සමාගමක් ලෙස සංස්ථාගත කිරීමේ සහතිකයේ බලපෑම, 'සංස්ථාගත කර ඇති විටක මෙන්' යන අර්ථය ඇති);

(කුසලතා) නම්කළ නිලධාරියාගේ තීරණය වෙනස් වූ අතර, පොදු අධිකාරිය එහි ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මානව සම්පත් නිලධාරී (HHR), ප්‍රධාන වාණිජ නිලධාරී, (CCO) යන අයගේ වැටුප් සහ අනෙකුත් දීමනා සහ/හෝ ප්‍රතිලාභ මෙන්ම PIA සමඟ ඇති කරගත් 2016 ජූලි මස 28 වන දින දරන අවබෝධතා ගිවිසුම, PIA සමඟ ඇති කරගත් 2016 අගෝස්තු 04 වන දින දරන කෙටිකාලීන කල්බදු ගිවිසුම හා PIA සමඟ ඇති කරගත් 2016 නොවැම්බර් 02 දරන කල්බදු දීර්ඝ කරගැනීමේ ගිවිසුම/ AerCap සමඟ ඇති කරගත් පිළිවෙළින් 2016 අප්‍රේල් මස 06 හා 2016 ඔක්තෝබර් මස 04 දරන අවසන් කිරීමේ ගිවිසුම් 02/ගුවන් යානා උපදේශ වාර්තා, Seabury, ගුවන් කටයුතු සහ Nyrus වලට අදාළ වාර්තා ද ඇතුළුව අදාළ මණ්ඩල පත්‍රිකා සහ රැස්වීම් වල ලුහුඬු වාර්තා 5 (1) (ඈ) වගන්තිය යටතේ තුන්වන පාර්ශ්වයක තරඟකාරී තත්වයට හානිදායක වන වාණිජ විශ්වාසය හෝ 5 (1) (එ) වගන්තිය යටතේ තුන්වන පාර්ශ්වයක් විසින් ලබා දෙන ලද අදාළ අවස්ථාව වන විට රහස්‍ය යැයි සලකන ලද තොරතුරු යන විෂයපථය තුළට එනයින්ම නොවැටෙන රහස්‍යභාවය පිළිබඳ වගන්ති ආරක්ෂා කිරීම පිණිස සංශෝධන සහිතව (තක්සේරු කර තිබේ නම්) ප්‍රසිද්ධියේ අනාවරණය කිරීමට බැඳී සිටී.

---

39 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /99/2017, 2018.03.23 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.

මෙය 5 (1) (ඈ) වගන්තියෙහි දක්වා ඇති පරිදි අන්‍යෝන්‍ය වශයෙන් මිල හා මිල සංශෝධනය කිරීමේ යාන්ත්‍රණ ඇතුළුව, 'වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු ඇතුළත්' දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලියක් ය යන පදනම මත A350 ගුවන් යානා හතරක් මිලදී ගැනීම සඳහා (2020 දී සැපයීමට පවතින ගුවන් යානා තුනක් සහ 2021 දී සැපයීමට පවතින එක් ගුවන් යානයක්) පොදු අධිකාරිය හා Airbus S.AS අතර පැවති 2013 ජූනි 28 දරන ගිවිසුම හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් නම්කළ නිලධාරියාගේ තීරණය අනුමත නොකරන ලදි.

**මූලික පද** : වාණිජ රහස් (5(1)(ඈ) වගන්තිය/ගිවිසුම්/ එකඟතා/ මහජන අරමුදල් භාවිත කිරීම, ගිවිසගැනීම්, අවසන් වූ එකඟතා සමඟ සසඳන කළ දැනට පවත්නා එකඟතා, වැටුප් විස්තර, රහස්‍ය වගන්ති)/තෙවන පාර්ශ්වයක් විසින් ලබාදුන් රහස්‍ය තොරතුරු/භාරකාරත්ව/පූර්ව වගන්ති/පෞද්ගලිකත්වය/පොදු යහපත (පොදු යහපත ඉස්මතු කරන තොරතුරු, පොදු යපහත පිළිබඳ තොරතුරු ඇතුළුව)/මහජන අරමුදල්/යම් කොටසකින් සාධාරණ ලෙස වෙන්කළ හැකි (6 වන වගන්තිය)

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු</u>

අභියාචක විසින් 2017.06.29 වන දින සිදු කරන ලද තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලීම කරන ලදී.

1. ශ්‍රී ලංකා ගුවන් සේවයේ සේවය කරන පහත නම් සඳහන් නිලධාරීන්ගේ වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ/දීමනා
    a. විධායක නිලධාරී
    b. මානව සම්පත් කළමනාකරණ ප්‍රධානී (HHR)
    c. ප්‍රධාන වෙළඳ නිලධාරී (CCO)
2. ශ්‍රී ලංකා ගුවන් සේවය සහ පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය (PIA) අතර සිදුවූ ලිපි හුවමාරුවට අදාළ/සම්බන්ධ සියලු තොරතුරු

3. පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එළැඹුණු මූලික ගිවිසුමේ සහ එයට අදාළ/සම්බන්ධ සියලු තොරතුරු
4. පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එළැඹුණු මූලික ගිවිසුමට/එකඟවීමට අදාළ මූල්‍යමය තොරතුරු (ලාභ/අලාභ සහ වන්දි මුදල් ඇතුළු අනෙකුත් තොරතුරු)
5. පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් සේවය සමඟ එළැඹුණු මූලික ගිවිසුම අවසන් කිරීමට අදාළ/සම්බන්ධ සියලු තොරතුරු
6. Airbus A350 ගුවන් යානා ඇනවුම අවලංගු කිරීමට අදාළ/සම්බන්ධ සියලු තොරතුරු (ගිවිසුම්/ලිපි හුවමාරු කිරීම් ඇතුළු අනෙකුත් තොරතුරු)
7. විධායක නිලධාරී සුරේන් රත්වත්තේ මහතාගේ A320 Jet Conversion ගුවන් යානයේ පෞද්ගලික පියාසර පුහුණුව සඳහා ශ්‍රී ලංකා ගුවන් සේවයට/වෙනත් පාර්ශ්වවලට දැරීමට සිදුවූ පිරිවැයට අදාළ/සම්බන්ධ සියලු තොරතුරු

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය</u>

අභියාචක 2017.06.29 දින මුල් තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කරන ලදී. තොරතුරු නිලධාරී 2017.06.30 දින ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට අභියාචකට දැන්වූ අතර, 2017.07.19 දිනැති ලිපියෙන් පවසා සිටියේ මෙම තොරතුරු ඉල්ලීම්වල අයිතම් 4 සහ 6 ට අදාළව තොරතුරුවලින් කොටසක් ලබා දිය හැකි අතර අනෙකුත් තොරතුරු ඉල්ලීම් පනතේ 5(1) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන බවයි.

පොදු අධිකාරිය තොරතුරු ඉල්ලීම පනතේ පහත වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කරන ලදී. තොරතුරු ඉල්ලීමේ අයිතම් අංක 1 ට අදාලව 5(1)(අ) සහ 5(1)(උ) වගන්ති ද, අයිතම් අංක 2 සිට 5 ට අදාළව 5(1)(ආ)(ii) සහ 5(1)(ඈ) වගන්ති ද, අයිතම අංක 6 ට අදාලව 5(1)(i), 5(1)(ඈ) සහ 5(1)(ක) වගන්ති ද, අයිතම අංක 7 ට අදාලව 5(1)(අ) සහ 5(1)(උ) වගන්ති පෙන්වා දෙන ලදී.

තොරතුරු නිලධාරී ලබාදුන් පිළිතුර පිළිබඳව සෑහීමකට පත් නොවූ අභියාචක, 2017.08.02 දින නම්කළ නිලධාරී වෙත අභියාචනාවක්

ඉදිරිපත් කරන ලද්දේ විමසා සිටින ලද තොරතුරු මහජන සුභසිද්ධිය සැලකිල්ලට ගනිමින් ඉදිරිපත් කළ යුතු බවත්, තොරතුරු නිලධාරී ලබා දුන් තොරතුරු සාවද්‍ය සහ නොමඟ යවන සුලු වන බවත් පවසමිනි. මෙයට පිළිතුරු ලබා දුන් නම්කළ නිලධාරී 23.08.2017 දිනැති ලිපියෙන් අයිතම් අංක 1 සහ 6 ට අදාළව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළඅතර, අයිතම 2 සිට 5 දක්වා ඉල්ලා සිටින තොරතුරු වල සීමා නිර්ණයක් නොමැති බව පෙන්වමින් පවසා සිටියේ, ඉල්ලා සිටින ලද සියලුම තොරතුරු ලබාදීම් දෙරට, එනම් ශ්‍රී ලංකාව සහ පාකිස්ථාන අතර සම්බන්ධතාවය පළුදු වීමට හේතු විය හැකි බවයි. මෙම පිළිතුර මඟින්ද සෑහීමකට පත් නොවූ අභියාචක, 15.09.2017 දින කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී.

## නෛතික බල සීමාව පිළිබඳ නියෝගය[40]

2007 අංක 7 දරන සමාගම් පනතේ 529 වන වගන්තිය ප්‍රකාරව, "සමාගම" යන්නෙන් මෙම පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ සමාගමක් හෝ පවත්නා සමාගමක් අර්ථ නිරූපණය වන බවටත්, සමාගම් පනත "පවත්නා සමාගමක්" සහ පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ සමාගමක් යන කාණ්ඩ දෙකම සමාගමක් ලෙසට අර්ථ නිරූපණය කරන නිසාවෙන් මෙම පනතේ විධිවිධාන සමාගම් කාණ්ඩ දෙකටම අයත් වන බවට කොමිෂන් සභාව හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ගුවන් සේවය මේ පිළිබඳ ඉදිරිපත් කළ ප්‍රතිරෝධය, තොරතුරු පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියක් යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්. අර්ථ නිරූපණය වන අතර ශ්‍රී ලංකා ගුවන් සේවය 2007 සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ පවත්නා සමාගමක් වන හෙයින් ශ්‍රී ලංකා ගුවන් සේවාව තොරතුරු පනතේ විෂය සීමාවට පරිබාහිර වන බවට ඉදිරිපත් කල ප්‍රතිරෝධයට පමණක් සීමා වේ.

මෙම ප්‍රතිරෝධය සලකා බැලීමේදී, දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබූ දේශන සහ කරුණු සැලකිල්ලට ගන්නා ලද අතර පනත්

40 2018.02.23 දින ලබාදෙන ලදි. අභියාචක වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්: ජනාධිපති නීතිඥ නලීන් ලද්දුවහෙට්ටි, නීතිඥ තරින්දි විජේපුර. පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්: ආචාර්ය ශිවාජි ෆීලික්ස්

පිළිබඳව ද අවධානය යොමු කෙරේ. සමාගම් පනතේ XVII වන කොටස (සංක්‍රාන්තික විධිවිධාන) එනම් "පවතින සමාගම් වලට පනත අදාළ වීම" (වගන්ති 485-487 දක්වා) පවතින සමාගමක් සම්බන්ධව පනතේ වගන්ති ක්‍රියාත්මක වන අයුරු සාකච්ඡා කරයි. මෙම XVII වන කොටසට අනුව, 2007 අංක 7 දරන සමාගම් පනත බලාත්මක වන දින වන විට පවත්නා සමාගම් සියල්ල සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ යුතු අතර පනතේ විධිවිධාන ප්‍රකාරව සමාගම් නාමය වෙනස් කිරීම, සහ නව ලියාපදිංචි අංකයක් ලබා ගැනීම සිදු කළ හැකිය.

මෙම ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීමේ ප්‍රතිවිපාක සමාගම් පනතේ දක්වා ඇත. සමාගමක් මෙම ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට යම් හෙයකින් අපොහොසත් වුවහොත්, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් (මාස 12 ක මහජන දැන්වීමකින් අනතුරුව) සමාගමේ නම රෙජිස්ටරයෙන් කපා හරිනු ලබන අතර, එම සමාගමට අයත් සියලු දේපළ රජය සතු කරනු ලැබේ. [487(5) වගන්තිය]. මෙම ක්‍රියාදාමයට අනුකූල වීම සලකා බැලීමේදී පවත්නා සමාගම්ද, නව ලියාපදිංචි අංකයක් සහිතව සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් ලෙස සලකනු ලබයි.

2007 අංක 7 දරන සමාගම් පනතේ 485(6) වන වගන්තිය මෙසේ සඳහන් කරයි.;

(අ). (5) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කරන ලදැයි සැලකෙන වෙනස් කිරීමට ආනුෂංගිකව රෙජිස්ට්‍රාර්වරයා විසින් නව නාමය කලින් තිබූ නාමය වෙනුවට රෙජිස්ටරයේ ඇතුළත් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි ඉහත කී ප්‍රත්‍යය හෝ කෙටි යෙදුම ඇතුළත් කරමින් නව සංස්ථාගත කිරීමේ සහතිකයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ). එකී නව සංස්ථාගත කිරීමේ සහතිකය රෙජිස්ට්‍රාර්වරයා විසින් 487 වන විධිවිධානය යටතේ නව අංකයක් පැවරීමෙන් පසුව, නිකුත් කළ යුතු ය.

මෙම අභියාචනයේ කරුණු සැලකීමේදී ශ්‍රී ලංකා ගුවන් සේවයේ 2007.11.09 දිනැති සංස්ථාගත කිරීමේ සහතිකය (කොමිසම

අවධාරිත පරිදි), සමාගම් පනතේ 485(6) වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් සේවය සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස "සංස්ථාපනය කරන ලද" ලෙසින් (කොමිසම අවධාරිත පරිදි) ලියාපදිංචි වී ඇති පවත්නා සමාගමක් වශයෙන් හඳුන්වනු ලැබේ.

සංස්ථාගත කිරීමේ සහතිකය (කොමිසම අවධාරිත පරිදි), මගින් තවදුරටත් කරුණු දක්වමින් පෙන්වා සිටින්නේ, නව ලියාපදිංචි අංකය සමාගමට පැවරීම සිදු කර ඇති අතර එය රෙජිස්ටරයේ ඇතුළත් කර ඇති බවයි. නව ලියාපදිංචි අංකය වන PB 67 පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ සංස්ථාගත කිරීමේ සහතිකයේ සමාගමේ පැරණි ලියාපදිංචි අංකය PBS 1020 වන බවයි.

එහෙයින්, 2007 සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් සහ පැරණි නීතිය යටතේ සංස්ථාපනය කරන ලද පවත්නා සමාගමක්. වශයෙන් වෙනස් කිරීමක් සිදු කිරීමට තැත් කළ ද, එය 2007 සමාගම් පනත යටතේ සමාගම් නියාමනය කිරීමේ පහසුව වන සීමිත අරමුණු සඳහා සිදු කරන ලද කෘත්‍රිම වෙනසක් වන අතර, නොකඩවා ක්‍රියාත්මක වීමේ අරමුණකින් ඇති කරන ලද වෙනස් කිරීමක් නොවන බව කොමිෂන් සභාවේ මතයයි.

කෙසේ වෙතත් 2007.11.09 දිනැති සංස්ථාගත කිරීමේ සහතිකයට අනුව මෙය සහතිකයේ බැලූ බැල්මට ඇති නාමික වෙනසක් පමණක් වේ. ඒ අනුව ජාතික ගුවන් සේවය සංස්ථාපනය කරන ලදුව, 2007 සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ සමාගමක් සේ සලකනු ලබයි. මෙසේ නොසැලකීම මගින් ජාතික ගුවන් සේවයට තම ඉදිරි ක්‍රියා කටයුතු සිදු කිරීමෙදී නීත්‍යානුකුල සහ/හෝ නෛතික පුද්ගලභාවයකින් තොරව කටයුතු කිරීමට සිදු වනු ඇත.

මෙම නිගමනයන්ට එළඹීමේදී 2007 සමාගම් පනතේ රාමුව තුල සිට කටයුතු කිරීමට සහ ඒ අනුව "පොදු අධිකාරිය" යන්නට තොරතුරු පනතේ 43(ඉ) වගන්තිය ප්‍රකාරව සහ පනතේ ව්‍යවස්ථාපිත අභිප්‍රායට අනුකුලව අර්ථ නිරූපනයක් ලබා දීමට කොමිෂන් සභාව වග බලා ගැනීමට ක්‍රියා කරන ලදී. තොරතුරු පනතේ පූර්විකාව "පොදු අධිකාරීවල විනිවිදභාවය සහ වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමට" කටයුතු කිරීමේ වගකීම ව්‍යවස්ථාපිත අභියාචනා අධිකාරිය

වන කොමිෂන් සභාව වෙත පවරන ලදී. එහෙයින්, තම නිර්දේශ වලට එළඹීමේදී, මහජන සුබසිද්ධිය සිහි තබා ගනිමින් කටයුතු කිරීමට කොමිෂන් සභාව බැඳී සිටියි.

එහෙයින්, 2007 සමාගම් පනත යටතේ ඇති සංස්ථාගත කිරීමේ සහතිකයේ බලපෑමද නොසලකා ජාතික ගුවන් සේවය තොරතුරු පනතේ 43(ඉ) වගන්තිය ප්‍රකාරව "පොදු අධිකාරියක්" නොවන බවට නියෝගයක් නිකුත් කිරීම නිවැරදි නොවේ. තවද, ජාතික ගුවන් සේවය පොදු අධිකාරියක් නොවන බව අර්ථකථනය කිරීම, ශ්‍රී ලංකා ගුවන් සේවය පමණක් නොව, අනෙතුක් ආයතන ද තොරතුරු පනතේ 43(ඉ) වගන්තියේ ව්‍යතිරේකයට යටත් වීමේ වාසිය අත් කරගැනීමට කටයුතු කළ හැකි වන අතර මෙමඟින් තොරතුරු පනතේ 43(ඉ) වගන්තිය නිරර්ථක තත්ත්වයකට පත් කරනු ලබයි.

මෙසේ නිරර්ථක ව්‍යවස්ථාපිත අර්ථකථන සිදු කිරීමෙන් ආරක්ෂාවක් සැලසීම සම්බන්ධව, ව්‍යවස්ථාවන් කෘත්‍යාත්මක අර්ථකථනයක් ලබා ගනිමින් ව්‍යවස්ථාපිත අභිප්‍රායට අනුකූලව කටයුතු කළ යුතු බවටත්, අසාධාරණ සහ අයුක්ති සහගත නිගමනයන් මඟ හැරිය යුතු බවටත්, අනර්ථය මර්දනය කරමින් අර්ථය ප්‍රගමනය කළ යුතු බවට සහ පෞද්ගලික යහපත සැලකිල්ලට ගනිමින් (*pro privato commodo*), පනතක් මහජන සුබසිද්ධිය තකා (*pro bono publico*) අර්ථ නිරූපණය කළ යුතු බවට හේඩන් ගේ නඩු නියෝගය සඳහන් කරයි. (*හේඩන්ස් තීරණය* [1584] 76 ER 637, 3 CO REP 7a)

මෙහිදී, තොරතුරු පනත මඟින් නිර්දේශ කරන ලද පිළියම සහ ප්‍රතිකාරය නිරර්ථක නොකළ යුතු අතර පනතේ අභිප්‍රාය වන පොදු අධිකාරීවල විනිවිදභාවය සහ වගවීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම. (තොරතුරු පනතේ පූර්විකාව ප්‍රකාරව) ව්‍යර්ථ නොකළ යුතු ය.

ව්‍යවස්ථාවන් සැලකිල්ලට ගත් කල, යම් දෙයක් අවලංගු කර තබා ගැනීමට වඩා ක්‍රියාවට නැංවීම වඩා හොඳ වේය යන *'ut res magis valeat quam pereat'* මූලධර්මයද මෙහිදී සැලකිල්ලට ගනු ලැබේ. "තීරණය අර්ථකථනයන් දෙකක් අතර වන අවස්ථාවකදී ව්‍යවස්ථාවේ අභිප්‍රාය ඉටු කරගත නොහැකි පටු අර්ථකථනය හැර පාර්ලිමේන්තුවේ අභිප්‍රායට පණ පෙවිය හැකි වඩාත් පුළුල් අර්ථකථනය තෝරා ගැනීම

සිදු කළ යුතුය." [Viscount Simon LC in *නෝකස් එ. ඩොන්කාස්ටර් ඇමල්ගමේටඩ් කොලිරිස්* ((1940) AC 1014)].

තවද, ව්‍යවස්ථාපිත අර්ථ විග්‍රහ කිරීමේදී, "පනතක් සම්බන්ධව අර්ථකථනයන් එකකට වැඩි ගණනක් ඇති අවස්ථාවන්හී දී, සංස්ථාවේ සුමට ක්‍රියාකාරීත්වයට අනුරූප වන විකල්පය තෝරා ගත යුතු අතර, සංස්ථාවට ව්‍යාකූලතා සහ අවිනිශ්චිතතාවන් ගෙනදෙන විකල්පය බැහැර කළ යුතු ය." [*ශැනොන් රියැලිටීස් සමාගම එ. විල්ලේ ද සාන්ත මයිකල්* ((1924) AC 185)]

ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ගුවන් සේවය තොරතුරු පනතේ 43(ඉ) වගන්තිය යටතට අයත් වන බවට සනාථ වේ. එනම් එය සිය කොටස්වලින් සියයට විසිපහක් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් හෝ අන්‍යාකාරයකින් පාලන අයිතියක් ඇති රජය හෝ රාජ්‍ය සංස්ථාවක් එකතුව දරනු ලබන "2007 අංක 7 දරන සමාගම් පනත යටතේ" සංස්ථාගත කරන ලද සමාගමක් වේ. විකල්ප නිගමනයකට එළඹීම තොරතුරු පනතේ සුමට ක්‍රියාකාරීත්වයට අනුරූප නොවන අතර සංස්ථාවට ව්‍යාකූලතා සහ අවිනිශ්චිතතාවන් ගෙන දෙන්නක් වේ.

පසුගිය සභාවාරයේදී පුනරාවර්තනය කළ පරිදි (2018.02.06 දින කොමිෂන් සභාවේ වාර්තාගත කාර්යයපටිපාටිය ප්‍රකාරව), ශ්‍රී ලංකා ගුවන් සේවය, තම ආයතනයට තොරතුරු පනත බලාත්මක නොවන බවට ඉදිරිපත් කළ ප්‍රතිරෝධය, ශ්‍රී ලංකා ගුවන් සේවය පනතේ විධිවිධාන ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු සහ නම්කළ නිලධාරියෙකු පත්කර වසරකටත් අධික කාලයක් ඉක්මවීමකින් අනතුරුව ඉදිරිපත් කරන ලද්දකි. තවද, ශ්‍රී ලංකා ගුවන් සේවය තම සමාගම 2007 සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ආයතනයක් වන බවට වාර්තාගතව, නීත්‍යානුකූල ලේඛන මඟින් සහ තම නිල වෙබ් අඩවියේ සඳහන් නෛතික දැන්වීම මඟින් ස්ථිර කරන ලදී (http://www.srilankan.com/a/plan-and-book/legal-notice).

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමේදී, නෛතික බල සීමාව පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් සේවය ඉදිරිපත් කළ ප්‍රතිරෝධය නිෂ්ප්‍රභා කරනු ලැබේ.

## අභියාචනයේ කරුණු මත නියෝගය[41]:

මෙම පනතේ ප්‍රධාන පරමාර්ථය, එහි සාරාංශගත විධිවිධාන වලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි සහ පූර්විකාවේ අවධාරණය කර ඇති පරිදි, "පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම් පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති බැවින්, එමගින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගී විය හැකි සහ රටේ පොදු ජන ජීවිතයේදී සක්‍රිය ලෙස සහභාගී විය හැකි සමාජයක් ප්‍රවර්ධනය කිරීම" පෙන්වා දිය හැකිය.

පොදු ආයතනවල විනිවිදභාවය හා වගවීම පනතේ කේන්ද්‍රීය අවධානය වේ. ඒ සම්බන්ධයෙන් පනතේ පූර්විකාව, උපරිම වශයෙන් තොරතුරු හෙළිදරව් කිරීමේ මූලධර්මය පදනම් කොටගෙන කටයුතු කරයි.

ඉන්දියාවේ තොරතුරු දැනගනීමේ අයිතිවාසිකම පිළිබඳ (2005) පනතේ ඇති "ගැටෙන අවශ්‍යතා තුලනය කිරීම" යන මූලධර්මය; එනම්, ... "සීමිත මුල්‍ය සම්පත් ප්‍රශස්ථ ව භාවිතා කිරීම සහ සංවේදී තොරතුරු පිළිබඳ රහස්‍යභාවය සුරකින කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සම්බන්ධව තොරතුරු හෙළිදරව් කිරීම, අනෙකුත් පොදු අවශ්‍යතා සමග ගැටීමට ඉඩ ඇති බැවින්, මෙම ගැටෙන අවශ්‍යතා ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයේ අතිමූලිකත්වය රැක ගනිමින් තුලනය කිරීමට" කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ මූලධර්මය සමඟ සැසඳීමේ දී වෙනස් බව අවබෝධ කරගත යුතු වේ.

එබැවින් මහජන මුදල් භාවිතය සැලකිල්ලට ගැනීමේදී පොදු අධිකාරිය විසින් සිදු කර ඇතැයි පවසන මුල්‍ය අක්‍රමිකතා කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂාවට ලක් වන බව පැහැදිලිය. මෙම කොමිෂන් සභාව නියෝගය ලබා දීමේදී මහජන සුබසිද්ධිය පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරනු ඇත. අභියාචකයාගේ ඉල්ලීමෙහි ඇති සෑම අයිතමයක්ම ඉතා සුපරීක්ෂාකාරීව සැලකිල්ලට ගනිමින් මෙම කරුණු ඉදිරිපත් කෙරේ.

41 2018.05.09 දින ලබා දෙන ලදි.

<u>අයිතම අංක 1 සහ 7 සම්බන්ධව (නියෝගයේ සාරාංශය)</u>

මෙම තොරතුරු පොදු අධිකාරියේ මහජන මුදල් සම්බන්ධ මූල්‍යමය වගකීම සහ විනිවිදභාවයට ඍජුවම සම්බන්ධ වන නිසා අනාවරණය කළ යුතු තොරතුරු වේ. මෙම තොරතුරු ලබා දීම වඩාත් වැදගත් වන්නේ පොදු අධිකාරිය රටේ ජාතික ගුවන් සේවය ලෙස සලකන ආයතනය නිසාවෙනි. මෙහි මූල්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් මහජනයාට අවැසි තොරතුරු ලබා දීමට කොමිෂන් සභාව බැඳී සිටියි. මීට අමතරව අයිතම් අංක 1 හි සඳහන් තොරතුරු, 20 (1) (ii) රෙගුලාසි ප්‍රකාරව ප්‍රගාමී ලෙස අනාවරණය කිරීමට පොදු අධිකාරිය බැඳී සිටින බවට අවධාරණය කෙරේ.

අභියාචක විසින් ඉල්ලා සිටින ලද තොරතුරු නම් සඳහන් විධායක නිලධාරීන් තිදෙනෙකුගේ වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ/දීමනා පිළිබඳ වන හෙයින් මෙය විශ්වසනීය සම්බන්ධතාවයක් පැවතීම මත ප්‍රතික්ෂේප කළ නොහැක. තවද, මෙය සේවා ගිවිසුමේ අඩංගු සියලු තොරතුරු පිළිබඳ ඉල්ලීමක් නොවන හෙයින් පොදු අධිකාරිය මෙම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළ පදනම, එනම් වගන්ති 5(1)(අ) සහ (උ) භාවිතය වලංගු නොවේ.

එහෙයින් මෙම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සඳහා පොදු අධිකාරිය විසින් හුවා දැක්වූ කරුණු මෙම පනතේම වගන්ති 5 (4) දක්වන වගකීමට යටත් වන හෙයින් අයිතම් අංක 1 සහ 7 ට අදාළ තොරතුරු ලබා දීමට මෙයින් නියෝග කර සිටිමු.

මෙම තොරතුරු අයිතම්වලට අදාළව නම්කළ නිලධාරියාගේ තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

<u>අයිතම අංක 2,3,4 සහ 5 සම්බන්ධව</u>

පොදු අධිකාරිය පාකිස්ථාන අන්තර්ජාතික ගුවන් සේවය සමඟ එළැඹි කල්බදු ගිවිසුම (Wet Lease Agreements) කොමිෂන් සභාවේ නිරීක්ෂණයට 2018.04.26 දින ඉදිරිපත් කරනු ලැබූ අතර, 2016.08.04 දිනැති එම කල්බදු ගිවිසුම නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ රාහස්‍යභාවය පිළිබඳ 24.3 වන වගන්තිය එම ගිවිසුමේ 24.3.1 සිට 24.3.3 දක්වා වන අනු වගන්ති වල ව්‍යතිරේකයන්වලට යටත් බවයි.

මෙහි 24.3.2 වන අනු වගන්තියේ මෙසේ සඳහන් වේ. "මෙම රහස්‍යභාවය පිළිබඳ වගන්තිය ව්‍යාවස්ථාපිත නීති, උසාවි නියෝග සහ ඕනෑම රාජ්‍ය ආයතනයක නියෝගයකට යටත් වේ". තවද *ට්‍රාන්සෙන්ට් සමාගම හා තවත් අය එ. එස් ඒ යන්ත්‍රෝපකරණ සමාගම හි තීරණය වූ* පරිදි පොදු අධිකාරියක් මහජන මුදල් භාවිතයෙන් ගිවිසුමක් ප්‍රදානයෙන් අනතුරුව රහස්‍යභාවය පිළිබඳ වගන්තියට ගිවිසුමේ තොරතුරු අනාවරණය කිරීම සීමා කල නොහැකි වේ.

එබැවින්, අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු පනතේ 5(1)(ආ)(ii) සහ 5(1)(ඈ) වගන්ති ප්‍රකාරව ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූලව ප්‍රමාණවත් හේතුකාරකයක් නොවන බවට ප්‍රකාශ කර සිටිමු. තවද 5(1)(ආ)(ii) වගන්තිය යටතේ තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට අදාළ කොන්දේසියක් වන "බරපතල අගතියක් සිදුවීම" ඔප්පු කර දැක්වීමට පනතේ 32(4) වගන්තිය සමඟ සලකනු ලැබූ කල පොදු අධිකාරිය විසින් සෑහීමකට පත්වන අයුරකින් කරුණු දැක්වීමට අපොහොසත් වී ඇත.

තවද 5(1)(ඈ) වගන්තිය මඟින් දක්වා ඇති තොරතුරු ප්‍රතික්ෂේප කිරීම 5(4) වගන්තියේ දක්වන මහජන සුභසිද්ධියට යටත් වන හෙයින්, අයිතම් 2, 3, 4 සහ 5 වලට අදාළ තොරතුරු අනාවරණය කල යුතු බවට මෙයින් දන්වා සිටිමු. එනම්; 2016.07.28 දිනැති අවබෝධතා ගිවිසුම, 2016.08.04 දිනැති කල්බදු ගිවිසුම සහ 2016.11.02 දිනැති කල්බදු ගිවිසුම දීර්ඝ කිරීම පිළිබඳ ගිවිසුම වේ. ඉහත සඳහන් තොරතුරු පනතේ විධිවිධාන යටතේ අනාවරණය කළ හැකි තොරතුරු වේ.

මෙම තොරතුරු අයිතම්වලට අදාළව නම්කළ නිලධාරියාගේ තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

**<u>අයිතම අංක 6 සම්බන්ධව</u>**

අභියාචක විසින් ඉල්ලා සිටින තොරතුරු පනතේ 32(4) වගන්තිය සමඟ සලකනු ලැබූ කළ පනතේ 5(1)(ඈ) සහ 5(1)(එ) වගන්ති ප්‍රකාරව පොදු අධිකාරිය විසින් තොරතුරු ප්‍රතික්ෂේප කිරීම පිළිගත නොහැකි ය. එනම් 2016.08.06 දින සහ 2016.04.10 දින පොදු අධිකාරිය AerCap ආයතනය සමඟ සමාප්ත කල ගිවිසුම් (Termination Agreements)

දෙක පිළිබඳව තොරතුරු පහත සඳහන් කරුණු සැළකිල්ලට ගනිමින් ඉදිරිපත් කළ යුතු බවට නියෝග කර සිටිමු.

(a) එකී සමාප්ති ගිවිසුම් (Termination Agreements) වල කාර්යය අවසන් වී ඇත. එම නිසා එම ගිවිසුම්වල රහස්‍යභාවය පිළිබඳ ව වගන්ති ඇති පමණින් පනතේ 5(1)(එ) සහ 29 වගන්ති සැලකිල්ලට ගෙන තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ නොහැක. එය සිදු කිරීමට අදාළව 32(4) වගන්තියෙහි සඳහන් ඔප්පු කිරීමේ භාරය ඉටු කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇත

(b) එහි අන්තර්ගතය අනුව ඉහත සඳහන් ගිවිසුම්වල, සමාප්ති ගාස්තු හා ගෙවීම්, ගිවිසුම් අවසන් කිරීම, පැවරීම ආදිය පිළිබඳව (2016.04.06 දිනැති සමාප්ති ගිවිසුම) සහ AGAT කල් බදු සමාප්ති ගිවිසුම්, ණයවර ලිපි සමාප්ති කිරීම්, අතිරේක කල්බදු සඳහා වන ණය ගිවිසුම්, බෙදාහැරීම් ක්‍රියාවලි කිහිපයක් පිළිබඳ කරුණු ඇතුළත් වේ. මෙම ගිවිසුම්වල මූලික වගන්ති පොදු ආයතනය විසින් සමාප්ති/අවලංගු කිරීමේ ගාස්තු ගෙවීම් පිළිබඳ වේ. එබැවින් මෙම ලේඛන පොදු අධිකාරියට 3 වන පාර්ශ්වයක් විසින් ලබා දී ඇති රහස්‍ය තොරතුරු ලෙස සලකනු ලබන ආකාරය සහ ඒවා අනාවරණය කිරීම මඟින් AerCap ආයතනයට වන වාණිජමය හෝ තරඟකාරී බලපෑමක් මෙම කොමිෂන් සභාවට හඳුනාගත නොහැකිය.

(c) කෙසේ වෙතත්, ඉහත සඳහන් හේතුන් අනුව, පනතේ 5(1)(ඈ) සහ 5(4) වගන්ති ප්‍රකාරව මෙම තොරතුරු පොදු සුභසිද්ධිය උදෙසාත් මෙමඟින් රටට සිදුවූ මූල්‍යමය පාඩුව අනාවරණය කිරීමටත් ඉදිරිපත් කළ හැකිය. එක්සත් රාජධානියේ *Rob Evans v Information Commissioner* (පරිපාලන අභියාචන මණ්ඩලය, [2012] UKUT 313 (AAC)) හි නිරීක්ෂණය කල පරිදි, මහජන සුභසිද්ධිය රාජ්‍ය ප්‍රතිපත්ති සහ පොදු මුදල් භාවිතය සම්බන්ධ කරුණු අනාවරණය කිරීමට ප්‍රබල හේතුකාරකයක් වේ.

AerCap ආයතනය සමඟ අත්සන් කරන ලද සමාප්ති ගිවිසුම් අනාවරණය නොකිරීමට තොරතුරු නිලධාරියා ලබා දුන් තීරණය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, A350 ගුවන් යානා 4 ක් මිලදී ගැනීම සම්බන්ධව පොදු අධිකාරිය 2013.06.28 දින Airbus SAS සමඟ එළැඹි ගිවිසුමට අදාළ ලියකියවිලි අනුකූලව 2020 වර්ෂයේදී ගුවන් යානා තුනක් සහ එක් ගුවන් යානයක් 2021 වර්ෂයේදී ලබා ගැනීමට නියමිතය. මෙම ගිවිසුම තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින අතර පනතේ 5(1) වන වගන්තියේ දක්වා ඇති පරිදි එහි "වාණිජමය වශයෙන් සංවේදී තොරතුරු" සලකා බැලිය යුතු අතර, Airbus SAS හි 2017.07.19 දින විද්‍යුත් තැපැල් නිවේදනයෙහි මිල සංශෝධන යාන්ත්‍රණයන් ඇතුළත් වේ.

මෙම තත්ත්වය යටතේ, Airbus SAS සමඟ ගිවිසුමට අදාළ තොරතුරු අනාවරණය නොකිරීමට තොරතුරු නිලධාරියා ගනු ලැබූ තීරණය තහවුරු කෙරේ.

**Seabury, Skyworks සහ Nyrus හි වාර්තා**

Seabury, Skyworks සහ Nyrus හි වාර්තා වල (එම ගුවන් යානා මිලදී ගැනීම හා අවලංගු කිරීම සම්බන්ධ ක්‍රියාවලියෙහි කොටසක් බවට පත් වූ තොරතුරු) මාර්ගජාලය සහ නැව් තක්සේරු කිරීම, මූලෝපායික පොදු ආයතනවල දළ විශ්ලේෂණය සහ ව්‍යාපාර උපදේශන පිළිබඳ පිළිබඳ සවිස්තරාත්මක ඇගයීම සහ වැදගත් තොරතුරු අන්තර්ගත වන බවත්, මෙම තොරතුරු අනාවරණය කිරීම පොදු අධිකාරියේ ව්‍යාපාර කටයුතුවලට අවදානම් සහ තර්ජනයක් වනු ඇති නිසාත්, වාර්තාවල අඩංගු තොරතුරු තරඟකරුවන් විසින් භාවිත කරනු ලැබුවහොත් පොදු අධිකාරියට බරපතල මූල්‍ය ප්‍රතිවිපාක සහ අහිතකර බලපෑම් ඇති විය හැකි බවත් පොදු අධිකාරිය විසින් පැවසූ නමුත් මේ පිළිබඳ කිසිදු විශේෂිත කරුණක් දක්වා නොමැත.

32 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට නම්කළ නිලධාරියාගේ *"තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි"* නිසාවෙන් පොදු අධිකාරියට පහත සඳහන් තොරතුරු වාර්තා අභියාචක හට ඉදිරිපත් කිරීමට මෙයින් නියෝග කර සිටිමු. මෙහිදී පොදු අධිකාරිය විසින් පනතේ 5(1)(ඇ) ප්‍රකාරව *"වාණිජ රහස් හෙළිදරව් කිරීම යම් තුන්වන පාර්ශ්වයක තරඟකාරී තත්ත්වයකට අහිතකර ලෙස බලපානු ඇති"* ලෙස සලකනු ලබන තොරතුරු හැර Seabury (පෙබරවාරි 2013), Skyworks (2015.10.22 සහ

2015.10.26) සහ Nyrus (මාර්තු 18) ට අදාලව ට අනෙකුත් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

පොදු අධිකාරියට තෙවන පාර්ශ්වයක් විසින් ලබාදුන් පනතේ 5(1)(ඵ) වගන්තිය ප්‍රකාරව රහස්‍යභාවයක් සහිත තොරතුරු යැයි සලකනු ලබන තොරතුරු ඇතුළත්ව ඇති වාර්තාවලින් ඉවත් කොට ලබා දිය හැකි යැයි සැළකෙන තොරතුරු ලබාදීම පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව සිදු කළ හැකිය.

තොරතුරු ඉල්ලීම 6 වන අයිතමයේ තොරතුරු ප්‍රදානය මුක්ත කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය පනත ප්‍රකාරව ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් හේතුකාරක වලට සීමා වී, ලබා නොදිය යුතු තොරතුරු වල අන්තර්ගතය පිළිබඳව තීරණය කිරීමට අපි කටයුතු කරමු.

**මෙම ගැටළුව සම්බන්ධයෙන් අදාළ මණ්ඩල වාර්තා සහ පොදු අධිකාරියේ රැස්වීම් වාර්තා**

තොරතුරු ලබා දීම, රහස්‍යබව, වාණිජමය වටිනාකමක් සහිත වීම හෝ විශ්වසනීය සමබන්ධතාවක් පැවතීම යන පදනම මත ප්‍රතික්ෂේප කළද, එම තොරතුරු වලින් ආරක්ෂා කළ යුතු කොටස හැර අනෙකුත් තොරතුරු කොටස් අභියාචකට ලබා දිය හැක. *ශ්‍රී සුහාස් වෛද්‍ය එ. මහාරාෂ්ට්‍ර බැංකුව, (File No. CIC/MP/C/2014/900191/SH, File No. CIC/SH/A/2014/001847)* හි උසාවි නියෝගය මඟින්ද මෙසේ තීරණය වන ලදී.

පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට "එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම, හෝ ප්‍රතිවර්තනය කිරීම කළ හැකි අතර එම ඉල්ලීම අවශ්‍ය කටයුතු සඳහා අදාළ තොරතුරු නිලධාරියාට නැවත යැවීමට" ලබා දී ඇති අධිකාරිය භාවිතයෙන් ඉහත සඳහන් තොරතුරුවල පොදු අධිකාරියට තෙවන පාර්ශ්වයක් විසින් ලබා දුන් පනතේ 5(1)(ඵ) වගන්තිය ප්‍රකාරව රහස්‍යභාවයක් සහිත තොරතුරු යැයි සලකනු ලබන තොරතුරු ඇතුලත්ව ඇති වාර්තාවලින් ඉවත් කොට ලබා දිය හැකි යැයි සැලකෙන තොරතුරු ලබාදීම පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව අභියාචක හට ලබා දීමට මෙයින් නියෝග කර සිටිමු.

තොරතුරු ඉල්ලීම 6 වන අයිතමයේ තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් හේතු සැළකිල්ලට ගෙන ලබා නොදිය යුතු තොරතුරුවල අන්තර්ගතය තීරණය කිරීම එම හේතුකාරකවලට සීමා කෙරේ.

මෙම නියෝගය ඉදිරිපත් කර සති හතරක කාලයක් තුළ පහත සඳහන් තොරතුරු අභියාචකහට ලබාදී නැතහොත් පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව තොරතුරුවලින් කොටසක් ලබාදීමේ හැකියාව පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කරන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු.

(අ). 2013.03.01 දින බත්තරමුල්ල පිහිටි කථානායක නිවසේ සිදුවූ A350 ගුවන් යානා 4ක් මිලදී ගැනීමට සහ තවත් A350 ගුවන් යානා අතරක් කල්බදු ක්‍රමයට ගැනීමට අදාළව මණ්ඩල රැස්වීමේ වාර්තා.

(ආ). 2013.03.14 දිනට අදාළව මණ්ඩල අනුමැතිය ලබාදුන් මණ්ඩල රැස්වීම් වාර්තා; 2015.09.09 දිනට අදාළව AreCap ආයතනය සමඟ A350 ගුවන් යානයක් කල්බදු ක්‍රමයට ලබා ගැනීම සම්බන්ධ සාකච්ඡා කිරීමට අවසර ලබාදීම පිළිබඳ වාර්තා.

(ඇ). 2017 නොවැම්බර් මස ලැබීමට නියමිතව තිබූ A350 ගුවන් යානයේ කල්බදු ගිවිසුම සමාප්ත කිරීමට තීරණය කිරීමට අදාළ 2016.03.09 දින මණ්ඩල රැස්වීම් වාර්තා.

(ඈ). 2017 ඔක්තෝබර් සහ නොවැම්බර් මස ලැබීමට නියමිතව තිබූ A350 ගුවන්යානයේ කල්බදු ගිවිසුම සමාප්ත කිරීමට තීරණය කිරීමට අදාළ 2016.09.28 දින මණ්ඩල රැස්වීම් වාර්තා.

(ඉ). විධායක නිළධාරී සුරේන් රත්වත්තේ මහතා යොමුකළ 2016 මාර්තු 8 දිනැති මණ්ඩල පත්‍රිකාව.

නම්කළ නිලධාරීගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

# ශ්‍රීන් සරුැර් එ. අග්‍රාමාත්‍ය කාර්යාලය[42]

*'මෙම පනත ශ්‍රී ලංකාවේ මහජනයාට සහ පොදු අධිකාරීන්ට තවමත් ආධුනික පනතක් වන අතර මෙහි ඇති ක්‍රියා පටිපාටීන්ට හුරු වීමට සියලු දෙනාටම කල් ගත විය හැකි බවට සිහි කර සිටිමු'*

**තීරණය:** කැබිනට් මණ්ඩලය ඉදිරියේ ඇති පනත් කෙටුම්පත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 43 වගන්තිය යටතේ 'තොරතුරු' යන අර්ථ නිරූපණයට වැටීම මත වන්දි පිළිබඳ පනත් කෙටුම්පතේ සැලැස්මක් සැපයීමට පොදු අධිකාරිය බැඳී සිටියි.

**මූලික පද:** කැබිනට් සංදේශය, අර්ථ දැක්වීම්, අර්ථ නිරූපණ, නීති කෙටුම්පත් (43 වගන්තිය), කාල සීමාවන්

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරු:</u>

අභියාචක, 2017.06.07 දින ලිපියක් මගින් සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට අදාළව පහත සඳහන් තොරතුරු අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ඉල්ලා සිටින ලදී.

(A) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 සම්මතය (UN HRC 30/1) සම්බන්ධව පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවලට අදාළ යෝජනා/ නීති කෙටුම්පත්/ සංකල්ප සටහන්/ලිපි ලේඛනවල පිටපත්:

- (a) අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලයක් ස්ථාපනය කිරීම
- (b) සත්‍ය ගවේෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
- (c) විශේෂඥ නීතිඥයින් ඇතුළත් අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
- (d) සත්‍ය, යුක්තිය, හානිපූරණය ප්‍රදානය සහ ප්‍රතිවර්තනය වැළැක්වීමට ගනු ලබන යාන්ත්‍රණය ස්ථාපනය කිරීම

42 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /01/2018, 2018.05.15 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. 2018.07.10 සහ 2018.09.04 දින නියෝගය ලබා දෙන ලදි.

(B) ඉහත සඳහන් යෝජනා/නීති/කෙටුම්පත්/සංකල්ප සටහන්/ලිපි ලේඛනවලට අදාළව දේශීය/අන්තර්ජාතික උපදේශකවරුන්/ප්‍රවීණයන් සමග කරනු ලැබූ සමාලෝචන/සන්නිවේදන/සාකච්ඡා/ලිපි ලේඛන කෙටුම්පත්වල පිටපත්

(C) UN HRC 30/1 ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගනු ලැබූ ක්‍රියා සැලසුම්වල පිටපත/පිටපත්

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරය:</u>

තොරතුරු නිලධාරියා 2017.07.07 දිනැති ලිපිය මඟින් පිළිතුරු දක්වමින් පවසා සිටියේ, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට අදාළව පනත් දෙකක් පොදු ලියවිලි බවට පත් කර ඇති බවත්, එම ලියවිලි documents.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් හැකි බවයි. ඉල්ලා සිටින ලද අනෙකුත් තොරතුරු පනතේ 5(1)(ක) ප්‍රකාරව තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයන් සම්බන්ධ වන හෙයින්, ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. ඉහත තොරතුරුවලින් සෑහීමකට පත් නොවූ හෙයින් අභියාචක 2017.07.22 දින නම්කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. එයට පිළිතුරු වශයෙන් 2017.07.31 දිනැති ලිපියෙන් අභියාචක හට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශයට අභියාචකගේ තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කර ඇති බව පෙන්වන ලිපි දෙකක් නම්කළ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලදී. අභියාචක විසින් 2017.10.06 දිනැතිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කර ඇත.

## අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කරුණු [43]:

පොදු අධිකාරිය කරුණු දක්වමින් පවසා සිටියේ තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ වූ තොරතුරු පිළිබඳ ව නොවුවද, තමා අදාළ තොරතුරු වෙනත් අධිකාරීන්ගෙන් ක්‍රියාශීලීව ලබා ගැනීමට කටයුතු කළ බවයි.

## නියෝගය:

මෙම තොරතුරු ඉල්ලීම මඟින් ඉල්ලා සිටින ලද තොරතුරු ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය පිළිබඳ වන හෙයින් මෙම තොරතුරු මහජන සුබසිද්ධිය තකා සලකා බැලීම ඉතා වැදගත් වේ.

43 අභියාචක වෙනුවෙන් පෙනී සිටීම : නීතිඥ සංකිතා ගුණරත්න මෙනවිය, පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම : රජයේ නීතිඥ සුරේෂ් ගණරාජ් මහතා (නීතිපති දෙපාර්තමේන්තුව)

නීති සම්පාදනය සලකන කල්හි *ගෝමස් එ. සමාජ සවිබලගැන්වීම්, සුභසාධනය සහ උඩරට උරුමය* (RTIC Appeal/51/2018, 2018.02.27 දින RTIC වාර්තා) පිළබඳ නඩු නියෝගයේ මෙසේ සඳහන් කර ඇත. "කලාපයේ මෙන්ම අන්තර්ජාතිකවද බොහෝ රටවල්වල නීති සම්පාදනයේදී පනත් ගැසට් කිරීමට පෙර එහි කෙටුම්පත් මහජනතාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය කරුණකි. ඒ මහජන ආකල්ප පසුවිපරම සහ එකඟත්වය මේ ක්‍රියාවලිය සඳහා වාසිදායක විය හැකි හෙයිනි" පනතේ 43 වගන්තිය ප්‍රකාරව "නීති කෙටුම්පත්" තොරතුරු ලෙස සලකනු ලැබේ.

2017.10.06 දිනැති අභියාචනය මගින් අභියාචක, 2017.07.27 දිනැති ලිපිය මගින් පොදු අධිකාරිය ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත තම තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කළ ලිපි කෙරෙහි අවධානය යොමු කරන ලදී. මේ නිසා අභියාචක මෙම ලිපි කොමිෂන් සභාවට ඉදිරිපත් නොකිරීම ඇයගේ අත් වැරැද්දක් මත සිදු වූ කාරණයක් ලෙසට කරන ලද පැහැදිලි කිරීම කොමිෂන් සභාව පිළිගනු ලබයි. (මෙම ලිපි අභියාචනයේ කොටසක් ලෙස අමුණා නොමැත).

පනතේ 32(2) ප්‍රකාරව අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා නියමිත කාලයේදී අභියාචනය ගොනු නොකිරීම නිසා 32(1)(අ) වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය විසින් අභියාචනය ඉදිරිපත් කිරීම කල් ඉකුත් වීම පිළිබඳ ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයට පිළිතුරු දැක්වූ අභියාචක පවසා සිටයේ ඇය අභියාචනාවක් ගොනු කිරීමට ප්‍රථම අදාළ අමාත්‍යාංශවලින් ප්‍රතිචාර ලබා ගැනීම සඳහා කටයුතු කළ සිටි බවත් එම ප්‍රයත්නය අසාර්ථක වූ බවත්ය.

පනතේ 32(2) ප්‍රකාරව කල් ඉකුත් වීම පිළිබඳව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද මෙම පැහැදිලි කිරීම පිළිබඳ කොමිෂන් සභාව සෑහීමකට පත් වේ. තවද මෙම පනත ශ්‍රී ලංකාවේ මහජනයාට සහ පොදු අධිකාරීන්ට තවමත් ආධුනික පනතක් වන අතර මෙහි ඇති ක්‍රියා පටිපාටීන්ට හුරු වීමට සියලු දෙනාටම කල් ගත විය හැකි බවට සිහි කර සිටිමු.

කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කර ඇති තොරතුරු සැලකිල්ලට ගැනීමේදී පැහැදිලි වන්නේ 18/0430/702/008 දරන 2018.03.05 දිනැති

වන්දි ලබාදීමේ කාර්යාලයක් ස්ථාපනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා අත්සන් කල සංදේශයක් හෙයින් පනතේ 3 වගන්තිය ප්‍රකාරව මෙම තොරතුරු පොදු අධිකාරිය "භාරයේ, සන්තකයේ සහ පාලනයේ" (එනම්; අග්‍රාමාත්‍ය කාර්යාලය) ඇති තොරතුරු විය යුතු බවයි.

2018.03.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වන්දි ලබා දීමේ කාර්යාලයක් ස්ථාපනය කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි එහි 1 වන ඇමුණුමට අදාලව නීති කෙටුම්පත් කිරීමට නීති සම්පාදකයින්ට උපදෙස් ලබා දී ඇති බවට කොමිෂන් සභාව තවදුරටත් නිරීක්ෂණය කරයි.

නම්කළ නිලධාරීගේ තීරණය මින් ප්‍රතිවර්තනය කෙරේ.

# ෆයිසාල් සමාත් එ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය [44]

*'විමසා ඇති තොරතුරු සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය සහ/හෝ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර පවතිනු අවබෝධතා ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධයෙන් වන අතර, ඒ අනුව එම රටවල රැකියාවෙහි නිරත වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීම වන මහජන සුභ සිද්ධිය අදාළ වේ'*

**තීරණයඃ** මාධ්‍යවේදීන් විසින් මහජන යහපත උදෙසා ඉල්ලා සිටින සංක්‍රමණික සේවකයන් සම්බන්ධ තොරතුරුවලට අදාළ ශ්‍රී ලංකා රජය සහ සෞදි අරාබිය, ශ්‍රී ලංකා රජය සහ කටාර් රාජ්‍ය, ශ්‍රී ලංකා රජය සහ කුවේටය අතර ඇති අවබෝධතා ගිවිසුම් සහ/හෝ ද්විපාර්ශ්වික ගිවිසුම් වල පිටපත් සැපයීමට පොදු අධිකාරිය බැඳී සිටියි.

**මූලික පදඃ** අන්තර්ජාතික ගිවිසුම්, අන්තර්ජාතික නීතිය යටතේ වන බැඳීම් (5(1)(ආ)(ii) වගන්තිය)/විදේශීය වෙළඳ ගිවිසුම් (5(1)(ඇ)(v) වගන්තිය)

## පසුබිම් වූ සිද්ධිමය කරුණු සැකෙවින්

<u>අභියාචක විසින් අයදුම්කරන ලද තොරතුරුඃ</u>

අභියාචක විසින් 2017.07.03 දින ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර පවතිනු ලබන අවබෝධතා ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම්.

<u>පොදු අධිකාරියේ ප්‍රතිචාරයඃ</u>

තොරතුරු නිලධාරියා 2017.07.06 දිනැති විද්‍යුත් තැපැල් පණිවිඩයෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම

44 RTIC අභියාචන (පෞද්ගලික විභාග කිරීම) /201/2017, 2018.02.06 දින පැවැති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි. නියෝගය 2018.02.23 දින ලබාදෙන ලදි.

පිළිබඳ පනතේ 5 (ආ) (ii) වන වගන්තිය යටතේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉක්බිතිව අභියාචක 2017.07.13 දිනැතිව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරියා විද්‍යුත් තැපැල් මාර්ගයෙන් තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාරය දක්වමින් 2017.08.10 දිනැතිව තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව, අභියාචක 2017.10.17 දිනැතිව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කර ඇත.

**නියෝගය:**

අභියාචක විසින් විමසා ඇති තොරතුරු රහසිගත වන්නේ කුමන අයුරින්ද සහ කෙසේද යන්න කොමිෂන් සභාවට සතුටුදායක ලෙස කරුණු දැක්වීමට පොදු අධිකාරිය අපොහොසත් වී ඇත. විමසා ඇති තොරතුරු සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය සහ/හෝ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යයන් අතර පවතින අවබෝධතා ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධයෙන් වන අතර, ඒ අනුව එම රටවල රැකියාවෙහි නිරත වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීම වන මහජන සුභ සිද්ධිය අදාළ වේ.

තවද, විමසා ඇති තොරතුරු අදාළ වන්නේ සමාප්ත කළ අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් වන අතර එළැඹීමට ඇති ගිවිසුම් නොවන නිසාවෙන් ගිවිසුම්වල පාර්ශ්වකරුවන්ට බරපතල අගතිගාමී විය නොහැකිය. එමනිසාවෙන්, පොදු අධිකාරිය විසින් දක්වා ඇති 5(1)(ආ)(ii) සහ 5(1)(ඇ)(v) යන වගන්ති යටතේ තොරතුරු ප්‍රදානය ප්‍රතික්ෂේප කර නොහැකිය.

